

ශ්‍රී කාලි දාස මහා කවීන් විරචිත

රඝුවංශ මහා කාව්‍යය

සමරවිභාකරව්‍යාඛ්‍යා සහිතයි.



සමයත කවිචක්‍රවර්ත්තිඛාමණි ශ්‍රී කාලිදාස මහාකවින් විසින්
විරචිත

රඝුවංශ මහාකාව්‍යය

හෙනරත්ගොඩ හංසගිරිවලව්වේ නිවැසි
ප්‍රාචීන ප්‍රතීචීන භාෂා ශාස්ත්‍රාචාර්ය
ජේ. සමරදිවාකර මන්ත්‍රිශ්වරයාණන් විසින්
ලියනලද

සමරදිවාකරව්‍යාඛ්‍යා

කම් පදගත සන්ධියෙන් සහ ධාතු ප්‍රත්‍යය නිර්වචනාදියෙන්
සමලඞ්කෘතයි.

විවර්ජනකිරීටායමානවූ පැලියගොඩ
විද්‍යාලඞ්කාර මහාපරිවෙණාධිපතිව වැඩවසූ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය
මහොපාධ්‍යාය රත්මලානේ
ධම්මකීර්ති ශ්‍රීධර්මාරාමාභිධාන
ප්‍රධාන සඞ්ඝනායක මංකිස්සියාණන්වහන්සේ විසින්
අවසාන ශෝධ්‍යපත්‍රාවලෝකනයෙන්
පිළිගෙන වදුරනලදි.

සිසිලියා ඉලැයිසා සමරදිවාකර මැතිනිය
විසින්
දෙවෙනි වරට
ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි
මුද්‍රණයකරවනලදි.

ශ්‍රී බු. ව. **2473.**
ක්‍රි. ව. **1930.**

THE

RAGHUVANSA,

OF

KALIDASA

WITH A SINGHALESE COMMENTARY

BY

J. SAMARADIWAKARA

M. R. A. S, M. C. O. S.

APPROVED BY THE

LATE VENERABLE TRI-PITAKA VAGISWARACHARYA MAHOPADHYAYA

K. SRI DHARMARAMA

Chief High Priest,

PRINCIPAL OF

The Vidyalankara Oriental College.

PUBLISHED BY

Mrs. C. E. Samaradiwakara.

Second Edition.

PRINTED AT THE

LANKABHINAWA VISSRUTA PRESS.

COLOMBO.

1930.



J. Samaradiwakara.

ජේ. සමරදිවාකර.



ශ්‍රී ධම්මාරාම මාහිමිනාණන් වහන්සේ.

PREFACE.

The Raghuvansa is one of the three great works written by **Kalidasa** who is universally admitted to be the Shakespeare of the East and who is held to have lived in the fifth century of the Christian Era. Sir Wilson Jones has rendered the beauties of his pastoral drama "**Sakuntala**" accessible to Europeans by a classical version of it in the English language Mr. Jone's rendering of Kalidasa's second work **Wikkramorwasi**, "The Hero and the Nymph" is in so romantic a strain that it has been compared to Shakespeare's "Tempest" and "Midsummer Night's Dream." His third poem, the **Raghuvansa** or History of the Emperor of Raghu and his descendants, far excels the other two in tenderness and delicacy, in sublimity of description, in richness and elegance of metaphorical expression, in originality and depth of thought. Indeed, so exquisite is the pleasure it conveys to the intellectual reader that it has been truly said "Excelled by the sweetness of poetry, nectar has fled to the Gods."

What the Latin and Greek languages are to the English, the Sanskrit and Pali are to the Singhaleso. As the knowledge of pure Sanskrit in Ceylon, is confined almost exclusive to the most learned amongst the Buddhist priesthood, the key to the intellectual and moral treasures contained in the **Raghuvansa** is at present possessed in Ceylon by very few. My object in embarking upon the enterprise of writing a Singhalese commentary on the work has been to furnish a much wider circle of my countrymen with facilities for studying the work, the main purpose of which is to instil into its readers the fundamental principles of morality. The insistent requests of an impatient public who were aware of the labour I am engaged in, have compelled me to allow the publication of my commentary on the first ten chapters in a separate volume. The remaining nine chapters of the work will shortly follow.

In regard to this undertaking I must note with gratitude the encouragement I received at the hands of my reverend tutors, the late Venerable Hikkaduwe Sri Sumangala Maha Nayaka Thera, and the Venerable Ratmalane Dharmakirti Sri Dharmarama Maha Nayaka Thera. It is matter for sincere regret to me that the former died before this work was completed. My grateful acknowledgments are due in no small measure to the other Venerable Maha Nayaka Thera to whose invaluable assistance the success of this undertaking is mainly to be ascribed.

J. Samaradiwakara.

Hansagiri Walawwa,
Henaratgoda, 1914.

රඝුවංශ මහාකාව්‍යය.

"ඉදමඤ්ඤතමං කාතඤ්ඤං ජායෙන භුවනත්‍රයම්
යදි ශබ්දහවයං ජ්‍යොතිරාසංසාරානන දිප්‍යතෙ"

යන මේ දිව්‍යප්‍රායවූ සුකතිතොමෝ
සියලු කවීන්විසින් දන්නාලද්දිමය.

"සාහිත්‍යාදි විද්‍යාමයශබ්ද නමැති මේ ආලොකය සත්‍ය ලොකය හිමිකොට ඉදින් ප්‍රකාශතොවේනම් මුළුතුන්ලොව නිරන්තරයෙන් අඥානතමක වෙයි" යුබැවින් ඥානවාරයෙන් ළෙඟි වමතකෘතිය (=අලෞකිකවූ සතුට) උපදවා ගුණාගුණ වෙන්කිරීමෙහි ශක්තිය උපදවනහෙයින් යථොක්ත ශබ්දමයවූ ආලොකය සුධින්ම සුව්‍යක්තමය. ඒ එසේමැයි. සත්කාව්‍යයන්ගේ හැදෑරීමෙහි කිසි අවාච්‍යවූ රසසඤ්ඤීතියක් පහළවන්නිය. ඕ වනාහි තමා විසින්ම දතයුත්තිය. රසමයවූයේ කාව්‍යයයි.

"කාදම්බරීරසඥානා-
දුහාරෙ'පි න රොවතෙ"

"කාදම්බරීකාව්‍යයාගේ රසය දැන්මෙන් ආහාරාදර රුවිතොකෙරෙයි" යනු කීහෙයින් කාව්‍යාර්ථයන්ගේ අනුසන්ධානයෙන්ම සියලු බාහ්‍යගොචරයන් විසමෘතකරවන්න හුදකලා සතුවක් රසඥවූ ප්‍රාඥයෝ විඳනය කෙරෙති. මේ වනාහි දිනක් පාසා සුධින් විසින් ප්‍රත්‍යක්ෂ කරනු ලැබේමය. එහෙයින් කාව්‍යවිෂයක ප්‍රශංසනයෙහි ලා කුමට තතපර වමුද?

"සුභාෂිතරසස්‍යාග්‍රෙ
සුධා හිනා දිවං ගතා"

යන අභියුක්තොකතියෙන් "සත්කාව්‍යසඞ්ඛ්‍යාත සුභාෂිත යාගේ රසය ඉදිරියෙහි අමෘතය බියවැ දෙව්ලොවට ගියේය"යි එත්ප්‍රෙක්ෂිතයි.

ඒ මෙ කාව්‍යාමෘතය ලෞකිකඥානයෙන් සකස්වූ සිතින් සුව්‍යක්තව කල්පනාකරන්නවුන්ට මැ මධුරතරවැ වැටහේ.

මයූර, භාරවි, මාඝාදි ඉතා පුරාතන මහාකවීන් අතුරෙහි කනිෂ්ඨවූද කුමාරදාස භොජරාජාදි මහාකවීන් අතුරෙහි ජ්‍යෙෂ්ඨවූද කාලිදාස මහාකවිතෙමේ කාව්‍යාමෘතනිර්මාණයෙහි කවිචක්‍රවර්තිත්වයෙන් පුරාතන සුධින්විසිනුදු සලකනලද්දේය:-

"මසදසදනෙන කාලිදාසං කවිජනහදයානන්දහෙතුං කවිතෙන" යන ශ්‍රීශාරිපුත්‍ර මහාසාමිවණීණනාවෙන්ද මේ සුශ්‍රුකටයැ. මහා කවීන් විසින් විරචිත කාව්‍යරත්නයන් බොහෝ ඇතත් ඒ සියල්ලෙහුදු රඝුවංශමහාකාව්‍යය ම ශ්‍රෙෂ්ඨතර වේ.

"සචොතනමං කවිසාචිහෙමසය
කාතිං කාලිදාසසය රඝුවංශං"

"කවිවක්‍රවර්ති කාලිදාසයන් කළ රඝුවංශ මහාකාව්‍යය සචොතනම වෙයි" යනු ඉදුනිත්තන මහාපණ්ඩිතයන්ගේද සම්මතයයි.

මෙසේ ප්‍රාචීනදෙශීය සකල කවිවරේණ්‍යයන් විසින් සම්මානිත වූ ශ්‍රැතිසමෘතිතකීව්‍යාකරණ කාව්‍යනාටකාලඞ්කාරවිශෙෂ විවිත්‍යාදි වෙදවෙදාඞ්ගවිද්‍යාන්තරයෙහි හා සංසකෘත ප්‍රාකෘත මාගධාදි ෂඩ්භාෂාකවිබන්ධයෙහිද පාරප්‍රාප්ත කවිසාම්‍රාජ්‍යශ්‍රීවිභූතියෙන් විරාජමානවූ ශ්‍රීමත් කාලිදාස මහාකවීන්‍දුයාණන් විසින් මේ රඝුවංශමහාකාව්‍යනම්ලද ග්‍රන්ථරත්නය රචනාකරන්නලද්දේය. ආදි කල්පිකවූ රඝුරාජාදි සූර්‍යවංශික නරපතීන්ගේ අන්‍වයසඞ්ඛ්‍යාත වංශකථා ප්‍රවෘත්තිය මෙහි මූඛ්‍යකථාශරීරය වුවද කවිසමයාගතවූ සකල කාව්‍යාඞ්ගයම කාව්‍යශාස්ත්‍රාභිලාෂීන්ගේ අමන්‍දප්‍රබොධනය පිණිස හෙතුවන පරිදි අද්භූතාකාරයෙන් සඞ්ග්‍රහ කරන්නලද්දේය.

එකොනවිංශත්‍යාගීතකින් සම්පන්නිතවූ මේ මහාකාව්‍යය පම්බුවිපයෙහි හිරසඳ සේ ප්‍රකටවූයේ මේ තාක්ම සංසකෘතකාව්‍යශාස්ත්‍රාභිලාෂීන් විසින් අත්‍යාදරයෙන් පරිශීලනය කරනුලබන්නේය. ඉන්දියා ලඞ්කා ජනපදයන්හි ප්‍රචුරප්‍රචාරයට පැමිණි මහාකාව්‍යයන් අතුරෙන් ප්‍රනස්තිපදප්‍රාප්තවූ මේ මහාකාව්‍යය පුරාතන පණ්ඩිතාචාර්‍යවරයන් විසින් සචොතකශීයෙන් ප්‍රතිඝෘහිත වූයේම ටිකානුටිකාදියෙන් උපලක්ෂිත වැ කාව්‍යශාස්ත්‍රාභිලාෂීන් විසින් හස්තසාර වස්තුවක් මෙන් සාදරයෙන් රක්ෂාකරන්නලද්දේය.

එසේම වර්තීමානකාලයෙහිද සකල ප්‍රාචීන කවිවරයන් විසින් සංසකෘතකාව්‍යශාස්ත්‍රාභිලාෂී ශිෂ්‍ය සමූහයාගේ මනොදෞහෘද පූරණය පිණිස මේ කාව්‍යය සමාවර්ණිත වැ උගන්වනුලැබේ. චමත්කාරජනක අලඞ්කාරපදසන්‍දර්භයෙන් ලීලොපෙතවූ මේ කාව්‍යයාගේ අපීශරීරය ශාස්ත්‍රඥයෙන් ඉදුරාම ප්‍රිණනයට පැමිණවීම සච්ඡාවලක්ෂණ කොට ඇති බැවින් කාව්‍යශාස්ත්‍රාණීණවතරණයට ප්‍රබල මහා නෞකාවක් වැ පවත්නේය.

මෙසේ සර්ව්‍වප්‍රකාරයෙන්ම ගරුතරවූ මේ මහාකාව්‍යග්‍රන්ථයට සිංහල ව්‍යාඛ්‍යාවක් නොමැත්තෙන් ශිෂ්‍ය සමූහයාට ඇතිවී

සිංහල බලවත් බාධාව සලකා වදාළාවූ පූජ්‍යාවාර්ය්‍ය කිත්තඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන මාහිම්‍යාණන්වහන්සේ විසින්ද පූජ්‍යාවාර්ය්‍ය රත්මලානේ ශ්‍රීධම්මාරාමාභිධාන මාහිම්‍යාණන්වහන්සේ විසින්ද මීට සිංහල සන්නයක් ලියා මුද්‍රණය කරවුවහොත් ලාඞ්කිකයන්ට මහත් ශාසනානුග්‍රහයක් කරනලද්දේ වේයයි මේ ව්‍යාඛ්‍යාකරණයෙහි අපි මෙහෙයනලද්දමෝ අපගේ ආචාර්‍යොත්තමවූ ඒ මාහිම්‍යාණන්වහන්සේලාගේ මෙහෙයිම ගෞරවයෙන් පිළිගෙන සිංහල ලිපිවාසි සංස්කෘතකාව්‍යනාටෙත්‍රාදිග්‍රන්ථාභිලාෂී ශිෂ්‍යසමූහයා කෙරෙහි කරුණාවෙන් මේ සන්නය ලිමෙහි යථාවකාශයකින් ව්‍යාපෘත වීමු. අපගේ බලවත් අභිලාෂයේ ප්‍රකාර විකතලකදීම සන්නය සම්පූර්ණයෙන් ලියා නිමකොට මුද්‍රණයද පවත්වා ලීවු.

එසේම මෙය මුද්‍රණය කිරීමේදී පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය්‍ය මහොපාධ්‍යාය ධම්මකීර්ති ශ්‍රීධම්මාරාමාභිධාන මාහිම්‍යාණන්වහන්සේගෙන් ලැබුණු විශිෂ්ටාධාරයෙන් අපේ ප්‍රමොදයද වර්ධිත විය. එම මාහිම්‍යාණන්වහන්සේ අවසාන ශෝධ්‍යපත්‍ර පරීක්ෂණාදියෙන් මේ කටයුත්ත නිරාකුලවීමට අප්‍රමාණ ආධාර සලස්වාවදාළබව කෘතඥතාවශයෙන් ගෞරවයෙන් මෙහි සඳහන්කරමු.

මේ ව්‍යාපාරයෙහි අප පළමුකොට මෙහෙයූ විද්‍යෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය්‍ය මහොපාධ්‍යාය ශ්‍රීසුමඞ්ගල මාහිම්‍යාණන්වහන්සේ මෙවකට අපවත්වී වදාළහෙයින්ද ප්‍රාචීන භාෂාකවිත්වයෙන් විරාජමානවූ කීර්තිශරීරයක් ඇතිවැ විසුවාවූද සංස්කෘතග්‍රන්ථ කීපයකට ව්‍යාඛ්‍යාවන් ලියා ප්‍රසිඞ්කළාවූද අපගේ ආචාර්‍යවරවූ වේරගම බෞද්ධනායක ධම්මාලඞ්කාර ප්‍රංවිඛණ්ඩාර පඬිතුමාණන් අපවත්වූ හෙයින්ද මේ සන්නයේ ශෝධ්‍යපත්‍රයක් උන්වහන්සේට සහ ඒ පඬිතුමාණන්ටත් දක්වන්නට නොලැබීම අපට මහත් ඛේදයෙකි.

මෙසේ මුළුපොත සන්නසහිත කොට එකවරටම මුද්‍රණය කරවා ප්‍රසිඞ්කරන්නට අදහස්කළ නමුත් අවුගැසී තිබෙන ප්‍රමාණය වත් පළමුකොට ප්‍රසිඞ්කළ මැනවැයි නොයෙක් යළාත්වැසි හිතමිත්‍ර හවතුන් බොහෝදෙනා ලියුම්කියුම් එවූහෙයින් ඒ ඉල්ලීමේ ප්‍රකාර මේවරට "පෝර්ම" සතලිසකින් නිමිඅවු සඟිය දශයක් ප්‍රමාණ පූර්වාඞ්ශය නිකුත්කෙළෙමු. අපරාඞ්ශයවූ සඟිය නවයද මුද්‍රණය කරගත හැකිවැවින් එය අවසන්කොට විස්තර සංඥපන ශෝධ්‍යපත්‍රාදියෙන් යුක්තවූ සම්පූර්ණ පොත ළඟදීම නිකුත්කරනු ලැබේ.

තවද මෙම ව්‍යාඛ්‍යාව මුද්‍රණාංකිරීමේදී ප්‍රමාදසඛලතාදියෙන් ඇතම්තන්ගේ ශිථිලධ්වනිතාක්ෂරයන් විපාක්‍ෂාස වැ වැටීමෙන්ද ඇතම් තන්ගේ උඛරණය කළ පදයන්ගේ අර්ථයන් අඩු වීමෙන්ද ප්‍රමාදපතිතස්ථානයෝ දක්නට ලැබෙත්.

මෙහි සවෙනි සර්ගයේ පන්සාලිස් වන ශ්ලෝකයේ "ආචාර ශුඛොභයවංශදීපං" යන තෘතීය පාදය උඛරණය කළ නමුත් කොටසකට ලියූ අර්ථය මුද්‍රණයේදී අත්හැරී තිබේ.

"ආචාරශුඛ, ආචාරයෙන් පිරිසුදුවූ; උභයවංශදීපම්, මවුපිය කුලවය පිළිබඳ ප්‍රසිඛි ඇත්තාවූ" යනුවෙන් එහි අර්ථ හදුළයුතුයි. එහිම ප්‍රථම පාදයෙහි–සා යන පදයද උඛරණය කළ පදයට ගැළපී නොමැතියි. "සා කුමාරි, ඒ ඉන්දුමතී කුමරිතොමෝ" කියා එහි අර්ථ හදුළයුතුයි.

ඒ සර්ගයේම සිවුපනස්වන ශ්ලෝකයේ ප්‍රථමපාදයෙහි "මහෙන්ද්‍රාදිසමානසාරඃ" කියා ද්‍රිකාරය වෙනුවට දිකාරය වැටී තිබේ. එය "මහෙන්ද්‍රාද්‍රිසමානසාරඃ" කියා දතයුතුයි.

මේආදි ප්‍රමාදපතිතස්ථාන සම්පූර්ණ පොත සමඟ යොදන ශොඛ්‍යපත්‍රයට ඇතුළත් කරනුලබනබවද සැලකියයුතුයි.

ජේ. සමරදිවාකර.

වෂී 1914 දෙසැම්බර් 2
හංසගිරි වලව්ව,
මහනුවර.



පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති

ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය උපාධ්‍යාය

ධුරන්ධර

රත්මලානේ ධම්මකිර්ති ශ්‍රී ධම්මානන්දනිධාන

කොළඹ ඉලාවත දෙදිගාවේ ප්‍රධාන සඞ්ඝනායක

සවාමීන්ද්‍රයන් වහන්සේ විසින්

ප්‍රතිග්‍රහීත යි.



ප්‍රස්තාවනා

කාව්‍යය ද අන්‍ය සියලු කලාවන් මෙන් ම ජනසමාජයට සිදුවන ගහපත අයහපත අනුව විවෙචනය කටයුතුය.

සාමාන්‍ය විවෙචන රීති

කාව්‍යයක් කොතරම් දුරට සත්‍යයට හා යුක්තියට අනුකූල වේ ද? සමපරිසරීතිය පිළිබඳ කාව්‍ය කර්තෘහුගේ හැඟීම හෝ කෙසේ වේ ද? දේශය කාලය හා මනුෂ්‍ය වර්ගයා පිළිබඳ වූ ප්‍රශ්න හේ කෙසේ විසඳ ද? සැකෙවින් කියතොත් ඔහුගේ දෘෂ්ටිය හෝ කෙබඳු ද?=පැහැදිලි ද? නො පැහැදිලි ද? ගැඹුරු ද? නො ගැඹුරු ද? සියුම් ද? බහල ද? සමාජය, ආත්මවෘත්තිය–Sex–, කලාව –Art–යන මේ දෑ පිළිබඳ ඔහුගේ මනොවෘත්තිය කවරේ ද? ඔහුගේ කෘතිය හෝ කිනම් පරමාර්ථයක් ලක්කොට තිබේ ද? යනු විමසා බැලිය යුතු ය.

පැරණි කාව්‍යයන් විවෙචනය කිරීමේදී කිව්න් කෙරෙහි ඇති පාරම්පරික ගෞරවය නිසා අපි එක් අන්තයක් ගෙන ඔවුන් ගැන විනිශ්චය කිරීමට පුරුදු ව සිටුමු. එය අනුචිත ද හානිකර ද වේ. මහාපුරුෂයන් මහාමානය (=මහාම්ම්ම)කින් ම මිනිය යුතු ය. සුළු කිව්න්ගේ මහවැරදි වුව ද ක්ෂමා කළ හැකි ය. එසේ ද වුවත් කාව්‍ය චක්‍රවර්තීන්ගේ කෘතීන්හි දක්නට ලැබෙන සුළු දෝසක් වුව ද නො සලකා හැරීම කලාදූෂණයෙකැයි නො කිය යුතු ද?

නො විමසා ගෞරව කිරීම අන්ධභක්තියකි. විශේෂයෙන් මෙය පරීක්ෂණ බුද්ධියට රුකුල්දෙන යුගයකි. මේ යුගයෙහි ඇති වූ විවෙචකයන්ගේ අන්තලෝභකාහය නිසා මෙයට ඉහත කිසි කලෙකත් නො සිතූ පරිදි කරුණු සහිත වූ ද තර්කානුකූල වූ ද පිරිසුදු වූ ද විවෙචන රීති අද අප අතර සුලභ ය.

විශේෂ රීති

කිව්යකුගේ කෘතියක් කිව්යකු විසින් ම විවෙචනය කළ යුතු බැව් සත්‍යයෙකි. ඒ වනාහි එහි රචනා ශෛලිය හා කාව්‍ය රීති පිළිබඳ ව ය. කාව්‍යයේ පවත්නා සෞන්දර්යයත් අර්ථසිද්ධියත් පිළිබඳ අවසාන තීරණය දීමට බලය ඇත්තේ ශ්‍රොතෘජනයා කෙරෙහි ය. කාව්‍යයහ ප්‍රයෝජනය ද කලාවක් වශයෙන් එහි ඇති මහත්වය ද මිනිය යුත්තේ රස භාවාදී වශයෙන් පමණක් නො ව සාමාජික, ආර්ථික, රාජනෛතික වශයෙන් ද ලොවට සිදුවන අර්ථසිද්ධිය අනුව ය. ඒ කාව්‍ය

යෙන් කිව්වරයා අදහස් කරන පරිවර්තනයෝ කෙබඳු ද? පැහැදිලි කර දෙන සත්‍යයෝ කවරහු ද? උසස් කොට දක්වන, ඛණ්ඩනය කරන, මානසික වූ ද භෞතික වූ ද තත්ත්වයෝ කවරහු ද? ශ්‍රොතෘ ජනයාට විසඳා ගැනීමට ඉඩ තබන ප්‍රශ්න හෝ කවරේ ද? මේ වනාහි කාව්‍යයක් නූතන රීති අනුව විවෙචනය කිරීමේදී සිතට නැඟෙන ප්‍රශ්න කිපයෙකි.

රඝුවංශ මහාකාව්‍යය

රඝුවංශ මහාකාව්‍යය මහාකවි කාලිදාසයන්ගේ ශ්‍රේෂ්ඨතම කාව්‍යය වශයෙන් ප්‍රසිද්ධ ය. මහාකාව්‍ය යනට ඇතිවිය යුතු ලක්ෂණ වශයෙන් ආලඞ්කාරිකයන් විසින්–

සර්ගබන්ධෝ මහාකාව්‍යමුච්‍යතෙ තස්‍ය ලක්ෂණම්
ආශීර්නමස්ක්‍රියාවස්තු-නිර්දේශෝ වාපි තන්මුඛම්.

යනාදීන් දක්වන ලද සියලු ලක්ෂණයෙන් අනූන වූ මේ මහා කාව්‍යය සර්ග එකුන්විස්ස(19)කින් පරිමිත වේ. මෙහි කථාශරීරය **රාම** රජතුමන්ගේ පරම්පරාව යි. මෙහි ප්‍රථම සර්ගයෙහි පවත් නවවැනි සර්ගය දක්වා රාමවන්ද්‍රයන්ගේ මුතුන්මිත්තන්ගේ වරිතය වර්ණිත ය. ඔවුහු දිලීප, රඝු, අජ, දශරථ යන සතරදෙන වෙත්. මොවුන් අතුරෙන් රඝුරජතුමා සවකීය වංශය උසස් කළ මහාවීරයකු හෙයින් ද රාමවන්ද්‍රයන් වැනි ශෞරවීර රජකුගේ පහළවීමට මුල් වූ බැවින් ද කවිවරයා විසින් මේ **රඝුවංශ** යයි නම් කළ බව සිතිය හැකි ය. රඝුවංශ නාමය වූ කලී කාලිදාස කිව්හු විසින් ම තබන ලද්දක් නොවේ. එය පළමුවරට වහරන ලද්දේ මහාකවි වාල්මීකීන් විසිනි.

(ස යථාකථිතං පූර්වං නාරදෙන මහාත්මනා
රඝුවංශස්‍ය චරිතං චකාර භගවාන් මුනිඃ.
රාමායණ බාලඛණ්ඩ 3-9.

අහඤ්ච **රඝුවංශඤ්ච** ලක්ෂ්මණඤ්ච මහාබලඃ
වෛදෙහ්‍යා දර්ශනෙනාද්‍ය ධර්මතඃ පරිරක්ෂිතාඃ.
රාමායණ යුද්ධඛණ්ඩ 1-11.)

දසවැනි සර්ගය පටන් පසළොස් වැනි සර්ගය දක්වා (10-15) ඇති සර්ග සයෙන් රාම චරිතය වර්ණිත ය. මෙහි එන වර්ණනය වාල්මීකි රාමායණයට බෙහෙවින් සමාන ය. රඝුවංශ 15 වැනි සර්ගයෙහි 41 වැනි ශ්ලෝකයෙන් වාල්මීකි කිව්හු **ආදිකාව්** යයි දක්වා තිබෙන හෙයින් එ කී වර්ණනය රාමායණයෙන් උපුටාගත් බව පැහැදිලි වේ.

සොළොස් වැනි සතළොස් වැනි (16–17) සගීඳුයෙන් රාම රජුට පසු ව ඇති වූ රජවරුන් තිදෙනකු පිළිබඳ චරිතය වර්ණිත ය. අවසාන (18–19) සගීඳුයෙහි රජවරුන් සූචිසි (24) දෙනෙක් දක්නා ලැබෙත්. මේ සියල්ලෝ ම රාම රාජ වංශයෙහි වූවෝය. අන්තිමයේ දී අග්නිවර්ණ නම් කාමුක රජුගේ චරිතයෙන් හදිසියෙන් මෙන් කාව්‍යය අවසන් කෙරෙයි.

රඝුවංශයට නොයෙක් පණ්ඩිතයන් විසින් කළ ටීකා විස්සක් පමණ දක්නා ලැබේ. මෙයින් රඝුවංශය වෛදික ශිෂ්ටා චාරය අනුගමනය කළවුන් විසින් කොතරම් ආදූත දූසිසිතා ගත හැකි වේ. මේ ටීකාවන් අතුරෙන් මල්ලිනාථ ශූරීන්ගේ සඤ්ජීවනිය අතිසම්භාවිත බව පෙනේ. කාව්‍ය කර්තෘගේ අදහස හැකි තාක් ප්‍රකට කිරීමට උත්සාහ කර තිබීම එයට හෙතුව වශයෙන් සැලකිය හැකි ය.

කාව්‍ය කර්තෘගේ කාලය

කාව්‍යය සමාලෝචනයට බසින්ට පෙර නොයෙක් මත භෙදයෙන් අවුල් ව පවත්නා **කාලිදාස කිව්හුගේ කාලය** නිර්ණය කිරීම උචිත හෙයින් එය පළමු කොට ම දක්වමු.

සාම්ප්‍රදායික අදහස් ගරු කොට ගත් ඉන්දීය පණ්ඩිතයු සයං කල්පිත කරුණු අනුව මහාකවි කාලිදාසයන්ගේ කාලය නිශ්චය කෙරෙති. ඔවුන්ගේ නිගමනයේ හැටියට හෙතෙම ක්‍රිස්තුවර්ෂයට පූර්ව ප්‍රථම ශතවර්ෂයෙහි විසූවෙකි. එහෙත් කාලිදාස කිව්හු එත රම් පුරාතන කාලීනයෙකැයි පිළිගැනීමට ඓතිහාසික වශයෙන් දැක්විය හැකි කිසිම කරුණක් නො පෙනේ. එසේ ම මේ මතය අනුමත කරන සැලකිය යුතු කිසිවෙක් ඉන්දියාවෙන් පිටත නැත්තේ ය.

කාලිදාස කිව්හුගේ ජීවනයත් කාලයත් පිළිබඳ නිශ්චය වශයෙන් දැක්විය හැකි කරුණු ඉතා අල්ප ය. ඔහු ගැන දැන ගත හැකි යමක් ඇතහොත් එය ඔහුගේ කෘතීන්ට හා සංසකෘත සාහිත්‍යික ඉතිහාසයට සීමාවූවකි.

ඓතිහාසික සත්‍යයන් අනුව සලකන විට කාලිදාස කිව් තෙම ක්‍රි: ව: 400 පමණේ දී ඉසුවෙකි. මේ මතය ආචාර්‍ය **ස්මිත් ආතර් බැරිඩේල් කීත්, මහා මොහන් චක්‍රවර්ති** ආදි පූර්වාපර දෙශීය පණ්ඩිතයෝ ද අනුමත කෙරෙති.

කාලිදාසයන් ක්‍රි: ව: 350 ට ඉහත වූවකු නො වන බවට **සාධක වශයෙන්** නොබෝදා කාලක්‍රියා කළ ආචාර්‍ය **හර්මන්**

ජෑක්‍රෝබි මහතා (කාලිදාස කෘති) වික්‍රමොර්ශියෙහි එන දහවල් දවස හෝරා දෙලොසකට බෙදූ ක්‍රමය දක්වයි.

"ආලොකානන්තාත්.....
ෂඤ්ඨ කාලෙ තමපි ලහසෙ දෙව විශ්‍රාන්තිමහ්නඃ"
වික්‍රමොර්ශි 2. 1.

මෙහි "අහ්නඃ ෂඤ්ඨ කාලෙ" යනුවෙන් මධ්‍යාහ්න කාලය දැක් වූ බැවින් දහවල් දවස හෝරා දෙලොසකට බෙදීමේ ක්‍රමය ඉන්දියාවේ පැවැති ව්‍යවහාරයට අනුකූල නොවේ. බටහිරදිග පැවැති මේ ව්‍යවහාරය ඉන්දියාවට පැමිණීමෙන් පසු ව කාලිදාස ඇති වූ බවට මෙය වැදගත් සාක්ෂ්‍යයෙකි. තවද

රඝුවංශයෙහි:-

ග්‍රහෛස්තතඃ පඤ්චභිරුච්ච සංශ්‍රයෙ-
රඝූය්‍යීගෛඃ සූචිතභාග්‍යසම්පදම්.....3-13.

කුමාරසම්භවයෙහි:-

තිථෞ ච ජාමිත්‍රගුණාන්විතායාම්.....7-1.

යන මේ ශ්ලෝකයන්හි පැනෙන ග්‍රහයොග පිළිබඳ උච්ච-ජාමිත්‍ර යන පාරිභාෂික වචන හා ඵලාඵල දැක්වීමත් ග්‍රීකයන්ගේ වෛඥානික නක්ෂත්‍රයෙන් ගත් බව බැරිඩේල් කීත් මහතා කියයි. ග්‍රීක වෛඥානික නක්ෂත්‍රය ඉන්දියාවේ ව්‍යවහාරයට පැමිණියේ සතර වැනි ශතවර්ෂයේ මධ්‍යභාගයේ දී ය. මේ කරුණු අනුව රඝුවංශ කතෘගේ කාලය ක්‍රි: ව: 350 ට ඉහත නොවිය හැකි බැව් සත්‍යයෙකි.

භාරතීය පඬිවරුන්ගේ සාම්ප්‍රදායික මත මෙසින් ම බිඳ වැටෙන නමුත් කාලිදාස කිවිවරයාගේ කාලය ක්‍රිස්තු වර්ෂයෙන් 4 වැනි 5 වැනි ශතවර්ෂවලට අයත් බව පැහැදිලි වන වෙනත් ඓතිහාසික වූ ද ශාස්ත්‍රීය වූ ද කරුණු බොහෝ ය. සුඛාවබොධය පිණිස ඒ කරුණු මාතෘකා සතරකට බෙදා දැක්වීම සුදුසු ය.

එනම්:-

1 ඓතිහාසික විමර්ශන
2 ශිලාලිපි හා පැරණි කෘති
3 භාෂා සංඝඨනය
4 නානාකතෘක කාව්‍ය පරීක්ෂණය යනුවෙනි.

කාලිදාස කෘති පරීක්ෂණයේ දී ඔහුගේ කාලය නිසැකව ශිෂ්ටාචාරය පිළිබඳ සවිඥාණික යුගයක් බව නිශ්චිත වේ. පෙර අපර දෙදිග ම පඬිවරයෝ මෙය පිළිගනිති. එසේ ද වුවත් පාරම්පරික මත ගරුකොට ගත් ඉන්දීය පඬිවරයෝ මේ යුගය ක්‍රිස්තු පූර්ව 1 වැනි ශත වර්ෂයට අයත් යයි කියති. ඉන්දීය ඉතිහාසය සමාලෝචනය කරන්නකුට ක්‍රිස්තු පූර්ව ප්‍රථම ශතාබ්දයෙහි එබඳු ශ්‍රේෂ්ඨ යුගයක් නොපැවැති බැව් පැහැදිලි ව දැක්ක හැකි ය.

1 **ඓතිහාසික විමර්ශන**

චන්ද්‍රගුප්ත මෞර්‍ය විසින් පිහිටුවන ලද සාම්‍රාජ්‍යය* ඔහුගේ මුනුබුරු වූ අශෝක මහාරාජයන්ගෙන් පසු ක්‍රමයෙන් දුර්වල විය. මේ වංශයෙහි අන්තිම රජු වූ බෘහද්‍රථ (ක්‍රි: පූ: 185 දී) ඔහුගේ සෙන්පති වූ පුෂ්‍යමිත්‍රශුඞ්ග විසින් මරා රාජ්‍යය පැහැර ගන්නා ලදි. එතැන් පටන් (ක්‍රි: පූ: 73 දක්වා) ශුඞ්ගරාජ්‍යය පැවැත්තේ ය. ඔවුන්ගේ රාජ්‍යය මගධය සහිත පළාත් කිපයකට ද දකුණෙන් නර්මදා නදිය දක්වා ඇති ප්‍රදේශයට ද සීමා විය. බෞද්ධයන් විසින් පිළිකුල් කරනු ලැබූ අශ්වමේධ වාජපෙය ආදි යාගයන් ශුඞ්ගයන් විසින් මේ කාලයේ දී නැවත පටන් ගත් බැව් ශුඞ්ග කාලීන ශිලාලිපිවලින් පෙනේ.

පුෂ්‍යමිත්‍ර බෞද්ධයන්ගේ පරම සතුරෙකි. සවකීය අණසක පැවැති ප්‍රදේශයේ විහාරාරාම බිඳ හෙළා භික්ෂූන් මරා දමා බුද්ධ ශාසනයට මහත් හානි පැමිණවූවෙකි. බ්‍රාහ්මණ ධර්මය ව්‍යාප්ත කිරීමට උද්‍යෝගයෙන් ක්‍රියා කළ කෙනෙකි. මහාභාෂ්‍ය කර්තෘ වූ පතඤ්ජලි ඍෂි තෙම මොහුගේ සමකාලිකයෙකි.

---

*මේ කාලයෙහි බොහෝ දෙන අශෝක, ගුප්ත, කණිෂ්ක ආදි රාජ්‍යයන් ගැන අධිරාජ්‍යශබ්දය යොදන නමුත් වර්තමාන අධිරාජ්‍යයන් පිළිබඳ ව සලකන විට මෙය වැරදි ව්‍යවහාරයක් වන බැවින් අපි සාම්‍රාජ්‍ය ශබ්දය යෙදුවුමු. දිලීප රජු සඳහා කාලිදාස කිවිඳු ම සම්‍රාජ් ශබ්දය යොදා තිබේ එසේ ම "යශෝසෂ විජිගිෂුණාං" යනාදි වශයෙන් (පෞරාණික රජවරුන් අන් රටවල් යටත් කොට ගත්තේ ආර්ථික තත්ත්ව ප්‍රධාන කොට නොව යශස් පිණිස යයි) දැක් වූ බැවිනුත් වර්තමාන අධිරාජ්‍ය ක්‍රමය පුරාතනයෙහි නොපැවැති බව පිළිගත යුතු වේ.

වර්තමානයෙහි අධිරාජ්‍ය ක්‍රමය සම්පූර්ණයෙන් ආර්ථික ප්‍රශ්නය පිට රඳා නිබේ. එනම්: යටත් රටවල සවකීය භාණ්ඩයන් තරග නොමැති ව විකුණා ගැනීමත් භාණ්ඩ සෑදීමට වුවමනා අමු ද්‍රව්‍ය යටත් රටවලින් රිසි සේ අඩුමිලට ලබා ගැනීමත් වර්තමාන අධිරාජ්‍ය ක්‍රමයේ පරමාර්ථය යි. බ්‍රිතාන්‍ය ජපන් ආදි අධිරාජ්‍යයෝ මෙයට නිදසුන් වෙති.

කාලිඞ්ගයෙහි **බාරවෙල** රජු හා යුද්ධකොට පුෂ්‍යමිත්‍ර පරාජිත වූයේ ය. එසේ ද වුවත් ඒ කාලයේ පාටලිපුත්‍රය අල්වා ගැනීමට පැමිණි ග්‍රීක රජකු පලවා හැරීමෙහි ලා පුෂ්‍යමිත්‍ර සමර්ථ විය. මේ ග්‍රීකරාජයා බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් **මිනැණ්ඩර්** හෙවත් **මිලින්ද** යයි සැලකිය හැකි ය. මේ ග්‍රීක රජුට පාටලිපුත්‍රය ජයගත නො හැකි වුවත් සිඳුනදී මුවදෙර අනතර් දූපත් ද කටියාවාර් ප්‍රාග්ද්වීපය ද පශ්චිම මුහුදු බඩ ඇතැම් පළාත් ද අල්වා ගත හැකි විය.

ශුඞ්ග පරම්පරාවේ අනතිමයා **දෙවභූති** නම් කාමුක රජෙකි. මොහු නිඳිත කුමනත්‍රණයක යෙදී සිටියදී ම **වාසුදෙව** නම් සචකිය බ්‍රාහ්මණ අමාත්‍යයා විසින් මරා දමා රාජ්‍යය පැහැර ගන්නා ලදි. මොහුගේ පරම්පරාව අවුරුදු 45 ක් (ක්‍රි: පූ: 73 පටන් 28 දක්වා) පැවැත්තේ ය. මේ පෙළපතෙහි අනතිමයා ආන්ධ්‍ර රජකු අතින් මරුමුවට පත්විය.

මෙසේ සලකා බලන විට ක්‍රිසතු පූර්‍ව ප්‍රථම ශතවර්ෂය මුළුල්ලෙහි උත්තර භාරතය අවුල් වියවුල් වලින් ගහනව නො එක් පළාත් නො එක් රජුන්ට යටත් ව රටේ සථිර සාමයක් නොමැති ව පැවැති මෙ වැනි කාලයෙක සවණ්‍ණී යුගයක් ඇතිවීමට කිසිදු අවකාශයක් නැති බැව් පැහැදිලි ව ම පැනේ.

මෙයින් ඉක්බිති ව පැමිණියේ මොන්ගොලිය **කුෂාණ** නම් විදෙශිය සාම්‍රාජ්‍යය සි. එය ක්‍රිසතු වර්ෂ ප්‍රථම ශතවර්ෂයේ මධ්‍ය භාගයෙන් ආරම්භ වේ. මේ රාජ්‍යයේ ශ්‍රේෂ්ඨ අවධිය ක්‍රි: ව: දෙවැනි ශතවර්ෂයේ මුල්භාගය සි. අශොක මහරජුහෙන් පසු ඉන්දියාවේ ඇති වූ දෙවැනි සවණ්‍ණී යුගය මේ වේ. මේ පෙළපතේ ඇති වූ ප්‍රතාපවත් මහීපාලයා **කණිෂ්ක** ය. හේ බෞද්ධයෙකි. ඔහුගේ රාජ්‍යය උතුරෙන් චීන සීමාව දක්වා ද දකුණෙන් විඤ්‍ය පර්වතය දක්වා ද බටහිරින් පාර්ථියාව දක්වා ද පැවැති විශාල සාම්‍රාජ්‍යයකි. පළමුවෙන් ම බුද්ධරූප නිර්මාණය කරන ලද්දේ මේ රජුගේ කාලයේදී ය. ඔහු විසින් මහාසඞ්ගායනාවක් කරවා ශාසන ශොධනයක් ද කරන ලදි. ආගම ධර්මය පිළිබඳ කාලානුරූප වශයෙන් විශාල පරිවර්තනයක් කළ මේ රජතෙමේ දඹදිව බුද්ධශාසනය අතිශයින් බබුළුවාලී ය.

මේ මහීපාලයා සාහිත්‍ය සෙවකයෙක් ද විය. මහාකවියෙක් වූ ද බෞද්ධ දර්ශනිකයෙක් වූ ද ආචාර්‍ය අශ්වඝෝෂ මහාපණ්ඩිතයා මේ කාලයෙහි වුසුවෙකි. **චරක** නම් අතිශ්‍රේෂ්ඨ වෛද්‍ය ශාස්ත්‍රඥයා මොහුගේ චිකිත්සකයා විය.

අශ්වඝොෂාචාර්ය තෙම මහාකවියෙකි. **සංගීත විශාරද** යෙකි; තාර්කිකයෙකි; දාර්ශනිකයෙකි; වාදීහසිංහයෙකි; ධර්මධර විනයධර සුපෙශල ශික්ෂාකාමී භික්ෂු නමකි; **බුද්ධචරිතය, ශාරීපුත්‍ර ප්‍රකරණය, සෞන්දරනන්දය** ආදි කාව්‍ය නාටක ග්‍රන්ථ රාශියක් මෙතුමා විසින් රචිත ය. කාලිදාස කවිහු රඝුවංශයට බුද්ධචරිතයෙන් හා සෞන්දරනන්ද කාව්‍යයෙන් ආදර්ශ ගෙන තිබෙන බැව් පෙනේ.

කණිෂ්කට අනතුරු ව **හුවිෂ්ක, වාසුදෙව** නම් රජවරුන් දෙදෙනෙක් වූහ. වාසුදෙවගේ කාලයෙහි කුෂාණ සාම්‍රාජ්‍යය බිඳ වැටුණේ ය. මෙයට පසු ව හෙවත් තුන් වැනි ශතවර්ෂයෙහි උත්තර භාරතයේ ඉතිහාසය අන්ධකාර පරිවේෂ්ටනයෙකි.

මහා අලිසන්දර රජුගේ භාරතාක්‍රමණයෙහි පටන් කුෂාණ පෙළපත අවසන් වනතුරු වරින්වර ග්‍රීකයන් හා නොයෙක් සම්බන්ධකම් ඇති වූ නමුදු ඒ හෙතුකොට ගෙන භාරතීය ශිෂ්ටාචාරය පිළිබඳ ව හෝ භාරතීය ධර්මශාස්ත්‍ර විෂයෙහි හෝ කියයුතු තරම් වෙනසෙක් නො වීය. කලා සංගීත සාහිත්‍ය නක්ෂත්‍ර ජ්‍යොතිශ්ශාස්ත්‍ර ආදී නොයෙක් විෂයයන් ග්‍රීක විචාර අනුව සකස්වීමට තරම් ඉන්දියාවේ ග්‍රීක ප්‍රභාවය බලවත් වූයේ ගුප්ත කාලයේදී ය.

තුන් වැනි ශතවර්ෂයේ දී කුෂාණ රාජ්‍යයේ පතනයෙන් පසු **ගුප්ත පෙළපත** ආරම්භ විය. එකල මගධරට විසූ **චන්ද්‍රගුප්ත** නම් සුළු රජෙක් **කුමාරදෙවී** නම් **ලිච්ඡවී** කිසවක් විවාහකර ගත්තේ ය. මේ විවාහ සම්බන්ධය ඔහුගේ බලය වැඩිවීමට හෙතු විය. ලිච්ඡවීන් සහාය කොට ගත් ඔහුට සවකීය ආඥාචක්‍රය මගධයේ පමණක් නොව පසෙකින් අයොධ්‍යාව දක්වා ද පසෙකින් ප්‍රයාගය දක්වා ද පතුරුවා හැරීමට පිළිවන් විය. මේ වනාහි බුද්ධ කාලයෙන් පසු අවුරුදු 800 ක් මුළුල්ලෙහි කිසිම තොරතුරක් දැනගන්නට නැති ලිච්ඡවීන් නැවතත් දඹදිව ඉතිහාසයෙහි දෘශ්‍යමාන වන අවධියෙකි. හෙතෙම ක්‍රි: ව: 320 පෙබරවාරි මස 26 වැනි දා සිංහාසනාරූඪ විය. **ගුප්ත වර්ෂය** යන නමින් අලුත් වර්ෂ ව්‍යවහාරයක් ද ආරම්භ කෙළේ ඒ සුභ දිනය සිහිකිරීම පිණිස ය. මේ වර්ෂ ව්‍යවහාරය ඉන්දියාවේ වර්ෂ සියගණනක් මුළුල්ලේ පැවැතිණ. මොහුගේ නාම **පළමු වැනි චන්ද්‍රගුප්ත** නම් වේ. හේ වැඩි කලක් රාජ්‍යය නො කෙළේ ය. ඔහුගේ අභාවයෙන් ඔහු පුත් සමුද්‍රගුප්ත රජබවට පත් වී සතලිස් වසක් හෝ පනස් වසක් රාජ්‍යානුශාසනා කෙළේ ය. ඔහුගේ පරමාර්ථය වූයේ ඉන්දියාවේ දිග්විජය

කිරීම ය. එය බොහෝදුරට සඵල විය. ඔහුගේ රාජ්‍යය අශෝක රජුගෙන් පසු ව ඉන්දියාවේ ඇති වූ අතිවිශාල සවදෙශීය සාම්‍රාජ්‍යය විය. මෙය විදෙශීය රටවල් හා බොහෝ සම්බන්ධකම් පැවැති යුග යෙකි. මේ රජතෙමේ පුෂ්‍යමිත්‍රගෙන් පසු ව නැවතත් අශ්වමේධ යාගය ආරම්භ කිරීම් ආදියෙන් බ්‍රාහ්මණාදී සමයට නවජීවනයක් දුන්නේ ය. ඔහුට සතුරු උවදුරු නො මැති ව අභිනතවශීයක් පමණ රාජ්‍යය කළ හැකි විය. ඉක්බිති ඔහු පුත් තෙමේ **දෙවැනි චන්ද්‍රගුප්ත** නමින් සිංහාසනාරූඪ වූයේ පසු කාලයෙහි **වික්‍රමාදිත්‍ය** නම් උපනාමයකින් ද ප්‍රසිද්ධ විය.

ඔහුගේ රාජ්‍ය කාලය ක්‍රි: ව: 413 වනතුරු පැවැත්තේ ය. මහාකවි **කාලිදාස** විසූයේ මේ කාලයෙහි ය. ඉක්බිති ඔහු පුත් තෙමේ **කුමාරගුප්ත** නමින් රජ විය. ඔහු පිළිබඳ ව දත හැකි කරුණු ඉතා අල්ප ය. අශ්වමේධයාගාදියෙන් බ්‍රාහ්මණයන් පිදූ මේ රජ ක්‍රි: ව: 455 දී මෙලේ ය. එයට පසු ඔහු පුත් **ස්කන්ධ ගුප්ත** රජබවට පත්විය. හෙතෙම මේ පෙළපත අවසානයෙහි විසූ ප්‍රබල නරදෙවියා වශයෙන් සලකනු ලැබේ. ඔහුට අනතුරු ව ගුප්ත සාම්‍රාජ්‍යය කැඩී බිඳී ගිය නමුත් පෙළපත දීර්ඝකාලයක් පැවැති බවට සාධක නිබේ. පුරෝකථන ගුප්ත යුගය ඉන්දියා ඉතිහාස යේ එන **හිඳු සුවර්ණ යුගය** වේ. මේ කාලයෙහි සංගීත සාහිත්‍ය කලා විඥානාදිය ඉතා උසස් තත්ත්වයෙක පැවැතිණ. මෙයට ඉහත නො දක්නා ලද පරිදි වෛදික ධර්මයට හා වෛදික ශිෂ්ටාචාර යට නවජීවනයක් ලැබුණේ මේ යුගයෙහි ය. බ්‍රාහ්මණ බලය අන්තිම හිණිපෙත්ත දක්වා නැංගේය. බෞද්ධ ජෛන සමයද්වය හාසන පක්ෂයෙහි පතිත විය. මෙය සංස්කෘත සාහිත්‍යය පිළිබඳ ඉතා විශිෂ්ට යුගය වේ. එකල සංස්කෘත භාෂාව නොතරම් ප්‍රබල ව පැවැත්තේ දැයි කිවහොත් එය ම රාජකීය කටයුතු සඳහා ද ප්‍රයුක්ත බැව් පෙනේ. ගුප්ත මුද්‍රා ද සකුබසින් මුද්‍රිත ය. **කාලිදාස** මහාකිවිවරයකු වශයෙන් ද නාට්‍ය ලෙඛකයකු වශයෙන් ද අන් සියලු ම භාරතීය සංස්කෘත ලෙඛකයන්ට වඩා ශ්‍රෙෂ්ඨ බැව් විවෙව කයෝ ඉඳුරා පිළිගනිති. එසේ ම සංස්කෘත සාහිත්‍යික විශිෂ්ටකෘති සියල්ල ම ගුප්තරාජයන්ගේ සාහාය්‍යයෙන් කැරුණු බව ද ඓතිහාසික සත්‍යයෙකි. විශාඛදත්තගේ මුද්‍රාරාක්ෂසය මේ යුගයෙහි කෘතියකැයි විචාරකයෝ කියති. එය අතිශ්‍රෙෂ්ඨ ඉන්දීය රාජනෛතික නාටකය වේ. මෘච්ඡකටිකය ද මේ යුගයට අයිතිය. කිතීනි මත් බෞද්ධදර්ශනිකයෙක් වූ ආර්‍යය **වසුබන්ධු** ගුප්ත කාලීන යෙකි. අභිධර්මකෝෂය, රත්නත්‍රය, විඥප්ති මාත්‍රසිද්ධි, පරමාර්ථ සප්තති ආදිය ඔහුගේ කෘතීහු ය. ඔහු විසින් ලියන ලද අටුවා ද රාශියකි.

ගුප්තවංශිකයෝ ගණිතය, නක්ෂත්‍රය, ජ්‍යොතිශ්ශාස්ත්‍රය ආදි විවිධ විද්‍යාවන්ගේ වර්ධනයට බොහෝ රුකුල් දුන්හ. ගුප්තයුගය අවසානයේ දී **ආර්‍යභට** (ක්‍රි: ව: 476), **වරාහමිහිර** (ක්‍රි: ව: 505–587), **බ්‍රහ්මගුප්ත** (ක්‍රි: ව: 598) ආදි මහාපඬිවරුන් පහළ වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ආර්‍යභට ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයෙකි. ආර්‍යභටිය ඔහුගේ කෘතියකි. එය සම්පාදනයේදී ග්‍රීක ජ්‍යොතිශ්ශාස්ත්‍රීය විචාරයන් ගුරුකොට ගෙන තිබෙන බව පැහැදිලි ව පෙනේ. වරාහමිහිර තෙමේ නක්ෂත්‍රාවාර්‍යයකු මෙන් ම ජ්‍යොතිශ්ශාස්ත්‍ර විශාරදයෙක් ද වේ. ඔහු ග්‍රීක භාෂාශාස්ත්‍ර හා ග්‍රීක ජ්‍යොතිර්විද්‍යයෙහි විශාරදයකු ව සිටි බව සැකිය කෘතීන්හි යොදා තිබෙන ග්‍රීක පාරිභාෂික වචනයන්ගෙන් ප්‍රත්‍යක්ෂ වේ.* භාෂාශාස්ත්‍ර විෂයෙහි පමණක් නොව චිත්‍රශිල්පය, පාෂාණ ශිල්පය ආදි විවිධ ශිල්ප විෂයෙහි ද මේ කාලයෙහි භාරතීයයෝ අග්‍රස්ථානයකට පැමිණ සිටියහ. අජන්තාවේ අති ප්‍රශස්ත ගල්ලෙන් වලින් දෙකක් කපන ලද්දේ මේ කාලයේදී ය. කලාශිල්පශාස්ත්‍ර අතින් ද විදෙශීය සම්බන්ධතාම් අතින් ද වෙළඳෙළඳාම් අතින් ද

---

*ඉන්දියාවේ ජ්‍යොතිශ්ශාස්ත්‍රය වෛඥානික ක්‍රමයට හැඩ ගැසුණේ ග්‍රීක ප්‍රභාවයෙන් පසුව ය. දඹදිව ග්‍රීක විචාර තදින් බල පැවැත් වූ බැව් ප්‍රත්‍යක්ෂ කරවන එක ම ශාස්ත්‍රය ද ජ්‍යොතිශ්ශාස්ත්‍ර යයි. එසේ ම ඉන්දිය ජ්‍යොතිර්විද්‍යඥයන් නිතරම යවනයන් (=අයොනියන් හෙවත් ග්‍රීකයන්) සැකිය ආචාර්‍යවරයන් වශයෙන් පිළිගෙන තිබේ. මේ බව ඉන්දිය ජ්‍යොතිශ්ශාස්ත්‍රීය ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන ග්‍රීක වචනයන්ගෙන් පැහැදිලි වේ. වරාහමිහිරගේ හෝරා ශාස්ත්‍රයෙහි රාශි චක්‍රයට කියන ග්‍රීක නාම සියල්ල ම සඳහන් වීම එයට නිදර්ශනයෙකි,

(එහි එන ග්‍රීක වචන සුළුපයක් මෙහි පහත සඳහන් වේ.)

අරා-ශනි ග්‍රී: Ares	හෙලි-සූර්‍ය ග්‍රී: Helios
ජේව-බෘහස්පති ග්‍රී: Zeus	අස්ත්‍රජිත්-ශුක්‍ර ග්‍රී: Aphrodite
තෞරි-වෘෂභ ග්‍රී: Tavros	

කෙළින් ම ග්‍රීක ජ්‍යොතිශ්ශාස්ත්‍රීය කෘතීන්ගෙන් උපුටාගත් පාරිභාෂික වචන ද බොහෝ ය.

කෙන්ද්‍ර-ග්‍රී: Kentron	ආපොක්ලිමා-ග්‍රී: Apoklima
ත්‍රිකෝණ-ග්‍රී: Trigonos	ජාමිත්‍ර-ග්‍රී: Diametron
දූතුම්-ග්‍රී: Duton	එණඵරා-ග්‍රී: Epanaphora
ලෙප්තා-ග්‍රී: Lepte	අනඵා-ග්‍රී: Anaphe
සුනඵා-ග්‍රී: Sunaphe	ඛෘකණ-ග්‍රී: Dekanos

මේ ආදි වශයෙනි.

[L von Schroeder, Indiens Literateur und Cultur, p. 158.]

මෙයට වඩා දියුණු වූ කාලයක් ඉන්දියා ඉතිහාසයේ නො දක්නා ලැබේ. කාලිදාස කෘතීන්හි පෙනෙන නගර වර්ණනා ප්‍රදෙශ වර්ණනා රජ මහඇමති වර්ණනා ආදිය ද ඔහු සමෘද්ධි ශාලී කාලපරිච්ඡේදයක වූසුවකු බැව් ප්‍රත්‍යක්ෂ කරවනසුලු ය. ශාකුන්තල නාටකාදි ප්‍රශස්ත කාව්‍යයෝ ද සාහිත්‍යයේ උසස් අවස්ථාවෙක්හි ම කළ හැකි නිබඳියෝ ය. මේ උන්නතියට හෙතු වූයේ බටහිර රටවල් හා සම්බන්ධ පැවැති මහත් සම්බන්ධය මැයි.

මේ අනු ව සලකන විට ඉතිහාසයේ එන එක ම හිඳු සවණි යුගය මෙය බවත් මෙයට පෙර හිඳු සවණි යුගයක් නො පැවති බවත් ගුප්තරාජයන්ගේ සමයෙහි ග්‍රීකයන්ගේ වෙඳු නික අදහස් ඉන්දියාවට ප්‍රවෙශ වූ බවත් කාලිදාස කෘතීන්හි ග්‍රීක ජ්‍යොතිශ්ශාස්ත්‍රිය විචාර හා පාරිභාෂික වචන යොදා තිබෙන හෙයින් මෙයට අනතුරු ව ම කාලිදාස කිවිහු ඇති වූ බවත් නිශ්චිත වන්නේ ය. මේ දැක්වූයේ කාලිදාසයන්ගේ කාලය නිගමනය කළ හැකි ඓතිහාසික රූප රෙඛාවකි.

මෙනසින් ඓතිහාසික සත්‍යයනට අනුකූල ව සැලකුව ද **කාලිදාස** කිවිහු හිඳු සභ්‍යත්වයේ සවණි යුගය වූ **වික්‍රමාදිත්‍ය** පර නාමධෙය **දෙවැනි චන්ද්‍රගුප්ත** (ක්‍රි: ව: 380–413) රජතුමා ගේ කාලයෙහි වුසූ බැව් ප්‍රතීයමාන වේ.

2. ශිලා ලිපි හා පැරැණි කෘති

කාලිදාස කිවිහුගේ කාලය නිර්ණය කළ හැකි ශිලාලිපි ද රාශි යකි. **දෙවැනි පුලකෙශි** රජුගේ කාලයෙහි පිහිටු වන ලද (ක්‍රි: ව: 634) ඓහෝලේ ශිලා ලිපිය ඉන් එකකි. එහි කාලිදාසයන්ගේ නාමය සඳහන් වේ.

යෙනායොජිනවෙශමසථිරමථිවිඩෙෂ විවෙකිනා ජිනවෙශම
ස විජයතාම් රවිකීර්තිඃ කවිතාශ්‍රිතකාලිදාසභාරවිකීර්තිඃ

පැරැණි කෘතියක් වූ වාණභට්ටගේ (ක්‍රි: ව: 620) **හර්ෂචරිත** යෙහි ද කාලිදාස නාමය දක්නා ලැබේ.

නිර්ගතාසු න වා කස්‍ය **කාලිදාසස්‍ය** සූක්තිෂු
ප්‍රීතිම්ධුරසාර්ද්‍රාසු මඤ්ජරිෂ්විව ජායතෙ.

සත්වැනි ශතවර්ෂයට පූර්වයෙහි කාලිදාස විසූ බව මෙයින් නිශ්චිත වේ.

ක්‍රි: ව: 350 සිට 550 දක්වා මෙදෙතුරට අයත් පැරණි ලිපි රැසක් දැනට සොයා ගෙන තිබේ. ෆ්ලීට් මහතාගේ පුරාලිපි සඩ්ග්‍රහයෙහි 3 වැනි කාණ්ඩයේ මෙයින් ගද්‍යපද්‍යාත්මක වැදගත් ලිපි 18 ක් ඇතුළත් වේ. එයින් වැඩි ගණනක ව්‍යවහාර වන්නේ ගුප්තවර්ෂ ක්‍රමය සි. සිපයක මාලව වර්ෂය (හෙවත් වික්‍රම වර්ෂය) ද දක්නට ලැබේ. මේ ලිපිවලින් බොහොමයක් ප්‍රශස්තිය හෙවත් රාජසෙනාත්‍ර ය.

හරිසේන නම් කිවිහු විසින් සමුද්‍රගුප්ත රජු ගැන ලියන ලද ප්‍රශස්තිය විශෙෂයෙන් සැලකිය යුතු ය.* ගද්‍ය පද්‍ය මිශ්‍රිත මේ ප්‍රශස්තියෙහි රචනා ශෛලිය දණ්ඩීන්ට හා කාලිදාසයන්ට සපථී කරන්නක් වැනි ය. ගද්‍යාංශය සමාස භූයස්ත්වසඩ්ඛ්‍යාත ඔජෝ ගුණ යුක්ත ය. වචන එකාසිය විස්සකින් යුත් සමාස පදයෙක් ද එහි වේ.

පද්‍යශෛලිය කාලිදාසයන්ගේ මෙන් වෛදර්භීරීතියට අනුකූල ය. ද්විතීය චන්ද්‍රගුප්ත (=වික්‍රමාදිත්‍ය) රජුගේ අමාත්‍යයකු වූ වීර

---

*හරිසේන ලිපියෙහි ඇතැම් කොටස් මෙසේ සි.

23. සම්භාරදානාඥුකරණ ප්‍රණාමාගමන පරිතොෂිත ප්‍රවණ්ඩශාස හාස්‍ය අනෙකභ්‍රමටරාජ්‍යෝත්සන්න රාජවංශ ප්‍රතිෂ්ඨාපනොද්ධූත නිඛිල භුවන විචරණ ශාන්තනයශසඃ දෙවපුත්‍රෂාහිෂාහානුෂාහිශකමුරුණ්ඩඃ සෛංහල කාදිභිශව,

24. සම්විපවාසිභිරාත්මනිවෙදන කන්‍යොපායනදාන ගරුත්මදඛ්ක සවිෂය භුකතිශාසන යාචනාදූතප්‍රෙෂණ බාහුවීර්‍යප්‍රසර ධරණී බන්ධස්‍ය ප්‍රි(ප්‍ර)තීව්‍යාමප්‍රතිරථස්‍ය,.....

27. නිශිතවිදග්ධමති ගාන්ධර්වලලිතෛර්ව්‍රීඩිතන්‍රිදශපති ගුරුතුම්බුරු නාර දදෙර්විවර්ජනොපජීව්‍යානෙකකාව්‍යක්‍රියාභිඃ ප්‍රතිපාදිත කවිරාජශබ්දස්‍ය සුචිරසෙනාතව්‍යානෙකාද්භුතොදරචරිතස්‍ය,

28. ලොකසමයක්‍රියානුවිධානමානුමානුෂස්‍ය ලොකධාමනො දෙවස්‍ය මහාරාජ ශ්‍රීගුප්තාප්‍රපෞත්‍රස්‍ය මහාරාජ ශ්‍රීඝටොත්කචපෞත්‍රස්‍ය මහා රාජාධිරාජ ශ්‍රීචන්‍රගුප්තපුත්‍රස්‍ය

29 ලිච්ඡවිදෞහිත්‍රස්‍ය මහාදෙව්‍යාං උත්පන්නස්‍ය මහාරාජාධිරාජ සමුද්‍ර ගුප්තස්‍ය සකීපෘථිවිවිජය ජනිතොදය ව්‍යාප්තනිඛිලාවනිතලා කීර්තිමිතඝන්‍රි දශපනිභවනගමනාවාප්ත.....

31. එතච්ච කාව්‍යං එෂාමෙව භටාරකපාදානාං දශස්‍ය සම්පරිසර්ජණානුග්‍රහාන්මිලිතමනෙඃ මහාදණ්ඩනායක ධ්‍රැවභූතිපුත්‍රස්‍ය සන්ධිවිග්‍රහික කුමාරාමාත්‍ය මහාදණ්ඩනායක "හරිසෙනස්‍ය" සකීකුනඛිනසුඛායාසකු,

සෙන විසින් ලියන ලද මෙබඳු ම ලිපියෙක් වේදැ. එසල වෛදභී මාගීය අතිසම්භාවිත ව පැවැති බවට මෙ ද සාක්ෂ්‍යයෙකි. හරි සෙන කාලිදාසයන්ට පෙර විසූවෙකි. වීරසෙන කාලිදාසයන්ගේ සමකාලිකයෙකි. ගුප්තකාලය සමෘද්ධිශාලි යුගයක් බැව් හරි සෙනගේ ශිලාලිපියෙන් ද පැහැදිලි වේ. සමුද්‍රගුප්ත ප්‍රබල මහි පාලයෙකි. ඔහු යටතේ බොහෝ සාමන්ත රජුන් විසූ බව එම ලිපියෙහි ම සඳහන් ව තිබේ. සිංහලදෙශයෙන් ද මේ රජහට කප්‍යොපායනය කර තිබීම ඔහුගේ බලමහිමය ප්‍රත්‍යක්ෂ කරවන කරුණෙකි.

කාලිදාසගේ කාලය නිර්ණය කිරීමෙහි ලා මඳසෝර් නෙවත් දශපුර* ප්‍රශස්තිය අන් හැමට ම වඩා වැදගත් බැව් කිය යුතු ය.

මාලව (=වික්‍රම) සංවත් 529 දී හෙවත් ක්‍රි: ව: 473 දී ප්‍රතිෂ්ඨා පිත ශ්ලොක සුසාලිසකින් යුත් මේ ශිලාලිපිය ශාර්දූලවික්‍රීඩිත, මාලිනී, ආර්‍යා, වසන්තතිලකා, වංශස්ථ, උපජාති, අනුෂ්ටුබ් ආදී නානාවිධ වෘත්තයෙන් සමන්විත ය. එහි කතුවරයා

---

§ඇතැම් සොටස් ලුප්ත වූ (උදයගිරි නම් ලෙන්හි සොටා නිබෙන) ඒ ලිපිය මෙසේ ය:-

සිද්ධම්.

1. යදන්තජ්‍යානිරකීාභූම්‍යාං [— — ⏑ — ⏑ — — — — — ⏑ —] ව්‍යාපි වඳුගුප්තාඛ්‍යමද්භුතම්.

2. වික්‍රමාවක්‍රමක්‍රීතාදෘස්‍යත්‍යග්භූතපාර්ථිවා [— — —] මානසංරකතා ධර්ම [— — ⏑ — ⏑ —]

3. තස්‍ය රාජාධිරාජර්ෂේ [— ⏑ —] ර්‍මනඃ අක්‍ෂයප්‍රාප්තසාවිත්‍රෝ ව්‍යාපෘතසන්ධිවිග්‍රහඃ.

4. කෞත්සශාඛ ඉතිඛ්‍යාතෝ **වීරසෙනඃ** කුලාඛ්‍යයා ශබ්දාර්‍ත්‍යායලොකඥඃ කවිඃ **පාටලිපුත්‍රකඃ.**

5. කෘත්ස්නාපෘථිජයාවේන රාඥෛවෙහ සභාගතඃ සභාත්‍යා භගවතශ්ශම්භොර්ගුහා මෙතාමකාරයත්.

[*දශපුරය වික්‍රමාදිත්‍ය- දෙවෙනි වඳුගුප්ත- රජුගේ රාජධානිය වූ උජ්ජයිනී නගරාසන්නයෙහි පිහිටි පුරයෙකි. මෙය පසු කාලයෙහි මඳසෝර් නමින් ප්‍රසිද්ධ විය. දශපුර යනු දශෝර් කියා සවභාෂානුකූල ව ව්‍යවහාරයට පැමිණි පසු නගරයට සිදු වූ විපත්තියන් නිසා මඳදශෝර් (විපතට වැටුණු දශෝර්) යි ද උච්චාරණ සෞකර්‍යය පිණිස මඳසෝර් යි ද ව්‍යවහාර බව සිතිය හැකි වේ.]

වනඤහට්ටි නම් කිව්යෙනි කුමාරගුප්ත (මාලවසංවත් 493) කාලයෙහි ලාට (ගුජ්ර) දෙශයෙන් පැමිණි පට වසත්‍ර වෙළඳ සමූහයක් විසින් හිරුදෙවියන් උදෙසා තැනූ කෝවිලක් එම වෙළඳ සමාගමය විසින්ම නැවත ප්‍රතිසංස්කරණය කැරැවීම නිමිත්තෙහොට මේ ශිලාලිපිය පිහිටුවා තිබේ.

එහි රචනා විලාසය ඒ පිළිබඳ තත්ත්‍වය නිර්ණයකර ගැනීමෙහි ලා අදාළ වන හෙයින් ප්‍රශස්තිය සම්පූර්ණයෙන් මෙහි පහත දක්වමු.

සිද්ධම්

1 යෝ වෘත්තාය්‍යාමුපාස්‍යතෙ සුරගණෛස්සිද්ධෙශ්ච සිඛ්‍යර්විශර්-
ද්ධ්‍යානෙකාග්‍රපරෛර්ධෙයවිෂයෙමෝක්ෂාජිහාසෛඃගිහිඃ,
භක්තාය්‍යා තිව්‍රතපොධතෙශ්ච මුනිභිර් ශාපප්‍රසාදක්ෂමෛර්-
හෙතුයෛඃ ජගතඃ ක්ෂයාභ්‍යුදයයොඃ පාඃත් සවෝ භාස්කරඃ.

2 තත්ත්‍වඥතව්දෛ'පි යස්‍ය න විදුර්බ්‍රහ්මර්ෂයෝ'භ්‍යුද්‍යතාඃ
කෘත්ස්නං යශව ගභස්තිභිඃ ප්‍රවිශෘතෙඃ පුෂ්ණාති ලොකත්‍රයම්,
ගන්ධර්ෂාමරසිද්ධකිම්නරනරෛරෙඃ සංස්තූයතෙ'භ්‍යුත්සිතෝ-
භක්තෙභ්‍යශව දදාති යෝ'භිලසිතං තස්මෛ සවිත්‍රෙ නමඃ.

3 යඃ ප්‍රත්‍යහං ප්‍රතිවිභාත්‍යුදයාවලෙඳ්-
විස්තීර්ණෙතුඛශිඛරස්ඛලිතාංශුජාලඃ,
ක්ෂීබාඛභාජනකපොලතලාභිතාම්‍රඃ
පාඃතස්ස වස්සුකිරණාභරණෙ විවශවාන්.

4 කුසුමහරාතතරුවර-දෙවකුලසභාවිහාරරමණීයාත්-
ලාටවිෂයාත්තාගාවෘත-ශෛලාජ්ජගති ප්‍රථිතශිල්පාඃ.

5 තෙ දෙශපාර්ථිවගුණාපහෘතාඃ ප්‍රකාශ-
මධ්‍යාදිජාත්‍යවිරලාත්‍යසුඛාත්‍යපාස්‍ය,
ජාතාදරා දශපුරං ප්‍රථමං මනොභි-
රම්භාගතාඃසසුතබන්ධුජනාඃසමෙත්‍ය.

6 මත්තෙභගණ්ඩතටවිච්යුතදානබින්දු-
සික්තොපලාචලසහස්‍රවිභූෂණායාඃ,
පුෂ්පාවනම්‍රතරුමණ්ඩවතංසකායා-
භූමෙඃ පරං තිලකභූතමිදං ක්‍රමෙණ.

7 තත්තොත්‍රවෘක්ෂව්‍යුතනෙකපුෂ්ප-
විචිත්‍රතීරානතජලානි භානති,
ප්‍රඵුල්ලතපද්මාහරණානි යත්‍ර
සරාංසි කාරණ්ඩවසංකුලානි.

8 විලොලවීචිවලිතාරවින්ද-
පතත්රජඃපිඤ්ජරිතෙශ්ච හංසෛඃ,
සවෙණරොදඃරහරාවහුඥෛඃ
ක්වචිත් සාරාංස්‍යම්බුරුහෛශ්ච භානති.

9 සවපුෂ්පභාරාවනතෛනීගෙෂ්ඩ-
මීදප්‍රගල්භාලිකුලසවතෛශ්ච,
අජස්‍රගාභිශ්ච සුරාඛගනාභි-
ර්‍යානානි යසම්න් සමලඞ්කෘතානි.

10 වලත්පතාකාන්‍යබලාසනාථා-
න්‍යත්‍යඊශුකලාන්‍යධිකොන්නතානි,
තඩිල්ලතාවිත්‍රසිතාභ්‍රකූට-
තුල්‍යොපමානානි ගෘහාණි යත්‍ර.

11 කෛලාසතුඞ්ගශිඛරප්‍රතිමානි වාන්‍යා-
න්‍යාභානති දීර්ඝවලභීනි සවෙදිකානි,
ගාඞ්ගීශබද්මුඛරාණි නිවිෂ්ටවිත්‍ර-
කර්මාණි ලොලකදලීවනශොභිතානි.

12 ප්‍රාසාදමාලාභිරලඞ්කෘතානි
ධරාං විදූයෙව සමුත්ක්ෂිතානි,
විමානමාලාසදෘශානි යත්‍ර
ගෘහාණි පූණේණන්දුකරාමලානි.

13 ඝද්භාත්‍යභිරම්‍යසරිද්-ද්වයෙන වපලොර්මිනා සමුපගූඪම්,
රහසි කුවඞ්ගලිනිභ්‍යාං ප්‍රිතිරතිභ්‍යාං සමරාඞ්ගම්ව.

14 සත්‍යක්ෂමාදමශමාවෘතශෞචධෛර්‍ය්‍ය-
සවාධ්‍යාඅවෘත්තවිනයස්ථිතිබුද්ධ්‍යුපෙතෛඃ,
විද්‍යුතපොනිධිභිරසමසිතෛශ්ච විප්‍රෛ-
ර්‍යද්භ්‍රාජතෙ ග්‍රහගණෛඃ ඛම්ව ප්‍රදීප්තෛඃ.

15 අථ සමෙත්‍ය නීරන්තරසඞ්ගතෛ-
රහරහඃ ප්‍රව්‍රජමහිතසෞහෘදඃ,
නෘපතිභිඃසුතවත් ප්‍රතිමානිතාඃ
ප්‍රමුදිතාන්‍යවසන්න සුඛං පුරෙ.

16 ශ්‍රවණසුභගං ධාතුශ්ලේඃ්‍යං දෘඪං පරිනිඝ්ඨිතාඃ
සුවරිතශතාසඞ්ඝාඃ කෙචිදවිත්‍රකථාවිදඃ,
විනයනිභෘතාඃසසම්‍යඤ්මීප්‍රසඞ්ගපරායණාඃ
ප්‍රියමපරුෂං පථ්‍යං වාන්‍යෙ ක්ෂමා බහු භාෂිතුම්.

17 කෙචිත්සංවකම්මිණ්‍යධිකාසතථාන්යෛර්-
විඥයතෙ ජ්‍යොතිශමාතමවද්භිඃ,
අද්‍යාපි චාන්‍යෙ සමරප්‍රගල්භාඃ
කුර්වන්ත්‍යරීණාමඝිතං ප්‍රසභ්‍ය

18 ප්‍රඥමනොඥවධවඃ ප්‍රපිතොරුවංශා
වංශානුරූපවරිතාහරණාසතථාන්‍යෙ,
සත්‍යව්‍රතාඃ ප්‍රණයිනාමුපකාරදක්ෂා
විස්‍රම්භපූර්වමපරෙ දෘසෙවභෘදශ්ච.

19 විජිතවිෂයසඞ්ඝබ්ධිමේඛලෙසතථාන්‍යෙ-
මෘදුහිරධිකාසත්‍යෙවලොකයාත්‍රාමරෙශ්ච,
සඞ්කුලතිලකභූතෙමීකතරාගෙරුදරෙ-
රධිකමභිවිභාති ශ්‍රෙණීරෙවං ප්‍රකාරෙඃ.

20 තාරුණ්‍යඛණ්ඩත්‍යුපචිතොඅපි සුවර්ණභාර-
තාම්බූලපුෂ්පවිධිනා සමලඞ්කෘතොඅපි,
නාරීජනඃ ප්‍රියමුපෙති න තාවදග්‍ර්‍යං
යාවන්න පට්ටමයවස්ත්‍රයුගානි ධත්තෙ.

21 සඅශීවතා වර්ණිතා නතර-විභාගවිත්‍රෙණ නෙත්‍රසුභගෙන,
යෙසඅකලමිදං ක්ෂිතිතල-මලඞ්කෘතං පට්ටවස්ත්‍රෙණ.

22 විද්‍යුධරීරුචිරපල්ලවකර්ණපූර-
වාතෙරිතාඅස්ථිරතරං ප්‍රවිචින්ත්‍ය ලොකම්,
මානුෂ්‍යමර්ථනිවයාංශ්ච තථා විශාලාං
සෙතුඅං ශුභා මතිරභූදවලා තතඅතු.

23 චතුඅසමුද්‍රානන්තවිලොලමෙඛලාං
සුමෙරුකෙලාසබෘහත්පයොධරාම්,
වනානනවානනඅුටපුෂ්පහාසිනීං
කුමාරගුප්තෙන පෘථිවීං ප්‍රශාසති.

24 සමානධිශ්ශුක්‍රබෘහසපතිභ්‍යාං
ලලාමභූතො භුවි පාර්ථිවානාම්,
රණෙෂු යඃ පාර්ථසමානකර්මා
බභූව ගොප්තා නෘපවිශ්වවර්මා.

25 දීනානුකම්පනපරඃ කෘපණාර්තවර්ග-
සඞ්ඛාප්‍රදෙඅධිකදාලුරනාථනාථඃ,
කල්පද්‍රුමඃ ප්‍රණයිනාමභයං ප්‍රදශ්ච
හිතස්‍ය, යොඅ ජනපදස්‍ය ච බන්ධුරාසීත්.

26 තස්‍යාත්මජඃ සෛථයීනයොපපත්තෝ
බන්ධුප්‍රියො බන්ධුරිව ප්‍රජානාම්,
බන්ධවතීතිභක්තිතා නෘපබන්ධුවම්‍ය
දුඩ්දුපතපඃක්ෂපණෛකදක්ෂඃ.

27 කානෙතා යුවා රණපටුර්විනයානවිතශ්ච
රාජාපි සනාතුපසෘතො න මදෛඃ සමයාද්‍යෛඃ,
ශෘඞ්ගාරමූර්තිරභිභාත්‍යනලඞ්කෘතෝ'පි
රූපෙණ යඃ කුසුමචාප ඉව ද්වීතීයඃ,

28 වෛධව්‍යතීව්‍රව්‍යසනක්ෂතානාං
සමෘතිා යමධ්‍යාප්‍යරිසුන්දරීණාම්,
භයාද් භවත්‍යායතලොචනානාං
ඝනස්තනාභාසකරඃ ප්‍රකාමඃ.

29 තස්මින්නෙව ක්ෂිතිපතිවංෂෙ බන්ධුවම්‍ය්‍යුදාරෙ
සම්‍යක් සීතං දශපුරම්දං පාලයත්‍ය්‍යන්නතාංසෙ,
ශිල්පාචාර්‍යෛඃ නිනසමුදයෙඃ ප්‍රීථවාගෙරුදාරං
ශ්‍රෙණීහුතෙභීවනමතුලං කාරිතං දීපතරශෙමඃ.

30 විසතීණීණතුඞ්ගශිඛරං ශිඛරිප්‍රකාශ-
මහ්‍යුදාතෙන්දුවමලරශ්මිකලාපගෞරම්,
යද් භාති පශ්චිමපුරස්‍ය නිවිෂ්ටකාන්ත-
චූඩාමණිප්‍රතිසමත්‍වනයනාභිරාමම්.

31 රුමාසනාථභවතොදරභාසකරාංශු-
වහනිප්‍රතාපශුභගෙ ජලලීනමීතෙ,
චන්ද්‍රාංශුහම්‍යතලවන්දනතාලවෘන්ත-
හාරොපහොගරභිතෙ භිමදඃඛපදෙම.

32 රොධ්‍රප්‍රියඞ්ගුතරුකුන්දලතාවිකොශ
පුෂ්පාසවප්‍රමුදිතාලිකලාභිරාමෙ,
කාලෙ තුෂාරකණකර්‍ශශිතවාත-
වෙගප්‍රතෘත්තාලවලීනගතෙකශාඛෙ.

33 සම්‍රවශගතරුණජනවිලලභාඞ්ගනාවිපුලකාන්තපීනොරු-
සන්තජඝනඝනාලිඞ්ගනනිර්භර්ත්සිත තුහිනභිමපාතෙ.

34 මාලවානාං ගණසපිත්‍යා ඝාතෙ ශතවතුෂ්ටයෙ,
ත්‍රිනවත්‍යධිකෙ'බ්දුනාමෘතෙෂ සෙව්‍යඝනසවනෙ.

35 සහස්‍යමාසශුකලස්‍ය ප්‍රශසෙ'හනි ත්‍රයොදශෙ,
මඞ්ගලාචාරවිධිනා ප්‍රාසාදෙ'ඃං නිවෙශිතඃ.

36 බහුනා සමතීතෙන කාලෙනාන්‍යෙශ්ච පාර්ථිවෙඃ,
ව්‍යශීයතීතෙකදෙශොঽස්‍ය භවනස්‍ය තතොঽධුනා.

37 සවයශොවෘද්ධයෙ සම්මත්‍යුදරම්බුදරයා,
සංසකාරිතමිදං භූයඃ ශ්‍රෙණ්‍යා භාත්‍රුමතො ගෘහම්.

38 අත්‍යුන්නතමවදාතං නභඃස්පෘශනිව මනොහරෛඃ ශිඛරෛඃ
ශශිභාකොරභ්‍යුදයෙෂ්වමලමධ්‍යුඛායතනභූතම්.

39 චතසරශතෙෂු පඤ්චසු-විංශත්‍යධිකෙෂු නවසු චාබ්දෙෂු,
යාතෙෂවභිරම්‍යතප-ස්‍යමාසශුකුලද්විතීයායාම්.

40 සපශෙටරශොඝතරුකෙතකිසිඤුචාර-
ලොලාතිමුක්‍තකලතාමදඝනනිකානාම්,
පුෂෙපාදගමෛරභිතවෛරඩිගම්‍ය නූන-
මෙෂ්‍යං විජෘම්භිතශරෙ හරධූ(පූ?)තදෙහෙ,

41 මධුපානමුදිනමධුකර-කුලොපගීතනගනෛකපෘථුශාඛෙ,
කාලෙ නවකුසුමොදගම-දනතුරකානනප්‍රචුරලොධ්‍රෙ.

42 ශශිනෙව නභො විමලං-සෞඝතුහමණීනෙව ශාර්ඛගිණො වක්‍ෂඃ,
භවනවරෙණ තථෙදං-පුරමඛිලමලඞ්කෘතම්බුදරම්.

43 අමලිනශශිලෙඛාදනතුරං පිඬලානාං
පරිවහති සමූහං යාවදීශො ජවානාම්,
විකටකමලමාලාමංසසක්‍තානාං ච ශාර්ඬගී
භවනමිදමුදරං ශාශවතං තාවදසතු.

44 ශ්‍රෙණ්‍යාදෙශෙන භක්‍තත්‍යා ච කාරිතං භවනං රවෙඃ
පූර්ණා වෙයං ප්‍රයතෙනන රචිතා වත්සභට්ටිනා.

සවසති කතීලෙඛකවාචකශ්‍රොතෘභ්‍යඃ.

සිද්ධිරස්තු

මෙහි භාෂාවිලාසයත් රවනාපද්ධතියත් වර්ණනා ක්‍රමයත් ගැන සලකනවිට මේ ප්‍රශස්තිය කාලිදාසානුකරණයෙන් කරන ලද්දක් බැව් පැහැදිලි ව ම පැනේ. ගුප්තයුගයට අයත් ශිලාලිපි හා වෙනත් කෘති ඇතත් ඒ එකක වත් මෙබඳු අනුගමනයක් නො දක්නා ලැබෙන හෙයිනුත්, ප්‍රශස්තියෙහි වර්ණනා ශෛලිය හැම අතින් ම කාලිදාසයන්ගේ වර්ණනාශෛලියට සමාන හෙයිනුත්, මේ කෘතිය මහත්, උත්සාහයකින් කළ සඛර්ගිය ප්‍රථම රවනාව බැව්

වත්සභට්ටි තමන් ම කියන හෙයිනුත්, කාලිදාස වත්සභට්ටිට අඩි ශතවර්ෂයකට පමණ ඉහත විසූවකු බැවින් මේ කාලය වන විට කාලිදාසගේ කවිත්වයත් ඔහුගේ කෘතිත් ඒ ප්‍රදේශයෙහි ව්‍යාප්ත ව පැවැති බව හැඟෙන හෙයිනුත්, දශපුරවර්ණනය මේඝසන්දේශ යෙහි අලකාවර්ණනයට සමාන හෙයිනුත්, දශපුරය උජ්ජයිනියට සමීපවර්ති නුවරක් හෙයිනුත්, කාලිදාසයන් උජ්ජයිනියෙහි හෝ ඒ සමීපයෙහි විසූවකු බැව් පැහැදෙන හෙයිනුත් වත්සභට්ටි කාලි දාස කෘති අතු ව තම කෘතිය සැපයූ බැව් නිසැක ව ම කිය හැකි ය. මේ ද කාලිදාසයන් දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ කාලයෙහි වූසූ බවට සාධකයෙකි.

පහත දක්වන ශ්ලෝක සඳහා බැලීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

ප්‍රශස්ති 10– වලභපතාකාන්‍යඛලාසනාථා–
න්‍යත්‍යඊශුකලාන්‍යධිකොන්නතානි,
තඞිල්ලතාචිත්‍රසිතාභ්‍රකූට–
තුල්‍යොපමානානි ගෘහාණි යත්‍ර.

ප්‍රශස්ති 12– ප්‍රාසාදමාලාභිරලඞ්කෘතානි
ධරාං විදූයෛව සමුත්ථිතානි,
විමානමාලාසදෘශානි යත්‍ර
ගෘහාණි පූර්ණේන්දුකරාමලානි

මේඝසන්දේශ (උත්තරමේඝ 1)

විද්‍යුද්වන්තං ලලිතවනිතාසේවන්‍ද්‍රචාපං සචිත්‍රාඃ
සංගීතාය ප්‍රහතමුරජාඃ සනිඞ්ඝගම්භීරඝොෂම්,
අන්තස්තොයං මණිමයභුවස්තුඞ්ගමභ්‍රංලිහාග්‍රාඃ
ප්‍රාසාදාස්ත්වාං තුලයිතුමලං යත්‍ර තෛස්තෛර්විශෙෂෛඃ.

ඍතුසංහාර 2-1- සශීකරාමෙඝාඛරමත්තකුඤ්ජරස්–
තඞිත්පතාකොශනිඝබද්ධදිඞ්මුඛඃ,

ප්‍රශස්ති 11- කෛලාසතුඞ්ගශිඛරප්‍රතිමානි චාන්‍යා–
න්‍යාහානති දීඞ්වලභිනි සවෙදිකානි
ගාඞ්ගීශබද්ධමුඛරාණි නිවිෂ්ටචිත්‍ර–
කර්මාණි ලොලකදලීවනශොභිතානි.

ප්‍රශස්ති 31– රාමාසනාථභවනොදරභාසකරාංශු–
වහ්නිප්‍රතාපශුභගෙ ජ්වලිතාමිනෙ,
චන්ද්‍රාංශුහර්ම්‍යතලචන්දනතාලවෘන්ත–
හාරොපහොගරහිතෙ භිමදර්ශිපදෙම.

ඍතු: 5-2- නිරුද්ධවාතායනමන්දිරොදරං
හුතාශනො භානුමතො ගහසන්තයඃ
ගුරුණි වාසාංස්‍යබලාඃ සයෞවනාඃ
ප්‍රයාන්ති කාලේ'ත්‍ර ජනස්‍ය සෙව්‍යතාම්.

" 3- න චන්දනං චන්ද්‍රමරිවිශීතලං
න හම්‍යපෘෂ්ඨං ශරදින්දුනිර්මලම්,
න වාඝවඃ සාන්ද්‍රතුෂාරශීතලාඃ
ජනස්‍ය චිත්තං රමයන්ති සාම්ප්‍රතම්.

තවද මේ ප්‍රශස්තිය රචනා කිරීමේදී මත්සහට්ටි කිවියාට මෙහි පහත සඳහන් කාලිදාසීය රචනාවන් සිහියට නැඟුණු බව ඉඳුරා කිය හැකි ය.

ඍතු: 44 කාඤ්චිද්ගුණේඃ කාඤ්චනරත්නවිත්තෛඃ

මාල: මි: 4-10 චිත්‍රාර්පිතවෙෂ්ටයා කිමෙව මයි

වික්‍ර: 2-10 න ච සුවදනාමාලෙඛ්‍යෙපි ප්‍රියාමසමාප්‍යතාම්

රඝුවංශ: 8-93 සාදෘශ්‍යප්‍රතිකෘතිදර්ශනෛඃ ප්‍රියායාඃ

" 14-15 වාෂ්පායමාණෙ බලිමන්නිකෙත-
මාලෙඛ්‍යශෙෂස්‍ය පිතුර්විවෙශ

ශාකුන්තල 6-146 යද්‍යත් සාධු න චිත්‍රෙ ස්‍යාත්

" 6-148 චිත්‍රාර්පිතාං මූහුරිමාං බහුමන්‍යමානඃ

" 6-154 වාෂ්පසතු න දදෘත්‍යෙනාං ද්‍රෂ්ටුං චිත්‍රගතාමපි

මාලවි: 1 චිත්‍රගතායා දෙව්‍යාඃ පරිජනමධ්‍යගතා.....

" 4 නනු එෂ චිත්‍රගතො භතෘ

වික්‍ර: 2 අථවා තත්‍රභවත්‍යා උර්ව්‍යා ප්‍රතිකෘතිමාලිඛ්‍යාව ලොකයංස්තිෂ්ඨ

රඝු: 14-25 ආසෙදුෂොඃ සදමසු චිත්‍රවත්සු

ශාකු: 11-43 චිත්‍රෙ නිවෙශ්‍ය පරිකල්පිතසත්ත්වයොගා

" 4 චිත්‍රකර්මපරිවයෙනාඩෙඛෂ්ණු ත් ආහරණවිනියොගං කුර්‍යාඃ

" 6 තසම්නෙම චිත්‍රඵලකගතාං සවහස්තලිඛිතාං තත්‍රභවත්‍යාඃ ශකුන්තලායාඃ ප්‍රතිකෘතිමාකශ

ශාකු: 6–153 සමෘතිකාරිණා තවයා මේ පුනරපි චිත්‍රිකෘත කාතතා

කුමාර: 3–42 } චිත්‍රාර්පිතාරම්භ ඉවාවතසෙථ
රඝු: 2–31 }

මාලවි: 2 චිත්‍රගතාඝාමස්‍යාං කානතිවිසංවාදශඞ්ගි මෙ හෘදයං සම්ප්‍රති ශිවිලසමාධිං මන්‍යෙ යෙනෙය මාලිඛිතා.

මාලවි: 1 චිත්‍රශාලං ගතා දෙවී ප්‍රත්‍යග්‍රවර්ණිරාගාන්විත ලෙඛාමාචාර්‍යස්‍යාලොකයනතී නිඝ්‍යති.

---

3. භාෂා සංඝඤනය

ව්‍යවහාර භාෂාවන්ගේ විකාශය අනුව ද කාලය නිර්ණය කළ හැකි ය. සංස්කෘතනාටකයන්හි තත් තත් කාලීන ප්‍රාකෘත විශෙෂයෝ අනතර්ගත ය. අපභ්‍රංශ, ශෞරසෙනී, මාගධි, අර්ධ මාගධී යයි ප්‍රාකෘත ය චතුර්ධ ය. භාස කිවිහුගේ නාටකයන්හි උපයුක්ත භාෂාව ශෞරසෙනී ය. භාස වනාහි අශ්වඝොෂ යන්ට පසුවත් කාලිදාසයන්ට පෙරත් ඇති වූ විශිෂ්ට නාට්‍ය ලෙඛකයා වේ. දූතවාක්‍යය හැර ඔහුගේ අන් සියලු කෘතීන්හි ම ප්‍රාකෘතය දක්නා ලැබේ.

අශ්වඝොෂ කාලිදාසයන්ගේ ප්‍රාකෘතය ගැන සලකනවිට භාසගේ ප්‍රාකෘතය විකාශයේ මධ්‍යතන අවස්ථාව බව පැහැදිලි වේ. එහි වෙනස් වෙමින් පැවැති ලකුණු දක්නා ලැබෙන හෙයිනි. මෙහි පහත දක්වන කරුණුවලින් එය සුඛාවබොධ වේ.

අශ්වඝොෂ ප්‍රාකෘතයෙහි එකම වචනයෙක හැර අන් කිසි තැනෙක්හි මූර්ධන්‍යාක්ෂරය දන්ත්‍ය කොට නො යොදන ලදි. එහෙත් එය භාසයන්ගේ කාලය වන විට බහුල වශයෙන් පැවැති ප්‍රයොගයක් බව ඔහුගේ කෘතිවලින් පැනේ. ව්‍යඤ්ජනාක්ෂර අත් නො හැරීම මූල ප්‍රාකෘතයේ ලක්ෂණයෙකි. එය අශ්වඝොෂ කෘත ශාරීපුත්‍ර ප්‍රකරණයෙන් දැක්ක හැකි ය. එහි ව්‍යඤ්ජන ලොපය (සවරශෙෂ වචන) කිසි තැනෙක යොදා නැත. කාලිදාස කෘත ශාකුන්තල වික්‍රමොර්ශී මාලවිකාග්නිමිත්‍ර යන නාටක ත්‍රයෙහි ම ව්‍යඤ්ජන ලුප්ත වූ සවරශෙෂ වචන බෙහෙවින් යොදා තිබේ. එය භාසයන්ගේ කෘතීන්හි දක්නා ලැබෙනුයේ සවල්ප වශයෙනි. ක, ග, ච, ජ, ත, ද, ප, ය, ව යන වර්ණ සවරයන් අතරට පැමිණි කල්හි ව්‍යඤ්ජනලොපය ඔහුට අභිමත ය.

දුරිආ, සාඅදං, වඅනෙන, රාඅා, ගඔ, භිඅඅං, අයඋත්ත, උහඅාණී, කරිඅ, යනාදිය එයට නිදර්ශනයෝ ය.

"රාඥු" යනාදි තන්හි අශ්වඝෝෂයෝ "රඤ්ඤ" යනාදි වශයෙන් ප්‍රාකෘතයෙහි ද්විත්වඤකාරය ම ප්‍රයොග කළහ. භාස යන්ගේ කෘතීන්හි ද මෙය මෙසේ ම දක්නා ලැබේ. කාලිදාසයෝ එබඳු තන්හි ද්විත්ව ණකාරය යෙදූහ. භාසගේ එක ම ප්‍රයොගයෙහ ද්විත්ව ණකාරය ඇතත් එය ශොධකයන්ගේ වරද කැයි සිතිය හැකි වේ.

සකුබසෙහි "න්‍ය" "ණ්‍ය" වෙනුවට ප්‍රාකෘතයෙහි ද්විත්ව ණකාරය යෙදීම භාස කාලිදාස දෙදෙනාට රුචි වුව ද අශ්ව ඝෝෂයෝ ද්විත්ව "ඤ්ඤ" කාරය ම යෙදූහ.

"දිසදි" යනාදි තන්හි සංයොගාක්ෂරය ලොප් කොට පූර්වයට දීඝ කිරීම අශ්වඝෝෂයන්ට අපරිචිත ය. භාස එය බහුල වශයෙන් ද කාලිදාස නිත්‍ය වශයෙන් ද ප්‍රයුක්ත බව පෙනේ.

අකාරාන්ත නපුංසකලිඞ්ගික ශබ්දයන්ගේ ප්‍රථමා ද්විතීයා බහුවචනාන්තය කුසුමානි, අඞ්ගානි යනාදීන් "ආනි" අන්ත කොට අශ්වඝෝෂයන් යෙදූ නමුත් භාසයන් "ආණි" අන්තව ද පසු කාලයෙහි ආණී, ආඉං, අන්තව ද ව්‍යවහාර බව දක්නා ලැබේ. කාලිදාස කෘතීන්හි "ආඉං" අන්ත ව ම යොදා තිබේ.

"ඛසි උත්ත මනොරහාඉං අඞ්ගාඉං" යනු ශාකුන්තලයෙහි කාලිදාස ප්‍රයුක්ත පාඨයෙකි.

ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග සප්තමී එකවචනය භාස "ආම්" අන්තව ද "ආඑ" අන්තව ද කාලිදාස "ආඑ" අන්තව ද යොදා තිබේ.

මේ කිවිහු තිදෙන පහත සඳහන් වචන යොදා තිබෙන අයුරු බැලිය යුතු සි.

අශ්වඝෝෂ= අත්තානං, වයං–අම්හාකං.

භාස=අත්තානං, වයං–අමෙහ, අම්හාඅං–අම්හානං.

කාලිදාස= අත්තානාං, අමෙහ, අම්හානං.

මේ ආදි වශයෙන් දැක්විය හැකි නිදර්ශන බොහෝ ය. මේ අනු ව සලකනවිට කාලයක් මුළුල්ලේ වෙහස් වෙමින් වර්ධනා රයේ පැවැති ප්‍රාකෘතයේ මුල් අවධියේ අශ්වඝෝෂ විසූ බව ද ඉක් බිති භාෂ ද ඔහුට අනතුරු ව කාලිදාස ද විසූ බව මෙයින් පැහැ

දිලි වේ. තවද කාලිදාසයන් යොදා තිබෙන මහාරාෂ්ට්‍රිය 3 වැනි 4 වැනි ශතවර්ෂයේ පැවැති මහාරාෂ්ට්‍රිය නොව ආදි ම භාවගීත කාලයට පසු ව ඇති වූ ප්‍රාකෘතයක් බව නිසැකව ම කිය හැකි ය. මෙය කාලිදාසයන් අශ්වඝෝෂයන්ට පසු ව වූහ බවට ප්‍රබල සාක්ෂ්‍යයෙකි.

අශ්වඝෝෂයන්ගේ බුද්ධචරිතය ගුරුකොට ගෙන කාලිදාස රඝු වංශය රචනා කොට තිබේ. බුද්ධචරිතය

4 නානාඝණීඝ කෘති විවෙචනය

රාමායණය ආශ්‍රය කොට විරචිත ශබ්දාර්ථාලඞ්කාර පරිපොෂිත මහා කාව්‍යයෙකි.

වාල්මිකි, අශ්වඝෝෂ, භාස, කාලිදාස, යන මේ ශ්‍රෙෂ්ඨ කිවීන්ගේ කෘති සඝඳ බැලීමේදී පැරණි කිවීන්ගේ කෘති ආදර්ශ කොට ගෙන පසු පසු කාව්‍යයන් නිෂ්පාදිත බව ඉදුරා වැටහේ. වාල්මිකි පැරණි තම කිවියා බව විවාද රහිත ය. සෙසු කවීහු තිදෙන විවාදයට භාජනවූවෝ ය. අප මෙතෙක් දැක් වූ කරුණු අනුව සැලකුව ද වාල්මිකිට පසු ව අශ්වඝෝෂ ද, අශ්වඝෝෂට පසු ව භාස ද, භාසට පසුව කාලිදාස ද වූහ බව නිගමනය වේ. පාරම්පරික මතයන්හි හෝ ආගමික විශ්වාසයන්හි එල්බ ගත් ඉන්දීය පඬිවරු භාසකාලිදාසයෝ අශ්වඝෝෂයන්ට පැරණි යයි දැක්වීමට බොහෝ වෙහෙසෙති. පසු ව කරන කාව්‍යයක් එයට ඉහත වූහ කිවියකුගේ කෘතියක් අනුගමනයෙන් රචනා කිරීම මහාකව්‍යයට මදිකමෙකැයි ද කුඩා වැඩයකැයි ද සලකන ඔවුන්ගේ ප්‍රයාසය හාස්‍යජනක ය. ලොකයේ හැම දෙයක් ම ක්‍රමයෙන් විකාශවන බව ඔවුනට නොවැටහී ම මේ මුළාවට හේතුව වේ.

කාව්‍යයක් නිෂ්පාදනයේදී පූර්වකවියකු අනුකරණය කිසි සේත් කුකව් ලක්ෂණයෙක් නම් නොවේ. "අස්තිං කුකවිඃ පදං වෛරඃ" යනු විකාශසිද්ධාන්තය පිළිබඳ ආභාසමාත්‍රයකුදු නොලත් කූපමණ්ඩූක ප්‍රලාපයෙකි. මේ දුරාලාපය සත්‍ය වශයෙන් ගතහොත් ලොකයේ කුකව්භවයෙන් හා කාව්‍ය වෛරභවයෙන් විමුක්ත වූ මහා කිවියෙක් නොලැබේ. ලොකයේ මේතාක් ඇති වූ මහාකවියා වශයෙන් පිළිගෙන තිබෙන **ෂේක්ස්පියර්** පවා පූර්වර්තී කවීන් අනුගමනය කළ කෙනෙකි. එහෙත් ඒ කුකවියෙකැයි කියන සිහිමොළේ ඇති කිසිවෙක් මිහිපිට නැත. එසේ ම ජර්මන් සාහිත්‍ය ඉතිහාසයෙහි ශ්‍රෙෂ්ඨ කිවියකු වශයෙන් පිළිගත් **ෂිලර්** කාලිදාසයන්ගේ මෙඝදූතය අනුව සඛකීය "මාරිෂ්ටුවට්" නම් කාව්‍යය සකස් කළ බව ජර්මන් සාහිත්‍ය ලොකයේ

ප්‍රකට කරුණෙකි. එහෙත් ඒ හෙතුවෙන් ෂිලර් කිවියාට කුක් විෂය ආරොපණය කරන කිසිවෙක් නො මැත.

වර්තමාන මහාලෙඛකයන් මෙන් ම වෛඥානිකයෝ ද පූර්ව පූර්ව ශාස්ත්‍රඥයන්ගේ කෘති හා අදහස් මුල්කොට ගෙන උත්තරොත්තර නිෂ්පාදනයන් පහළ වන බව පිළිගනිති. කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ ජ්‍යොතිර් විද්‍යාව හා ආන්වික්ෂිකී දර්ශන විද්‍යාව පිළිබඳ ප්‍රධානාචාර්‍ය වූ **සර් ආතර් එඩින්ටන්** මහතා "විඥානයේ නව්‍ය මාර්ගය" නම් සවකීය කෘතියෙහි මෙසේ කියයි:-

"විඥානයේ නවීන දිශුණුව පුරාතන අදහස් මුල්කොට ගෙන ඇතිවූවකි. අපි අපේ පැරැණියන්ට වඩා දූරදර්ශිවමු නම් එය අප ඔවුන්ගේ කරපිට නැඟී සිටින හෙයිනි..... .....මා අයත් පරම්පරාවේ කරපිට නගින්නෝ ද දැන් පහළ වේගන යති. මතු මතු ද මේ මෙසේ ම යි."

ක්‍රමක්‍රමයෙන් ලොකය දියුණුව දෙසට ගමන් කරන බව දන්නා ප්‍රාඥයන්ගේ අදහස් මෙසේ වුව ද කාලිදාස වැනි මහා කිවියකු කෘතයුගයේ මුත් එයින් මෙපිට ඇතිවිය නො හැකි යයි සලකන ඇතැමුන් කාලිදාසයන් අශ්වඝොෂ කෘත බුද්ධචරිතය අනුගමනය කොට තිබෙනා බව දැක දැකත් ඔහු අශ්වඝොෂයන්ටත් පෙර සිටියෙකැයි පෙන්වන්නට උත්සාහ දැරීම පුදුමයක් ද නො වේ.

කාලිදාස කෘත මාලවිකාග්නිමිත්‍රයෙහි: "ප්‍රථිතයශසාං **භාස** සෞමිල්ලකවිපුත්‍රාදීනාං ප්‍රබන්ධානතික්‍රම්‍ය" යනුවෙන් භාස නාමය උල්ලිඛිත හෙයින් භාස කාලිදාසට පූර්වතන බව පැහැදිලි වේ. එසේ ම භාස කෘත ප්‍රතිඥයෞගන්ධරායණයෙහි බුද්ධචරිතය අනුගමනය කර තිබෙන බව පැනෙන හෙයින් අශ්වඝොෂයන් භාසට පෙර වූසු බව ද නිශ්චිත වේ. භාෂාසංසන්දනයෙන් ද එය සනුට කෙළෙමු.

කාලිදාසයන් අදහස් පමණක් නො ව පද වාක්‍ය හා රචනා ක්‍රම පවා බුද්ධචරිතයෙන් ගෙන තිබෙන බව පහත සඳහන් ශ්ලෝක සසඳා බැලීමෙන් පෙනෙනවා ඇත. රඝුවංශයෙහි 7 වැනි සර්ගයේ 5 වැන්නේ පටන් 15 වැන්න දක්වා ඇති ශ්ලෝක ඒකොළොසින් ඉන්දුමතියගේ සවයංවර විවාහයෙන් පසු අජ කුමරුන් සමඟ නගර ප්‍රවේශය පුරසත්‍රීන් දුටුපරිදි වර්ණිත ය. මෙය බුද්ධචරිතයෙහි සිදුහත් කුමරුන් උයන් කෙළියට නික්ම යන අයුරු පුරයන්‍රීන් දුටු පරිදි වර්ණිත ක්‍රමය අනුකරණයෙන් කර තිබේ.

බුද්ධචරිත 3 සර්ගයෙහි:-

13 තතඃ කුමාරඃ ඛලු ගච්ඡතීති
ශ්‍රුත්වා සත්‍රියඃ ප්‍රෙෂ්‍යජනාත් ප්‍රවෘත්තිම්,
දිදෘක්ෂයා හර්ම්‍යතලානි ජගමුඃ
ජනෙන මාත්‍රෙය්‍යන කෘතාභ්‍යනුඥඃ

14 තාඃ ස්‍රස්තකාඤ්චිගුණවිඝනිතාශ්ච
සුප්තාප්‍රබුද්ධාකුලලොචනාශ්ච,
වික්‍රීතනානාවිධ්‍යාසනවිභූෂණාශ්ච
කෞතූහලෙනානිභෘතාඃ පරීයුඃ

15 ප්‍රාසාදසොපානතලප්‍රණාදෛඃ
කාඤ්චීරවෛර්නූපුරනිස්වනෛශ්ච,
චිත්‍රාසනෙභ්‍යා ගෘහපක්ෂිසඞ්ඝා -
නන්‍යොන්‍යවෙගාංශ්ච සමාක්ෂිපන්‍ත්‍යඃ.

16 කාසාඤ්චිදූසාං තු වරාඞ්ගනානාං
ජාතත්‍රපාණාමපි සොත්සුකානාම්,
ගතිං ගුරුත්වාජ්ජගෘහුර්විශාලාඃ
ශ්‍රොණීරථාඃ පීනපයොධරාශ්ච.

17 ශීඝ්‍රං සමර්ථාපි තු ගන්තුමන්‍යා
ගතිං නිජග්‍රාහ යයෞ න තූර්ණම්,
ත්‍රියාප්‍රගල්භා විනිගූහමානා
රහඃ ප්‍රයුක්තානි විභූෂණානි.

18 පරස්පරොත්පීඩනපිණ්ඩිතානාං
සංමර්දිසංක්ෂෝභිතකුණ්ඩලානාම්,
තාසාං තදා සස්වනභූෂණානාං
වාතායනෙෂ්වප්‍රශමෝ බභූව.

19 වාතායනෙභ්‍යඃ තු විනිඃසෘතානි
පරස්පරායාසිතකුණ්ඩලානි,
සත්‍රීණාං විරෙජුර්මුඛපඞ්කජානි
සඤ්ඡාදනාන්‍යම්බුරුහාණීව පඞ්කජානි.

20 තතොඃ විමානෛර්ද්‍යුවතීකරාලෛඃ
කෞතූහලොද්ඝාටිතවාතයානෛඃ,
ශ්‍රීමත්තදමන්‍යානගරං බභාසෙ
වියද්විමානෛරිව සාප්සරොභිඃ.

21 වාතායනානාමවිභාලභාවා-
දංසත්‍යාත්‍යගණ්ඩාර්පිතකුණ්ඩලානාම්,
මුඛානි රෙජුඃ ප්‍රමදෙත්තමානාං
බද්ධාඃ කලාපා ඉව පඞ්කජානාම්.

22 තාං තාඃ කුමාරං පති ප්‍රියෙප්සමාණාඃ
සත්‍රියෝ බහුශීඃම්ව ගන්තුකාමාඃ,
ඌරුශ්‍රීතාමුඛශෛවනමුදීක්ෂමාණාඃ
නරා බහුර්දෘම්ව ගන්තුකාමාඃ.

23 දෘෂ්ටවා ච තාං රාජසුතාං සත්‍රියස්තා-
ජාජ්වල්‍යමානාං වපුෂා ශ්‍රියා ච,
ධන්‍යාඃස්‍ය භාගෙයීති ශනෛරවොචඞ්-
ගුරෝර්මනොභිඃ ඛලු නාන්‍යභාවාත්.

24 අයං කිල ව්‍යාඝතපීනබාහූ-
රුපෙණ සාක්ෂාදිව පුෂ්පකෙතුඃ,
ත්‍යක්ත්වා ශ්‍රියං ධර්මමුපෙෂ්‍යතීති
තස්මින් හි තා ගෞරවමෙව චක්‍රුඃ.

කාලිදාස කෘත කුමාරසම්භව 3 වැනි සර්ගයෙහි 22 ශ්ලෝකයේ පටන් 72 දක්වා ඇති අනඛද්‍ය වර්ණනය අශ්වඝෝෂ කෘත බුද්ධචරිත 13 වැනි සර්ගයෙහි 1 ශ්ලෝකයේ පටන් 13 දක්වා ඇති මාරවර්ණනය හා සසඳා බැලිය යුතු යි.

කුමාරසම්භවයේ අනඛද්‍ය වර්ණනය:-

22 තථෙති ශෙෂාම්ව හර්තුරාඥා-
මාදාය මූර්ධ්නා මදනඃ ප්‍රතස්ථෙ,
ඵෙරාවතාඃස්ඵාලනකර්කශෙන
හස්තෙන පස්පර්ශ තදඞ්ගමින්ද්‍රඃ.

24 තස්මින් වනෙ සංයමිනාං මුනීනාං
තපඃසමාධෙඃ ප්‍රතිකූලවර්තී,
සංකල්පයොනෙරභිමානභූත-
ඔත්මානමාධාය මධ්‍යජිජ්‍රඃමෙහ.

43 දෘෂ්ටිප්‍රපාතං පරිහෘත්‍ය තස්‍ය
කාමඃ පුරඃ ශුක්‍රමිව ප්‍රයාණෙ,
ප්‍රාත්තෙතෂු සංසක්තතමෙරුශාඛඃ
ධ්‍යානාඥදං භූත්‍යතෙර්වෙශ.

44 ස දෙවදාරුද්‍රුමවේදිකායාං
ශාර්දූලචර්මව්‍යවධානවත්‍යාම්,
ආසීනමාසන්නශරීරපාතඃ
ත්‍රියම්බකං සංයමිනං දදර්ශ.

51 සමරසතප්තාභූතමයුග්මනෙත්‍රං
පශ්‍යන්නාදූරාතමනසාපත්‍යධෘෂ්‍යම්,
නාලක්ෂයත්සාධවසඝන්නාඝසත්තඃ
ස්‍රස්තං ශරං වාපමපි සවහස්තාත්.

57 තාං වීක්ෂ්‍ය සම්භාවයවානවද්‍යාං
රතෙරපි ත්‍රිපදමාදධානාම්,
ජිතෙන්ද්‍රියෙ ශූලිනි පුෂ්පචාපඃ
සවකාර්‍යසිද්ධිං පුනරාශශංසෙ.

62 උමාපි නීලාලකමධ්‍යශොභි
විශ්‍රංසයන්ති නවකර්ණිකාරම්,
චකාර කර්ණව්‍යුතපල්ලවෙන
මූර්ධ්නා ප්‍රණාමං වෘෂභධ්වජාය.

64 කාමස්තු බාණාවසරං ප්‍රතීක්ෂ්‍ය
පතඞ්ගවද්ආහනිමූඛං විවික්ෂුඃ,
උමාසමක්ෂං ශරබද්ධලක්ෂ්‍යඃ
ශරාසනජ්‍යාං මුහුරාමමර්ශ.

66 ප්‍රතිග්‍රහීතුං ප්‍රණයිප්‍රියත්වාත්
ත්‍රිලොචනස්තාමුපචක්‍රමෙ ච,
සමෙමාහනං නාම ච පුෂ්පධන්වා
ධනුෂ්‍යමොඝං සමධත්ත බාණම්.

69 අථෙන්ද්‍රියක්ෂොභමයුග්මනෙත්‍රඃ
පුනර්ශිත්වාද් බලවන්නිගෘහ්‍ය,
හෙතුං සවෙතො විකෘතෙර්දිදෘක්ෂුර්-
දිශාමුපාන්තෙෂු සසර්ජ දෘෂ්ටිම්.

70 ස දක්ෂිණාපාඞ්ගනිවිෂ්ටමුෂ්ටිං
නතාං සමාකුඤ්චිතසව්‍යපාදම්,
දදර්ශ චක්‍රීකෘතචාරුචාපං
ප්‍රහර්තුමභ්‍යුද්‍යතමාත්මයොනිම්.

71 තපඃ පරාමර්ශිවිරුද්ධමන්‍යෙර්-
භ්‍රූභඞ්ගදුෂ්ප්‍රෙක්ෂ්‍යමුඛස්‍ය තස්‍ය,
සද්‍යඃ වසන්තානුදර්විඃ සහසා තෘතීයා-
දක්ෂ්ණඃ කෘශාඞ්ගඃ කිල නිෂ්පපාත.

72 ක්‍රොධං ප්‍රහෝ සංහර සංහරේති
යාවද් ගිරඃ ඛෙ මරුතාං චරන්ති,
තාවත්‍ය වහ්නිර්භවතෝත්‍රජත්මා
භසමාවශෙෂං මදනං චකාර.

බුද්ධචරිතයෙඞි මාරවර්ණ්‍යනය:-

1 තස්මින් විමොක්ෂාය කෘතප්‍රතිඥෙ
රාජර්ෂිවංශප්‍රභවෙ මහර්ෂෞ,
තත්‍රොපවිෂෙට ප්‍රජහර්ෂ ලොකස්-
තත්‍රාස සද්ධර්මරිපුස්තු මාරඃ.

2 යං කාමදෙවං ප්‍රවදන්ති ලොකෙ
චිත්‍රායුධං පුෂ්පශරං තථෙව,
කාමප්‍රචාරාධිපතිං තමෙව
මොක්ෂද්විෂං මාරමුදාහරන්ති.

3 තස්‍යාතවජා චිත්‍රමහර්දයිස්-
තිස්‍රො රතිප්‍රීතිතෘෂශ්ච කන්‍යාඃ,
පප්‍රච්ඡුරෙනං මනසෝ විකාරං
ස තාංශ්ච තාශෙවව වචොභ්‍යුවාච.

4 අසෞ මුනිර් නිශ්චයශවර්ම බිභ්‍රත්
සත්වායුධං බුද්ධිශරං විකෘෂ්‍ය,
ජිගීෂුරාසෙත විෂයානමිදියාන්
තස්මාදයං මෙ මනසෝ විෂාදඃ.

5 යදිහ්‍යසෞ මාම්භිභූය යාති
ලොකාය චාකඛ්‍යාත්‍යපවර්ගමාර්ගම්,
ශූන්‍යාසනතෝ'යං විෂයෝ මමාද්‍ය
වෘතතාචව්‍යුතස්‍යෙව ත්‍රිදෙහභර්තුඃ.

6 තදුවදෙවෙෂ න ලබ්ධවක්ෂුර්-
මදෙහාචරෙ තිෂ්ඨති යාවදෙව,
යාස්‍යාමි තාවද් ව්‍රතමස්‍ය හෙත්තුං
සෙතුං නදීවෙග ඉවාතිවෘද්ධඃ.

7 තතො ධනුඃ පුෂ්පමයං ගෘහීත්වා
ශරාන් ජගත්මොහකරාංශ්ච පඤ්ච,
සෝ'ශවත්ථමූලං සසුතෝ'භ්‍යගචඡ-
දසවාසප්‍යකාරී මනසඃ ප්‍රජානාම්.

8 අථ ප්‍රහ්‍රාන්තං මුනිමාසන්නසප්තං
පාරං තිතීර්ෂුං භවසාගරස්‍ය,
විජ්‍ය සව්‍යං කරමායුධාග්‍රෙ
ක්‍රුඩන් ශරෙණෙදමූවාච මාරඃ.

9 උත්තිෂ්ඨ හොඃ ක්ෂත්‍රිය මෘත්‍යුශිත
වර සවධර්මං ත්‍යජ මොක්ෂධර්මම්,
බාණෙශව යඥෙදශව විනීය ලොකං
ලොකාත් පදං ප්‍රාපනුහි වාසවස්‍ය.

10 පන්‍ථා හි නිර්‍යාතුමයං යශස්‍යා
යො වාභිතඃ පූජිතමෙනීරෙන්ද්‍රෛඃ,
ජාතස්‍ය රාජර්ෂිකුලෙ විශාලෙ
මෙක්ෂ්‍යාකමශ්ලාක්‍ෂ්‍යමිදං ප්‍රපත්‍යතුම්.

11 අථාද්‍ය නොත්සහෙ ඉසි නිශ්විතාත්මන්
භව සථිරොා මා විමුවඃ ප්‍රතිඥම්,
මයොද්‍යතො හ්‍යෙෂ ශරඃ සථිව
යඃ ශුෂ්කෙ මිතරිපො විමුකතඃ

12 සපෘෂ්ටඃ ස වානෙන කථඤ්චිදෙඛඃ
සොමස්‍ය නප්තාප්‍යහවද්විචිත්තඃ,
ස චාභවච්ඡන්තනුරසථතන්ත්‍රඃ
ක්ෂීණෙ යුගෙ කිං බත දුර්බලොා'න්‍යඃ.

13 තත් ක්ෂිප්‍රමුත්තිෂ්ඨ ලහසව සංඥං
බාණොා හ්‍යයං තිෂ්ඨති ලෙලිහානඃ,
ප්‍රියාවිධෙයෙෂු රතිප්‍රියෙෂු
යං වක්‍රවාකෙෂ්විව නොත්සෘජාමි.

ක්‍රියාප්‍රයොග වශයෙන් ද කාලිදාසයන් බුද්ධචරිතය අනුගම නය කර තිබෙන බව පෙනේ.

බු: ච: 6-58 දිවේ‍යර්විශෙෂෛර්ජිහයාං ච චක්‍රුඃ

රඝු: 9-61 තං පාතයාං ප්‍රථමමාස පපාත පශචාත්

,, 13-36 ප්‍රභ්‍රංශයාං යො නහුෂං චකාර

,, 16-86 සංයොජයාං විධිවදුස සමෙතබන්ධුඃ

මේ වනාහි අපාණිනිය ප්‍රයොගයෙකි. ටීකාකාරයෝ ද එය කියා, වාකරණ විරුද්ධ වූ මේ ක්‍රියා ප්‍රයොගය බුද්ධචරිතයෙහි

යොදූ තිබෙනු දැක එය සාධුබවයෙන් ගෙන කාලිදාසයෝ සවකීය කෘතියෙහි කිප පොළකම යෙදූහ යනු නිශ්චිත වේ.

(මේ පිළිබඳ වැ 9 වැනි සගීයේ 61 වැනි ශ්ලෝකයට ලියූ විවරණය බලනු.)

වචන හා වගනති වශයෙන් ද බුද්ධචරිතය අනුගමනය කර තිබේ.

බුද්ධචරිත: 6–68 ක්වචිත් ප්‍රදධ්‍යෞ විලලාප ව ක්වචිත්
ක්වචිත් ප්‍රවස්ඛාල පපාත ච ක්වචිත්.

රඝුවංශ: 13–19 ක්වචිත් පථා සඤ්චරතෙ සුරාණාං
ක්වචිත් ඝනානාං පතතාං ක්වචිච්ච.

බු: ච: 13–73 දිශඃ ප්‍රසෙදුඃ ප්‍රබභෞ නිශාකරඃ

රඝු: වං: 3–14 දිශඃ ප්‍රසෙදුර්මරුතො ව්වුඃ සුඛාඃ

බු: ච: 1–22 වාතා ව්වුඃ සපශීසුඛා මනොඥ

කුමාරසං: 11–37 වාතා ව්වුඃ සෞඛ්‍යකරාඃ ප්‍රසෙදුඃ

බු: ච: 13–73 දිව්‍යො නිපෙතුර්භුවි පුෂපවෘෂ්ටයඃ

රඝු: 15–25 තත්ප්‍රතිඛ්‍වනිනො මූර්ධ්නි දිව්‍යාඃ කුසුමවෘෂ්ටයඃ

තවද බුද්ධචරිතයෙහි එන එක ම අදහස වෙනස් වචනයෙන් යෙදූ තැන් ද කාලිදාස කෘතීන්හි දක්නා ලැබේ. ඒ මෙසේ යි:–

බු: ච: 11–43 අතොඃපි නෛකානනසුඛොඝති කඝව්–
න්නෛකානනදුඃඛඃ පුරුෂඃ පෘථිව්‍යාම්.

මෙඝදූත: 2–48 කෘෂ්‍යෛකානනං සුඛමුපනතං
දුඃඛමෙකානනතතො වා.

බු: ච: 11–41 කාමෙෂවනෙකානතිකතා ව යසමා–
දතොඃපි මෙ තෙෂු න භොගසංඥ.

රඝු: 2–57 එකානනාවිධවංසිෂු මදවිධානාං
පිණ්ඩෂවනාසථා බලු භෞතිකෙෂු

බු: ච: 1–13 ධර්මාථිකාමා විෂයං මිථොන්‍යං
න වෙශමාචක්‍රුරසය නීත්‍යා

රඝු: 17–57 න ධර්මථිකාමාභ්‍යාං බබාධෙ න ච තෙන තෙන
නාථිං කාමෙන කාමං වා සොඃථෛන සදෘශසත්‍රිෂු.

මේ ආදි වශයෙන් දැක්විය හැකි සදෘශතා අනන්ත ය. ඒ සියල්ල මෙහි ලා දැක්වීම අනවශ්‍ය ය. විසතරාර්ථීන් විසින්

ආචාර්ය් කවල් මහතාගේ විවරණය බැලියයුතු. සැකෙවින් කිය තොත් අශ්වඝොෂ කෘත බුද්ධචරිත නැමැති කවුසටහන අකු ව කාලිදාසයන් සවකිය රඝුවංශ කාව්‍යවිත්‍රය සම්පූර්ණකර තිබේ. එය පහත සඳහන් ප්‍රයොගයන්ගෙන් ද සුබොධ වේ.

බු: ච: 3–19 වාතායනෙභ්‍යසතු විනිඃසෘතානි
පරස්පරොපාහිතකුණ්ඩලානි,
සත්‍රිණාං විරෙජුර්මුඛපඞ්කජානි
සකතානි හර්‍ම්‍යෂ්විව පඞ්කජානි.

රඝු: 7–11 තාසාං මුඛෙරාසවගන්ධගර්භෛර්–
ව්‍යාපාතාන්තරාඃ සාඳ්‍රකුතූහලානාම්,
විලොලනෙත්‍රභ්‍රමරෙගීවාක්ෂාඃ
සහස්‍රපත්‍රාභරණා ඉවාසන්.

„ 14–13 ප්‍රාසාදවාතායනදෘශ්‍යබන්ධෛඃ
සාකෙතනාගෙර්ඊඋදඤ්ජලිභිඃ ප්‍රණෙමුඃ.

කාලිදාස මහ කිවිහුගේ කාලය නිර්ණය කිරීමෙහි ලා අප විසින් මෙතෙක් කරුණු දැක්වූයේ ඓතිහාසික වූ ද ශාස්ත්‍රීය වූ ද සත්‍යයන් නොසලකා ඇතැම් භාරතීය විචාරකයන් විවිධ මත පළකර තිබෙන හෙයිනි. ඔවුන්ගේ මතානන්තර සියල්ලට ම මෙසින් පිළිතුරු ලැබී ඇත. රඝුවංශ කතෘහු කවරකලෙක විසූ වෙක් දැයි දැන ගැනීමට මෙයට වඩා කරුණු අවශ්‍යය යි නොසිතමු.

මෙඝදූත කාව්‍යයෙහි පෙනෙන "දිඞ්නාගානාං පථි පරිහරන් සථූලහස්තාවලෙපාන්" යන ශ්ලොකපාදයෙන් **දිඞ්නාගාචාර්‍ය්‍ය**යන් සිහි කෙරෙතියි ටීකාකාරයන් දක්වන මතය ද සැලකිය යුත්තක් සේ නොපෙනේ. මෙබඳු ශ්ලෙෂ කාව්‍යප්‍රයොග කාලිදාසයන්ගේ කෘතීන්හි නොදක්නා ලැබෙන හෙයිනුත්, දිඞ්නාගාචාර්‍ය්‍යවරයා කිවියකු නොවන හෙයිනුත්, න්‍යාය ශාස්ත්‍රඥයකු වූ දිඞ්නාගයන් හා විරොධයක් හෝ සඞ්ගවක් කිරීමට කිවියකු වූ කාලිදාසයන්ට කිසිම හේතුවක් ඇතැයි සිතීමට කරුණක් නැති හෙයිනුත් මේ මතය සර්ප්‍රකාරයෙන් ප්‍රතික්ෂා රහිත ය.

දිඞ්නාගාචාර්‍ය්‍යවරයා ආචාර්‍ය් වසුබන්ධුගේ ශිෂ්‍යයෙකැයි සිතීමට කරුණු තිබේ. කාල වශයෙන් කාලිදාසයන්ට මදක් පෙර විසූවෙකැයි සිතිය හැකි ය. හැරත් යථොක්ත මෙඝසන්දෙශ

ශ්ලෝකය පවා කාලිදාස රචිත වූවක් නොවේ යයි ද සැක කෙරෙති. ඒ කෙසේ හෝ වේවා මෙය කාලිදාසයන්ගේ කාල නිර්ණය කිරීමෙහි ලා ඉතා දුබල නිදර්ශනයෙකි.

කාලිදාසයන්ගේ කවිත්වය ඉතා ප්‍රකට ය. ඒ පිළිබඳ කිය යුතු දැ මතු දක්වමු. කාලිදාස කෙබඳු චරිතයක් කාලිදාසයෝ ඇති ව විසූවෙක් ද යනු අඳුකාරයෙන් වැසී තිබෙන කරුණෙකි. එයට හෙතුව චරිත හෝ ඉතිහාස ලිවීම එකල ඉන්දියාවට නුපුරුදු වූවක් හෙයිනි. කාලිදාසයන් වටකොට ගොතා තිබෙන විශ්වාස නො කට හැකි ජනප්‍රවාද ඉවත් කළහොත් ඉතුරුවන්නේ ඔහුගේ ම කෘතිවලින් උපුටාගත හැකි කරුණු සුළුපටු යෙකි. කාලිදාසීය කෘති සියල්ල පරිශීලනයෙන් බලන කලාවිඥයකුට ඔහුගේ තරමක් හොඳ චිත්‍රයක් නිර්මාණය කළ හැකි වේ.

වර්ණනාවන් ගැන සලකනවිට ඉන්දියාව පිළිබඳ ඔහුගේ දැනීම ඉතා මහත් ය. ඔහු තමන් උපන් ප්‍රදේශය වූ උතුරු ඉන්දියාවේ අධික වශයෙනුත් දකුණු ඉන්දියාවේ සුළුපට වශයෙනුත් සංචාරය කොට තිබෙන බව කිය හැකි ය. ඇතැම් ස්ථානයන් හා වස්තූන් පිළිබඳ කර තිබෙන වර්ණනයන් සලකා බැලීමේදී ඒ පිළිබඳ ප්‍රත්‍යක්ෂඥානයකින් යුක්තවූවකු බව ද නිශ්චය කළ යුතු ය.

කාලිදාසයෝ නගරයේ පවත්නා කලකලයටත් වනයේ ප්‍රශාන්ත භාවයටත් එක සේ ප්‍රිය කළ කෙනෙකි. දෙවියන්ට හා තපසුන්ට භක්තිමත් වූ හෙතෙම රජවරුන්ට හා කුමාරවරුන්ට ද ළැදි වූවෙකි. සෞන්දර්‍යය ප්‍රිය කළ ඔහු ස්ත්‍රීන්ගේ රූපශ්‍රියට වශඟ වූවෙකි. මෙයින් ඔහුගේ භින්න රුචිකත්වය හැඟේ. මේ භින්නරුචිකත්වය ඔහු නියම ශිල්පියකු බව පළ කෙරෙයි. සංගීතය, චිත්‍රශිල්පය, සවාභාවික සෞන්දර්‍යය, ආචාර ධර්මය, දර්ශන ශාස්ත්‍රය, රහස්‍යවාදය, ගණිතය, ජ්‍යොතිර්විද්‍යාව, යුද්ධ ශිල්පය, කාමශාස්ත්‍රය, රාජනීතිය, කෘෂිකර්මය, නාට්‍යකලාව, නෘත්‍යය යන මේ කරුණු ඔහුගේ මනොගොචර ව පැවැති විෂයයෝ ය. තත්කාලීන කලාශිල්ප ශාස්ත්‍ර විෂයෙහි පෘථුලාව බොධයකින් යුක්ත වූවකු බව යථොක්ත විෂයයන් ගැබ්කොට ඇති ඔහුගේ කාව්‍ය සවරූප මුද්‍රාවන්ගෙන් පැහැදිලි වේ.

කාලිදාස සවකීය කෘතීන්හි ප්‍රථම රචනාවෙන් තෘප්ත නො වූ වෙකි. පළමු කළ් රචනාව නැවත නැවතත් විවෙචන බුද්ධියෙන්

කියවා බලා නැවත නැවත වෙනස් කිරීම ඔහුගේ සිරිත විය. එක ම ග්‍රන්ථයේ තොයෙක් සංස්කරණයන් දක්නට ලැබීම මෙයට සාධකයෙකි.

වෙදවෙදඞ්ගාදි ඒ ඒ විෂයයන් පිළිබඳ කාලිදාසයන්ගේ නෛපුණ්‍යය පහත සඳහන් පාඨයන්ගෙන් ප්‍රකට වේ.

ආසීනමගීක්ෂිතාමාද්‍යඃ ප්‍රණවශ්ඡන්දසාමිව	රඝු: 1–11
ශ්‍රැතෙරිවාර්ථං සමෘතිරන්වගච්ඡත්	රඝු: 2– 2
උද්ඝාතඃ ප්‍රණවෝ යාසාං න්‍යාසයෙසන්‍ත්‍රිභිරුදීරණම් කාම් යඥඃ ඵලං සවගීස්තාසාං වේං ප්‍රභවෝ ගිරාම්	කුමාර:2–12
සතාං මතෙන ශ්‍රද්ධෙව සාඤ්ඡාදවිධිනොපපන්නා	රඝු: 2–16
අපවාද ඉවොත්සඟීං ව්‍යාවතීයිතුමීශ්වරඃ	රඝු: 15– 7
ධාතොඃසථාන ඉවාදෙශං සුග්‍රීවං සංන්‍යවෙශයත්	රඝු: 12–58
අපවාදෙරිවොත්සඟීඃ කෘතව්‍යාවෘත්තයඃ පරෛඃ.	කුමාර: 2–27
පශ්චාදධ්‍යයනාර්ථස්‍ය ධාතොරධිරිවාභවත්	රඝු: 15– 9
සුතාවසුත සම්පන්නෟ කොශදණ්ඩාවිව ක්ෂිතිඃ	රඝු: 15–13

භූගොලය හා ප්‍රාකෘතික විඥානය පිළිබඳ ව කිවිහුගේ ඥානය පහත සඳහන් වාක්‍යයන්ගෙන් හැඟේ.

සහස්‍රගුණමුත්ස්‍රෂ්ටුමාදත්තෙ හි රසං රවිඃ	රඝු: 1–18

සූර්‍යරශ්මියෙන් ඇදගන්නා ජලය නැවත වර්ෂාඝාරූපයෙන් පොළොවට ලැබෙන අයුරු ඔහු දැන සිටි බව මෙයින් පැහැදිලි ව පෙනේ.

රවිපිතජලාතපාත්‍යයෙ පුනරොඝෙණ හි යුජ්‍යතෙ නදී. කු: 4–44

යනුවෙන් මෙය ම කුමාරසම්භවයෙහි දැක්වී.

රඝුවංශ– 10–58. 13–4 ශ්ලෝක ද බලනු.

මේ ආදි වශයෙන් බාහිර කරුණු පිළිබඳ ව ද විශෙෂ ඥාන යකින් යුක්ත වූවකු බව පැහැදිලි වන නිදර්ශන බොහෝ ය.

කාලිදාසයන්ගේ කවිත්වය හා කෘතිහු

සංස්කෘත භාෂාමය කාව්‍ය රචනයෙහි පරමෙශ්වරත්වය කාලිදාස යන්ට පිරිනැමීම උචිත ය. කාලිදාස නාමය භාරතීය සංස්කෘත කාව්‍යලොකයෙහි අත්‍යුච්ච ස්ථානය භජනය කෙරෙයි.

"පුරා කවීනාං ගණනාප්‍රසඞ්ග
කණිෂ්ඨිකාධිෂ්ඨිතකාලිදාසඃ,
අද්‍යාපි තත්තුල්‍යකවේරභාවා-
දනාම්‍යා සාර්ථවතී බභූව"

යනාදීන් ගැයුන ලද කීර්තියක් ඇති අන්‍ය කිවිවරයෙක් මුළු ආශියා ඛණ්ඩයෙහි ම නැත්තේ ය. සංස්කෘතය ද ලෝකයේ ව්‍යාප්ත වූ විශාල සාහිත්‍යයක් ඇති පැරණි භාෂාවකි. එසේ ද වුවත් සංස්කෘතයට නවජීවනයක් ලැබුණේ කාලිදාසයන්ගේ විශිෂ්ට කෘතිවලිනි. කාලිදාසයන්ට පෙරත් පසුවත් රචනා කළ ගැඹුරු වූ ද සරල වූ ද නොයෙක් කාව්‍ය ඇතත් කාලිදාස කෘතීන්හි දක්නා ලැබෙන අර්ථ ව්‍යක්තිය හා මනොහරත්වය අන් කෘතීන්හි නො දක්නා ලැබේ. අශ්වඝොෂාදි පැරණි කිවීන් අනුකරණය කළ නමුත් කාලිදාසයන්ගේ කවිත්වය නිසර්ගසිද්ධ (=සවභාවික) ය. රඝුවංශ, කුමාරසම්භව, ශාකුන්තල, වික්‍රමොර්ශීය, මාලවිකාග්නි මිත්‍ර, ඍතුසංහාර, මෙඝසන්දෙශ යන මොවුහු ඔහුගේ කෘතිහු ය. මේ හැර තවත් සුළු සුළු නොයෙක් කෘති මොහු විසින් ම රචිත යයි සලකතත් ඒ කිසිවක් මහාකවි කාලිදාසයන්ගේ යයි කීමට අවකාශ නැත.

ඍතුසංහාරය

ඍතුසංහාර මෙඝසන්දෙශාදිය භාවයින කාව්‍යයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ ය. ඍතුසංහාරය මෙඝසන්දෙශය මෙන් ම කාලිදාසයන්ගේ නිර්මාණ ශක්තිය විදහා පාන දර්පණතලයක් වැන්න. සවාභාවික සෞන්දර්ය රුචිකත්වය මොහුගේ හැම කෘතියකින් ම පැනෙනත් ඍතුසංහාරය එහි පරිසමාප්ත ප්‍රඥඛ්කරත්වය පැහැදිලි කෙරෙයි. සුළු ප්‍රයාසයකින් මහත් අර්ථයක් ප්‍රකාශ කිරීමේ ශක්තිය කාලිදාස යන් තුළ පැවැති ලක්ෂණයක් වුව ද එය ඍතුසංහාරයෙන් ප්‍රකාශ නො වේ. මෙය කිවිහු තරුණ කාලයේ කළ කෘතියකැයි සැලකි මට කාරණයෙකි. ෂඩ්විධ ඍතූන් වර්ණනා කිරීම් වශයෙන් කරන ලද මේ කාව්‍යයෙන් සවභාව ධර්මයේ විවිධ ක්‍රියාකාරිත්වය ශතගුණ යෙන් සිතුවම්කොට පෙන්වයි. එසේ ම කිවියකුගේ සිතෙහි හට ගන්නා ක්ෂණික උද්වෙගයත් සවභාව ධර්මය කෙරෙහි පවත්නා ප්‍රේමයත් විදහා දක්වයි. රචනාශෛලිය වශයෙන් වර්ධ උසස් නොවන හෙයින් මෙය කාලිදාස කෘතියක් නොවේ යයි ද ඇතැම් විවාරකයෝ කියති. මෙ ද ඔහුගේ අන්‍ය නාට්‍යයන් පමණ මනහර නොවන මාලවිකාග්නිමිත්‍රය කාලිදාස කර්තෘත්වයෙන් බැහැර ලන්නට කරන උත්සාහය මෙන් නිෂ්ඵල ප්‍රයාස යෙකි. මේ කාව්‍යාදිය කිවිහු තරුණ කාලයෙහි කළ කෘතීහු යයි පිළිගත යුතු ය.

මෙඝසන්දේශය

භාරතයේ ඇති වූ අතිවිචිත්‍ර භාවගීත කාව්‍යය වූ මෙඝ සන්දේශය ලෝකයේ ම මධුර කාව්‍යයන් අතුරෙන් එකකි. රවනා ශෛලියෙන් ද නිර්මාණ ශක්තියෙන් ද සවාභාවිකා සෞන්දර්‍යයෙන් ද සියලු ම භාවගීත කාව්‍යයන්ට වඩා ශ්‍රේෂ්ඨ ය. එහි එන විවිධ වර්ණන නැමැති ඉන්ද්‍රජාලයෙන් කියවන්නාගේ සිත වශඟ කෙරෙයි. මෙම භාවගීත මුක්තාදාමයෙහි මූල පටන් අග දක්වා ප්‍රේමය නමැති රන්හුය අඛණ්ඩ ව පවත්නේ ය.

මෙහි දූතයා පිළිබඳ අදහස රාමායණයෙන් ගත් බව හැඟෙතත් කාව්‍යය නව්‍යනිර්මාණ ශෛලියෙක් ම ය. මේ කාව්‍යය අනුගමනයෙන් පසු කාලයන්හි නොයෙක් දූත කාව්‍ය කළ නමුත් මෙයට සමාන වන අන්‍ය කාව්‍යයක් මේ දක්වා ඇති නො වීය.

ශාකුන්තල

කාලිදාස කෘතීන් අතර අති ප්‍රකට කාව්‍යය ශාකුන්තල නාටකය යි. ඔහුගේ ප්‍රශස්ත කෘතිය ද මේ මැයි.

"කාව්‍යේෂූ නාටකං රම්‍යං තත්‍ර රම්‍යං ශකුන්තලං" යනාදීන් වර්ණිත වූ රසඥයන්ගේ මනනුවන් පැහැර ගන්නා වූ මේ කාව්‍යයෙහි කාලිදාසයන්ගේ නිර්මාණ ශක්තිය මැනවින් ප්‍රතිබිම්බිත ව පවත්නේ ය. එසේ ම අන්‍යයන්ගේ මානසික ප්‍රවෘත්තීන් නොයෙක් අයුරින් කල්පනය කොට වාක්ද්වාරයෙන් ප්‍රකට කිරීමේ ප්‍රභුත්වය මොහු කෙරෙහි නිසඟයෙන් ම පැවැති බව ශාකුන්තලයෙන් ප්‍රකට වේ. කාලිදාසයන්ට ඉන්දියාවේ ෂෙක්ස්පියර් යයි ව්‍යවහාරවූයේ මේ කාව්‍යය නිසා ය. එතෙකුදු වුවත් දෘශ්‍ය කාව්‍යයක් වශයෙන් බලන කල මෙය සර්වාංගදෝෂ යයි කිවහැකි නො වේ. කියවීමෙන් ප්‍රීතිවීම මුත් අභිනය දැක්වීමෙහිදී කාර්‍යසාධාරණයට නංවාලිය නො හැකි සූක්ෂ්ම හැඟීම් ඇතුළත් කොට තිබීම එහි ඇති මහාදෝෂය වේ.

වික්‍රමොර්වශීය

ශාකුන්තලය හා මහත් සමානත්වයක් ඇති මේ නාටකය කාලිදාසයන්ගේ කවිත්වයට කැලැල් කරන්නක් මෙන් පෙනේ. මෙය අභිනය කිරීමට දුෂ්කර වූවකි. මෙහි බොහෝ සෙයින් ශාකුන්තලයෙහි යෙදූ ප්‍රයෝගයන් ම දක්නා ලැබෙන හෙයින් මේ නාටකය රවනා කිරීමේදී කිවිහු වෙහෙසට පත් ආකාරයක් හැඟේ.

මාලවිකාග්නිමිත්‍රය

පූර්ණ නාටකාර්ථය හා සසඳන විට මාලවිකාග්නිමිත්‍රය ඉතා දුර්වල කෘතියෙකි. මෙහි පැනෙනුයේ රජවරුන් හා රාජ මාලිගාවන්හි ජීවිතය පිළිබඳ රූප රේඛාවකි. කථාශරීරයෙහි හෝ අදහස්වල හෝ නව්‍යත්වයෙක් ද නැත්තේ ය.

කුමාරසම්භවය

මේ වනාහි සකල කුමාරයාගේ නොහොත් ස්කන්ද දෙවියාගේ උත්පත්තිය වර්ණිත මහාකාව්‍යය සි. ශෘඞ්ගාරාදී රසයෙන් ද නගරාදි වර්ණනයෙන් ද චිත්තාකර්ෂණීය ලුහුඬු සිතුවම්න් ද විචිත්‍ර වූ මෙහි කාලිදාසයන්ගේ චින්තන ශක්තිය ප්‍රතිමූර්තිත ය. ශිව පාර්වතී දෙදෙනාගේ ප්‍රේම බන්ධනය සිතුවම් කොට තිබෙන අයුරු ද අතිශයින් මනහර ය.

මෙහි කථාශරීරය ශිවපුරාණ සකල්පුරාණාදියෙන් ගන්නා ලද්දකි. දෙවැනි වන්ද්‍රගුප්ත පුත්‍ර වූ කුමාරගුප්ත කුමාරයාගේ උත්පත්තිය නිමිති කොට රචනා කරන ලදැයි අනුමාන කටහැකි මේ කාව්‍යයට කුමාරසම්භව යන නාමය තබන ලදැ සි ඇතැම් විචාරකයෝ කියති.

රඝුවංශය

සංස්කෘත මහාකාව්‍යයන් අතර සර්ව්‍රේෂ්ඨ වූයේ රඝුවංශය සි. ශ්‍රෝතෘජනයාගේ ප්‍රසාද සංවේගයන් කුළුගන්වන අයුරින් බඳනා ලද මේ මහාකාව්‍යයෙහි රචනා ශෛලිය ප්‍රෞඪ ය, භාෂාව සුලලිත ය, අදහස් ප්‍රකට ය, වර්ණනා චිත්තාකර්ෂණීය ය, ශෘඞ්ගාරාදි රසයෙන් පරිපුෂ්ට ය, දූර්ශනික විචාරයන්ගෙන් අනූන ය. කාලිදාස කිව්න් කෙරෙහි පැවැති භක්තිය උද්වේගය, නිසුණු අවබෝධය හා රචනා චාතුර්‍යය මේ කාව්‍යයෙන් මොන වට පැහැදිලි වේ. ප්‍රේමය මූර්තිමත් කිරීමට, සවභාවධර්මය සිතුවම් කිරීමට, අධික වර්ණනයට, කල්පිත පියැඹීමට, කාව්‍යකයන්ගේ මනොවෘත්තිය විදහා පෑමට, ප්‍රකෘතිය පිළිබඳ විවිධ අවස්ථාවන් කැටයම් කිරීමට, උපමාසන්දර්ශනයට කාලිදාසයන් කොතරම් චතුර ද යනු රඝුවංශයෙන් තේරුම්ගත හැකි ය.

රඝුවංශය වීරකාව්‍යයෙකි. ලොකයේ වෙනත් මහාකාව්‍ය යන් හා සංසන්දනය කර බලන විට සර්ව්‍රෝත්කර්ෂයෙන් එහි වීර රසය ගැබ් වී තිබේ. වීර චරිත, වීර ක්‍රියා, වීර අදහස් වර්ණනා කිරීම මේ කාව්‍යයේ විශෙෂ ලක්ෂණයෙකි. පහත සඳහන් ශ්ලෝකවලින් රඝුවංශයේ වීර රසය ප්‍රකට වේ.

3–53 තතඃ ප්‍රහස්‍යාපභයඃ පුරන්දරං
පුනර්හාෂේ තුරගස්‍ය රක්ෂිතා,
ගෘහාණ ශස්ත්‍රං යදි සඟී ඒෂ තෙ
න බල්වනිර්ජිත්‍ය රණ්‍ඩං කෘතී භවාන්.

3–54 ස එවමුක්ත්වා මඝවන්නමුන්මුඛඃ
කරිෂ්‍යමාණඃ සශරං ශරාසනම්,
අතිෂ්ඨදුලීඪවිශෙෂශොභිතා
වපුඃප්‍රකාමේණ විඩම්බිතෙශ්වරඃ.

3–57 ඛරෙඃ කුමාරෙ පි කුමාරවික්‍රමඃ
සුරද්විපාසඵාලනකර්කශාඞ්ගුලෞ,
භුජේ ශචීපත්‍රවිශෙෂකාඞ්කිතෙ
සඛ්‍යාමචිහ්නං නිචඛාන සායකම්.

3–58 ජහාර වාන්‍යෙන මයූරපත්‍රිණා
ශරෙණ ශක්‍රස්‍ය මහාශනිධ්වජම්,
චුකොප තස්‍යෙම ස භෘශං සුරශ්‍රියඃ
ප්‍රසහ්‍ය කෙශව්‍යපරොපණාදිව.

3–63 රණ්‍ඩහීඃශං වක්ෂසි තෙන තාඩිතඃ
පපාත භූමෞ සහ සෛනිකාශ්‍රැභිඃ,
නිමෙෂමාත්‍රාදවධූය තද්ව්‍යථාං
සහොත්ථිතඃ සෛනිකහර්ෂනිස්වනෛඃ.

සත් වැනි සඟියේ 38 සිට 65 දක්වා ද, 9 වැනි සඟියේ 50 සිට 72 දක්වා ද, 11 වැනි සඟියේ 11 සිට 19 දක්වා ද, එහි ම 26 සිට 31 දක්වා ද, එහිම 63 සිට 86 දක්වා ද, 12 වැනි සඟියේ 72 සිට 100 දක්වා ද, 15 වැනි සඟියේ 17 සිට 24 දක්වා ද, 16 වැනි සඟියේ 77 සිට 79 දක්වා ද ඇති ශ්ලෝක ද බැලිය යුතු ය.

වංශකථා ගැන සලකන විට රඝුවංශය ඉතා විශිෂ්ට වංශ කථාවෙකි. භාරතීයයන්ගේ අතිප්‍රිය කාව්‍යය ද මේ මැයි. බාල තරුණ මඛලු හැමදෙනාගේ ම සිත්ගන්නා අයුරින් රචනා කර තිබීම එයට හේතුවී යයි සිතිය හැකි වේ. සංස්කෘතප්‍රිය භාරතීය යන් බාල්‍යාවස්ථායෙහිදී ම තම දූපුතුන් අතට දෙන ප්‍රථම කාව්‍යය ද මේ ය. මේ අනුව සලකන විට ජනොපයොගිත්වය කෙසේ වෙතත් රඝුවංශය මුහු කළ නුමුහු කළ නුවණ ඇති කාගේත් විනොදය දියුණු කරන එක ම මහාකාව්‍යය යි කිය යුතු වේ.

කිව්යකු වශයෙන් කාලිදාසයන්ට ලැබියයුතු සථානයත් ඔහුගේ කෘතීන් පිළිබඳ තක්සයත් කෙබඳු දැ යි

රඝුවංශ මහාකාව්‍යයෙන් මීට ප්‍රථම අප විසින් දැක් වූ කරුණු

පැහැදිලි වන අනු ව වටහා ගැනීම දුෂ්කර නො

තත්කාලීන ආර්ථික වේ. එසේ ද වුවත් සාමාන්‍යයෙන්

රාජනෛතික කාව්‍ය හදුරන්නවුන් විසින් නො

සාමාජික තත්ත්වය සලකා හරින පැත්තක් ද ඇත්තේ ය. එනම් කාව්‍යය රචනා කරන කාලයේ දී රටේ පැවැති ආර්ථික රාජනෛතික සාමාජික තත්ත්වය කෙසේදැ යි කාව්‍යානුසාරයෙන් පිරික්සා බැලීම යි.

රඝුවංශාගත වර්ණනාවන් අනු ව සලකන ඓතිහාසික හැඟීම් විරහිත ඇතැම් විවාරකයෝ ඒ කාලයේ අවශේෂයෙන් සියලු ම භාරතීයයෝ වහල් බැවින් තොර ව ආචාරශීලී ව සුඛිත ව මුදිත ව විසූහ යි නිගමනය කෙරෙත්. එය මහා මුළාවෙකි. එබඳු සවණී යුගයක් කිසිකලෙකත් ඉන්දියාවේ හෝ වෙන රටෙක හෝ ඇති නො වූ හෙයිනි.

ගුප්තසවණීයුගයේ පැවැති උත්තමතිය ප්‍රධාන වශයෙන් බ්‍රාහ්මණයන් සවලපදෙනකුගේත් රජුන්ගේත් සිටුවරුන්ගේත් රදළ වරුන්ගේත් පමණක් යශෛශ්වර්‍යයට සීමා වූවකි. සීමා රහිත කාලයක පවත් ජනසමාජයේ දුෂ්කර වැඩ කොටස සිදුකිරීමෙන් මනුෂ්‍යවර්ගයාට මහත් සේවයක් කළ නීව යයි සම්මත අසරණ මිනිසුන්ගේ තත්ත්වය හින්දු ශිෂ්ටාචාරයේ අතිශ්‍රේෂ්ඨ අවධිය වූ ගුප්ත සවණීයුගයේදීත් අහලකින් වත් උසස් ව නො පැවැති බව රඝු වංශයේ පැතෙන **ශම්බූක** ශූද්‍රයාගේ කථාවෙන් පැහැදිලි වේ. ඒ මෙසේ යි:–

"අනතුරු ව එක්දිනක් එක්තරා බ්‍රාහ්මණයෙක් තරුණ වන්නව ද පෙර මළා වූ පුත්‍රයකු රාම රජු වෙත ගෙන අවුත් මාලිගා ද්වාරයෙහි බහා රජහට ආක්‍රෝශ කරන්නට වන. "එම්බා පෘථිවිය! ඔබ දශරථ රජුගේ අභාවයෙන් ඉතාමත් අභාග්‍ය අවස්ථාවකට පැමිණියහු" යනාදීන් පරිභව බණන්නා වූ බ්‍රාහ්මණයාගේ හඬ අසා තොරතුරු විමසා දැන රාම රජ ලජ්ජිත විය, අකාල මරණයක් ඉක්ෂ්වාකුවංශිකයන්ගේ රාජ්‍යයෙහි නො වන හෙයිනි. රජතෙම "මොහොතක් ඉවසව"යි බ්‍රාහ්මණයා නවතා යමයාගෙන් පළි ගැනීමට පිටත් විය. එහෙණෙහි ම රජු ඉදිරියෙහි "මහරජ තොපගේ රාජ්‍යයෙහි මිනිසුන් කෙරෙහි අයෝග්‍ය හැසිරීමෙක් වෙයි, එය සොයා ශමනය කරව. එයින් ඉෂ්ටාර්ථ සිද්ධිය වන්නේ ය"යි අමානුෂිකාවවාදයෙක් ඇසිණ.

රජ එය ද සිතට ගෙන පුෂ්පක රථයෙන් ඒ ඒ දිශායෙහි ඉඟිලෙමින් පරීක්ෂා කරන්නේ ගඝක ඝරිකුරු ව එල්බ දුෂ්කර තපසක් කරන්නා වූ ශම්බක නම් ශූද්‍රයකු දැක ජාති හොත්‍ර විචාරා ශූද්‍රයන් විසින් තපස් රැකීම වේදයටත් ධර්මශාස්ත්‍රයටත් විරුද්ධ බැවින් "මෙය ම ධර්මවිරෝධී අනාචාරය" යි සිතා රජතෙමේ ඔහුගේ හිස සිඳ ලී ය. දුෂ්කර වූ තපසින්‍නුදු සඟනියට යා නො හැකි වූ ශම්බුකයා රජු අතින් දඬුවම් ලැබීමෙන් එකෙණෙහි ම සඟගියට ගියේ ය. රජතුමා පෙරළා මාලිගයට එත් ම මළ බමුණු පැටියාට නැවත ජීවිතය ලැබී තිබෙනු දක්නා ලදි." (15 වැනි සඟියේ 42 පටන් 56 දක්වා ශ්ලෝක බලනු.)

මෙය පහත් පඬිකමියේ මිනිසුන්ට අන් සැපතක් තබා යටත් පිරිසෙසින් ආගම ඇදහීමේ නිදහස වත් එකල නො පැවැති බවට සාධකයෙකි. මේ අනු ව සලකන විට අද මෙන් ම එදා ද සාමාන්‍ය මහජනයා නොයෙක් දුක් කම්කටොලුවලින් ගහන ව සිටි බව නිශ්චය කළ හැකි වේ.

ශම්බුක කථාව රාම රජ කාලයේ කථාවකැ යි කියහැකි වුවත් කාලිදාස එය අනුමත කර තිබෙන නිසා එකල ද ජාතිභේදය උග්‍ර වැවැති බව නිසැක ය. බ්‍රාහ්මණ බලය එකල අතිශයින් බල පැවැත් වූ හෙයින් බ්‍රාහ්මණයන් තුටු කිරීම පිණිස මෙය ලියූ බව ද සැලකිය හැකි ය. බ්‍රාහ්මණයන්ගේ කූට බුද්ධියත් වසතු තණ්හාවත් නිසා එකල රජුන් විසින් රටේ ධනය බ්‍රාහ්මණයන් පිදීම පිණිස ම යෙදූ බව ද පෙනේ.

1 වෙනි සඟියේ 26 වෙනි ශ්ලෝකය
5 වෙනි „ 31 වෙනි ශ්ලෝකය
} බලනු.

කාලිදාස බ්‍රාහ්මණ බලය කොතරම් වසඟ සිටියේ දැ යි දෙවැනි සඟියේ දැක්වෙන දිලීප රජුගේ ගොත්‍රත සමාදානය වර්ණිත ක්‍රමයෙන් සිතාගත හැකි වේ. තවද ගුප්ත කාලයේ දුප්පත් අසරණතම් හා රොගපීඩාවලින් මහජනයා පෙළුණු බව ඒනියන්ගේ ගමන් විසතරයෙන් පෙනෙන්ට තිබේ. එකල පැටිනා නගරයේ දුප්පත් රොගීන්ට හා අනාථයන්ට ගිලන්හල් තනා තුබුණු බව හෙතෙම සඳහන් කරයි. නියම සඟණියුගයක් තුබුණේ නම් රටක් දුප්පතුන්ගෙන් හා අනාථයන්ගෙන් යුක්ත විය නො හැකි ය.

රඝුවංශය විශිෂ්ට රාජනෛතික කාව්‍යයෙකැ යි ද සමහරු කල්පනා කරත්. විවෙචන බුද්ධියෙන් බලතහොත් එහි දක්නා

ලැබෙන නීති සිඟල්ල ම පාලකයන්ගේ බලය වැඩි කරගන්නා වූ ද සාමාන්‍ය මහජනයාගේ තත්ත්වය පිරිහෙළන්නා වූ ද කුට උපාය මාර්ගයෝ ය. රජුන්ගේ ම වර්ණනයන් මිස ප්‍රජාවගේ දියුණු ව පරමාර්ථ කොට පැවැති කිසිම පාලන ක්‍රමයක් එහි නො පෙනේ. කොටින් කියතොත් මේ කාව්‍යය සාම්‍රාජ්‍ය ප්‍රතිපත්ති තහවුරු කිරීම ට ලියූවකි. ප්‍රථම සර්ගයේ 30 වැනි ශ්ලෝකය එයට එක් නිදර්ශනයෙකි. එසේ ම මේ කාව්‍යය ගුප්තරාජ්‍යයේ මහත්ත්ව අන් අයුරෙකින් ප්‍රකාශ කිරීම පිණිස කරන ලද්දකැ සි ද සැලකීමට තරුණු තිබේ. චතුර්ථ සර්ගයේ පැතෙන රඝු රජුගේ දිග්විජය වර්ණනය යෙන් සමුද්‍රගුප්ත රජුගේ දිග්විජය දක්වයි. රඝු රජුගේ ජයසන්ධ පිහිටුවීමත් අශ්වමේධ යාගයත් සමුද්‍රගුප්ත රජුගේ එම ක්‍රියා ලක් කොට වර්ණිත බව කිය හැකි ය. ඇත්ත වශයෙන් කියතහොත් රඝුවංශය වනාහි පළමු වැනි චන්ද්‍රගුප්ත රජුගේත් ඔහු පුත් සමුද්‍ර ගුප්ත රජුගේත් ශූර වීර ක්‍රියා පිළිබඳ වර්ණනයෙකි.

එකල ඉන්දියාවේ ගමන් මාර්ග ඉතා දුෂ්කර ව පැවැති බව රඝු රජුගේ දිග්විජය වර්ණනයෙන් පෙනේ. ඉතා ධාර්මික ව රජ කළ රජුගේ රාජ්‍යයෙහි පවා වරප්‍රරූඪ ක්‍රමය පැවැත්තේ ය. එයින් හැඟෙන්නේ ඒ ආණ්ඩුක්‍රමය මහජනයා ප්‍රිය නො කළ බැවින් දැඩි පාලන විධි ඔසොදා තුබුණු බව යි. එකල පැවැති රාජ්‍යතන්ත්‍රය අද පවත්නා එකාධිපති ක්‍රමයට සමාන වූවක් මුත් ප්‍රජාතන්ත්‍ර ක්‍රමයක් නො වේ. බුද්ධ කාලයේ පවා ඉන්දියාවේ පැවැති ප්‍රජාතන්ත්‍ර පාලන ක්‍රම බ්‍රාහ්මණ බලය වැඩි වූ කාලයේ අභාවයට පත්වූයේ ක්ෂත්‍රියයන්ගේ ගණතන්ත්‍ර ක්‍රම බ්‍රාහ්මණ යන් රැවි නො කළ හෙයිනි. බුද්ධාගම ගණතන්ත්‍ර පාලනයට අනුබල දුන් ආගමකි. එහෙත් එය වෛදික ශිෂ්ටාචාරයට අනු කූල නො වූ බැවින් මහජනයාගේ දියුණුවට හිතවත් පාලන ක්‍රමයන්ට පමණක් නො ව ඊට අනුබල දෙන ආගම්වලට ද විරුද්ධවීම බ්‍රාහ්මණයන්ගේ සිරිත විය. ඉන්දියාවෙන් බුද්ධධර්මය අතුරුදන්වීමට අන්‍යායීන්ගේ වරදටත් වඩා රාජනෛතික ප්‍රතිගාම්භාවය හේතුවී යයි මෙයින් නිශ්චය කළ හැකි ය.

රඝුවංශයේ සඳහන් රජුන්ගේ චරිත ගැන සොයා බැලීමෙන් ද කරුණු රැසක් අවබෝධ කරගත හැකි ය.

රටවැස්සන්ගේ ජීවිතයත් මරණයත් අතට ගෙන සිටි මේ නරදෙවියන් වස්තු සම්පත් හා කාමසම්පත් විඳනය කිරීමෙහි ලා මේ පොළොවෙහි උපන් කිසිවකුටත් දෙවෙනි නො වන බව රඝුවංශයෙන් පෙනේ. අනතිමේදී ඔවුන් කරන ලොකු ම

පරිත්‍යාගය නම් කාම දුඃඛය සංසිඳීමෙන් පසු මොක්ෂය සෙවීම පිණිස තපසට යෑම සි. මොවුනතර දැඩි මිථ්‍යාවිශ්වාසයෝ වූහ. දඩයම් කිරීම ඔවුන්ගේ ලොකු ම ක්‍රීඩාව විය. මිනිසුන්ට ළංවිය නො හැකි පරිදි සුරක්ෂිත විශාල වනප්‍රදෙශ මේ සඳහා වෙන්කර තුබුණේ ය. නාටක සත්‍රීන් නො මැති රජමාලිගයක් ඉඳියාවේ නැති විය. මල්මාලා ගෙතීම්, ඇඟ ඉලීම්, නැහැවීම්, පවන් සැලීම්, මඟුල්සත් ඇල්වීම්, සුවඳ දීම්, ඇදුම් පැලඳුම් ඇඟලීම් ආදියෙන් ඔවුහු රජුන්ට උපස්ථාන කළහ.

බ්‍රාහ්මණබලය අධික ව පැවැති අතර ම රජුන්ගේ කැමැත්ත ඉටුකිරීමට ද බාධාවෙක් නො විය. එකල නීතිය නම් රජුගේ කැමැත්ත ය. එහෙයින් ම ඔවුන්ගේ බලය සීමාරහිත විය. එය සීමාකිරීමට ප්‍රබල වූයේ කරුණු දෙකෙක් පමණෙකි. එනම් කැරලි ගැසීම හා රජුගේ ජීවිත විනාශය සි. රඝුවංශයේ එන මහිපාලයන් අතර අතිපි රජ ශ්‍රෙෂ්ඨ පුරුෂයෙකි. එසේ ද වුවත් ඔහුගේ රාජ්‍යයේ ද වරපුරුෂයන් නො අඩු ව සිටි බව පැනේ. ඒ රජුගේ ආණ්ඩු ක්‍රමය පවා මහාජනයා රුචි නො කළ බව එයින් සිතා ගත හැකි ය.

රඝුවංශයේ අන්තිම සර්ගයෙන් අතීත රජකුගේ චරිතය කාලිදාස විසිතුරු බසින් සිතුවම් කරයි. දිවා රාත්‍රී දෙක්හි කාමුක කාන්තාවන් පිරිවරා ජලක්‍රීඩා කරමින්, උද්‍යානයන්හි හැසිරෙමින්, මද්‍යපානය කරමින්, නටමින්, ගයමින්, වයමින්, ඒ ඒ අවස්ථායෙහි භාග්‍යවන් සතුටු කිරීම පිණිස ඔවුන්ගේ තාඩන පීඩනයන් ද ලබමින් කල්ගෙවන රජතෙමේ රට වැස්සාගේ යහපත තණ පතක් පමණවත් නො සැලකී ය. තූර්‍යනාදයෙන් තොර නො වූ මාලිගයන්හි කාමිනීන් හා කාම සුඛයෙහි ම්මත්ත වූ මේ අග්‍රිවර්ණී රජ මහජනයාට දක්නට පවා සුලභ නො විය. මන්ත්‍රීන්ගේ ඉල්ලීමට ගෞරවයක් වශයෙන් ප්‍රජාවන්ට දර්ශනය පිණිස කිසිකලෙක පැමිණියේ කවළියෙකින් දික් කළ පාදය පමණෙකි. අතීත කාලයේ විසූ බොහෝ රජවරු කොතරම් ආත්මාර්ථකාමී ව ක්‍රියා කළාහුදැ යි තේරුම් ගැනීමට මෙය හොඳ ම නිදර්ශනයෙකි.

මේ ආදි වශයෙන් කරුණු විමසා බැලීමේ දී භාරතීය ඉතිහාසයේ අතිසමෘද්ධිශාලී යුගය වූ ගුප්ත සවර්ණයුගයේ පවා ජනකාය නානාවිධ ජාතිභෙද පඬුකාභෙදාදියෙන් භින්න ව අන්තනෝ මනික රාජබලයෙන් තැළී පෙළී, දුක්කරදරවලින් ගහන ව වුසූ බවත්, එබඳු යම්කිසි සැපයක් ශාන්තියක් ඒතම් එය රජුන්ට හා

ඔවුන් ඇසුරු කරන පුරෝහිතයන්ට ද, උසස් තත්ත්වයේ බමුණන්ට ද, තවත් ධනවත් විසා දෙනකුට ද සීමාවූවක් බවත් පැහැදිලි වේ. රඝුවංශ කාව්‍යයෙන් මෙකී නොකී දූෂිත පාලන ක්‍රමවලට හා දූෂ්ට සාමාජික ප්‍රතිපත්තිවලට අනුබල දීමක් මුත් වචනයෙකිනුදු විරෝධයක් නො දැක්වීම අදහස් අතින් කාව්‍ය කර්තෘහුගේ දුර්වලත්වය ප්‍රකට කිරීමෙකි. ජනප්‍රවාදයක පෙනෙන හැටියට කාලිදාසයන්ගේ පියා පවා ඉතා ම දුප්පත් තැනත් ගම්වැසියෙකි. එසේ තිබියදීත් කාලිදාසයන්ට දුප්පතුන් ගැන මතක් නොවීම පුදුමයට කරුණෙකි "කාව්‍යං යශසේ'ර්ථකෘතෙ ව්‍යවහාරවිදෙ **ශිවෙතරක්ෂතයෙ**" යනුවෙන් පාපය හෙවත් දුඃඛය දුරුකිරීම ද කාව්‍යයෙන් ලැබිය යුතු ප්‍රයෝජනයෙකැයි දැක් වේ. එහෙත් රඝුවංශයෙන් ආවිණිණකල්පික මිථ්‍යා විශ්වාසයන්ට අනුබලදීමත් රජුන්ට ආවැඩීමත්, බ්‍රාහ්මණ බලය අතිශය උත්කර්ෂයෙන් පෙන්වීමත් හැර සාමාන්‍ය ලොකයාගේ දුඃඛ විනාශයට හෝ බුද්ධි විකාශයට හෝ, පවත්නා දූෂ්ට සිරිත් විරිත් නැති සොඵ ශිෂ්ට සමාජයක් නිර්මාණය කිරීමට හෝ පිහිටක් නැතිවීම ඔහුගේ මහා කවිත්වයට කැලලෙකි.

පෙර අපර දෙදිග ම ඇතැම් ලෙඛකයන් විසින් කාලිදාස ෂේක්ස්පියර්ට සමාන කොට දක්වා තිබේ. මේ දෙදෙනා **කාලිදාස හා ෂේක්ස්පියර්** බැලිය යුතු ය.

කාව්‍යකලාව අතින් සලකන විට වේ දෙදෙන ම සමකක්ෂයෙහි ලා ගිණිය හැකි ය. එසේ ද වුවත් මේ දෙදෙනාගේ කෘතීන් පරීක්ෂා කිරීමේදී රසභාවාදි වශයෙන් පවත්නා වෙනස් කම් අහසට පොළොව මෙන් දුරස්ථ ය. කාලිදාස කෘති විනොදයට හා ශෘඞ්ගාරයටත් මනඃකල්පිත අදහස්වලටත් සීමා වී තිබේ. එහෙත් ෂේක්ස්පියර්ගේ තත්ත්වය මෙයට හාත්පසින් ම විරුද්ධ ය. හෙතෙම මනුෂ්‍ය ජීවිතය පිළිබඳ හැම අංශයක් ම විදහා දක්වූවෙකි. ජීවිත වීණාවෙහි හැම තතක් ම සපගී කළ කෙනෙකි. නාට්‍යකලා විශාරදයකු වශයෙන් ද, අන්‍යයන්ගේ විපත්තේදී දුක් වන්නකු වශයෙන් ද, සැපතේදී ප්‍රීතිවන්නකු වශයෙන් ද, කාව්‍ය කලාවේ පරමාර්ථය සොයන කලාවිඥයකු වශයෙන් ද, මානව සමාජය නියම මාර්ගයේ ගමන් කරවන මාර්ගදේශකයකු වශයෙන් ද, නව්‍යසමාජයක් ගොඩනැඟීමට අනුබල දුන් අනුශාසකයකු වශයෙන් ද ෂේක්ස්පියර්ගේ බුද්ධි ප්‍රභාවය ඉදිරියෙහි කාලිදාසයෝ හිරු ඉදිරියෙහි කඳේකිම්යකු මෙන් නිෂ්ප්‍රභ වෙති.

කාලිදාසගේ කෘතිවලින් ඔහුගේ බුද්ධි විකාශයෙක් නො පැනේ. ඔහුගේ ජීවිතයේ මූල් කාලයේ යම් විශ්වාසයෙක් හෝ පිළිගැනීමෙක් ඒ නම් ජීවිතාවසානය දක්වා එය ම බල පැවැත් වී ය. රජුන් හා ප්‍රබල මිනිසුන් සාමාන්‍ය ජනයාගේ ගැලවුම් කාරයන් හැටියට පිළිගෙන තුබුණු බව මූල් අවධියේ කළ මාල විකාග්නිමිත්‍රයෙන් පැනේ. ඒ විශ්වාසය බුද්ධිය මුහුකළ අවසථා යෙහි පවා නො වෙනස් ව පැවැති බව ශාකුන්තලයෙන් හා රඝු වංශයෙන් ද දැක්ක හැකි ය. කාලිදාස තත්කාලීන වහල් අදහස් වලට හෝ මිථ්‍යා විශ්වාසයන්ට විරුද්ධ ව වචනමාත්‍රයක් වත් ප්‍රකාශ කිරීමට තරම් උදාරචරිත ඇත්තකු නො වීම ඔහු කෙරෙහි කරුණාවක් හෝ මෛත්‍රියක් නො පැවැති බවට සාක්ෂ්‍යයෙකි.

ෂේක්ස්පියර්ගේ කෘතිවලින් ඔහුගේ තරුණ කාලයේ පටන් වෘද්ධාවසථාව දක්වා ක්‍රමයෙන් බුද්ධි විකාශය ඇති වූ පරිදි පැහැ දිලි ව පෙනෙන්ට තිබේ. ඔහුගේ කෘති, ආරම්භ කාලය පරිනත කාලය සඞ්ක්‍ෂී කාලය නිවෘත්ති කාලය යි සතර කොටසකට බෙදිය හැකි ය. **මිඩ් සමර් නයිට්ස් ඩ්‍රීමය** වැනි කාල්පනික කෘති ප්‍රථම යුගයට ද, **ඇශ් යූ ලයික් ඉට්** හා **ට්වෙල්ත් නයිට්** වැනි සුඛාන්ත නාටක දෙවෙනි යුගයට ද, **හැම්ලිට්, ලියර්** හා **මැක්බත්** වැනි විශිෂ්ට දුඃඛාන්ත නාටක තෘතීය යුගයට ද, ටෙම් පිස්ට් වැනි ආධ්‍යාත්මික විචාරයන්ගෙන් ගහන නාටක සිවුවැනි යුගයට ද අයත් වෙති.

ෂේක්ස්පියර්ගේ කෘතිහු ඔහුගේ සාමාජික ජීවිතයත් කලා ශිල්පඥතයත් විදහා පාන කැඩපත් වැන්න. කලාශිල්පියකු වශයෙන් ඔහුගේ නෛපුණ්‍යය කෙබඳු දැ යි දැක්වීමට මෙහි අව කාශයෙක් නැත්තේ ය. එහෙත් සංක්ෂේපයෙන් කියතොත් සාජීජනීන ප්‍රඥාදෘවභාවයත්, මානුෂික ප්‍රකෘතිය පිළිබඳ ගැඹුරු අවබොධයත්, නාට්‍ය රස ගැන්වීමෙහි අනුපම ශක්තියත්, අප්‍රතිහත වාක් වාතුර්යයත් නිසා කලාවිඥයකු වශයෙන් ඔහුට ඉතා උසස් සථානයක් හිමිවිය යුතු ය.

ෂේක්ස්පියර්ගේ ඥානගතිය හැම තත්වයක ම මිනිසුන් හා ඔවුන්ගේ ජීවිතය පිළිබඳ හැම අවසථාවක් ම විනිවිද පැවැත්තේ ය. හෙතෙම දුක මෙන් ම සැපය ද හොඳ මෙන් ම නපුර ද, මුළාව මෙන් ම නුමුළාව ද, ධනී බව මෙන් ම දුගී බව ද මැනැවින් දත්තෙකි. ෂේක්ස්පියර් මිනිසුන්ගේ අදහස් හා ලොකතත්වය මූර්තිමත් කොට තිබෙන අයුරු විසමය ජනක ය.

ෂේක්ස්පියර් ජනසමාජයට තත්ත්වාවබොධයක් ඇතිකිරීමට කෙතරම් උත්සාහ ගෙන තිබේ ද යනු ඔහුගේ කෘති පරීක්ෂණ

යෙන් පැහැදිලි වේ. ඔහු ද ආදි ම අවස්ථාවේ කාව්‍ය රචනා කෙළේ රාජාදි ප්‍රබල මිනිසුන් ආදර්ශී කොට පෙන්වමිනි සමා ජයේ එක්සත්කම හා ක්‍රමානුකූල පැවැත්ම මහේශාක්‍ය ප්‍රජෙශ් වරයන්ගේ අනුභාවයෙන් ම සිදුවිය යුතු යයි හෙතෙම මුල් කාල යේදී කල්පනා කෙළේ ය එහෙත් සමාජ සඞ්ඝර්ෂය පිළිබඳ ප්‍රත්‍යක්ෂානුභවය පසුව ඒ අදහස වෙනස්වීමට හෙතු විය. **ලියර්, මැක්බත්** නම් දුඃඛාන්ත නාටකද්වයෙන් පෞද්ගලික බලයට තදින් පහර දුන් ඔහු තත්කාලීන දුක් කම්කටොලු හා අධර්ම වලට හෙතු ද පෙන්වා තිබේ. ලියර් නාටකයෙන් පෞද්ගලික බලය පැහැර ගැනීමෙන් පසු අනුන් මැඩලීමට ඇති වන අභිලාෂ යත් මැක්බත් නාටකයෙන් පෞද්ගලික බලය තමාගේ ම විනාශ යට හේතුවන සැටිත් දැක්විය. ඔහුගේ මුල් කාලයේ පැවැති අදහස් පසු ව වෙනස් වූ බවට **ඇන්ටනි ඇන්ඩ් ක්ලියෝපැට්රා** නාටකය ද සාක්ෂ්‍යයෙකි. එහි දැක්වෙන අයුරු මෘදුගති ඇති ඇන්ටනිගේ වැටීමෙන් මධ්‍යයුගයේදී පැවැති මානුෂික සම්බන්ධයේ විනාශයත්, අනුකම්පා විරහිත ඔක්ටේවියැස්ගේ ජය ග්‍රහණයෙන් ආත්මාර්ථකාමී ධනවාදීන්ගේ විජය ප්‍රාප්තියත් පැහැදිලි කෙරෙයි.

වර්ෂ 1607 දී මධ්‍යම එඞ්ගලන්තයේ බලවත් කැරැල්ලක් ඇති විය. **කොරියෝලේනස්, ටෙමන්** යන නාටකද්වය රචනා කෙළේ මේ වර්ෂයේදී ය. කොරියෝලේනස් නාටක යෙන් කර්‍කශ පාලකයන්ගෙන් වන අනර්ථය පෙන්වයි. පෞද්ග ලික බලමහිමයෙකින් ධනවාදයේ පවත්නා අවුල් විශවුල් නිරවුල් කළ නොහැකි බව මේ කාලයේදී ෂේක්ස්පියර් මැනවින් දැන සිටියේ ය. හෙතෙම තත්කාලීන දුෂ්ට සමාජික ප්‍රතිපත්ති නිසා අතිශයින් සංවේගයට ද පැමිණියේ ය. මිනි සුන්ගේ ගුණධර්මවලින් කිසි ම පිහිටක් නැතැයි සිතන තරමට ඔහුගේ සංවේගය බලවත් වූයේ ය. මුදලේ බලය අන් සියල්ල ම පැරද වූ බව ඔහුට තදින් අවබෝධ විය. ටෙමන් නාටකය ලියූයේ මෙවැනි චිත්තසවභාවයක් පැවැති අවස්ථා වෙක්හි ය.

මෙසේ බලන කල ෂේක්ස්පියර් කාලිදාස මෙන් නොව සමා ජයේ තත්ත්වය මැනවින් අවබෝධ කොට ගෙන දුඃඛ හේතුව තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂ කොට එය පිටු දැකීම පිණිස සමාජ සඞ්ග්‍රාමයේ භටයකු මෙන් සටන් කළ කලාවිඥයකු බව පැහැදිලි වේ. ෂේක්ස්පියර් තමාගේ කාලයත් බලයත් ඥානයත් යෙදුයේ මහජනයාගේ යහපත පිණිස ය. කාලිදාස මෙන් රජුන්ට හා

ඛමුණන්ට තුතිපුද පැවැත්වීමට හෝ ආචිර්ණ කල්පිත මිථ්‍යා විශ්වාසයන් තර කිරීමට හෝ නොවේ. සැකෙවින් කියතොත් ෂේක්ස්පියරයෝ පදදලිත අපමානිත පරපීඩිත මනුෂ්‍යවර්ගයා වෙනුවෙන් සටන් කළ මහා කිවියෙකි. සඛ්‍යා වශයෙන් ද ෂේක්ස්පියර්ගේ කෘතීහු කාලිදාසගේ කෘතිමෙන් කිප ගුණයෙකින් අධික ය. ඒවා හදාරන්නනට ලැබෙන බුද්ධි ප්‍රබෝධය ද ශතගුණයෙන් අධික යයි කිව යුතු ය. මේ අනුව සලකන විට ජනොපයොගී කාව්‍ය ලෙඛකයකු වශයෙන් ෂේක්ස්පියර් කාලිදාස යන්ට කිසිසේත් සමාන කළ නොහැකි බව ප්‍රතීයමාන වේ.

රඝුවංශ ප්‍රස්තාවනාව අප නොසිතූ තරම් දික් වූ හෙයින් මෙතෙකින් නවත්වමු. විවාරපූර්ණ ප්‍රස්තාවනාවක් වශයෙන් පාඨක යන් අතට පත් කිරීමට අපි යථාවකාශ පරිදි උත්සාහ කෙළෙමු. ඒ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි නිශ්චය කිරීම ශ්‍රොතෘජනයාට භාරවූවකි. තවද මේ ප්‍රස්තාවනාව ලිවීමේදී අප සහෝදර, විද්‍යාලඞ්කාර පිරිවෙන්හි ආචාර්‍ය්‍ය ත්‍රිපිටකාචාර්‍ය්‍ය **කැඩපන්නල ප්‍රඥාලෝක** ස්ථවිරයන් වහන්සේ ද විද්‍යාලඞ්කාර පිරිවෙන්හි අපරදිග භාෂාශාස්ත්‍රාධ්‍යාපනයෙහි නියුක්ත **කොටහේනේ සෝම** ස්ථවිරයන් වහන්සේ ද අපට බෙහෙවින් උපස්තම්භක වූ බව මෙහි සඳහන් කළ යුතු වේ.

නාරාවිල ධම්මරතන

වෂී 1938 ක්වූ ඔක්තොම්බ්‍ර මස 1 වැනි දින
විද්‍යාලඞ්කාර පිරුවන්හිදී ය.

විඥාපනය.

රඝුවංශ මහාකාව්‍යයේ දෙවැනි භාගය පිළිබඳ ව්‍යාඛ්‍යාව බොහෝ ප්‍රමාද ව වුව ද මුද්‍රණද්වාරයෙන් ප්‍රසිද්ධ කිරීමට ලැබීම ප්‍රීතියෙකි. මෙහි ප්‍රථම කාණ්ඩය මෙයින් සුවිසි වසකට පෙර ප්‍රසිද්ධ කරන ලද්දේ දෙවැනි භාගය ද වහාම ප්‍රකාශයට පැමිණ වීමේ බලාපොරොත්තු ඇතිව ය. එසේ ද වුවත් නොසිතූ දෙයක් සිදුවීමත් සිතූ දෙය වැනසීමත් ලොක සභාවයක් හෙයින් ව්‍යාඛ්‍යා කතෘ වූ ප්‍රාචීන භාෂාභිවෘද්ධි කාමී **ජේ. සමර දිවාකර** මැතිඳුන්ගේ හා සංශොධනයෙන් ප්‍රතිග්‍රහණය කර වදාළ අප ප්‍රාචාසෝත්තම විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති විද්වජ්ජන ශෙඛරායමාණ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍යය් ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම නායක මාහිමියන් වහන්සේගේ කීර්තිශෛශවත්වයෙන් බලාපොරොත්තු සියල්ල ම වෙනස් විය.

මෙසේ කලක් ගතවීමෙන් පසු 1924 පමණේදී සබකිය සබාමි පුරුෂයාණන්ගේ කෘතිය නිමාවකට පැමිණවීමේ අධික ආශා ඇති සමරදිවාකර මැතිනිය විසින් රඝුවංශ ව්‍යාඛ්‍යාවේ කොපි සියල්ල ම වර්තමාන විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති අප ආචාසෝත්තම නායක මාහිමියන් වහන්සේ වෙත පවරන ලදි. උන්වහන්සේගේ අවසර හා උපදෙස් පරිදි අපි යථාවකාශ යෙන් මෙය ශොධනපූරණවශයෙන් සකස් කිරීමෙහි යෙදුණෙමු. මදක් දුරට වැඩ කරගෙන යන අතර සමරදිවාකර මැතිනියගේ ද අභාවය සිදුවීම මිට මහත් බාධාවෙක් විය.

මෙහි මුල් පෝර්ම කිපයක් හැර අන් සියල්ල අප විසින් ම සංශොධිතය. ටීකානුසාරයෙන් සුදුසු තන්හි භාවාර්ථ හා විසතරාර්ථ ද පද විභාගාදිය ද යොදන ලදි. මේ කාව්‍යය හදාරන විද්‍යාර්ථීන්ගේ පහසුව සලකා සඟියක් පාසා විසතර පටුනක් ද කථා සාරය ද අකාරාදි ක්‍රමයෙන් කාව්‍යාගත සඞ්කෘත නාම සියල්ල ද යොදා ඇත.

අපගේ අනවධානයෙන් හෝ මුද්‍රණයෙන් වූ වරද තැන් මෙහි ඇතිවිය හැකි ය. එහෙත් බොහෝ දෙනකුන්ගේ ඉල්ලීම පරිදි ඉක්මනින් ප්‍රකාශයට පැමිණ විය යුතු හෙයින් ද අවකාශ මඳ හෙයින් ද ශුද්ධිපත්‍රයක් යොදනු නොහැකි විය. අනායාසයෙන් දක්නා ලද කිහිප පළක් මෙහි දක්වා ඇත. එබදු අශුද්ධිස්ථානයන් දක්නා සුධීන් අප වෙත දන්වා එවත්හොත් කෘතඥතා පූර්ණ ව පිළිගන්නෙමු.

මෙහි සංක්ෂේපනය විචාර පූර්ණ ව හා සවිස්තර ව ලියා දීමෙන් ආධාර කළ ගෞරවාර්හ ශාස්ත්‍රාචාර්ය **නාරාවිල ධම්මරතන** ස්ථවිරපාදයන් වහන්සේට අපගේ ගෞරවය පිරිනමමු.

මේ බවට,

හැඩපන්නල ප්‍රඥාලෝක.

2481
1938 ඔක්තෝම්බර් 1 දින
විදුලකර පිරුවන්හිදී ය.

ශුද්ධි පත්‍රය

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
V	33	තිබේ. එනම්:	තිබේ.
342	25	බහුඃ, වූහ.	බහුඃ, බැබළුහ.
352	27	න වෙදමි; නො දනිමි.	න න වෙදමි, නො දන්නෙමි නො වෙමි කෑපත
355	1	කලුපත	
,,	17	,,	,,
357	31	කදුලු	කඳුළු
364	7	නා සික්මවූ	නො ඉක්මවූ
403	11	තත්‍රවබොධෙන	තත්‍රාවබොධෙන
407	10	හරිසඵර	හරිශ්වර
436	62	නොසිවසිය	නො ඉවසිය
466	24	රාජ්‍යවෙහි	රාජ්‍යයෙහි
468	11	සඒජනාඃ, සිඝලු ම ජනයෝ;	තෙ සඒ ජනාඃ, ඒ සිඝලු ජනයෝ;
535	5	පරාභසඛ්‍යාන	පරාභිසඛ්‍යාන
554	26	ආඛොරණ	ආඛොරණා

විශේෂ ආවේදනය:

මෙම රඝුවංශ මහාකාව්‍ය සමරදිවාකරව්‍යාඛ්‍යා ද්විතීය භාගය නැවත මුද්‍රණ කිරීම මධ්‍යමදිශාවේ කොහොන්සිය පත්තුවේ හලංගොඩ රාජපක්ෂ රාජකරුණා අබේකෝන් වාසලමුදියන්සේලාගේ **රොබර්ට් බණ්ඩාර හලංගොඩ** බණ්ඩාර මහත්මයාගේ අවසර පරිදි විය යුතු ය.

පටුන

පිටු		ශ්ලෝක
1–30	**ප්‍රථම සර්ගය.** ශ්ලෝක-96	
	ඉෂ්ටදේවතා නමස්කාරය	1
	වංශෝත්කර්ෂ කථනය හා සවාහංකාර නිරාකරණය	2–4
	සූර්‍යවංශ මහත්කීර්තනය	5–9
	පණ්ඩිතායාවතාරය	10
	වර්ණ්‍යවස්තූපක්ෂේපණය	11
	දිලීප රාජ වර්ණනා	12–30
	සුදක්ෂිණා වර්ණනා	31–32
	අපුත්‍රක බැවින් දුක්විම	33
	පුත්‍රලාභය පිණිස ක්‍රියාරම්භය	34–37
	වශිෂ්ඨාශ්‍රමගමන වර්ණනය	38–49
	වශිෂ්ඨාශ්‍රම වර්ණනය	50–57
	මුනිවන්දනය හා කුශල ප්‍රශ්නය	58–59
	දිලීප රජ්ජුගේ යථාර්‍ථවත් ප්‍රකාශය	60–73
	වක්‍ෂ්‍යක්ලේශයට හේතු දර්ශනය	74–80
	වක්‍ෂ්‍යප්‍රතීකාර ,,	81–82
	නන්දිනී වර්ණනය	83–88
	ව්‍රතාවරණ නියමය	89–96
31–62	**ද්විතීය සර්ගය.** ශ්ලෝක 75	
	ව්‍රතය පිණිස වනයට යෑම	1– 4
	ව්‍රතය පුරන අයුරු	5 –7
	වන විහරණය වැනීම	8 –18
	පෙරළා ආශ්‍රමයට පැමිණීම	19–23
	පසුදින පටන් පිළිවෙළ	24–26
	සිංහයකු විසින් දෙන අල්වා ගැනීම	27–32
	සිංහ දිලීප දෙදෙනාගේ දෙබස	33–58
	සිංහයාට දිවිපිදීම හා දෙනගේ වරදානය	59–70
	නැවත නුවරට පැමිණ රාජ්‍යය භාරගැනීම්	71–74
	සුදක්ෂිණාව ගර්භිණී වීම	75

පිටු		ශ්ලෝක
63–95	**නාතිය සර්ගය.** ශ්ලෝක 72	
	දෙළඳුක් පහළ ව ගභීය මුහුකුරා යෑම	1 –9
	ගැබ පෙරහර කිරීම	10–12
	රඝුකුමාරෝත්පත්තිය	13–20
	කුමාරෝදය වර්ණනය	21–34
	යුවරජ තනතුරු දීම	35
	යුවරාජ වර්ණනය	36–37
	දිලීප යාගය	38–39
	ශක්‍රයා හා රඝු අතර යුද්ධය	40-63
	ශක්‍රයා සතුටු ව වර දීම	64–69
	රඝු කුමරු රාජ්‍යයට පැමිණීම	70–72
96–128	**චතුර්ථ සර්ගය.** ශ්ලෝක 91	
	රඝුරාජ වර්ණනය	1 –13
	ශරද් වර්ණනය	14–25
	රඝු රජුගේ දිග්විජයාරම්භය	26–28
	පූර්වදිග් ප්‍රයාණ වර්ණනය	29–36
	සුහම විජය	37
	වඞග ,,	38–39
	උත්කල ,,	40
	කලිඞග ,,	41–46
	දක්ෂිණ දිග්ප්‍රයාණ වර්ණනය	47–51
	පාණ්ඩ්‍ය විජය	52–54
	අපරාන්ත විජය ප්‍රයාණය	55–56
	කේරල විජය හා අපරාන්ත විජය	57–62
	පාරසීක විජය ප්‍රයාණය	63
	යවන විජය	64–68
	උත්තර දිග්විජය ප්‍රයාණය	69–70
	හූණ විජය	71
	කාම්බෝජ විජය	72–73
	හිමාලයාරෝහණ වර්ණනය	74–79
	උත්සව සංකේත විජය	80–83
	ප්‍රාග්ජ්‍යෝතිෂ (=කාමරූප) විජය	84–87
	දිග්විජයාවසානය (=විශ්වජිත් යාගය)	88–91

පිටු		ශ්ලෝක
128–161	**පඤ්චම සර්ගය.** ශ්ලෝක 76	
	ගුරු පූජා පිණිස ධනාර්ථී වූ කෞත්‍ස මුනිහුගේ පැමිණීම	1–3
	රඝු රජුගේ කුශල ප්‍රශ්නය	4–11
	කෞත්‍ස මුනිහුගේ ප්‍රත්‍යුත්තරය	12–17
	ගුරුධනය පිළිවිසීම	18
	මුනිහුගේ ප්‍රත්‍යුත්තරය	19–23
	රඝු රජතුමා මුනිහු නවත්වා ගැනීම	24–25
	කුවේරයා හා යුද්‍යට සැරසීම	26–28
	රාත්‍රියෙහි රුවන් වැස්ස	29–30
	කෞත්‍ස මුනිහු ධනය ලැබ කළ ආශීර්වාදය	31–34
	අජකුමාරෝත්පත්තිය	35–36
	අජකුමාර වර්ණනය	37–39
	විද්‍යාධිපතිහුගේ සංදේශය	39
	ඉන්දුමතියගේ ස්වයංවරය සඳහා අජකුමරු යැවීම	40–42
	වනභාග්‍යයකු හමුවීම	43–39
	අජකුමරුගේ හී පහරින් ඔහුගේ සවාත්ම ප්‍රතිලාභය	50–51
	ප්‍රියංවදගේ ශාප ප්‍රවෘත්තිය	52–56
	ඔහුගෙන් ගාන්ධර්වාස්ත්‍ර ලාභය	57–60
	විද්‍යාදේශයට පැමිණීම	61–63
	නින්දට පැමිණීම	64
	උදාසන වන්දීන්ගේ වෛතාලික පඨනය	65–75
	රාජසභාවට යාම	76
162–198	**ෂෂ්ඨ සර්ගය.** ශ්ලෝක 86	
	රාජසභා වර්ණනය	1–9
	ඉන්දුමතියගේ පැමිණීම	10–11
	රජවරුන්ගේ ශෘඞ්ගාරවේෂ්ටා	12–19
	මගධේශ්වර (පරන්තප) රාජසතුති	20–24
	අඞ්ගාධිප ,,	27–29
	අවන්තිනාථ ,,	31–35
	අනූපාධිප ,,	37–43
	ශූරසේනාධිප (සුෂේණ) ,,	45–51
	කාලිඞ්ගනාථ (හේමාඞ්ගද) ,,	53–57

පිටු		ශ්ලෝක
	පාණ්ඩ්‍යදේශාධිප රාජසතුති	59–65
	රාඝව (=අජ) කුමාර සතුති	68–79
	අජකුමරුන් පතිවඹයෙන් තෝරා ගැනීම	80–86

199–225 සප්තම සර්ගය. ශ්ලෝක 71

	අජ–ඉන්දුමතී විවාහ මඬුලය	1–30
	රාජසමූහය මහ රැස සිටීම	31–34
	යුද්ධාරම්භය	35–37
	යුද්ධ වර්ණනය	38–60
	ගාන්ධර්වාස්ත්‍ර ප්‍රයෝගය	61–62
	අජ කුමාරයාගේ ජයග්‍රහණය	63–70
	සුවපුර ප්‍රවේශය	71

225–262 අෂ්ටම සර්ගය. ශ්ලෝක 96

	අජ රාජාභිෂේකය	1–3
	අජ රාජ වර්ණනය	4–9
	රඝු රජතුමා තපසට යාම	10–14
	අජරාජ–රඝුරාජර්ෂීන් දෙදෙනාගේ වර්ණනය	15–24
	රඝුරාජර්ෂිහුගේ සුවර්ගප්‍රාප්තිය	25–27
	දශරථෝත්පත්තිය	29–32
	අජ රජුගේ උද්‍යාන ගමන	33
	නාරද ඍෂිහු අහසින් යාම	34
	ඍෂිහුගේ මල්මාලාව වාතයෙන් ගසා යාම	35–36
	එය ඉන්දුමතී දේවියගේ තනමත්තේ වැටීම	37
	ඉන්දුමතියගේ මරණය	38–39
	අජ විලාපය	40–70
	දේවියගේ ආදාහනාදි ක්‍රියා	71–75
	වශිෂ්ඨ මුනිහුගේ සංදේශය	76–91
	ප්‍රියවිප්‍රයෝග දුඃඛයෙන් රජතුමා රෝගීවීම	93–94
	පුත්‍රයා රාජ්‍යයෙහි පිහිටුවා අජ රජතුමා දිවි තොරකරගැනීම	95–96

263–297 නවම සර්ගය. ශ්ලෝක 82

	දශරථ රාජ වර්ණනය	1–23
	වසන්ත ඍතු වර්ණනය	24–48

පිටු		ශ්ලෝක
	මෘගයා වණීනය	49–72
	ශබ්දවේධි හියෙන් මුනිපුත්‍රයකු විදීම	73–77
	අඬ මුනිහුගේ ශාපය	78–80
	පෙරළා නුවරට පැමිණීම	82

298–322 **දශම සර්ගය.** ශ්ලෝක 86

	දශරථ රජුට පුත්‍රයන් නො ලැබීම	1 –3
	පුත්‍රකාම්‍ය යාගාරම්භය	4
	රාවණ රජුගෙන් පීඩා ලත් දෙවියන් විෂ්ණු කරා යාම්	5–6
	විෂ්ණු වණීනය	7–14
	දෙවියන්ගේ විෂ්ණුස්තෝත්‍රය	15–34
	විෂ්ණුගේ උත්තරය	35–47
	විෂ්ණුගේ අන්තර්ධානය	48
	දෙවියන් ද සුග්‍රීවාදි වේශයෙන් ඉපදීම්	49
	විෂ්ණුදෙව් දශරථපුත්‍ර ව උපන් පරිදි	50–59
	මෙහෙසින්ගේ සුවප්න	60–64
	රාමාදීන්ගේ උත්පත්තිය	65–73
	පෙරනිමිති පහළවීම	74–77
	කුමාර වණීනය	78–86

323–355 **ඒකාදශ සර්ගය.** ශ්ලෝක 93

	කෞශික මුනිහු රාමකුමරුන් ඉල්ලීම	1–2
	ගමනාරම්භය	3–7
	රාම-ලක්ෂ්මණ දෙදෙනාගේ ගමන් වණීනය	8–13
	තාඩකා විජය	14–21
	වාමනාශ්‍රමයට යාම	22–25
	මාරීචාදි රාක්ෂස විජය	26–31
	ජනක රජුගේ දුන්න බැලීමට යාම	32
	ගෞතම පත්නියගේ ශාප මෝක්ෂය	33–34
	මිථිලා පුරයට පැමිණීම	35–37
	ධනුර්භඞ්ගය	38–46
	සීතා විවාහය	47–48
	දශරථ රජතුමා වෙත දූතයන් යැවීම	49

පිටු		ශ්ලෝක
	දෙපස නෑයන් එක් ව කළ විවාහ මඞ්ගලය	50–56
	පෙරළා අයෝධ්‍යාව බලා පිටත්වීම	57
	පරශුරාම විජය	58–91
	රාම කුමරු සිය නුවරට යාම	92–93

356–382 මාදශ සර්ගය. ශ්ලෝක 104

	දශරථ රජුගේ අවසාන කාලය	1–2
	රාමාභිෂේකාරම්භය	3–4
	කෛකේයී බිසවගේ වරය	5–6
	රාමකුමරුගේ වන ගමනය	7–9
	දශරථ මරණය	10–11
	භරතාගමනය	12–13
	භරත කුමරු රාම කුමරු සොයා ගොස් රාජ්‍යය පැවරීම	14–15
	රාම රාජ්‍යය ප්‍රතික්ෂේප කිරීම හා පාදුකාභිෂේකය	17–19
	රාමකුමරුගේ වනවාස වර්ණනය	20–27
	විරාධ නම් රාක්ෂසයා නැසීම	28–30
	පඤ්ච වටියෙහි විසීම	31
	ශූර්පනඛා වධය	32–40
	ඛරදූෂණාදීන් හා යුද්ධය	41–50
	රාවණ රජුට දැන්වීම	51–52
	රාවණා සීතාව පැහැරගෙන යාම	53–54
	සීතා සෙවීම	55–59
	හනුමත්හුගේ ලඞ්කා ගමන	60–66
	රාම–රාවණ යුද්ධය	67–101
	රාවණ පරාජය හා රාමගේ සපුරාභිගමනය	102–104

383–412 ත්‍රයෝදශ සර්ගය. ශ්ලෝක 79

	රාමකුමරු රාවණගේ පුෂ්පක නම් අකාශ යානයෙන් යාම	1
	මාගී වර්ණනය (2–67)	
	සමුද්‍ර වර්ණනය	2–18
	ආකාශ ,,	19–21
	ජනස්ථාන ,,	22–23
	වන ,,	24–29

පිටු		ශ්ලෝක
	පම්පා තඩාග වර්ණනය	30–32
	ගෝදාවරී ,,	33
	පඤ්චවටී ,,	34–35
	අගස්ත්‍යාශ්‍රම ,,	36–37
	පඤ්චාප්සර ,,	38–40
	සුතීක්ෂ්ණ මුනි ,,	41–44
	ශරභඞ්ග මුනිහුගේ තපෝවනය	45–46
	චිත්‍රකූට වර්ණනය	47
	මන්දාකිනී වර්ණනය	48–49
	අත්‍රිමුනිහුගේ තපෝවන වර්ණනය	50–53
	ප්‍රයාග (=ගඞ්ගා යමුනා එක් වූ තැන) වර්ණනය	54–58
	ගුහපුර (=ශෘඞ්ගිවේර පුර) ,,	59
	මානස (=අනෝතත්ත) විල ,,	60
	සරභූ (=ශරයූ) නදිය ,,	61–63
	භරතාභිගමන ,,	64–68
	රාම කුමරුන් පිළිගැනීම ,,	69–73
	නුවරට යෑම ,,	74–79

412–445 චතුර්දශ සර්ගය. ශ්ලෝක. 87

ඥති සමාගමය	1–6
රාමාභිෂේකය	7–10
පුරප්‍රවේශ වර්ණනය	11–17
මඞ්ගල ප්‍රීතිය	18–20
රාම රාජ්‍යශ්‍රී වර්ණනය	21–25
සීතාගේ දෙළදුක	26–29
පුරවැසියන්ගේ නිගුව	30–35
සීතාව වනයට යැවීම	36–53
සීතා විලාපය	54–68
වාල්මීකි මුනිහුගේ පැමිණීම	69–71
සීතාගේ තපෝවන වාසය	72–82
රාම රජුගේ එකලා වාසය	83–87

446–474 පඤ්චදශ සර්ගය. ශ්ලෝක 103

ලවණාසුර පීඩාව	1–5
ශත්‍රුඝ කුමාරයා යුද පිණිස යැවීම	6–11

පිටු		ශ්ලෝක
	කුශ ලවොත්පත්තිය	12–13
	ලවණාසුර වධය	14–25
	මථුරාපුර නිර්මාණය	26–30
	කුශ ලව දෙදෙනාගේ වර්ධනය	31–34
	ශත්‍රුඝ්නාති සුබාහු දෙදෙනා	35–36
	ශත්‍රුඝ්න කුමරු පෙරළා ඒම	37–41
	රාම රජුගේ මාර විජය	42–53
	අගස්ති මුනිහුගේ ගෞරවය	54–56
	මළ පුතුට පණ දුන් බැවින් පිය බමුණුගේ ප්‍රශංසා	57
	රාම රජුගේ යාග ක්‍රියා	58–62
	කුශ ලව කුමරුන් රජු වෙත පැමිණීම	63–69
	වාල්මීකි කිවිඳුට රාජ්‍යය පිදීම	70
	මුනිවචනයෙන් සීතාදේවිය නැවත රජුට පාවාදීම	71–80
	සීතාවගේ සත්‍යක්‍රියාව	81–84
	මිහිකත සීතාදෙවිය ගෙන යාම	85–86
	භරත කුමරුගේ ගන්ධර්ව විජය	87–88
	තක්ෂ පුෂ්කල දෙදෙන	89
	අඟදත චන්ද්‍රකේතු දෙදෙන	90
	මාරයාගේ ආරාධනය	92–93
	ලක්ෂ්මණගේ දේහත්‍යාගය	94–96
	කුශ ලව දෙදෙනාගේ අභිෂේකය	97
	රාම රජුගේ සවර්ගාරෝහණය	98–103

475–511 මහාඩඹ සඟිය ශ්ලෝක 88

	රඝුවංශජ කුමරුන් අටදෙන	1–3
	අයෝධ්‍යාපුරාධිදේවතාවා කුශරජු කරා යැම	4–9
	ජනශූන්‍ය වූ අයෝධ්‍යා වර්ණනය	10–21
	කුශරජුගේ අයෝධ්‍යා ගමන	22–25
	සේනාවගේ ගමන් වර්ණනය	26–34
	අයෝධ්‍යා නගර ප්‍රතිසංස්කරණය	35–39
	නගර ප්‍රවේශ මඬලය	40–42
	ග්‍රීෂ්ම ඍතු වර්ණනය	43–53
	සලිල ක්‍රීඩා වර්ණනය	54–71
	කුශ රජුගේ ජෛත්‍රාභරණය නැතිවීම	72–76

පිටු		ශ්ලෝක
	නාරජු හා යුද්ධාරම්භය	77–78
	කුමුදවතී නම් නාග කන්‍යාව ලැබීම	79–85
	කුමුදවතී විවාහය	86–88

512–537 සප්තදශ සර්ගය. ශ්ලෝක 81

	අනිල කුමාරෝත්පත්තිය	1–4
	දුර්ජය හා යුද්ධය හා රජුගේ මරණය	5
	කුමුදවතී දේවියගේ මරණය	6–7
	අනිල කුමාරයාගේ රාජ්‍යාභිෂේක වර්ණනය	8–26
	රාජසභා ගමනය	27–31
	රාජ්‍ය වර්ණනය	32–81

538–561 අෂ්ටාදශ සර්ගය. ශ්ලෝක 53

	නිෂධ කුමාර වර්ණනා	1–2
	අනිල රජුගේ මරණය	3
	නිෂධ රජ	4
	නල ,,	5
	නභස ,,	6
	පුණ්ඩරීක ,,	8
	ක්ෂේමධන්‍ව ,,	9
	දේවානීක ,,	10–12
	අහීනගු ,,	13–15
	පාරියාත්‍ර ,,	16
	ශිල ,,	17–19
	උත්තරාභ ,,	20
	වජ්‍රණාභ ,,	21
	ශංඛණ ,,	22
	ව්‍යුෂිතාශ්ව ,,	23
	විශ්වසහ ,,	24
	හිරණ්‍යනාභ ,,	25–26
	කෞශල්‍ය ,,	27
	බ්‍රහ්මිෂ්ඨ ,,	28–29
	පුත්‍ර ,,	30–31
	පුෂ්‍ය ,,	32–33

පිටු		ශ්ලෝක
	ඛ්‍රැවසඤ්ඣි රජ	34
	සුදර්ශන කුමාරයාගේ බාල්‍යය	35
	සුදර්ශන කුමාරයා රජවීම	36
	බාලවයසක සුදර්ශන රජතුමාගේ රාජ්‍ය වර්ණනය	37–53

562–586 එකොනවිංශති සර්ගය ශ්ලෝක 57

	අග්නිවර්ණ රජුගේ රාජ්‍යාභිෂේකය	1
	සුදර්ශන රජු තපස් රැකීම	2
	අග්නිවර්ණ රජුගේ රාජ්‍ය සුඛය	3–8
	ඔහු කාමයෙන් මත් වූ පරිදි	9–15
	ශෘඞ්ගාරවේෂ්ටා වර්ණනය	16–36
	වර්ෂා ඍතු වර්ණනය	37–38
	ශරද් ,,	39–40
	හෙමන්ත ,,	41
	ශිශිර ,,	42
	වසන්ත ,,	43–44
	ග්‍රීෂ්ම ,,	45–46
	ක්ෂයරෝගය වැලඳීම	47–48
	අග්නිවර්ණ රජුගේ මරණය	49–53
	අග්නිවර්ණ මෙහෙසිය රාජ්‍යයට පැමිණීම	54–57

ශ්‍රීමත් කාලිදාස මහා කවිහු විසින් ශ්ලෝක
එක්දහස් පන්සිය සඅැත්තැවෙකින්

වි ර චි ත

රඝුවංශ මහා කාව්‍යය මෙතෙකින්

ස මා පත සි.

රඝුවංශම්.

වාගර්ථාවිව සම්පෘක්තෞ වාගර්ථප්‍රතිපත්තයෙ
ජගතඃ පිතරෞ වන්දෙ පාර්වතීපරමෙශ්වරෞ.

සමරදිවාකරව්‍යාඛ්‍යානය.

නමඃ ශ්‍රීඝනාඝ.

ආශංසෙ ජගදඝංඝ්‍යං ශ්‍රීඝනස්‍ය වචෝ'මෘතම්
සුධානිධිරිවාහාද්‍යෙ රඝුවංශපයොනිධෙඃ.

ආශංසෙ තදනුධ්‍යානසමහවං බුධ්වෙහවම්
ප්‍රත්‍යුහව්‍යුහරහිතමිහිතඤ්ච තදඛිලම්.

ආශංසු රඝුවංශ්‍යාං විවෘතිං භාෂයා ඔජයා
මනාමනාත්‍රිකුලොත්තංඝඃ සමරාදිදිවාකරඃ.

සිංහලකවිශිරොමණි ශ්‍රීකාලිදාසමහාකවිහු ආලඞ්කාරිකයන්ගේ "කාව්‍යං යශසෙ'ර්ථකෘතෙ ව්‍යවහාරවිදෙ ශිවෙතරක්ෂතයෙ" යනාදි වචනප්‍රාමාණ්‍යයෙන් කාව්‍යයාගේ අනෙකඋත්තෘයඃසාධනත්ව යද "කාව්‍යාලාපාංශ්ච වර්ජ්‍යයෙත්" යන නිෂෙධ්‍යාගේ අසත්කාව්‍ය විෂයකත්වයද දක්නානු රඝුවංශාඛ්‍ය මහාකාව්‍යයක් කවැවිවූවෝ විකිර්ෂිත අර්ථයාගේ අව්ඝනපරිසමාප්තිය හා සම්ප්‍රදායයාගේ අව්ඝවභදත්වද යන ඵලයන්ට සාධනවූ විශිෂ්ට ඉෂ්ටදෙවතානමස්කාරය ශිෂ්ටාචාරවත්වයෙන් පැමිණිබැවින්ද "ආශීර්නමස්ක්‍රියා වස්තු නිර්දෙශො වාපිතන්නමුඛම්" යි ආශීර්වාදදින් අතුරෙහි අන්‍යතමයක් ප්‍රබන්ධමුඛ ලක්ෂණවත්තබැවින්ද කාව්‍යනිර්මාණය තමා විශිෂ්ට ශබ්දර්ථියන්ගේ අවබොධමූලකබැවින්ද, ඒ විශිෂ්ට ශබ්දර්ථිදෙදෙනාත්-

"ශබ්දජාතමශෙෂතතු ඛත්තෙන ශර්ව්‍ය වල්ලභා
අර්ථරූපං යදඛිලං ඛත්තෙන මුණිපුඞ්ගවඃ" යි-

වායුපුරාණසංගීතාවවනබලයෙන් උමා මෙහෙසුරු දෙදෙනහට අයත්බැව් පැහැදහෙයින්ද, ශබ්දර්ථී දෙදෙනාගේ අවබොධය කැමැත්තෙන් "වාගර්ථාවිව" යනාදින් ඒ ඉෂ්ටදෙවතාවන් මැ අභිවාදනය කළහ.

"පදච්ඡේදඃ පදාර්ථොක්තිර්විග්‍රහො වාක්‍යයොජනා
ආක්ෂේපෙ'ථ සමාධානං ව්‍යාඛ්‍යානං පඤ්චලක්ෂණම්"

යනු ප්‍රාචීනාචාර්‍යසම්මතහෙයින් යථොක්ත පරිපාටින් මෙහි ව්‍යාඛ්‍යානය දක්වනුලැබේ.

වාගර්‍ථාවිව, යනු ලුප්තවිභක්‍යාඛ්‍යාතත්ව සමාසනාමපදය; සම්පෘක්තෙන, යනු විභක්‍යාඛ්‍යාතත්ව කෘදන්තනාමපදය; වාගර්‍ථප්‍රතිපත්තයෙ, යනු චතුර්‍ථ්‍යන්තත්ව සමාසනාමපදය; ජගතඃ, යනු ෂෂ්ඨ්‍යන්තත්ව කෘදන්තනාමපදය; පිතරෞ, යනු විභක්‍යාඛ්‍යාතත්ව සමාසනාමපදය; වන්දෙ, යනු වර්‍තමාන කාලික කර්‍තෘකාරක ආත්මනෙපද උත්තමපුරුෂෛකවචනාන්ත සකර්මක ආඛ්‍යාත ක්‍රියාපදය; පාර්‍වතීපරමෙශ්වරෞ, යනු විභක්‍යාඛ්‍යාතත්ව සමාසනාමපදය; යනු මෙහි පදච්ඡේදයි.

"අහම් පාර්‍වතීපරමෙශ්වරෞ වන්දෙ" යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි.

1. වාගර්‍ථාවිව, ශබ්දාර්‍ථදෙදෙන මෙන්; සම්පෘක්තෙන, නිත්‍ය යෙන් සම්බන්ධවූ; ජගතඃ, ලොකයාහට; පිතරෞ, මව්පියවූ; පාර්‍වතී පරමෙශ්වරෞ, උමා මෙහෙසුරු දෙදෙනා; වාගර්‍ථප්‍රතිපත්තයෙ, ශබ්ද අර්‍ථ දෙදෙනාගේ සුන්දරාවබොධය පිණිස; (අහම්, මම;) වන්දෙ, වඳිමි-යනු මෙහි පදාර්‍ථයි.

වාක් ච අර්‍ථශ්ච වාගර්‍ථෞ, ඉතරෙතරයොගවන්ත්වසමාසඃ, තෞ ඉව වාගර්‍ථාවිව, අව්‍යයීභාවඃ, "ඉවෙන සමාසො විභක්තිය ලොපශ්ච"නි වාර්‍තිකානනිත්‍යසමාසඃ. *සං සුෂ්ඨු පෘඛක්තඃ යුඛක්ත ඉති සම්පෘක්තෙන, තෙන, සම්පූර්‍වාත් 'පෘච-සම්පර්‍කී' ඉත්‍ය සමාත් කර්‍තරි ක්තඃ, වාක් ච අර්‍ථශ්ච වාගර්‍ථෞ; තයොඃ ප්‍රතිපත්තිඃ වාගර්‍ථප්‍රතිපත්තිඃ, තස්‍යෛ, වර්‍ණගතිතත්පුරුෂඃ. ගච්ඡති ප්‍රලය මිති ජගත්, තස්‍ය, 'ගම්ෘ-ගතා'විත්‍යසමාත් කර්‍තරි ක්විප්. මාතා ච පිතා ච පිතරෞ, තෞ, එකශෙෂවන්ත්වඃ. පර්‍වතස්‍යාපත්‍යං ස්ත්‍රී පාර්‍වතී, පරමශ්චාසාවීශ්වරශ්චෙති පරමෙශ්වරඃ, පාර්‍වතී ච පරමෙශ්වරශ්ච පාර්‍වතීපරමෙශ්වරෞ, තෞ, ඉතරෙතරයොගවන්ත්වඃ-යනු මෙහි විග්‍රහයි.

අහම් වාගර්‍ථාවිව සම්පෘක්තෙන ජගතඃ පිතරෞ පාර්‍වතීපර මෙශ්වරෞ වාගර්‍ථප්‍රතිපත්තයෙ වන්දෙ-යනු මෙහි වාක්‍යයොජනායි.

* "අයම්පි සමාසඃ පූර්‍වවත් කර්‍මධාරය එව" ඕ. කොෂ. ටී.

2 ක්ව සූර්‍යප්‍රභවෝ වංශඃ ක්ව චාල්පවිෂයා මතිඃ|
තිතීර්ෂුර්දුස්තරං මෝහාදුඩුපේනාස්මි සාගරම්.

චණ්ඩෝ, කඃ? අහම්. කෝ? පාණිනිපරමේශ්වරෝ. කථම්භූතෝ? සම්පූර්ණකලාපඃ. කාව්‍යේ? වාගර්ථාවිව. පුනඃ කීදෘග්භූතෝ? පිතරෝ. කස්‍ය? ජගතඃ. කස්‍යෛ? වාගර්ථප්‍රතිපත්තයේ-ඒතු මෙසි ආක්ෂේප සමාධාන සඞ්ඛ්‍යාත වොදනා පරිහාරයි.

මෙහි උමා මහේස්වරු දෙදෙනාගේ නිත්‍යසම්බන්ධත්වයට උපමා නත්වයෙන් වාගර්ථ දෙදෙන ගන්නාලදහ. "නිත්‍යඃ ශබ්දඃ ඒ සම්බන්ධඃ" යන මීමාංසක තාර්කිකවචනය ඊට සාධකයි. පර මෙශ්වරතාමයෙහි පරමශබ්දය සම්‍යොත්තමත්වදේශනය පිණිසයි. මෙහි උපමාලඞ්කාරය සප්‍රථමයි. කාලිදාසොකතකාව්‍යාදියෙහි මේ අලඞ්කාරය බොහෝසෙයින් පවත්නේ වේ. "වාගර්ථා" යි හුදෙවනාකවූ සර්ගුරුමයවූ මහණියාගේ ප්‍රයොගයෙන් මෙහි ගුහ ලාභය ප්‍රකාශ වේ. හේ කියනලදමැයි. "ගුහදේ මෝ භූම්මයඃ" යි. වකාරය අමෘතබීජ හෙයින් අභිවෘඞ්සිඞ්ය වේ.

ඉක්බිති කවිහු සවාහඞ්කාරය දුරුකරන්නෝ "ක්ව සූර්‍ය්‍ය" යනාදි ශ්ලෝකවය කියත්.

2. සූර්‍යප්‍රභවඃ, සූර්‍ය්‍යයා ප්‍රභවකොටඇති හෙවත් සූර්‍ය්‍යයාගෙන් හටගත්තාවූ; වංශඃ, වංශයතෙම; (සූර්‍ය්‍යවංශය;) ක්ව, කොතැන් හිද? අල්පවිෂයා, සවල්පවස්තුවක් විෂයකොට ඇති; මතිඃ, (මාගේ) ප්‍රඥතොමෝ; ක්ව ච, කොතැන්හිද? (මේ දෙදෙනාගේ අතර ඉතා මහතැයි සේයි ඒ එසේමැයි) දුස්තරම්, දුකසේ තරණය කට යුතුවූ හෙවත් තරණය නොකටහැකිවූ; සාගරම්, සයුර; මෝහාත්, නොදැන්ම හෙතුකොටගෙන; උඩුපෙන, පසුරෙකින් හෝ සමින් වෙළෑ පානපාත්‍රයෙකින්; තිතීර්ෂුඃ අස්මි, තරණය කරනු කැමැත්තෙක් වෙමි.

මෙහි ක්ව ශබ්දයෝ දෙදෙන මහදනන්තරයක් ප්‍රකාශ කෙරෙන්. සූර්‍ය්‍යවංශය ආකලනය කළ නොහැක්කෙමි යන අර්ථයි. මුළු සූර්‍ය්‍ය වංශවිෂයක ප්‍රබන්ධනිරූපණය දුරුකරනලද්දේය යනුද හඟවයි. මේ වංශොත්කීර්තනය යවකියය ප්‍රබන්ධයාගේ මහත්වය පිණිසමයි. කියනලදමැයි.

"ප්‍රතිපාද්‍යමහිමත්වා ව ප්‍රබන්ධෝ හි මහත්තරඃ" යි. ප්‍රතිපාද්‍ය යාගේ මහත්වයෙහුදු ප්‍රබන්ධයතෙම මහත්තර වේ.

3. මන්දඃ කවියශඃප්රාර්ථී ගමිෂ්‍යාම්‍යුපහාස්‍යතාම්
ප්‍රාංශුලභ්‍යෙ ඵලෙ ලොභාදුද්බාහුරිව වාමනඃ.

4. අථවා කෘතවාග්ද්වාරෙ වංශෙ‘ස්මින් පූර්වසූරිභිඃ
මණෞ වජ්‍රසමුත්කීර්ණෙ සූත්‍රස්‍යෙවාස්ති මෙ ගතිඃ.

5. සෝ‘හමාජන්මශුද්ධානාමාඵලොදයකර්මණාම්
ආසමුද්‍රක්ෂිතීශානාමානාකරථවර්ත්මනාම්.

---

3. මන්දඃ, අඥතාවූ; කවියශඃප්රාර්ථී, (එතෙකුදු වුවත්) කවීන්විසින් ලැබියයුතු යසස ප්‍රාර්ථනා කරනසුලුවූ; [අහම්, මම;] ප්‍රාංශුලභ්‍යෙ, උස්පුරුෂයකු විසින් නෙලා ගතයුතුවූ; ඵලෙ, ඵලවිෂයෙහි; ලොභාත්, ලොභය හෙතුකොටගෙන; උද්බාහුඃ, ඔසවනලද අත්ඇති; වාමනඃ ඉව, මිටි පුරුෂයකු මෙන්; උපහාස්‍යතාම්, ගැරහුම්සිනා කටයුතු බවට; ගමිෂ්‍යාම්, පැමිණෙන්නෙමි.

මෙහි "කවියශඃප්‍රෙප්සුඃ" සිද "ප්‍රාංශුලමෙය" සිද පාඨාන්තර පැනේ.

"අඥතයෙහි නම් එසේකලැ මේ ප්‍රයත්නය හරිනු ලැබේව"යි යන ආශංසාපයට් පරිහාර දක්වන්නෝ "අථවා" යනාදිය කියත්.

4. අථවා, එසේද වුවත්; පූර්වසූරිභිඃ, (වාල්මීකාදි) පෙර කිවිවර යන් විසින්; කෘතවාග්ද්වාරෙ, කරනලද වචන කවැසි දොරටුඇති; අස්මින්වංශෙ, මේ සූර්‍යවංශයෙහි; වජ්‍රසමුත්කීර්ණෙ, වජ්‍රයෙන් නෙවත් මැණික් විදිනා හිදිවෙසෙසින් විදිනලද්දාවූ; මණෞ, මැණිකෙහි; සූත්‍රස්‍ය ඉව, හුයක්හුගේ මෙන්; මෙ, (කාලිදාසනම් ලද) මාගේ; ගතිඃ, ඥානගතියක්; අස්ති, ඇත්තීය. (වර්ණනීයවූ රඝුවංශයෙහි මාගේ වාක්ප්‍රසරයෙක් ඇත්තේයයි සේයි.)

මෙසේ රඝුවංශකථනයෙහි ලබනලද ශ්‍රවෙශ ඇතිවැ තවණි නාව ප්‍රතිඥ කරන්නාහු "සෝ 'හම්" යනාදි පස්කවක් කුලක යෙන් කියත්.

5. සඃ අහම්, (කාලිදාසනම්වූ) ඒ මම; ආජන්මශුද්ධානාම්, (නිශෙකාදිසංස්කාර විසින්) උත්පත්තියෙහි පවන් පිරිසුදුවූ; ආඵලොදයකර්මණාම්, ඵලප්‍රාප්තිය දක්වා කරන කටයුතු ඇත්නාවූ; හෙවත් පවන්නත් කටයුත්තෙහි කෙළවරට පැමිණෙන්නාවූ; ආසමුද්‍රක්ෂිතීශානාම්, මුනුදු අවසන්කොට ඇති පොළොවට අධිපතිවූ; හෙවත් සක්විතිරාජ්‍යය කළාවූ; ආනාකරථවර්ත්මනාම්, දෙව්ලොව දක්වා පවත්නා රථමාර්ග ඇත්තාවූ; හෙවත් ඉන්ද්‍රයා හා සහවාරිවූ-

ආ ජන්මනඃ ආජන්ම, ආජන්ම ශුද්ධඃ ආජන්මශුද්ධඃ සෙනාම්. අව්‍යයීභාවගර්භී තත්පුරුෂයි. "ආඵලොදයකර්මණාම්" යනාදියද මෙසේමැයි.

6. යථාවිධිහුතාග්නීනාං යථාකාමාර්චිතාර්ථිනාම්
යථාපරාධදණ්ඩානාං යථාකාලප්‍රබෝධිනාම්.

7. ත්‍යාගාය සම්භෘතාර්ථානාං සත්‍යාය මිතභාෂිණාම්
යශසෙ විජිගීෂූණාං ප්‍රජායෛ ගෘහමෙධිනාම්.

8. ශෛශවෙ'භ්‍යස්තවිද්‍යානාං යෞවනෙ විෂයෛෂිණාම්
වාර්ධකෙ මුනිවෘත්තීනාං යොගෙනාන්තෙ තනුත්‍යජාම්.

---

6. යථාවිධි, විධිවූපරිද්දෙන්; හුතාග්නීනාම්, (ඍතාදිප්‍රක්ෂෙප යෙහි දෙව්‍යන් උදෙසා) පුදනලද ගිනි ඇත්තාවූ; යථාකාම, කැමැති පරිද්දෙන්; අර්චිතාර්ථිනාම්, පුදනලද හෝ සතුටු කරන ලද යාචකයන් ඇත්තාවූ; යථාපරාධ, අපරාධයට සුදුසුවූ; දණ්ඩානාම්, දඬුවම් ඇත්තාවූ; යථාකාල, සුදුසුකාලයෙහි; ප්‍රබොධිතාම්, පිබුදිනසුලුවූ-

මේහි විශෙෂණ සතරින් දෙවියන් පිදීමත්, ආගන්තුක සත්කාරත්, දණ්ඩධරත්වත්, ප්‍රජාපාලනත් සඳහා සමයජාගරූකත්වය යනාදිහු විවක්ෂිතයහ.

විධිමනසික්‍රම්‍ය යථාවිධි, යථාවිධි හුතා අග්නයෝ යෙනෙති. අව්‍යයීභාවගර්භ බහුව්‍රීහියි. සෙස්සද මෙසේමැයි.

7. ත්‍යාගාය, (සත්පාත්‍රයෙහි) පරිත්‍යාගය පිණිස; සම්භෘතාර්ථානාම්, රැස්කරනලද ධන ඇත්තාවූ; (දුසිරි පිණිස නොවෙයි සේයි.) සත්‍යාය, සබවස පිණිස; මිතභාෂිණාම්, ප්‍රමාණවවත කියනසුලුවූ; (පිරිහෙළුම් පිණිස නොවෙයි සේයි.) යශසෙ, කීර්තිය පිණිස; විජිගීෂූණාම්, දිනනුකැමැතිවූ; (ධන රැස්කිරීම පිණිස නොවෙයි සේයි) ප්‍රජායෛ, දුදරුවන්ගෙයා පිණිස හෙවත් වංශසථිතිය පිණිස; ගෘහමෙධිනාම්, ඉරපරිග්‍රහය කරනසුලුවූ; (කම්සැප පිණිස නොවෙයි සේයි)-

ගෘහෙර්දුරෙෘමේධනෙන සඛාවහතත ඉති ගෘහමෙධිතෘ- "මෙධෘ-සඛාමේ" යන ධාතුහු කෙරෙන් ගිලාපිමයෙහි ණිනිප්‍රත්‍යයයි. මෙහි "ත්‍යාගාය" යනාදි විශෙෂණයන් කරණකොට්ගෙන පරොපකාරිත්වය, සත්‍යවාදිත්වය, කීර්තිකාමිත්වය, පිතෘණශුද්ධිය යන ගුණයෝ විවක්ෂිතයහ.

8. ශෛශවෙ, බාල්‍යයෙහි; අභ්‍යස්තවිද්‍යානාම්, පුරුදුකළ විද්‍ය ඇත්තාවූ; යෞවනෙ, යොවුන්වියෙහි; විෂයෛෂිණාම්, කම්සැප කැමැතිවූ; වාර්ධකෙ, වෘද්ධාවස්ථායෙහි; මුනිවෘත්තීනාම්, මුනීන්ට බදු පැවතුම් ඇත්තාවූ හෙවත් වනෙසනසුන් ඇසුරු කරනසුලුවූ;

9. රඝූණාමන්වයං වක්ෂ්‍යේ නනුවාගවිභවෝ'පි සන්
තදගුණෛඃ කර්ණමාගත්‍ය චාපලාය ප්‍රණෝදිතඃ.

10. තං සන්තඃ ශ්‍රෝතුමර්හන්ති සදසව්‍යක්තිහේතවඃ
හේමඃ සංලක්ෂ්‍යතේ හ්‍යග්නෞ විශුද්ධිඃ ශ්‍යාමිකාපි වා.

අනෙක, අවසන්හි; (මරණකාලය එළඹසිටිකල්හි); යොගෙන, පරමාත්මධ්‍යානයෙන්; තනුත්‍යජාම්, දෙහත්‍යාගය කරනසුලුවූ-

මෙහි විශෙෂණචතුෂ්ටයෙන් යථාක්‍රමයෙන් බ්‍රහ්මචාරි, ගෘහස්ථ, වානප්‍රස්ථ, භික්ෂු යන චතුරාශ්‍රමය විවක්ෂිතයි.

ශිශොර්වඃ ශෛශවම්, යූනො භාවෝ යෞවනම්, වෘද්ධස්‍ය භාවොවාර්ධකම්, යි තඩිතවාක්‍යද-මුනීනාංවෘත්තිරිවවෘත්තිර්යේෂාං තෙ මුනිවෘත්තඃ යි සමාසවාක්‍යද ගතයුතු.

9. රඝූණාම්, රඝුරජුන්ගේ; අන්වයම්, වංශය හෙවත් තච්ඡාස්ත්‍ර ප්‍රබන්ධය; තනුවාග්විභවඃ සන් අපි, සවලපවූ වාක්සම්පත්තිඇත් තෙම් නමුදු; තදගුණෛඃ, ඔවුන්ගේ (ආජානමගුඩ්‍යාදි) ගුණයන් විසින්; කර්ණම්, (මාගේ) කන්පල; ආගත්‍ය, අවුත්; චාපලාය, (නො විමසා කරන සුලුවූ) චපලකර්මය කරනුපිණිස; හෙවත් තද්විෂයක ප්‍රබන්ධසම්පාදනය පිණිස; ප්‍රණෝදිතඃ, * මෙහෙයන්නලද්දෙම්; වක්ෂ්‍ය, කියම්.

"රඝූණාම්" යන්නෙහි ලක්ෂණයෙන් උකාරාදි ඇතිහෙයින් අපත්‍ය ප්‍රත්‍යය නොවී. එම කීහු භට්ටොජිදීක්ෂිතයෝ "රඝ්වාදු ශබ්දයොස්තාද පත්‍යෙ ලක්ෂණ්‍යා"යි.

දැන් සවකීය ප්‍රබන්ධයාගේ ගුණදොෂපරීක්ෂණය පිණිස පණ්ඩිතයන් අයදනාහු "තං සන්තඃ" යනාදිය කියත්.

10. තම්, ඒ රඝුවංශාඛ්‍ය ප්‍රබන්ධය; ශ්‍රොතුම්, අසන්නට; සදස ව්‍යක්තිහේතවඃ, ගුණදොෂ ප්‍රකාශයට කතීවූ හෙවත් යහපත අයහපත වෙන්කිරීමෙහිලා විචාරබුද්ධිමත්වූ; සන්තඃ, පණ්ඩිතයෝ; අර්හන්ති, සුදුසුවෙත්; හි, ඒ එසේමැයි; හෙමඃ, සවර්ණයාගේ; විශුද්ධිඃ, පිරිසිදු බව හෝ; ශ්‍යාමිකාපිවා, [ලොහාන්තර සංසර්ගයෙන් හටගත්] කාලුෂ්‍යය හෝ; අග්නෞ, ගින්නෙහිලා; සංලක්ෂ්‍යතෙ, දන්නාලැබේ. (එපරිද්දෙන් මෙහිදු පණ්ඩිතයෝම ගුණදොස් වෙන්කිරීමෙහි අධිකාරිහු වෙති අන්‍යයෝ නොවෙතියි සේයි.)

දැන් වර්ණනීය වස්තුව උපක්ෂෙප කරන්නාහු "වෛවස්වතඃ" යනාදිය කියත්.

---

* "ප්‍රණොදිතඃ"-යිද "ප්‍රතාරිතඃ"යිද පාඨයි.

11. වෛවස්වතෝ මනුර්නාම මානනීයෝ මනීෂිණාම්
ආසීන්මහීක්ෂිතාමාද්යඃ ප්රණවශ්ඡන්දසාමිව.

12. තදන්වයේ ශුද්ධිමති ප්රසූතඃ ශුද්ධිමත්තරඃ
දිලීප ඉති රාජේන්දුරින්දුඃ ක්ෂීරනිධාවිව.

13. ව්යූඩෝරස්කෝ වෘෂස්කන්ධඃ ශාලප්රාංශුර්මහාභුජඃ
ආත්මකර්මක්ෂමං දේහං ක්ෂාත්රෝ ධර්ම ඉවාශ්රිතඃ.

14. සර්වාතිරික්තසාරේණ සර්වතේජෝ'භිභාවිනා
සර්පතඃ සර්වෝන්නතෙනෝර්වීං ක්රාන්තා මේරුරිවාත්මනා.

---

11. මනීෂිණාම්, පණ්ඩිතයන් විසින්; මාන්‍යඃ, බුහුමන්කට යුතුවූ; ඡන්දසාම්, වේදයන්ට; ප්‍රණවඃ ඉව, ඕංකාරය මෙන්; මහීක්ෂිතාම්, පෘථිවීශ්වරයන්ට; ආද්‍යඃ, පළමුවෙනිවූ; වෛවස්වතඃ නාම, (සූර්‍යපුත්‍රයෙයින්) වෛවස්වතයයි ප්‍රසිද්ධවූ; මනුඃ, මනුරජතෙම; ආසීත්, වී.

විවස්වතෝ'පත්‍යං පුමාන් වෛවස්වතඃ, ආදෙඃ භව ආද්‍යඃ යනු තද්ධිතවිග්‍රහයි—මහීං ක්ෂිතවන්ති ඊෂත ඉති මහීක්ෂිතඃ, ඒෂාවයවීක්ෂි ධාතුහුකෙරෙන් කර්මප්‍රත්‍යය හා තුගාගමයෙයින් කෘදන්තවිග්‍රහයි.

12. ශුද්ධිමති, පිරිසිදුබවඇත්තාවූ; තදන්වයේ, ඒ (මනුරජහුගේ) වංශයෙහි; ශුද්ධිමත්තරඃ, අතිශයපරිශුද්ධත්වය ඇත්තාවූ; දිලීපඃ ඉති, දිලීපයයි ප්‍රසිද්ධවූ; රාජේන්දුඃ රාජශ්‍රේෂ්ඨයෙක් තෙම; ක්ෂීරනිධෙඃ, කිරිසයුරෙහි; ඉන්දුඃ ඉව, චන්ද්‍රයා මෙන්; ප්‍රසූතඃ, උපන්නේය.

ඉක්බිති දිලීපරජ්ජු වෙසඟනුවෝ "ව්‍යූඪෝරස්කෝ" ත්‍යාදි ශ්ලෝකත්‍රය කියත්.

13. කෙබඳු රාජශ්‍රේෂ්ඨයෙක්ද යත්? ව්‍යූඪෝරස්කඃ, මහත් ළයක් ඇත්තාවූ; වෘෂස්කන්ධඃ, වෘෂභයාක්මට බඳු මහත් සකඹ යක් ඇත්තාවූ; ශාලප්‍රාංශුඃ, සල්රුකක් මෙන් උස්වූ; මහාභුජඃ, මහත්බාහු යුග්මයක් ඇත්තාවූ; ආත්මකර්මක්ෂමම්, සවකීය ව්‍යාපාර යට සුදුසුවූ; දෙහම්, ශරීරයක්; ආශ්‍රිතඃ, ඇසුරුකළාවූ; ක්ෂත්‍රඃ ධර්මඃ ඉව, ක්ෂත්‍රියයන් පිළිබඳ ධර්මයමෙන් හෙවත් මූර්තිමත් පරාක්‍රමය මෙන් (සිටියාවූ)-(මෙහි ඉවශබ්දය උත්ප්‍රේක්ෂාවාචකයකි).

14. සර්වාතිරික්තසාරේණ, සකලභූතයන්ට වඩා අධිකශක්ති ඇත්තාවූ; සර්වතේජෝ'භිභාවිනා, සකලභූතයන් තේජසින් මැඩ පවත්වන සුලුවූ; සර්වෝන්නතෙන, සියල්ලන්ට වඩා උස්වූ; ආත්මනා, ශරීරයෙන්; මේරුඃ ඉව, මහමෙර මෙන්; ඌර්වීම්, පෘථිවිය; ක්‍රාන්තවා, ආක්‍රමණයකොට; සථිතඃ, සිටියාවූ-(මෙහි විශෙෂණයෝ මෙරුව කෙරෙහිදු රජු කෙරෙහිදු තුල්‍යතයෙන් විවක්ෂිත යෝයි).

15. ආකාරසදෘශප්‍රඥඃ ප්‍රඥයා සදෘශාගමඃ
ආගමෛඃ සදෘශාරම්භ ආරම්භඃසදෘශොදයඃ.

16. භීමකාන්තෛර්නෘපගුණෛඃ සබභූවොපජීවිනාම්
අබාඤ්‍යශ්වාභිගම්‍යශ්ච සාදෞරතෛනරිවාණ්ණවඃ.

17. රේඛාමාත්‍රමපි ක්ෂුණ්ණාද් මනොවර්තීම්‍යඃ පරම්
න ව්‍යතීයුඃ ප්‍රජාඤානස්‍ය නිඝනත්වනේමිවෘත්තයඃ.

18. ප්‍රජානාමේව භූත්‍යර්ථං ස තාභ්‍යෝ බලිමග්‍රහීත්
සහස්‍රගුණමුත්ස්‍රෂ්ටුමාදත්තෙ හි රසං රවිඃ.

---

15. ආකාරසදෘශප්‍රඥඃ, ශරීරසංඛ්‍යාත ආකාරය හා සමාන ප්‍රඥ ඇත්තාවූ; ප්‍රඥයා සදෘශාගමඃ, ප්‍රඥව හා සමාන ශාස්ත්‍ර ඉගනීම ඇත්තාවූ; ආගමෛඃ සදෘශ, ශාස්ත්‍ර ඉගනීම හා සමානවූ; ආරම්භඃ, ක්‍රියා ඇත්තාවූ; ආරම්භසදෘශොදයඃ, ක්‍රියාව හා සමාන ඵලසිද්ධි ඇත්තාවූ; (දිලීප ඉති රාජෙන්ද්‍රඃ, දිලීපයයි ප්‍රසිද්ධවූ රාජශ්‍රේෂ්ඨයෙක් තෙම; ප්‍රසූතඃ, උපන්නේය; ඝනු සම්බන්ධ කටයුතුයි).

16. සඃ, ඒ දිලීපරජතෙම්; භීමකාන්තෛඃ, බිහිළුවන්නාවූද මනොඥවූද; නෘපගුණෛඃ, රාජගුණයන් කරණකොටගෙන; උපජීවිනාම්, ඇසුරු කරන්නවුන් විසින්; යාදෘරතෛනඃ, මත්සයන් හා රත්නයන් කරණකොටගෙන; අබ්ධිඃ ඉව, සයුර මෙන්; අබ්‍යශ්ච, මැඩලිය නොනැකියෙක්ද; අභිගම්‍යශ්ච, ආශ්‍රය කටයුත් තෙක්ද; බහුව, ඕ.

මෙහි තෙජඃප්‍රතාපාදි රාජගුණයෝ භීමගුණයෝය. කුලශීල දාක්ෂිණ්‍යාදි ගුණයෝ කාන්තගුණයෝය. සමුද්‍රයාගේ ජලවරත්ව රත්නවිශෙෂයෝද ඒ ගුණයන්ට ක්‍රමයෙන් උපමාන කරන ලදහ.

17. නිඝනත්වඃ, (සඩඝන්) භික්මවන්නාවූ හෝ රථාවාහීවූ; තස්‍ය, ඒ දිලීපරජහුගේ; නෙම්වර්තයඃ, නිම්වළලුවැනි පැවතුම් ඇත්තාවූ; ප්‍රජාඃ, සඩඝයෝ; ආ මනොඃ, මනුරජහු පටන්; ක්ෂුණ්ණාත්, අහාස කරනලද්දාවූ හෝ ප්‍රාප්තවූ; වර්ත්මනඃ, ආචාර පඬතියෙන් හෝ මාර්ගයෙන්; පරම්, ඔබ්බෙහි; රේඛාමාත්‍රම් අපි, රෙඛාවක් පමණකුදු නෙවත් සඩලඝනකුදු; න ව්‍යතීයුඃ, ඉක්ම නොගියහ.

දක්ෂ රථාවාහීයකු විසින් මෙහෙයනලද රථනෙමින් මෙන් ඒ රජුගේ ප්‍රජාවෝද පෙරපුරුදු මාර්ග අත්නොහැරියානුව යනු හාවයි.

18. සඃ, ඒ දිලීපරජතෙම; ප්‍රජානාම්, සඩඝයන්ගේ; භූත්‍යර්ථම් එව, අභිවර්ධිය පිණිසම; තාභ්‍යඃ, ඒ ප්‍රජාවන්ගෙන්; බලිම්, අය (සුංකාම්); අග්‍රහීත්, ගත්තේය; හි, ඒ එසේමැයි; රවිඃ, සූර්‍යතෙම්;

19. සෙනා පරිච්ඡදඤ්ඤස්‍ය යසමෙවාපිසාධනම්
ශාසෙන්‍ද්‍රවකුණ්ඨිතා බුද්ධිර්‍ෆෝඊ ධනුෂි වානතා.

20. තස්‍ය සංවෘතමන්ත්‍රස්‍ය ගූඩාකාරෙඞ්ගිතස්‍ය ච
ඵලානුමෙයාඃ ප්‍රාරම්භාඃ සංස්කාරාඃ ප්‍රාක්තනා ඉව.

21. ජුගොපාත්මානමත්‍රස්තෙ නෙජේ ඛණ්ඩිතාතුරඃ
අගාධත්වාදදෙ සෙ'ථමසක්තඃ සුඛමන්විතුත්.

සහස්‍රගුණම්, දහස්ගුණ කොට හෙවත් දහස්පරිද්දෙකින්; උත් ස්‍රෘවුම්, දෙන්නම; රසම්, ජලය; ආදත්තෙ, ගනී.

පුපොෂ වෘද්ධිං හරිදශ්වදීධිතෙ-
රනුප්‍රවෙශාදිව බාලචන්ද්‍රමාඃ.

(දහනෙකි බදනාලද්දෙක්); න බහුව, නුවුයෙය; [එකෙක් ඇති;] සඃ, ඒ රජතෙම; තදා, එකල්හි; පිතෘණාම්, පියන් සම්බන්ධිවූ; ඍණාභිධානාත්, ණය නමිලද; බන්ධනාත්, බන්ධනයෙන්; කෙවලම්, හුදකලාව; සවයම් එව, තෙමේම; මුමුචෙ, මිදිණි.

"මුමුචෙ" යනු කර්මකර්තෘයෙහි ලිට්ප්‍රයොගයයි.

පිතෘන්ගේ ඍණ මොවතය තම් පුත්‍රොත්පාදනයෑ. මේ අර්ථයෙහි "ඵල වා අනෘණෝ ඍසිපුත්‍රි" යන වෙදවාක්‍යය ප්‍රමාණ වේ.

21. අපිවිත්, ශබ්දඥ දන්නාවූ; පාර්ථිවඃ, (දිලීප) රජතෙම; අස්මිම් අහිකඃ, මේ ළදරුතෙම; ශ්‍රුතස්‍ය, ශාස්ත්‍රයාගේ; අනන්‍යම්, කෙලව රට; යාදෘශාත්, යාහැකි වෙයි; තථා, එසේම; යුධි ච, යුද්ධයෙහිද; පරෙෂාම්, සතුරන්ගේ; [අනන්‍යම් යාදෘශාත්] ඉති, [කෙළවරට යා හැකි වෙයි.] යන හෙතුවෙන්; ධාතොඃ, [ලකි] ධාතුහුගේ; ගම්‍ය මාර්ථම්, ගමනාර්ථය; අවෙක්ෂ්‍ය, බලා; ආත්මසම්භවම්, පුත්‍රයා; නාමනා, නමින්; රඝුර්විචකාර, "රඝු" නම් කෙළේය.

22. සඃ, ඒ රඝුකුමාරතෙම; සම්ග්‍රසම්පදඃ, සියලු සම්පත් ඇත්තාවූ; පිතුඃ, පියරජහුගේ; ප්‍රයත්නාත්, උත්සාහයෙන්; ශුභෙඃ, ශොභනවූ; ශරීරාවයවෛඃ, අඞ්ගප්‍රත්‍යඞ්ගයන් කරණකොටගෙන; දිනෙ දිනෙ, දවසක් පාසා; වෘද්ධිම්, අභිවෘද්ධිය; පුපොෂ, පොෂණය කෙළේය; [කවරක්හු මෙන්ද?] හරිදශ්වදීධිතෙඃ, සූර්‍යරශ්මිහුගේ; අනුප්‍රවෙශාත්, වැදගැන්මෙන්; බාලචන්ද්‍රමාඃ ඉව, [පෙරපස දිනක් පාසා වැඩෙන] තරුණ චන්ද්‍රයා මෙන්.

මෙහි වෙන්‍රාපම්‍යානය වරාහමිහිරාචාර්‍යයන් විසින් කියන ලද ප්‍රකාර ඇත්තේය. වරාහසංහිතායෙහි:—

"සලිලමයෙ ශශිනි රවෙර්දීධිතයෝ මූර්ඡිතාස්තමෝ නෙශම් ක්ෂපයන්ති දර්පණොදරනිහිතා ඉව මන්දිරස්‍යානනඃ"

ජලමයවූ සඳමඬලෙහි හිරුරැස් වැදුණාහු රැ අඳුරු දුරලත්. [කෙසේද?] කැටපත තුළ වැටුණු රශ්මිහු ගෙය තුළ අඳුරු දුරලන්නාක් මෙනි-යනු වරාහසංහිතාවචනාර්ථයි.

23. උමාවෘෂාඞ්කෞ ශරජන්මනා යථා
යථා ජයන්තෙන ශචිපුරන්දරෞ
තථා නෘපඃ සා ච සුතෙන මාගධී
නනන්දතුඃ ෂන්සදෘශෙන නත්සමෞ.

24. රථාඞ්ගනාමෙනාරිව භාවබන්ධනං
බභූව යත් ප්‍රෙම පරස්පරාශ්‍රයම්
විභක්තමප්‍යෙකසුතෙන තත් තයෝඃ
පරස්පරස්‍යොපරි පශ්‍යිවීයත.

---

23. උමාවෘෂාඞ්කෞ, උමා මෙහෙසුරු දෙදෙන; ශරජන්මනා, සඝන්දකුමාරයා කරණකොටගෙන; යථා, යම්සේ; නන්දතුඃ, සතුටු වූවාහුද; ශචිපුරන්දරෞ, ඉන්ද්‍රාණී ශක්‍ර දෙදෙන; ජයන්තෙන, ජයන්ත නම් පුත්‍රයා කරණකොටගෙන; යථා, යම්සේ [සතුටු වූවා හුද]; තථා, එපරිද්දෙන්; නන්දතුඃ, ඒ උමා මෙහෙසුරු දෙදෙනා හාද ඉන්ද්‍රාණී ශක්‍ර දෙදෙනා හාද සමවූ; සා මාගධී, ඒ සුදක්ෂිණා නොමෝද; නෘපඃ, (ඒ) දිලීපරජතෙමේද (ඝන දෙදෙනා); තත් සදෘශෙන, ඒ (සඝන්ද ජයන්ත) දෙදෙනා හා සමානවූ; සුතෙන, (රඝු නම්) පුත්‍රයා කරණකොටගෙන; නන්දතුඃ, සතුටු වූහ.

මෙහි ක්‍රමානත උපමානොපමෙයයන්ගේ වශයෙන් දිලීපරජ හට ඊන්ඛරයාද ශක්‍රයාද සමාන කළහ. සුදක්ෂිණාවට උමාවද ඉන්ද්‍රාණියද සමාන කළහ. රඝුකුමාරයාහට සඳකුමරුද ජයන්ත කුමරුද සමාන කළහු.

24. රථාඞ්ගනාමෙනාඃ ඉව, සක්වාලිඟිණියුවළඟ්හුගේ මෙන්; තයොඃ, ඒ සුදක්ෂිණා දිලීප දෙදෙනාගේ; භාවබන්ධනම්, හෘදයා කර්ෂණය කරන්නාවූ; පරස්පරාශ්‍රයම්, ඔවුනොවුන් ආශ්‍රයකොට ඇති; යත් ප්‍රෙම, යම් ප්‍රෙමයෙක්; බභූව, වීද; තත්, ඒ ප්‍රෙමය; එකසුතෙන, එකම පුත්‍රයා විසින් නොහොත් ඔවුන් කෙරෙන් අන්‍යවූ පුත්‍රයා විසින්; විභක්තම් අපි, බෙදනලදුවත්; පරස්පරස්‍ය උපරි, ඔවුනොවුන් මතුයෙහි; පශ්‍යිවීයත, වැඩුණේය.

යම් වස්තුවක් එකක්ම ආධාරකොට ඇද්ද එය ආධාර දෙකෙක්හි බෙදනු ලබන්නේ අඩු වෙයි. මෙහි වනාහි ඒ අඹුසැමි දෙදෙනාගේ ප්‍රෙමය පළමු එකකතීෘක වැ එකාධාර ඇතිවිය දැන් පුත්‍රනමැති ත්‍රිතීයාධාරයක් ඇතිවුවද අඩු නොවීය. යළි කුමක් වීද යත්? ඔවුනොවුන් කෙරෙහි වැඩුණේමයයි සේයි.

මෙහි චතුර්ථපාදය "පරස්පරස්‍යොපරි භාව්‍යගියත" යි බොහෝ පොත්හි පාඨයි. "පශ්‍යිවීයත" යනු කම්මකතීෘතායෙහි ලිවිරූපයයි. ප්‍රෙමය අකෘත්‍රිම හෙයින් තෙමේම වැඩිණැයි දක්වූහ.

25. උවාච ධාත්‍රයා ප්‍රථමොදිතං වචෝ
සසෞ තදීයාමවලම්බ්‍ය චාඞ්ගුලිම්
අහූචව නම්‍රඃ ප්‍රණිපාතශික්ෂයා
පිතුර්මුදං තෙන තනාන යෝ'භිනඃ.

26. නමඞ්කමාරොප්‍ය ශරීරයොගජෛඃ
සුඛෛර්නිමිත්තස්ඛලනන්මිවාමනං භවේ
උපාන්තසම්මීලිතලොචනෝ නෘප-
ශ්චිරාන් සුතස්පර්ශරසඥතාං යයෞ.

27. අමංසත චානෙන පරාඞ්මුඛජනතා
සපත්නෙරහෙතනා සපිතිමනතමඞ්ගජම්
සඛාමූර්තිභෙදෙන ගුණාග්‍රයවර්තිනා
පතිඃ ප්‍රජානාමිව සර්ගමාතමනඃ.

---

25. සඃ අභීක්ෂඃ, ඒ ළදරු (කුමාර) තෙම්; ධාත්‍රයා, කිරිමව විසින්; ප්‍රථමොදිතම්, පළමුව උගන්වනලද; වචඃ, තෙපුල; උවාච, කියේය; තදීයාම් අඞ්ගුලිම්, ඇයගේ ඇඟිල්ල; අවලම්බ්‍ය, එල්ලගෙන; යයෞ ච, ගියේද විය; ප්‍රණිපාතශික්ෂයා, ප්‍රණාමය ඉගැන්මෙන්; නම්‍රශ්ච අභූත්, නැමුණේද විය [යන යමක් ඇද්ද]; තෙන, එයින්; පිතුඃ, පියහට; මුදම්, සතුට; තනාන, කෙළේය.

මෙහි සඵිවාඃකාරාප්කාරවශයෙන් අනනයෙහි ප්‍රයුක්තවූ "අභීක්ෂඃ" යන්න වකාරයෙන් ඉතරවාක්‍යයන්හිදු පරාමෘෂ්ටයි එහෙයින් වාක්‍යවතුෂ්ටයෙහිම "අභීක්ෂඃ" යනු සවනන්‍රකතීය වේ.

26. ශරීරයොගජෛඃ, සිරුර යෙදීමෙන් වූ; සුඛෛඃ, සැප කරණ කොටගෙන; භවේ, (පියහුගේ) භවිෂ්‍යයෙහි; අමඃතං නිමිත්තවනතම් ඉව, අමා වන්කරන්නකු වැනිවූ; තම්, ඒ පුත්‍රයා; අඞ්කම් ආරොප්‍ය, ඇකයට නංවා; නෘපඃ, රජතෙම; උපාන්තසම්මීලිත ලොචනඃ-උපාන්ත දෙකෙළවරෙහි; සම්මීලිත, [සතුටින්] හකුළුවනලද; ලොචනඃ, ඇස් ඇත්තේ; චිරාන්, බොහෝ කලෙකින්; සුතස්පර්ශි රසඥතාම්, පුත්‍රස්පර්ශරසය දන්නාබවම; යයෞ, පැමිණියේය.

උපාන්තයොඃ සම්මීලිතෙ උපාන්තසම්මීලිතෙ, තථාභූතෙ ලොචනෙ යස්යාසෞ උපාන්තසම්මීලිතලොචනඃ-තත්පුරුෂගර්භ බහුව්‍රීහියි. සුතස්ය ස්පර්ශඃ සුතස්පර්ශඃ, තස්ය රසඃ (ස්වාදඃ) සුතස්පර්ශ රසඃ, තං ජානාතීති සුතස්පර්ශරසඥඃ, තස්ය භාවඃ සුතස්පර්ශරසඥ තා, තාම්-සමාසානෙතාපපද කෘදනතඃ ණකරෙන් තඬිතයි.

27. සපිතෙඃ අභෙතනා, මය්‍යාදුව කොබිදිකාවූ හෙවත් රාජධර්ම රක්නාවූ (ඒ රජ) තෙම්; පරාඞ්මුඛජනතම්ඃ, එතකෘෂ්ට එතපත්‍යා

28. සවෘත්තබාලශ්මශ්රුලකාකපක්ෂකෛ-
රමාත්‍යපුත්‍රෛඃ සවයොභිරන්විතඃ
ලිපෙඃ ශ්‍රුතාවද්ග්‍රහණේන වාඞ්මයං
නදීමුඛේනේව සමුද්‍රමාවිශත්.

29. අථොපනීතං විධිවද්විපශ්චිතෝ
විනීතයුරේණං ගුරවෝ ගුරුප්‍රියම්
අබන්ධ්‍යසන්ධානඵලං බහුවුරත්‍ර තෙ
ක්‍රියා හි වස්තූපනිධා ප්‍රසීදති.

ඇති; ගුණාග්‍රහවතීතිතා, [විදූ විතර්‍කාදි] අග්‍රගුණයෙන් පවත්නාවූ; සවමූර්තිභෙදෙන, සවකීය ප්‍රතිබිම්බවිශෙෂයක්වූ; අනෙන, මේ රඝු කුමාරයා කරණකොටගෙන; අන්වයම්, සවකීය වංශය; සථිතිමත්තම්, පිහිට ඇත්තක්; අමංස්ත ච, සිතුයේත් වී; [කව රක්නු මෙන්ද?] ප්‍රජාපතීඃ, බ්‍රහ්මතෙම; පරාඞ්මුඛජනමනා, [බ්‍රහ්මා යුෂ්මාගේ] චිත්තාඞ්ගෙහි උපපත්ති ඇති; ගුණාග්‍රහවතීතිතා, අග්‍ර ගුණයෙන් හෙවත් සත්ත්වගුණයෙන් පවත්නාවූ; සවමූර්තිභෙදෙන, සවකීය අවතාර විශෙෂයක්වූ (විෂ්ණු) කරණකොටගෙන; ආත්ම නඃ, තමාගේ; සඥාම්, නිර්මාණය; සථිතිමත්තම්, පිහිට ඇත්තක්; අමංස්ත ඉව, සිතුවාක් මෙනි. [යම්සේ බ්‍රහ්මතෙම තමා මැවූ ලොකය විෂ්ණුහුගේ උපතින් පිහිට ඇතිසේ සිතීද එමෙන් දිලීප රජද රඝුකුමාරයාගේ උපතින් තමාගේ රාජ්‍යය පිහිට ඇතිසේ සිතීය යුසේසිි].

28. වෘත්තබාලඃ, [නෘතීය වර්ෂයෙහි] කරනලද සිඵකම් ඇති; සඃ, ඒ රඝුකුමාරතෙම; එලකාකපක්ෂකෛඃ, සැලෙන්නාවූ කුඩිමඬි ඇති; සවයොභිඃ, සනිඹුවූ; අමාත්‍යපුත්‍රෛඃ, ඇමතිපුතුන්ගෙන්; අන්විතඃ, යුක්තවූයේ; ලිපෙඃ,[පඤ්චවර්ෂයෙහි පවාඝවණිණාත්මිකා] මාතෘකාවගේ හෙවත් සොඬිඝගේ; ශ්‍රුතාවද්ග්‍රහණේන, විධිවූ පරිද්දෙන් ඉගනීමෙන්; වාඞ්මයම්, ශාස්ත්‍රයට; ආවිශත්, වනි; [කෙසේද?] නදීමුඛෙන, ගංමුවදොරින්; සමුද්‍රම් [ආවිශත්] ඉව, [මකරාදි කිසිවකු] මුහුදට වන්නාක් මෙහි.

"වෘද්ධා කායස්ථා විප්‍රතීන්නාං සඥේෂාමෙව ධර්‍මිතඃ
ප්‍රථමෝ'ඛේද නෘතීයෙ වා කර්‍තව්‍යා ශ්‍රුතිචොදනාත්"

යනුද-"ප්‍රාථෙන තු පඤ්චමේ වර්ෂේ විද්‍යාරම්භඃ ච කාරයෙත්" යනුද මෙහි ධර්‍මශාස්ත්‍රොක්තියි.

29. අථ, ඉක්බිත්තෙන් හෙවත් උපපත්තියෙන් එකොළොස් වෙනි වර්ෂයෙහි; විධිවත්, වෙදෙකුත පරිද්දෙන්; උපනීතම්, උප නයනය කරනලද්දුවූ; ගුරුප්‍රියම්, ගුරුන්ට ප්‍රියවූ; එනම්, මේ රඝු කුමාරයා; විපශ්චිතඃ, ප්‍රාඥවූ; ගුරවඃ, ආචාර්‍යයෝ; අත්‍ර, මේ රඝු

30. ධියඃ සමග්ර්‍යෝ ස ගුණෛරුදූරධීඃ
ක්‍රමාච්චතස්‍රශ්චතුර ර්‍ණවොපමාඃ .
තතාර විද්‍යාඃ පවනාතිපාතිගි-
දීශො හරිද්භිර්හරිනාම්වෙශ්වරඃ.

31. තවං ස මෙධ්‍යාං පරිධාය රෞරවී-
මශික්ෂතාඃස්ත්‍රං පිතුරෙව මන්ත්‍රවත්
න කෙවලං නද්ගුරුරෙකපාර්ථිවඃ
ක්ෂිතාවහූදෙකධනුර්ධරොලපි සඃ.

කුමරනු කෙරෙනි; අඛණ්ඩාධ්‍යයනනාශව, නොසිස්වූ උත්සාහ ඇත්තෝද; බහුවූඃ, වූහ; හි, ඒ එසේමැයි. වස්තූපහිතා, සුදුස්සකු කෙරෙහි යොදනලද්දුවූ; ක්‍රියා, ශික්ෂාතොමෝ; ප්‍රසිදති, පහදියි හෙවත් ඵල දෙවත්නීය.

"නහීඤ්ඤෙම'ඛෙද කුවිත බ්‍රාහ්මණෙය්‍යොපනාඅනම්
ගහීදෙකාදඤෙ රාඤෙ ගහීවව වාදඤෙ විශඃ"

යනු මෙහි මනුසමෘතිවචනයි.

30. උදූරධීඃ, උත්කෘෂ්ට බුද්ධිඇති; සඃ, ඒ රඝුකුමාරතෙම, සම්‍යග්ර්‍යෝඃ, සිත්‍වලු; ධියඃ ගුණෛඃ, [ශුශ්‍රූෂාදි] බුද්ධිගුණයන් කරණ කොටගෙන; චතුරර්ණවොපමාඃ, සිවුසයුරුබඳුවූ; චතස්‍රඃවිද්‍යාඃ, [ආන්වීක්ෂිකීත්‍රයාදි] චතුර්විද්‍යාවන්; හරිතාම් ඊශ්වරඃ, සූර්‍යතෙම; පවනාතිපාතිගිඃ, පවන් ඉක්මවා යන සුලුවූ; හරිද්භිඃ, (සෙකිය) අශ්වයන් කරණකොටගෙන; [චතුරර්ණවොපමාඃ, සිවුසයුරු බඳුවූ]; දිනඃ ඉව, [සිවු] දිගුන් මෙන්; ක්‍රමාත්, පිළිවෙළින්; තතාර, තරණය කෙළේය (ඉක්මගියේය යියෙසේයි).

"ශුශ්‍රූෂා ශ්‍රවණඤෙවව ග්‍රහණං ධාරණං තථා
ඌහා'පොහොවිඥානං තත්ඵලඤෙව ධීගුණාඃ"-යනුද

"ආන්වීක්ෂිකී ත්‍රයී වාර්තා දණ්ඩනීතිශ්ච ශාශ්වතී
එතා විද්‍යාශ්චතස්‍රස්තු ලොකසංස්ථිතිහෙතවඃ"-යනුද

කාමන්දක වචනයි.

31. සඃ, ඒ රඝුකුමාරතෙම; මෙධ්‍යාම්, පවිත්‍රවූ; රෞරවිං, තවම්, රුරුමුවසම; පරිධාය, හැඳ; මන්ත්‍රවත්, මන්ත්‍රසහිතවූ; අස්ත්‍රම්, [ආග්නෙයාදි] ආයුධශිල්පය; පිතුඃ එව, පියරජු කෙරෙන්ම; ශික්ෂිත, උගත්තේය; තද්ගුරුඃ, ඒ කුමරහුගේ පියතෙම; එකඃ, අවිතීයවූ; පාර්ථිවඃ කෙවලම්, රජෙක්ම; න අභූත්, නොවී; [වැළි එකෙක් ඇති;] සඃ, ඒ දිලීපරජතෙම; ක්ෂිතෙඃ, පෘථිවීතලයෙහි; එකධනුර්ධරඃ අපි, අවිතීය ධනුර්ධරයෙක්ද; අභූත්, වී.

32. මහොක්ෂතාං වපුසතරඃ සපෘශතානි ව
විපෙඳුහාවං කලහඃ ශ්‍රයතාමිව
රඝුඃ ක්‍රමාද්‌යෞවනභින්නශෛශවඃ
පුපොෂ ගාම්භීර්‍යමනොහරං වපුඃ.

33. අථාස්‍ය හොදුනව්ඩෙරනන්තරං
විවාහදීක්ෂාං නිරවර්තයද්ගුරුඃ
නරෙන්ද්‍රකන්‍යාඃ සමවාප්‍ය සත්පතිං
තමොනුදං දක්ෂසුතා ඉවාබභුඃ.

"කාමීණරෙඉරවවාසතානි වම්මිාණි බ්‍රහ්මචාරිණඃ
වසිරන්නානුපූබ්බේණ ශාණක්ඛෙඉමාදිකානි ච"–

යනු මෙහි මානවධම්මයි. මේ එක්තිස්වන ශ්ලෝකයට අන තුරුව කිසි පොතෙක්හි මේ ශ්ලෝකය දක්නා ලැබේ.–

"පදුතියාත්‍රොඩනඛ්ලිඛ්ලසරෙම්මගිඤ්ඡිනාං ව්‍යජිනශකති–
මෞලිභිඃ
උපොඩපාදඤ්ඤමුපොඩයොවනං නිවෙශයාමාස පිතා සථාවිධි"

මෙය පරිපාව්‍යභාවයෙන් නොගන්නාලදි.

32. රඝුඃ, රඝු කුමාරතෙම; ක්‍රමාත්, ක්‍රමයෙන්; යෞවනභින්න ශෛශවඃ, තොවුන්විසෙන් හරනලද සිසුබැව් ඇත්තේ; මහොක්ෂතාම්, මහාවෘෂභවය; සපෘශන්, වැළඳගන්නාවූ හෙවත් ඊට පැමිණෙන්නාවූ; වපුසතරඃ ඉව, නාඹු වස්සකු මෙන්ද; විපෙඳුහාවම්, ගජරාජභාවය; ශ්‍රයන්, ඇසුරු කරන්නාවූ; කලහඃ ඉව, ඇත් පැටවකු මෙන්ද; ගාම්භීර්‍යම්, අවපලව්‍යයෙන්; මනොහරම්, මන වඩන්නාවූ; වපුඃ, ශරීරය; පුපොෂ, පොෂණය කෙළේ.

මහාන් උක්ෂා මහොක්ෂෝත්‍යස්‍ය භාවෝ මහොක්ෂතා, නාම්-යි වාක්‍ය ගතයුතුයි "අචතුරච්චතුරා" දි සූත්‍රයෙන් නිපාතන යෙන් "මහොක්ෂ" යි අකාරාන්තබව වේ. [ඉක්බිති ගෘහස්ථාශ්‍රම වර්ණනය කරන්නාහු "අථාස්‍ය" යනාදි කීහු.]

33. අථ, ඉක්බිත්තෙන්; ගුරුඃ, පියරජතෙම; අස්‍ය, මේ කුමර හුගේ; හොදුනව්ඩෙඃ, [දෙවිසිවන්තෙහි කටයුතුවූ] කෙශානත කර්මයට; අනන්තරම්, අනතුරුව; විවාහදීක්ෂාම්, විවාහසංස්කාරය හෙවත් විවාහය පිළිබඳ කටයුතු; නිරවර්‍යත්, සිඳ කෙළේය; නරෙන්ද්‍ර කන්‍යාඃ, රාජකන්‍යාවෝ; තමොනුදම්, අඳුරු දුරුකරන්නාවූ; තම්, ඒ රඝුකුමාර තමැති; සත්පතිම්, යහපත් සැමියකු; අවාප්‍ය, ලැබ; දක්ෂසුතාඃ, 'රොහිණ්‍යාදි] ප්‍රජාපතිපුත්‍රීහු; [තමොනුදම්, චන්ද්‍රතමැති; සත්පතිම්, යහපත් සැමියකු]; [අවාප්‍ය] ඉව, ලැබ මෙන්; ආබභුඃ, වෙසෙසින් බැබළුහ.

34. යුවා යුගව්‍යායතබාහුරංසලඃ
කපාටවක්ෂාඃ පරිණඛකක්ඛරඃ
වපුඃප්‍රකර්ෂාදජයද්ගුරූං රහු-
ඝතඵාපි නීවෙවිනයාදදෘශ්‍යත.

35. තතඃ ප්‍රජානාං විරමාත්තමනා බභාං
නිතාන්තගුර්වීං ලඝයිෂ්‍යතා ධුරම්
නිසර්ගසංස්කාරවිනීත ඉත්‍යසෞ
නෘපේණ චක්‍රේ යුවරාජශබ්දභාක්.

"කෙශාන්තඃ ෂෝඩශේ වර්ෂේ බ්‍රාහ්මණස්‍ය විධීයතේ
රාජන්‍යබන්ධෝර්වාවිංශේ වෛශ්‍යස්‍ය ව්‍යධිකේ තතඃ"-

යනු ව්‍රාහ්මණින් සඳහා කෙශාන්තකර්මයට කාලනියමය දක්වූ මානවධර්මයයි. යෞවරාජ්‍යයොග්‍යත්වය දක්වන්නාහු "යුවා" යනාදි කියත්.

34. යුවා, යොවුන් වයස්ඇති; යුගව්‍යායතබාහුඃ, විශදවූ යුග ලක්සේ දික්වූ බාහුඇති; අංසලඃ, ශක්තිමත්වූ; කපාටවක්ෂාඃ, පුළුල්වූ වක්ෂඃස්ථලඇති; පරිණඛකක්ඛරඃ, විශාලවූ ග්‍රීවාඇති; රඝුඃ, රඝු කුමාරතෙම; වපුඃප්‍රකර්ෂාත්, දෙහශ්‍රීයගේ ආධික්‍යය හෙතු කොටගෙන; ගුරූම්, පියරජතු; අජයත්, දිනුයේය; තඵාපි, එසේද වුවත්; විනයාත්, අවනතභාවය හෙතුකොටගෙන; නීවෙඃ, පහත්ව; අදෘශ්‍යත, පැනුණේය. [ඵඩහු නොව පැවැත්තේය යීසේයි.

යුගාවිව ව්‍යායතබාහුඃ යුගව්‍යායතබාහුඃ-කර්මධාරයගර්භී බහුව්‍රීහියි. අංසෞ ස්‍යත ඉත්‍යංසලඃ-"වත්සාංසාභ්‍යාං කාමබලේ" යන සූත්‍රයෙන් තඞ්ත "ලච්" ප්‍රත්‍යයයයි. [ඉක්බිති යෞවරාජ්‍යය දක්වනුවෝ "තතඃ" යනාදි කියත්.]

35. තතඃ, ඉක්බිති; ආත්මනා, තමාවිසින්; විරමී, බොහෝ කලක් මුළුල්ලෙහි; බභාම්, ධරනලද; නිතාන්තගුර්වීම්, අතිශයින් මහත්වූ; ප්‍රජානාම් ධුරම්, ප්‍රජාපාලනප්‍රයාසය හෙවත් රාජ්‍ය භාරය; ලඝයිෂ්‍යතා, සැහැල්ලු කරන්නාවූ; නෘපේණ, දිලිපරජතු විසින්; අසෞ, මේ රඝුකුමාරතෙම; නිසර්ගසංස්කාරවිනීතඃ ඉති-නිසර්ගඃ, සඛාවයෙන්ද; සංස්කාර, ශාස්ත්‍රාභ්‍යාසයෙන් ලබගත් වාසනාවයෙන්ද; විනීතඃ ඉති, හික්මුණේයයි; යුවරාජශබ්දභාක් යුවරාජ ශබ්දය භජනය කරන්නෙක්; චක්‍රේ, කරනු ලැබී.

"ලඝයිෂ්‍යතා" යනු "තත් කරොති තදුවහෙව" යන්නෙන් ලඝුශබ්දයා කෙරෙන් "ණිච්" ප්‍රත්‍යය හා ඉක්බිති "ලෘමෘ සමා"

36. නරෙන්ද්‍රමූලාශ්‍රයනාදනන්තරං
තදාසදං ශ්‍රීර්යුවරාජසංඥිතම්
අගච්ඡදංශේන ගුණාභිලාෂිණී
නවාවතාරං කමලාදිවොත්පලම්.

37. විභාවසුඃ සාරථිනේව වායුනා
සනාව්‍යපායේන ගභස්තිමානිව
බභූව තේනාතිතරාං සුදුඃසහඃ
කථප්‍රභේදේන කවිව පාර්ථිවඃ.

යන්නෙන් "ශතෘ" ප්‍රත්‍යය වූතැනි. යුවරාජ ඉති ශබ්දං භජතීති යුවරාජ ශබ්දභාක්- "භජෝණ්විඃ" යන සූත්‍රයෙන් භජ්ධාතුනු කෙරෙන් "ණ්වි" ප්‍රත්‍යයයි.

"විනයොපග්‍රහාන් භූත්‍යෛ කුර්‍යාත කෘපතිඃ සුතාන්
අවිනීතකුමාරං හි කුලමාශු විශීයතේ
විනීතමේවරසං පුත්‍රං යෞවරාජ්‍යේ, නිඝේවයේත්"-යනු මෙහි කාමන්දක වචනයි.

36. ගුණාභිලාෂිණී, [විනයාදි] ගුණයන් කැමැත්තාවූ; ශ්‍රීඃ, රාජ්‍යශ්‍රීතොම; නරෙන්ද්‍රමූලාශ්‍රයනාත්, (දිලීප) රාජ නමැති ප්‍රධාන ස්ථානයෙන්; අනන්තරම්, ඉක්බිතිවූ හෙවත් සමීපවූ; යුවරාජ සංඥිතම්, යුවරාජ්‍ය යන නම් ඇති; නවාවතාරම්, අලුත පහළවූ; තදාසදම්, ඒ රඝුකුමාර නමැති ප්‍රතිෂ්ඨාස්ථානයට; අංශෙන, අසෙකින්; අගච්ඡත්, ගියාය; [කවරක මෙන්ද?] ගුණාභිලාෂිණී, [සෞරභ්‍යාදි] ගුණ කැමැත්තාවූ; ශ්‍රීඃ, [පද්මාශ්‍රිත] ශ්‍රීතොමෝ; කමලාත්, [විරොතපන්නවූ] පද්මයෙන් (අපගත වැ); නවාවතාරම්, අලුත පහළවූ; උත්පලම්, උපුලකරා; අංශෙන, අසෙකින්; අගච්ඡත් ඉව, ගියාක් මෙනි. [ගුණ කැමැති ශ්‍රීකාශතාතොමෝ හැකිලූ යන පියුමෙන් ඉවත්ව පිපෙන උපුලම ගියාක් මෙන් වැඩවූ දිලීපරජු කෙරෙන් අපගතවැ අභිනව යුවරජුකරා පැමිණියාය යනු භාවයි].

ශ්‍රීදෙවිය වෘද්ධත්වයට පැමිණි රජහු හැර තරුණ යුවරජහු ආශ්‍රය කළාක්මෙන් සත්‍රීහු යොවුන්වියඉක්මවූ සුකිත සවාම්පුරුෂයන් හැර තරුණයන් කෙරෙහි ඇලෙති යනු මෙහි එක් අර්ථයෙකි.

ආත්මනඃ පදම් ආසාදම්- "ආසාදං ප්‍රතිඥාසාම්" යන්නෙන් නිපාතනයි.

37. සාරථිනා, සහායවූ හෙවත් අනුකූලවූයඇත්තාවූ; වායුනා, සුලඟ කරණකොටගෙන; විභාවසුඃඉව, ගින්නක්මෙන්ද; සාරථිනා, සහායවූ; සනව්‍යපායෙන, ප්‍රේෂාපගමය කරණකොටගෙන; ගභස්ති

38. නියුජ්‍ය තං හොමතුරඞ්ගරක්ෂණෙ
ධනුර්ධරං රාජසුතෙරනුද්‍රුතම්
අපූර්ණමේකෙන ශතක්‍රතූපමඃ
ශතං ක්‍රතූනාමුපවිඝ්නමාප සඃ.

39. තතඃ පරං තෙන මඛාය යජ්වනා
තුරඞ්ගමුඝ්නෂ්ටමනඝීලං පුනඃ
ධනුර්ධරානාමගුන එව රක්ෂිණාං
ජහාර ශක්‍රඃ කිල ගූඪවිග්‍රහඃ.

මාන් ඉව, සුශ්‍රීයා මෙන්ද; සාරථිනා, සහායවූ; කවුහෙදෙන, කොපුල්බිදීම හෙවත් මදවහනය කරණකොටගෙන; කරි ඉව, හස්තියකු මෙන්ද; පාර්ථිවඃ, දිලිපරජතෙම; සාරථිනා, සහායවූ; තෙන, ඒ රඝුකුමාරයා කරණකොටගෙන; අභිතරාම්, අභිශයින්; සුදුඃසහඃ, [සෙස්සන් විසින්] ඉවසිය නොහැකි තෙද ඇත්තෙක්; බභූව, වී.

මෙහි "සාරථිනා" යනු සචිවාකෙර්‍යාපකාරිත්වයෙන් ආදියෙහි යොදනලද හෙයින් "ආදිදීපක" නම් අලඞ්කාරය වේ.

38. ශතක්‍රතූපමඃ, ඉන්ද්‍රයා හා සමානවූ; සඃ, ඒ දිලිපරජතෙම; රාජසුතෙඃ, රාජපුත්‍රයන් විසින්; අනුද්‍රුතම්, අනුගතවූ; ධනුර්ධරම්, දුනු ධරන්නාවූ; තම්, ඒ රඝුකුමාරයා; හොමතුරඞ්ගරක්ෂණෙ, හොමය සඳහා වෙන්කරනලද අසු රැක්මෙහි; නියුජ්‍ය, යොදා; එකෙන අපූර්ණම්, එක් යාගයකින් නොපිරුණාවූ හෙවත් එකක් අඩුවූ; ක්‍රතූනාං ශතම්, [අශ්වමේධ නම්] යාග සියයකව; අප විඝ්නම්, නිරුපද්‍රව වැ; ආප, පැමිණියේය.

ශතං ක්‍රතවඃ යස්‍යාසෞ ශතක්‍රතුඃ, සඃ උපමා යස්‍යාසෞ ශතක්‍රතූපමඃ-බහුව්‍රීහිගර්භ බහුව්‍රීහියි.

39. තතඃ පරම්, ඒ [එකුන්සියක් යාගයන්ගේ පැමිණීමට] අනතුරුව; යජ්වනා, විධිවූ පරිද්දෙන් යාග කරන්නාවූ; තෙන, ඒ දිලීප රජහු විසින්; පුනඃ, යළිදු; මඛාය, අශ්වමේධයාගය පිණිස; උත්සෘෂ්ටම්, මුදාහරිනලද්දවූ; අනඝීලම්, බඹසරහිතවූ හෙවත් කැමැතිසේ හැසිරෙන්නාවූ; තුරඞ්ගම්, අශ්වයා; ධනුර්ධරානාම්, ධනුර්ධරවූ; රක්ෂිණාම්, රක්ෂකයන්ගේ; අග්‍රතඃ එව, ඉදිරියෙහිම; ශක්‍රඃ, ඉන්‍රතෙම; ගූඪවිග්‍රහඃ, සැඟවුණු ශරීරඇත්තේ; ජහාර කිල, පැහැරගත්තේ ලු.

"ම්බං කර්‍තුම්" යි කිවමනාතන්හි ක්‍රියාර්‍ථොපපදසංඥාවූ අප්‍රයුජ්‍යමාන තුමුන්ප්‍රත්‍යයානන්තයාගේ කර්මයෙහි "ක්‍රියාර්‍ථොපපදස්‍ය ච කර්මණි ස්ථානිනඃ" යන සූත්‍රයෙන් මඛාය යි චතුර්ථීවිභක්තියි.

40. විෂාදලුප්තප්රතිපත්ති විසම්භං
කුමාරසෛන්‍යං සපදි සම්භෘතඤ්ච තත්
වශිෂ්‍යධෙනුශ්ච සදෘක්ෂයාගතා
ශ්‍රුතප්රභාවා දදෘශේ'ථ නන්දිනී.

41. *උවාච සා වත්‍ස! මුනෙරනුඥයා
ජගත්සු කිඤ්චන පරොක්ෂමස්ති මේ
අතෝ'හමශ්වාහරණාකුලාතමනා-
ඤනවානුකම්පාම්මුපාගමං සඛයම්.

---

40. තත් කුමාරසෛන්‍යම්, ඒ කුමාරයාගේ සෛන්‍යතෙම; සපදි, එකෙණෙහි; විෂාදලුප්තප්රතිපත්ති-විෂාද, [ඉෂ්ටවස්තුහුගේ නැසීමෙන් වූ] බෙදයෙන්; ලුප්තප්‍රතිපත්ති, නටුවාවූ දැනුම් ඇත්තේ හෙවත් කටයුතු කුමක්දැයි නොදත්තේ; විසම්භම්, [අශ්වයාගේ නැසීමට හෙතුවක් නොපැනෙන හෙයින්] විසමයට පැමිණියේ; සම්භෘතඤ්ච, සිටියේත් විය; අථ, ඉක්බිති; ශ්‍රුතප්‍රභාවා, අසන ලද තෙජස් ඇති; සුදෘක්ෂයා ආගතා, සෙවඹායෙන් පැමිණියාවූ; නන්දිනී, නන්දිනී නම්වූ; වශිෂ්‍යධෙනුශ්ච, වශිෂ්‍යමුනිහුගේ හොම ධෙනුවතාමෝද; දදෘශෙ, දක්නාලැබී. [රඝුකුමරහුගේ සවකීය ප්‍රසාදයෙන් ලද්දිය බැවින් ඒ අනුග්‍රහකරනු කැමැත්තෙන් පැමිණි නන්දිනීතොමෝද දක්නා ලැබිය යුතු හාවයි].

මෙහි වාක්‍යදෙක්හිවූ "ච" කාරයෝ දෙදෙන අවිලම්බසූචක වෙත්.

41. සා, ඒ නන්දිනීතොමෝ; උවාච, [මෙසේ] කිව; වත්‍ස!, එම්බා දරුව!; මුනෙඃ අනුඥයා, [වශිෂ්ඨ] මුනිහුගේ අනුඥයෙන්; මෙ, මට; ජගත්සු, භුවනත්‍රයෙහි; පරොක්ෂම්, අගොචරවූ; කිඤ්චන්, කිසිවකුත්; න අස්ති, නැත්තේය; අතඃ, එහෙයින් හෙවත් සිතල්ල දත් හෙයින්; අහම්, මම; අශ්වාහරණාකුලාතමනඃ, අසූ පැහැරගැන්මෙන් උකටළි සිත්ඇති; තව, තට; අනුකම්පාම්, දයාපිණිස (සහායත්වය පිණිසය යියේයි); සඛයම්, තොමෝ (ම); උපාගමම්, එළඹියෙමි.

"අක්ෂණඃ පරම්" යන විග්‍රහයෙහි අව්‍යයීභාවසමාස වැ "පරොක්ෂම්" යනු වේ. "ප්‍රතිපරසමනුභ්‍යොඅක්ෂණඃ" යන්නෙන් සමාසාන්ත "ටච්" ප්‍රත්‍යයයි. මෙහි චතෙසත්‍යාදි සවයම්භූ පදසමුදයතෙම "උවාච" යන්නහුගේ අනුකර්තෘකර්මත්වයෙන් විවක්ෂිතයි. එසේම මතු කවෙහිද පූර්වාර්ධය ඊටම අනුකර්තෘකර්ම වේ.

---

* මේ ශ්ලෝක දෙක සම්භර රඝුවංශ පොත්හි නොපැනේ.

42. *සෙවදුම්බුනා මාජ්ජය පුත්ත! ලොචනෙ
මමෙව සෙනෙහ තුරඛහම්ක්ෂසෙ
ඩෙන්වා නිශමෙත්‍ය වචඃ සම්මිතං
මුදං පරාමාප දිලීපනන්දනඃ.

43. තදඛහනිස්‍යන්දජලෙන ලොචනෙ
ප්‍රමාජ්‍ය පුණ්‍යෙන පුරස්කාරඃ සතාම්
අතීන්ද්‍රියෙෂවප්‍යුපපන්නදර්ශිනෝ
බහුව භාවෙෂු දිලීපනන්දනඃ.

44. ස පූර්වඃ පර්වතපක්ෂශාතනං
දදර්ශ දෙවං නරදෙවසම්භවඃ
පුනඃ පුනඃ සූතනිසිඩවාපලං
හරන්තමශ්වං රථරශ්මිසංයතම්.

---

42. පුත්‍ර!, එම්බා දරුව!; මම එව, මාගේම; සෙවදුම්බුනා, මූත්‍ර යෙන්; ලොචනෙ, දෙඇස්; මාජ්ජය, ධොවනශීලකර; සෙන, ඝම්හෙ ඝකින්; ඉහ, මෙහිදී; තුරඛහම්, [නැසුණාවූ] අසු; ර්ක්ෂසෙ, දක් නෙහිද [එගෙයිනි]; ඩෙන්වා, කැඳිනිය විසින්; ඉති, මෙසේ; සම්මිර තම්, කියනලද; වචඃ, තෙපුල; නිශමය, අසා; දිලීපනන්දනඃ, දිලීප පුත්‍රවූ රඝුතෙම; පරාම් මුදම්, ඉතා සතුටට; ආප, පැමිණියේය.

"ර්ක්ෂසෙ" යනු "ර්ක්ෂ=දර්ශනෙ" යන ධාතුනුගේ ලට් කර්තෘකාරකමධ්‍යමපුරුෂෛකවචනරූපයි.

43. සතාම්, සත්පුරුෂයන් විසින්; පුරස්කාරඃ, පෙරටුකරනලද හෙවත් පුදනලද; දිලීපනන්දනඃ, දිලීපපුත්‍රවූ රඝුකුමාරතෙම; පුණ්‍යෙන, පවිත්‍රවූ; තදඛහනිස්‍යන්දජලෙන, ඒ ඩෙනුවගේ ශරීර යෙන් වහනයවූ [මූත්‍ර] ජලයෙන්; ලොචනෙ, දෙඇස්; ප්‍රමාජ්‍ය, සෝධා; අතීන්ද්‍රියෙෂු, ඉන්ද්‍රියශක්තිය ඉක්ම පවත්නාවූ; භාවෙෂු අපි, වස්තූන්කෙරෙහිද; උපපන්නදර්ශිනඃ, හටගත් දැකුම් ඇත් තෙක් (ප්‍රත්‍යක්ෂශක්ති ඇත්තෙක්); බහුව, වී.

ඉන්ද්‍රියාණ්‍යතික්‍රාන්තා අතීන්ද්‍රියාණෙෂු-"අක්ෂ්‍යාදඃ ක්‍රාන්තා ද්‍යර්ථෛ ඉතීයෂා" යන්නෙන් තත්පුරුෂසමාසයි.

44. නරදෙවසම්භවඃ, නරදෙවපුත්‍රවූ; සඃ, ඒ රඝුකුමාරතෙම; පුනඃ පුනඃ, නැවත නැවත; සූතනිසිඩවාපලම්, රියැදුරු විසින් වළක්වනලද ඔෂධත්‍යය ඇති; රථරශ්මිසංයතම්, රියරැහැනින් බඳනාලද; අශ්වම්, අශ්වයා; හරන්තම්, පැහැර ගන්නාවූ; පර්වත පක්ෂශාත නම්, පර්වතපක්ෂයන් සින්දුවූ; දෙවම්, ඉන්ද්‍රයා; පූර්වඃ, පෙරදික්හි; දදර්ශ, දිව්‍ය

45. ශතෙඝනමඝණාමනිමේඝවෘතහරි-
හීරිං විදිත්වා හරිභිශ්ච වාජිභිඃ
අවොවදෙනං ගගනසඃශා රඝුඃ
සඛරෙණ ධීරෙණ නිවර්තයන්නිව.

46. මඛාංශභාජාං ප්‍රථමෝ මනීෂිභි-
ස්ත්වමෙව දෙවෙන්ද්‍ර! සදා නිගද්‍යසෙ
අජස්‍රදීක්ෂාප්‍රයතස්‍ය මද්ගුරෝඃ
ක්‍රියාවිඝාතාය කථං ප්‍රවර්තසෙ ?.

47. ත්‍රිලොකනාථෙන සදා මඛෙෂ-
සවඃ නියම්‍යා නනු දිව්‍යචක්ෂුෂා
ස චෙත් සවඃ කර්මසු ධර්මචාරිණා.
තමන්තරායෝ භවති ච්‍යුතෝ විධිඃ.

සූතෙන නිෂිඩං චාපලං යස්‍යාසෞ සූතනිෂිඩවාපලඤ්ඣඃ-ත්‍රිපද බහුව්‍රීහිඃ.

45. රඝුඃ, රඝුකුමාරතෙම; තම්, ඒ අසු පැහැරගන්නහු; අනිමේෂ වෘත්තිභිඃ, පිය හෙළුම් නැත්තාවූ; අඝණාම් ශතෙඃ, සිය ගණන් ඇස් කරණකොටගෙනද හෙවත් දහසක් ඇස් කරණ කොටගෙනද; හරිභිඃ, පලාවන්වූ; වාජිභිශ්ච, අසුන් කරණකොට ගෙනද; හරිම්, ශක්‍රවූවහු; විදිත්වා, හැඳින; එනම්, මේඝක්‍රයා; ගගනසඃශා, අහස පැහිරෙන්නාවූ; ධීරෙණ, ගැඹුරුවූ; සඛරෙණ, හඬින්; නිවර්තයන් ඉව, නවත්වන්නකු මෙන්; අවොවත්, [මෙය] කී.

"හරිර්හාකීවඤ්ඣෘඤ්ඣයමොපෙන්ද්‍රමරීවිභූ" යනු විශ්වප්‍රකාශ ගෙයින් හරිශබ්දය මෙහි අශ්වපර්‍යාය වේ.

46. දෙවෙන්ද්‍ර!, පින්වත් ශක්‍රය!; මනීෂිභිඃ, පණ්ඩිතයන් විසින්; ත්වම් එව, නෝම්; මඛාංශභාජාම්, යාගභාගය අනුභව කරන්නවුන් අතුරෙහි; ප්‍රථමඃ, පළමුවෙනියයි; සදා, හැමකල්හි; නිගද්‍යසෙ, කියනු ලැබෙහි; [එතෙකුදු වුවත්]; අජස්‍රදීක්ෂාප්‍රයතස්‍ය, නිත්‍යදීක්ෂායෙහි (නිතර යාගකිරීමෙහි) තත්පරවූ; මද්ගුරොඃ, මා පියහුගේ; ක්‍රියාවිඝාතාය, යාගය නසනු පිණිස; කථම්, කෙසේ; ප්‍රවර්තසෙ, පවතිහිද ?.

"ක්‍රියාවිඝාතාය" යනු "ක්‍රියාං විහනතුම්" යන අර්ථයෙහි භාවවචනයෙන් "තුමර්ථාච්ච භාවවචනාත්" යන සූත්‍රයෙන් විහිත වතුර්ථියි.

47. ත්‍රිලොක නාථෙන, තුන් ලොවට සවාම්වූ; දිව්‍යචක්ෂුසා, අතීන්ද්‍රියාර්ථදර්ශිවූ හෙවත් දිවැස් ඇත්තාවූ; සවඃ, ඔබවිසින්; මඛ විධඃ, යාගවිඝාතකයෝ (යාගයට සතුරුවූවෝ); සදා, හැමකල්හි;

48. නදඛමග්‍ර්‍යං මඝවන්! මහාක්‍රතෝ-
රමුං තුරඛඃ ප්‍රතිමොක්තුමර්හසි
පථඃ ග්‍රැනෙදිශිසිතාර ඊශ්වරා
මලිම්සාමාදදතෙ න පඩතිම්.

49. ඉති ප්‍රගල්භං රඝුණා සමීරිතං
වචෝ නිශම්‍යාධිපතිර්දිවෞකසාම්
නිවර්තයාමාස රථං සවිස්මයඃ
ප්‍රවක්‍රමෙ ච ප්‍රතිවක්තුමුත්තරම්.

50. සදෘක්ෂ රාජන්‍යකුමාර! තත්තථා
ශශාසතු රක්ෂ්‍යං පරතෝ යශොධනෛඃ
ජගන්ප්‍රකාශං තදශෙෂමිජ්‍යයා
භවද්ගුරුලීඛ්සයිතුං මමොද්‍යතඃ.

නිශම්‍යාඃ තනු, ගික්මවිය යුත්තෝ නොවෙද්ද; සඃ ඔබ, ඒ තෝ; සවයම්, තෙමේ; ධර්මචාරිණාංකර්මසු, ධාර්මිකයන්ගේ [යාග] ක්‍රියා වන්හි; අන්තරායඃ, බවසි වෙත්, අන්තරාය කරන්නෙක් වෙහි නම්; විධිඃ, අනුෂ්ඨානයතෙම (යාගවිධානය); ව්‍යුතඃ, නටුයේ වේ.

"සදෘ මඝවිඃ" යනු "සතාං මඝවිඃ" යි බොහෝ පොත්හි පාඨයි.

48. මඝවන්!, පින්වත් මඝවන් නමැත්තව හෙවත් ශක්‍රය!; තත්, එහෙයින්; මහාක්‍රතොඃ, [අශ්වමේධ] මහායාගයාගේ; අග්‍ර්‍යම් අඩහම්, ශ්‍රෙෂ්ඨ යාගඵලය වූ; අමුම් තුරඛහම්, මේ අශ්වයා; ප්‍රතිමොක්තුම්, මුදන්නට (ආපසු දෙන්නට); අර්හසි, සුදුස්සෙහි; [ඒ එසේ මැයි]; ග්‍රැනෙඃ පථඃ, වෙදමාගීය; දර්ශිතාරඃ, දක්වන්නාවූ; ඊශ්වරාඃ, උතුමෝ; මලිම්සාම්, මලිනවූ; පඩතිම්, මාගීය හෙවත් අයහ පත්මාගීය; න ආදදතෙ, නො ගනිත්; [අසත්මාගීය ඇසුරු නො කෙරෙනැයි සේයි].

මෙහි උක්තාර්ථයාගේ සාධනය පිණිස උත්තමචරිතසඛ්‍යාත අර්ථාන්තරයක් දක්වූයෙන් මේ අර්ථාන්තරන්‍යාසාලඞ්කාරයි. කවිහට මේ අලඞ්කාරය අභීෂ්ටවැයි.

49. ඉති, මෙසේ; රඝුණා, රඝුකුමරහු විසින්; සමීරිතම්, කියන ලද; ප්‍රගල්භම් වචඃ, බුනුවි තෙපුල; නිශම්‍ය, අසා; දිවෞකසාම් අධිපතිඃ, දෙවියන්ට අධිපතිවූ ශක්‍රතෙම; සවිස්මයඃ, [රඝුනුගේ ප්‍රභාවයෙන්] ආශ්චර්‍යයෙන් සහිත වූයේ; රථම්, [තමාගේ] රථය; න්‍යවර්තයාමාස, නැවැත්වී; උත්තරම්, මත්තෙහි; ප්‍රතිවක්තුම්, පිළිතුරු කියන්ට; ප්‍රවක්‍රමෙ ච, ආරම්භද කෙළේ.

50. රාජන්‍යකුමාර!, පින්වත් ක්ෂත්‍රිය කුමාරය; ත්වත්, ඔබතෙපුලක්; ආත්ථ, කීයෙහිද; තත්, එතෙපුල; තථා, එසේමය (සත්‍යය යි

51. හරියශ්වමේකඃ පුරුෂොත්තමඃ සමාගතා
මහෙශ්වරසත්‍රාඹකඤ්ච එව නා පරඃ
තථා විදුෂාං මුනයඃ ශතක්‍රතුං
ස්තුතියඤ්චාම් න හි ශබ්ද එෂ නඃ.

52. අතොඃයමශ්වඃ කපිලානුකාරිණා
පිතුඃසවිදියස්‍ය මයාපහාරිතඃ
අලම්ප්‍රයත්නෙන තවාත්‍ර මා නිධාඃ
පදං පදව්‍යාං සගරස්‍ය සන්තතෙඃ.

සේයි); තු, එකෙක් ඇති; යශොධනෙඃ, කීර්තියය ධනකොට ඇති [අප වැන්නවුන්] විසින්; පරතඃ, සතුරාකෙරෙන්; යඥඃ, යඥය තෙම; රක්ෂ්‍යම්, රැක්කයුත්තේය; [ඒ කිමෙක්දයත්?] භවද්ගුරුඃ, නොපගේ පියතෙම; ජගත්ප්‍රකාශම්, ලොකයෙහි ප්‍රසිද්ධවූ; අශෙෂම්, නිරවශෙෂවූ; මම, මාපිළිබඳවූ; තත්, ඒ යඥය; ඉජ්‍යයා, යාගකිරීමෙන්; ලබ්ධයිතුම්, ඉක්මවන්නට; උද්‍යතඃ, උත්සාහවත් වූයේය

"ආඞ්" යනු "බ්‍රූඃ පචානාමාදින ආහොඃ බ්‍රූඃ" යන් නෙන් බ්‍රූධාතුහට වූ ආඞාදෙශයි.

51. යථා, යම්සේ; හරිඃ, විෂ්ණුතෙම; එකඃ පුරුෂොත්තමඃ, එකම පුරුෂොත්තමයයි; සමෘතඃ, දන්නාලද්දේද; ත්‍රාම්බකඃ එව, ත්‍රිනෙත්‍ර; තෙමේම [ශිවතෙමේම]; මහෙශ්වරඃ, [එකම] මෙහෙසුරුයයි දන් නාලද්දේද; අපරඃ, මෙයින් අන්‍යයෙක්තෙම; න, [පුරුෂොත්තම යයි හෝ මහෙශ්වරයයි හෝ] නොදන්නාලද්දේද; තථා, එසේ; මාම්, මා; මුනයඃ, මුනීහු; ශතක්‍රතුම්, ශතක්‍රතුනමැයි; විදුඃ, දනිත්; නඃ, [හරිහර දෙදෙනා හා මාද යන] අපගේ; එෂඃ ශබ්දඃ, මේ [ත්‍රිවිධ] ශබ්දයතෙම; ස්තුතියඤ්චාම් නහි, දෙවැනියකු කරා පැමිණෙන්නේ නොවෙයි; (අන්‍යසාධාරණ නොවෙයි සේයි.)

"පුරුෂොත්තමඃ" යන්නෙහි "පුරුෂෙෂු උත්තමඃ" යි සප්තමීන් වාක්‍ය ගතයුතුයි. "පුරුෂාණාං උත්තමඃ" යන වාක්‍යයෙහි නිර්ධාරණෂෂ්ඨී හෙයින් "න නිර්ධාරණෙ" යන සූත්‍රයෙන් සමාස ප්‍රතිෂෙධය වන හෙයිනි.

52. අතඃ, [යම්හෙයකින් මම ශතක්‍රතුයෙමිද] එහෙයින්; කපිලානුකාරිණා, කපිලමුනිනුබඳුවූ; මයා, මාවිසින්; ත්‍රිදිශස්‍ය, තා පිළිබඳවූ; පිතුඃ, පියහුගේ; අශ්වඃ අශ්වතෙම; අපහාරිතඃ, පැහැර ගන්නාලද්දේය; අත්‍ර, මේ අසු නිම්හිකොට; තව, තාගේ; ප්‍රයත්නෙන, උත්සාහයෙන්; අලම්, කම්නැත; සගරස්‍ය,

53. තතඃ ප්‍රහස්‍යාපහෘතඃ පුරන්දරං
පුනර්හරාමේ තුරගස්‍ය රක්ෂිතා
ගෘහාණ ශස්ත්‍රං යදි සඞ්ගතෙ එෂ තෙ
න බලවන්නිර්ජිත්‍ය රඝුං කෘති භවාන්.

54. ස එව මුක්තවා මෘගවාහනමුන්නමුඛඃ
කරිෂ්‍යමාණඃ සශරං ශරාසනම්
අතිෂ්ඨදාලීඪවිශෙෂශොභිනා
වපුඃප්‍රකර්ෂේණ විඩම්බිතෙශ්වරඃ.

සගරරජු පිළිබඳවූ; සන්තතෙඃ, සන්තානයාගේ (පරම්පරාවගේ); පදව්‍යාම්, පදවියෙහි; පදම්, පිය; මා නිධාඃ, නොතබව [නොකළ හැකි දෙයෙහි උත්සාහය විනාශයට කාරණයෙක යනු භාවයි.]

"අපහාරිතඃ" යන්නෙහි ණිච් ප්‍රත්‍යය සඞ්ඝර්ෂයෙහියැ ප්‍රේරණයෙහි නොවේ. "නිධාඃ" යනු නිපූර්ව ධාඤ් ධාතුහුගේ ලුඞ් ප්‍රයොගයි. "න මාඩ්යොගෙ" යන සූත්‍රයෙන් අඩාගම් ප්‍රතිෂේධයි.

53. තතඃ, ඉක්බිත්තෙන්; තුරගස්‍ය රක්ෂිතා, අශ්ව රක්ෂාවූ (රඝුකුමාර) තෙම; අපහෘතඃ, නිර්හෘතවූයේ; ප්‍රහස්‍ය, සිනාසී; පුනඃ, නැවත; පුරන්දරම්, ශක්‍රයාහට; බහාමෙ, [මෙසේ] කි; යදි, ඉදින්; එෂඃ, [අශ්ව නොහරිමි යන] මේ; තෙ, තාගේ; සඞ්ගතඃ, විනිශ්චය විනම් [එකේකල]; ශස්ත්‍රම්, ආයුධය; ගෘහාණ, [අතට] ගනුව; භවාන්, පින්වත්තෙම; රඝුම්, රඝුතුම්වූ (මා); අනිර්ජිත්‍ය, නොපරදවා; න කෘතී බලු, කරන්නලද කිස ඇත්තෙක් නොවේමය.

"රඝුම්" යි තමා නම ඇස්වීමෙන් තමාගේ දුර්ජයත්වය ප්‍රකාශ කෙරේ. මෙහි පූර්වාර්ධය සම්හර පොතෙක—"තතඃ ප්‍රහස්‍යාපහෘතඃ පුරන්දරං, ව්‍යපෙතහිර්භූමිපුරන්දරාතමජඃ කියාද පාඨයි.

54. සඃ, ඒ රඝුකුමාරතෙම; උන්මුඛඃ, ඌර්ධවමුඛවූයේ; මෘගවාහනම්, ශක්‍රයාහට; එවම්, මෙසේ; උක්ත්වා, කියා; ශරාසනම්, දුන්න; සශරංකරිෂ්‍යමාණඃ, ගි සහිත කරන්නේ; ආලීඪවිශෙෂ ශොභිනා, ආලීඪනම් ස්ථානකභෙදයෙන් අතිශයින් ශොබනාවූ; වපුඃප්‍රකර්ෂේණ, ශරීරයාගේ ඔන්නත්‍යය කරණකොටගෙන; විඩම්බිතෙශ්වරඃ, නිෂ්ඵකරනලද මෙහෙසුරු ඇත්තේ (ඊශ්වරයා වැනි වූයේ); අතිෂ්ඨත්, සිටියේය.

"ආලීඪ" යනු දුතුවාවන්ගේ පස තබා අර ඇඳ සිටීමේ එක් ලක්ෂණයකි. හේ මෙසේය:—

55. රඝොරවෂ්ටමහමයෙන පත්‍රිණා
හෘදි ක්ෂතෝ ශොත්‍රහිදප්‍යමර්ශිණඃ
නවාම්බුදෘනිකමුහූතීලායඝ්‍රනෙ
ධනුෂ්‍යමොඝං සමධත්ත සායකම්.

56. දිලීපසූනොඃ ස වෘහද්භුජාන්තරං
ප්‍රවිශ්‍ය භීමාසුරශොණිතොවිතඃ
පපාවනාස්වාදිතපූර්වමාශුගඃ
කුතූහලෙනෙව මනුෂ්‍යශොණිතම්.

"නම්නා ප්‍රථීජඝ්නා තු පශ්චිමා ප්‍රගුණා භවෙත්
අසමෝ මධ්‍යකායඃ ස්‍යාදෘලිඝස්‍ය ච ලක්ෂණම්"

යනු හෙයින් ඉදිරිකළ ජඝ්නාව නැමුණිද පසු ජඝ්නාව ඍජු විද මධ්‍යශරීරය අසම විද මේ "ආලිඝ" නම් සථානකවිශෙෂයාගේ ලක්ෂණයි. තවද දකුණුපය හකුළුවා වම්පය දිගු කොට සිටීම "ආලිඝ" නමැයි කියත්—"ආලිඪං දක්ෂිණං පාදං ප්‍රත්‍යාලීඪන්තු වාමකම්" කියනලද ප්‍රකාර ඇති අවසථානවිශෙෂයයි.

55. රඝොඃ, රඝුකුමාරයාගේ; අවඝටමහමයෙන, ස්‍යාමුඛසචරූපවූ (දුඩිවූ); පත්‍රිණා, හීයෙන්; හෘදි, වක්ෂඃසථලයෙහි; ක්ෂතඃ, විදින ලද්දාවූ; අමර්ශිණඃ, [එහෙයින්] නො ඉවසන්නාවූ; ශොත්‍රහිත් අපි, ශත්‍රුතෙමේද; නවාම්බුදෘනිකමුහූතීනලායඝ්‍රනෙ—නවාම්බුදෘනික, අභිනව මෙඝසමූහයහට; මුහූතීනලායඝ්‍රනෙ, මොහොතක් සල කුණුවූ; ධනුෂි, දෙව්දුන්නෙහි; අමොඝම්, නො සිස්වූ; සායකම්, හීය; සමධත්ත, සංහිතකෙළේ හෙවත් දුන්නෙහි ඊය ගැළපී.

නවාශ්ච තෙ අම්බුදශෙඛති නවාම්බුදඃ, තෙෂාම් අනීකඃ නවාම්බුදෘනීකඃ, මුහූතීනං ලායඝ්‍රනංමුහූතීනලායඝ්‍රනම් නවාම්බුදෘනීකස්‍ය මුහූතීනලායඝ්‍රනං නවාම්බුදෘනික මුහූතීනලායඝ්‍රනං තසමින්-කර්මධාරයතතපුරුෂගභී තත්පුරුෂ සමාසයි.

56. භීමාසුරශොණිතොවිතඃ-භීමාසුර, බිහිසුණුවූ අසුරයන්ගේ; ශොණිත, රුධිරයෙහි; ඵවිතඃ, පුරුදුවූ; සඃ ආශුගඃ, ඒ [ඉන්ද්‍රයා විසින් හරනලද] හීතෙම; දිලීපසූනොඃ, දිලීපපුත්‍රවූ රඝුකුමාරයාගේ; වෘහන්, පුළුල්වූ; භුජාන්තරම්, වක්ෂඃසථලයට; ප්‍රවිශ්‍ය, වැද; අනාස්වාදිතපූර්වම්, පෙර ආස්වාද නොකරනලද (රස නොවිඳින ලද) මනුෂ්‍යශොණිතම්, මිනිස්ලෙහෙය; කුතූහලෙන ඉව, කුහුලින් මෙන්; පපෙෞ, පානය කෙළේ.

57. හරේඃ කුමාරෝ'පි කුමාරවික්‍රමඃ
සුරව්‍යාසඵාලනකර්කශාඞ්ගුලෞ
භුජේ ශවිපත්‍රව්ශෙෂකාඞ්කිතෛ
සවනාමවිහනං නිවබාන සාශකම්.

58. ජහාර චාන්‍යෛන මයූරපත්‍රිණා
ශරේණ ශක්‍රස්‍ය මහාශනිධ්වජම්
චුකොප තස්‍යෛම ස හෘශං සුරශ්‍රියඃ
ප්‍රසහ්‍ය කෙශව්‍යපරොපණාදිව.

59. තයොරුපානහසමිතශිඛසෙනිකං
ගරුත්මදුශීවිෂශීමදශීතෛඃ
බභූව යුධං තුමුලං ජයෛෂිණොඃ
රඩොමුඩෛරුඃවමුඩෛශව පත්‍රිභිඃ.

භීමාශ්ච තෙ අසුරාශෙවති භීමාසුරාඃ, තෙෂාං ශොණිතං භීමාසුර ශොණිතම්, තයමින් උවිතඃ භීමාසුරශොණිතොවිතඃ-කර්ම ධාරයතත්පුරුෂනඥී තත්පුරුෂසමාසයි-පූර්ණං ආස්‍රාදිතං ආස්‍රාදිතපූර්ණම්-"භූත පූර්ණේ චරට්" යන සූත්‍රනිර්දේශයෙන් භූතශබ්ද ශාගේ පූර්ණිපාතයි.

57. කුමාරවික්‍රමඃ, කදකුමරහට බඳු ශෞර්‍ය ඇත්තාවූ; කුමාරඃ අපි, රඝුකුමාර නෙමේද; සුරව්‍යාසඵාලනකර්කශාඞ්ගුලෞ—සුරව්‍යප, ඓරාවණ හස්තිහුගේ; ආස්ඵාලන, චාලනයෙන් හෙවත් මෙහෙයීමෙන්; කර්කශාඞ්ගුලෞ, රළුවූ ඇඟිලිඇති; ශවිපත්‍රව්ශෙෂකාඞ්කිතෙ-ශවි, ඉන්ද්‍රාණිය විසින්; පත්‍රව්ශෙෂක, පත්‍රාකාරතිලකයෙන්; අඞ්කිත, සලකුණුකරනලද්දාවූ; හරේඃ, ඉන්ද්‍රයාගේ; භුජ, බාහුයෙහි; සවනාමවිත්නම්, සිදහැරීමින් අඞ්කිතවූ; සාශකම්, හීය; නිවබාන, හිඳුවී.

කුමාරස්‍ය වික්‍රම ඉව වික්‍රමොයස්‍යාසෞ කුමාරවික්‍රමඃ—ව්‍යධිකරණ ෂෂ්ඨී බහුව්‍රීහිසමාසයි.

58. මයූරපත්‍රිණා, මොනර පියාපත් ඇත්තාවූ; අන්‍යෛන ශරේණ, අනික් ගියකින්; ශක්‍රස්‍ය, ඉන්ද්‍රයාගේ; මහාශනිධ්වජම්, මහ සෙණක් බඳු ධ්වජය; ජහාර, සිදහැරියේය; සඃ, ඒ (ඉන්ද්‍ර) තෙම; සුරශ්‍රියඃ, දිව්‍යශ්‍රියගේ; ප්‍රසහ්‍ය, ලාහෙළා; කෙශව්‍යපරොපණාත් ඉව, ඍසකේ සිදදැමීමකින් මෙන්; තස්‍යෛම, ඒ රඝුකුමාරයාහට; ඍශම්, අතිශයින්; චුකොප, කිපියේය; [ඉන්ද්‍රතෙම දිව්‍යශ්‍රියට නිගා කළ අයකු බඳු රඝුකුමරහු නසනු කැමැතිවිය යියේසි].

"ක්‍රුධඳ්‍රැහෙර්ෂ්‍යාසූයාවිනාඃ ශම්ප්‍රති කොපඃ" යන්නෙන් සම්ප්‍රදාන සංඥාවූ හෙයින් "නස්‍යෛම" යි චතුර්ථීවිභක්ති වී.

59. ජයෛෂිණොඃ, [ඔවුනොවුන්] ජය කැමැත්තාවූ; තයොඃ, ඒ [ඉන්ද්‍ර රඝු] දෙදෙනාගේ; ගරුත්මදුශීවිෂශීමදශීතෛඃ-ගරුත්මත්

60 අතිප්රබඛප්රහිතාසත්ත්වෘෂවිහි-
සන්මාශ්රයං දුෂ්ප්රසහස්ය තේජසඃ
ශශාක නිර්වාපයිතුං න වාසවඃ
සඛාශ්වතීනාං වහනිම්වාද්ධිරම්බුදඃ.

61 තුෂ්ණීං ප්රකොෂේෂු හරිචන්දනාඞ්කිතෛ
ශුම්ප්යමානාඃ ක්ෂණවඩිරනාදිනීම්
රඝුඃ ශශාඞ්කාඞ්මුඛේන පත්නියා
ශරාසනජ්යාමලුනාම්ඩෞජසඃ.

පියාපත් ඇති; ආශීවිෂ, සර්පයන්ට බඳුවූ; භීමදර්ශනයෝ, භයජනක දැකුම් ඇති; අධොමුඛෝ, [බත්වින් උඩු යටි දෙදෙසෙහි සිටිහෙයින්] යටිකුරු මුවඇත්තාවූද; ඌර්ධවමුඛෝශ්ව, උඩුකුරු මුව ඇත්තාවූද; පන්ත්රිභිඃ, හී කරණකොටගෙන; උපාහෘතසර්වසිද්ධසෛනිකම්-උපාහෘතසර්ව, සම්පූර්ණයෙහි සිටියාවූ; සිද්ධ, [ඉන්ද්රයාගේ] දෙවසෙනාව හා; සෛනිකම්, [රඝුහුගේ සිවුරඟ] සෙනඟද ඇති; තුමුලම්, සඬකුලවූ; යුද්ධම්, යුද්ධයක්; බහුව, වී.

මෙහි "සිද්ධ" ග්රහණයෙන් දෙවයොනිවිශේෂයන් ගත්හ. සිද්ධලෝකය වනාහි සදමඩලින් පහත අහසෙහි පිහිටියේය. කියන ලදමැයි. සූත්රසිද්ධාන්තයෙහි:—

"මන්දුමරෙජ්‍යභූපුත්‍රසූර්‍යශුක්‍රභුජේන්දවඃ
පරිභ්‍රමන්ත්‍යධොඃධස්ථාඃ සිද්ධවිද්‍යාධරා ඝනාඃ" යි.

60. වාසවඃ, ශක්රතෙම; අතිප්රබඛප්රහිතාසත්ත්වෘෂවිහිඃ-අතිප්රබඛ, අතිශයාතත්‍යයෙන් හෙවත් ඉතාම නිරතුරුව; ප්රහිත, යවනලද; අසත්ත්වෘෂවිහිඃ, ශරවර්ෂයන් කරණකොටගෙන; දුෂ්ප්රසහස්ය තේජසඃ, මැඩපිය නොහැක්ක තේජසට; ආශ්රයම්, ආධාරවූ; තම්, ඒ කුමාරයා; නිර්වාපයිතුම්, නිවාලන්ට හෙවත් පරදවාලන්ට; න ශශාක, නොහැකි වී; [කවරෙක් කවරකුමෙන්ද?] අම්බුදඃ, මෙඝයතෙම; අද්භිඃ, ජලයන් කරණකොටගෙන; සඛතශ්වතීනාං, තමාගෙන් නික්මුණාවූ; වහනිම්, සෙණහින්න; නිර්වාපයිතුම් ඉව, නිවාලන්ට [නොහැකිවූවාක්] මෙනි. [ලොකපාලාතමකවූ රඝු කුමාරයාහටද ඉන්ද්රාංශයක් ඇති හෙයින් ඉන්ද්රයාවිසිනුදු රඝුතෙම පැරදවිය නොහැකිවිය යුයේසි].

අතිශයිතඃ ප්රබඛඃ අතිප්රබඛඃ, තෙන ප්රහිතාඃ අතිප්රබඛප්රහිතාඃ, අසත්ත්වානාං වෘෂටයඃ අසත්ත්වෘෂටයඃ, අතිප්රබඛප්රහිතාශ්ච තාඃ අසත්ත්වෘෂටයශ්චෙති අතිප්රබඛප්රහිතාසත්ත්වෘෂටයඃතාභිඃ-කර්මධාරය තත්පුරුෂගර්භ කර්මධාරයයි.

61. තතඃ, ඉක්බිති; රඝුඃ, රඝුකුමාරතෙමේ; හරිචන්දනාඞ්කිතෛ, රන්සඳුනෙන් සලකුණුවූ; ප්රකොෂේෂු, මණික්කවිටුවෙහි;

62. ස චාපමුත්සෘජ්‍ය විවෘඩමත්සරඃ
ප්‍රණාශනාය ප්‍රබලස්‍ය විද්විෂඃ
මහීධ්‍රපක්ෂව්‍යපරොපණොචිතං
සත්වරන්ප්‍රහාමණ්ඩලමස්ත්‍රමාදදෙ.

63. රඝුර්ගෘහං වක්ෂසි තෙන තාඩිතඃ
පපාත භූමෞ සහ සෛනිකාශ්‍රුභිඃ
නිමෙෂමාත්‍රාදවධූය තව්‍යථාං
සහොජසීනඃ සෛනිකහර්ෂනිස්වනෛඃ.

ප්‍රමථ්‍යමානාන්නිගමවධිරතාදිනිම්-ප්‍රමථ්‍යමාන, අලඟුලබන්නාවූ; අර්ණවඃ, සමුද්‍රයටබඳු; ධිරතාදිනීම්, ගැඹුරුගඟඅැති; විඩෞජසඃ, ඉන්ද්‍රයාගේ; ශරාසනජ්‍යාම්, දුනුදිය; ශශාඞ්කාඩ්වුඛඃ, අඩිවඳුරා කාරඵලය (තලය) ඇති; පත්‍රිණා, හීයෙන්; අලුනාත්, සිත්දේය.

විටි (ව්‍යාපකම්) ඔපෝ යස්‍ය ස විඩෞජාඃ, තස්‍ය විඩෞජසඃ-ෂෂ්ඨීබහුව්‍රීහිසමාසයි.

62. විවෘඩමත්සරඃ විශෙෂයෙන් වැඩුණු වෛරඅැති; සඃ, ඒ ඉන්ද්‍ර තෙම; චාපම්, දුන්න; උත්සෘජ්‍ය, හැර; ප්‍රබලස්‍ය, මහත් බල ඇත් නාවූ; විද්විෂඃ, සතුරාගේ; ප්‍රණාශනාය, වැනසීම පිණිස; මහීධ්‍රපක්ෂ ව්‍යපරොපණොචිතම්-මහීධ්‍රපක්ෂ, පර්වතපක්ෂයන්ගේ; ව්‍යපරොපණ, හිඳලීමෙහි; උචිතම්, පුරුදුවූ හෝ සුදුසුවූ; සත්වරන්ප්‍රහාමණ්ඩලම්-සත්වරන්, බබළන්නාවූ; ප්‍රහාමණ්ඩලම්, කාන්තිසමූහ ඇති; අස්ත්‍රම්, ආයුධය (විදුරවිය); ආදදෙ, ගත්තේය. (ඉතා බලවත්වූ සතුරා නසනු පිණිස වජ්‍රායුධය අනට ගත්තේය යනු භාවයි).

පූර්වයෙහි පර්වතයෝ පියාපත් ඇත්තෝ ල. ඉන්ද්‍රයා විසින් ඒ පියාපත්හු විදුරවියෙන් සිඳින ලදහ යන පුරාණකථාශ්‍රවණයෙන් කවිහු "මහීධ්‍රපක්ෂව්‍යපරොපණොචිතම්" යි කීහු.

63. රඝුඃ, රඝුකුමාරතෙම; තෙන, ඒ විදුරවියෙන්; හෘදයම්, අන්‍යජීයෙන්; වක්ෂසි, වක්ෂඃසථලයෙහි; තාඩිතඃ, තළනලද්දේ; සෛනිකාශ්‍රුභිඃ සහ, (සචකිත) සෙනාවන්ගේ කඳුළු හා සමඟ; භූමෞ, බිම; පපාත, හිණි; නිමෙෂමාත්‍රාත්, ඇසිපිය හෙළන පමණ කාලයෙකින්; තව්‍යථාම්, එසින්වූ පීඩාව; අවධූය, දුරුකොට; සෛනිකහර්ෂනිස්වනෛඃ සහ, සෙනාවන්ගේ තුෂ්ටිරාව්‍ය හා සමඟ; උත්සිතඃ, නැඟිසිටියේය. [කුමරු හුණුකල්හි සෙන්‍යයෝ හැඬුහ. නැඟිසිටිකල්හි සතුටින් සිංහනාද කළහ යුත්තේයි.]

64. තථාපි ශස්ත්‍රව්‍යවහාරනිෂ්ඨුරේ
විපක්ෂභාවේ විරමස්‍ය තත්‍යුෂඃ
තුතොෂ වීර්‍යාතිශයෙන වෘත්‍රහා
පදං හි සර්වත්‍ර ගුණෛර්නිධීයතෙ.

65. අසඞ්ගමද්‍රිෂ්වපි සාරවත්තයා
න මෙ භවදන්‍යෙන විසොඪමායුධම්
අවෙහි මාං ප්‍රීතමනෙ තුරඞ්ගමාන්
කිමිප්සිතං සත්‍යතමාහ වාසවඃ.

66. තතො නිශඞ්ගාදසමග්‍රමුද්ධෘතං
සුවර්ණපුඛාඳ්‍යුතිරඤ්ජිතාඞ්ගුලිම්
නරෙන්ද්‍රසූනුඃ ප්‍රතිසංහරන්නිෂුං
ප්‍රියංවදඃ ප්‍රත්‍යවදත් සුරෙශ්වරම්.

---

64. තථාපි, එසේද වුවත් (විදුරවිපහර දුන්නේ වීනමුත්); ශස්ත්‍ර ව්‍යවහාරනිෂ්ඨුරේ, ආයුධව්‍යාපාරයෙන් කකීශවූ; විපක්ෂභාවෙ, සතුරුබැව්හි; විරම්, බොහෝ කලක්; තත්‍යුෂඃ, සිටියාවූ; අස්‍ය, මේ රඝුකුමරහුගේ; වීර්‍යාතිශයෙන, අධිකවීර්‍යය හෙතුකොට; වෘත්‍රහා, ශක්‍රතෙම; තුතොෂ, සතුටු විය; හි, ඒ එසේමැයි; ගුණෛඃ, ගුණයන් කරණකොටගෙන; සර්වත්‍ර, [ශත්‍රු ජීත්‍ර ඵදෘසීත යන] සියල්ලන් මතුයෙහි; පදම්, පිය; නිධීයතෙ, තබනුලැබේ; [ගුණයෝ සතුරන් නමුත් ගුණවත්හට අවකත කෙරෙති යනු භාවයි.]

ශස්ත්‍රාණාං ව්‍යවහාරඃ ශස්ත්‍රව්‍යවහාරඃ, තෙන නිෂ්ඨුරං ශස්ත්‍ර ව්‍යවහාරනිෂ්ඨුරං තස්මින්-තත්පුරුෂගර්භ තත්පුරුෂයි.

65. සාරවත්තයා, සාරවද්භාවයෙන්; අද්‍රිෂූ අපි, පර්වතයන්හි පවා; අසඞ්ගම්, නොපැකිළෙන්නාවූ; මෙ, මාගේ; ආයුධම් වජ්‍රා, යුධය; භවත්අන්‍යෙන, තා හැර අනිකකු විසින්; න විසොඪම්, නො ඉවසන ලද්දේය; [එහෙයින්] මාම්, මා; ප්‍රීතම්, සතුටුවූවහු; අවෙහි, දනුව; තුරඞ්ගමාන් සෘතෙ, අශ්වයා හැර; කිම් ඉච්ඡසි ඉති, [අන්] කුමක් කැමැත්තෙහිදැයි; සත්‍යතම්, ව්‍යක්ත කොට; වාසවඃ, සක්දෙවිතෙම; ආහ, කී (විවාලේය යීසේයි).

මෙහි ප්‍රථමපාදයෙහි "අසහ්‍යමද්‍රිෂ්වපි"යිද-චතුර්ථපාදයෙහි "වරං වෘණීෂ්වෙති තමාහ වාසවඃ" යිද බොහෝ පොත්හි පාඨයි.

66. තතඃ, [ඒ සක්දෙව් රජහුගේ කථාවට] අනතුරුව; නිශඞ්ගාත්, ඊයවුරෙන්; අසම්ග්‍රම්, සංසෘෂ්ටකොට; උද්ධෘතම්, ඇදගත

67. අමොඝමශ්වං යදි මන්‍යසෙ ප්‍රභෝ!
තතඃ සමාපෙහි විධිනෙව කර්මණි
අජස්‍රදීක්ෂාප්‍රයතඃ ස මද්ගුරුඃ
ක්‍රතොරශෙෂෙණ ඵලෙන යුජ්‍යතාම්.

68. යථා ච වෘත්තානහනම්මං සදෙගත-
සත්‍රිලොචනෙක්ෂාංශනයා දුරාසදඃ
තවෙව සඤ්ඣගහරාඛිශාමපතිඃ
ශරණ්‍යොති දෙවෙශ! තථා විධිසතාම්.

ලද; සුවණීප්‍රඛද්‍යුතිරඤ්ජිතාඞ්ඝුලිම්-සුවණීප්‍රඛද්‍යුති, රන් පැළඳි යෙහි කාන්තියෙන්; රඤ්ජිතාඞ්ඝුලිම්, රදනාලද ඇඟිලිඇති; ඉළුම්, හිඟ; ප්‍රතිසංහරන්, නවත්වන්නාවූ; ප්‍රියංවදඃ, ප්‍රිය තෙපුල් කියන්නාවූ; නරෙන්ද්‍රසූනුඃ, [රඝු] කුමාරතෙම; සුරෙශ්වරම්, ශක්‍රයාහට; ප්‍රත්‍යවදත්, [මෙසේ] පිළිතුරු කී. [**"නාප්‍රහරණමප්‍රහරෙත්"**යි නිෂිඛ නෙයින් පහර නොදෙන්නාවූ ඉඤ්ඣයාහට රඝුතෙම පහර නොදී ප්‍රිය තෙපුලින් පිළිතුරු දුන්නේය යනු භාවයි.] මෙහි **"ප්‍රත්‍යවදත් සුරඤ්ජරම්"** යිත් කිසි පොතෙක් පාඨයි.

67. ප්‍රභොඃ!, පින්වත් ඉඤ්ඣය!; අශ්වම්, අසු; අමොඝම්, නොමිදිය යුතුවූවහු; යදි මන්‍යසෙ, ඉදින් හඟනෙහි නම්; තතඃ, එසේ කල; අජස්‍රදීක්ෂාප්‍රයතඃ, නිතර යාගයෙහි උත්සාහවත්වූ; සඃ මද්ගුරුඃ, ඒ මාගේ පියතෙම; විධිනා එව, වෙදැකෑ පරිද්දෙන්ම; කර්මණි, යඥකර්මය; සමාපෙහි, නිමවූ කල්හි [යම් ඵලයෙක් ඇද්ද]; ක්‍රතොඃ, අශ්වමේධ යාගයාගේ; අශෙෂෙණ ඵලෙන, [ඒ] සියලු ඵලයෙන්; යුජ්‍යතාම්, යුක්තකරනු ලැබේවා. [අශ්වමේධ යාගේ ඵලය ලැබෙන කල්හි අසුගෙන් කවර ප්‍රයොජනයෙක්ද යනු භාවයි].

68. ත්‍රිලොචනෙක්ෂාංශනයා, (අඤ්ඣමූර්තියක්ඇති) ඊශ්වරයාගේ එක්මූර්තියක් බැවින්; දුරාසදඃ, [අප වැන්නවුන් විසින්] ළංවිය නොහැකිවූ; සදෙගතඃ, සභාභූමියට පැමිණියාවූ; විශ්වාමපතිඃ, [මා පිය] නරපතිතෙම; තව, තාගේ; සඤ්ඣගහරාත් එව, පණිවුඩ ගෙනයන්නකුගෙන්ම හෙවත් [තොප] දූතයකුගෙන්ම; ඉමම් වෘත්තාන්තම්, මේ ප්‍රවෘත්තිය; යථා, යම්සේ; ශරණ්‍යොති, අසාද; දෙවෙශ!, දෙවෙන්ද්‍රය!; තථා, එසේ; විධිසතාම්, කරනු ලැබේවා. [ශ්‍රේෂ්ඨත්වයෙන් දූතයකු ලවාම මාගේ පියමහරජාණන්ට මේ ප්‍රීති දායක ප්‍රවෘත්තිය අස්වව යුසේයි].

69. තථේති කාමං ප්‍රතිශුශ්‍රුවාන් රඝෝ-
ර්‍යථාගතං මාතලිසාරථීයමෝ
නෘපස්‍ය නාතිප්‍රමනාඃ සදෝගෘහං
සුදක්ෂිණාසූනුරපිනෘවර්තත.

70. නමහ්‍යනන්දන් ප්‍රථමං ප්‍රබොධිනඃ
ප්‍රජාපතිර්‍යඃ ශාසනහාරිණා හරේඃ
පරාමෘශන් හර්‍යජඩෙන පාණිනා
නදීයමඞ්ගං කුලිශව්‍රණාඞ්කිතම්.

71. ඉති ක්ෂිතීශෝ නවනිං නවාධිකාං
මහාක්‍රතූනාං මහනීයශාසනඃ
සමාරුරුක්ෂුර්දිවමායුෂඃ ක්ෂයෙ
තතාන සොපානපරම්පරාමිව.

---

69. මාතලිසාරථීඃ, මාතලිහු රියැදුරුකොට ඇති [ශක්‍ර] තෙම; රඝෝඃ, රඝුකුමරහුගේ; කාමම්, කැමැත්ත; තථා ඉති, එසේ වේ වයි; ප්‍රතිශුශ්‍රුවාන්, ගිවිසියේ; යථාගතම්, ගමන වූපරිද්දෙන්; යෞ, ගියේය; සුදක්ෂිණාසූනුඃ අපි, රඝුකුමාරතෙමේද; නාතිප්‍රමනාඃ, (ජය ලදුවත් අසු නොලත් හෙයින්) ඉතා සතුටු නොවූයේ; නෘපස්‍ය, රජහුගේ; සදෝගෘහම්, සභාගෘහයට; න්‍යවර්තත, පෙරළා ගියේය.

ප්‍රතිශුශ්‍රුවාන් යනු "භාෂායාං සදවසශ්‍රුවඃ" යන්නෙන් ඣඝු ප්‍රත්‍යයාන්තව සිඛයි.

70. හරේඃ, ඉන්ද්‍රයාගේ; ශාසනහාරිණා, පණිවුඩ නොනැන්නකු විසින්; ප්‍රථමම්, පළමුකොට; ප්‍රබොධිනඃ, දන්වනලද්දුවූ; ප්‍රජේශ්වරඃ, ප්‍රජාධිපති [දිලිපරජ] තෙම; හර්‍යජඩෙන, සතුරින් සිඟිල්වූ; පාණිනා, අත්ලෙන්; කුලිශව්‍රණාඞ්කිතම්, වජ්‍රායුධව්‍රණයෙන් සලකුණුවූ; නදීයම් අඞ්ගම්, ඔහුගේ ශරීරය; පරාමෘශන්, වැළඳි ගන්නේ; තම්, ඒ රඝුකුමරහු; අහ්‍යනන්දත්, සතුටු කෙළේ.

තස්‍ය ඉදං නාදීයම්-"වෘධාචඃඃ" යනා සූත්‍රයෙන් වෘඩසංඥයා කෙරෙන් තඬිත ඡප්‍රත්‍යය හා ඡහට ඊයාදෙශයි.

71. මහනීයශාසනඃ පූජ්‍යවූ ආඥ ඇති; සඃ ක්ෂිතීශඃ, ඒ [දිලිප] රජතෙම; ඉති, මෙපරිද්දෙන්; මහාක්‍රතූනාම්, අශ්වමෙධ මහායාග යන් සමඟකිවූ; නවාධිකාම්, නවයක් අධික කොට ඇති; නවතිම්, අනුවක් (එකුන් සියයක්); ආයුෂඃ ක්ෂයෙ, ආයුෂයාගේ ගෙවීමෙහිදී හෙවත් මරණින්මතු; දිවම්, දෙව්ලොවට; ආරුරුක්ෂුඃ, නගිනු කැමැත්තේ; සොපාන පරම්පරාම් ඉව, නිඟිසෙතිපෙළක් මෙන්; තතාන, කෙළේ.

72. අථ ස විෂයව්‍යාවෘතනානාත්මා යථාවිධි සූනවේ
නෘපතිකකුදං දත්වා යූනෙ සිතාතපවාරණම්
මුනිවනතරුච්ඡායාං දෙව්‍යා තයා සහ ශිශ්‍රියෙ
ගලිතවයසාමිෂ්වාකූණාමිදං හි කුලව්‍රතම්.

ඉති ශ්‍රීරඝුවංශෙ මහාකාව්‍යෙ කාලිදාසකෘතෙ
රඝුරාජ්‍යාභිෂෙකො නාම තෘතීයඃ සර්ගඃ.

සම්පොසුම්වඳුඃ සමාරුරුක්ෂුඃ—"සනාගංසහිඤ්ඤ ලඃ" යන සූත්‍රයෙන් සනන්තයා කෙරෙන් උප්‍රත්‍යයයි.

72. අථ, [ඉක්බිති; විෂයව්‍යාවෘතනාත්මා, පස්කම්ගුණෙන් නැවතුණු සිත් ඇති; සඃ, ඒ [දිලිපරජ] තෙම; යථාවිධි, ශාස්ත්‍රොක්ත පරිද්දෙන්; යූනෙ, තරුණවූ; සූනවෙ, පුත්‍රයාහට [රඝුකුමරහට]; නෘපතිකකුදම්, රාජලක්ෂණය වූ; සිතාතපවාරණම්, ශ්වෙතවර්ත්‍රය; දත්වා, දී; [රඝුකුමාරයා රාජ්‍යයෙහි අභිෂෙකකොටය යුසේයි.] තයා දෙව්‍යාසහ, ඒ සුදක්ෂිණානම් මෙහෙසිය හා සමඟ; මුනිවනතරුච්ඡායාම්-මුනිවන, මුනින් විසින් සෙවිය යුතු තපොවනයෙහි; තරුච්ඡායාම්, රුක්සෙවණ; ශිශ්‍රියෙ, ඇසුරුකෙළේය; [වානප්‍රස්ථාශ්‍රමය පිළිගත්තේය යනු භාවයි] හි, ඒ එසේමැයි. ඉදම්, මේ වානප්‍රස්ථාශ්‍රමය පිළිගැන්ම; ගලිතවයසාම්, ගිලිහුණු වයස් ඇති (=වෘඩවයසකවූ); ඉක්ෂ්වාකූණාම්, ඉක්ෂ්වාකුවංශිකයන්ගේ; කුලව්‍රතම්, කුලවූතයෙක් වේ. (කුලපරම්පරාගත වාරිත්‍රධර්ම්මයෙකැයි සේයි).

"ඉක්ෂ්වාකූණාම්" යන්නෙහි "ඉක්ෂ්වාකොරෝත්‍රාපත්‍යානි ඉක්ෂ්වාකවස්තෙෂාම්" යි තද්ධිතවාක්‍යයි. අණ් ප්‍රත්‍යය තමා තද්රාජසංඥක හෙයින් අස්ත්‍රීබහුත්වයෙහි ඕහට "තද්රාජස්‍ය බහුසු තෙනෙවාස්ත්‍රියාම්" යන සූත්‍රයෙන් ලුක් වේ. "රඝෙරුදෙශ්ජිනතා සමානසභලා ගඃ ශිබිරිණි" යන ජාත්‍යුලක්ෂණයෙන් යුත් බැවින් මේ පදය "ශිබිරිණි" වෘත්තයි.

කාලිදාසකෘතෙඃ, කාලිදාස නම් මහා කවිහුගේ කෘතියවූ හෙවත් කාලිදාස මහා කවිහු විසින් රචනාකරනලද; ශ්‍රීරඝුවංශෙ මහාකාව්‍යෙ, ශ්‍රීමත් රඝුවංශ නම් මහාකාව්‍යයෙහි; රඝුරාජ්‍යාභිෂෙකඃනාම, [රඝුරජහුගේ අභිෂෙකය ප්‍රකාශකළ හෙයින්] රඝුරාජ්‍යාභිෂෙක යයි ප්‍රසිද්ධ වූ; තෘතීයඃ සර්ගඃ, තුන්වන සඟ; ඉති, මෙතෙකින් නිමියේයි.

චතුර්ථඃ සර්ගඃ.

1. ස රාජ්‍යං ගුරුණා දත්තං ප්‍රතිපද්‍යාධිකං බභෞ
දිනානෙන නිශිතං තෙජඃ සවිත්‍රෙව ඝ්‍රුතාශනඃ.

2. දිලීපානන්තරං රාජ්‍යෙ තං නිශම්‍ය ප්‍රතිෂ්ඨිතම්
පූර්වං ප්‍රඣ්මිනො රාඥඃ හෘදයෙ'ග්නිරිවොත්ථිතඃ.

3. පුරුහූතධ්වජස්‍යෙව තස්‍යානන්තශනපඛ්ඛතඃ
නවාභ්‍යුත්ථානදර්ශින්‍යෝ නන්දයුඃ සප්‍රජාඃ ප්‍රජාඃ.

---

1. සඃ, ඒ රඝුකුමාරතෙම; ගුරුණා, පිය [මහරජ] හු විසින්; දත්තම්, දෙනලද්දුවූ; රාජ්‍යම්, රාජ්‍යයට හෙවත් ප්‍රජා පරිපාලනයට; ප්‍රතිපද්‍ය, පැමිණ; දිනානෙන, දිවසාවසානයෙහි (සවස් කාලයෙහි); සවිත්‍රා, හිරුහු විසින්; නිශිතම්, තබනලද; තෙජඃ, තෙජසට [පැමිණ]; ඝ්‍රුතාසනඃ ඉව, ගින්න මෙන්; අධිකම්, වැඩියක්; බභෞ, බැබළී.

සූර්‍යයාගේ තෙජස සවස්කල්හි ගින්නට පැමිණෙයි යනාදින් දක්වනලද "සෞරං තෙජඃ සායමහනං සඞ්ක්‍රමතෙ, ආදිත්‍යෙ වා අස්තං ගහනගනිමඤ්‍රප්‍රවිශති, අග්නිං වා ආදිත්‍යඃ සායං ප්‍රවිශති" යනාදි වෙදවාක්‍යයන් ප්‍රමාණ කොට මෙහි වත්තූපමානය දැක්වූහ. මේ ශ්ලෝකයට අනතුරුව:—

"න්‍යඤ්ජනශඤ්ඣං දිලීපම තම ශුශ්‍රුවුෂාංප්‍රභූම්
රාඥමුඛානනාරාවෙ හෘදි ශල්‍යම්වාපිපිතම්.

යන ශ්ලෝකයෙක් බොහෝ පොත්හි හදුරනුලැබේ. පරශ්ලෝකය හා වසතුසාම්‍යය ඇති හෙයින් හේ මූලමධ්‍යයෙහි අනිවෙශිතයි.

2. දිලීපානන්තරම්, දිලීප රජහට අනතුරුව; තම්, ඒ රඝුකුමරහු; රාජ්‍ය, ප්‍රජාපරිපාලනයෙහි; ප්‍රතිෂ්ඨිතම්, පිහිටුවහු; නිශම්‍ය, අසා; පූර්වම්, පළමු [දිලීප කාලයෙහි]; රාඥම්, රජුන්ගේ; හෘදය, සිත්හි; ප්‍රඣ්මිතඃ, අතිශයින් දුමනලද; අග්නිඃ, සන්තාප කමැති වහ්නිතෙම; උත්ථිතඃ ඉව, නැඟී සිටියාක් වැනිවී. [පෙර මහරජුන් කෙරෙහි පැවැති තෙජසට වඩා අධික තෙජසක් ඇතිවිය යුතුයි]

මෙහි රාජකර්තෘකවූද නිශමනක්‍රියාව අග්නියෙහි උපචාරයෙන් ගත්හෙයින් සමානකර්තෘකත්වයට විරොධයෙක් නොවේ.

3. පුරුහූතධ්වජස්‍ය ඉව, [නියංකල්හි වැසිවස්වන] ශක්‍රධ්වජය බඳුවූ; තස්‍ය, ඒ රඝුරජහුගේ; නවාභ්‍යුත්ථානදර්ශින්‍යඃ-නව, අලුත්වූ; අභ්‍යුත්ථාන, පහළවීම; දර්ශින්‍යඃ, දක්නාවූ; උත්තුඞ්ග පඛ්ඛතයඃ,

4. සමමේව සමාක්‍රාන්තං වයං චිරදගාමිනා
නෙන ඝිංහාසනං පිත්‍ර්‍යමඛිලචාදිමණ්ඩලම්.

5. ජ්‍යාඝාමණ්ඩලලක්ෂ්‍යේණ තමදඃශ්‍යා කිල ක්ෂයම්
පදමා පදමානපත්‍රේණ හෙජෙ සාම්‍රාජ්‍යදීක්ෂිතම්.

එඩුකුරුවු හෝ බබළන්නාවූ නෙත්‍රපඞ්කති ඇති; සප්‍රජාඃ, (පුත්‍ර පෞත්‍ර) සන්තාන සහිතවූ; ප්‍රජාඃ, ප්‍රජාවෝ; තනූජඃ, සතුටු වූහ.

වැසිකල්හි රජුන් විසින් ඉඳුධවජය පුදනුලැබෙයි. කියනලද මැයි. භවිෂ්‍යොත්තරයෙහි:—

"එවං යඃ කුරුතෙ යාත්‍රාමිඳ්‍රධ්වජතොඋච්ඡ්‍රිතාම්!
පජ්ජන්‍යඃ කාමවර්ෂී ස්‍යාත්තස්‍ය රාජ්‍යෙ න සංශයඃ" යි.

රජවාසල පිහිටුවනලද පුරවැසියන්ට සැප එළවන්නාවූ සත රැස් ආකාර ඇති ධවජය ඉඳුධවජ නම්. එයින් කිහ:—

"චතුරස්‍රං ධවජාකාරං රාජමාරෙ ප්‍රතිෂ්ඨිතම්
ආහුඃ ශක්‍රධවජං නාම පෞරලොකෙ සුඛාවහම්" යි.

4. චිරදගාමිනා, ඇතකුසේ ගමන් කරන සුලුවූ; නෙන, ඒ රඝු රජහු විසින්; සමම් එව, එකවිටම; වයම්, සථාන දෙකෙක්; සමාක්‍රාන්තම්, ආක්‍රමණය කරනලද්දේය. [ඒ කවරේද ?] පිත්‍ර්‍යම්, පිය රජුකෙරෙන් පැමිණියාවූ; ඝිංහාසනඤ්ච, රාජාසනයද; අඛිලම්, සියලු; අරිමණ්ඩලඤ්ච, සතුරු රටද [යන දෙකයි].

පිතුරාගතං පිත්‍ර්‍යම්-"පිතුශ්චච" යන සූත්‍රයෙන් යන්ප්‍රත්‍යය යයි. මෙහි චතුර්ථ පාදය "අඛිලච මහිඤ්ඡිනාම්" කියාත් හදුරත්.

[සිංහාසනාරූඪ වීමෙන් ඉක්බිති ලක්ෂ්මියගේ ලභාවීම "ජ්‍යෘ" යනාදීන් කියත්].

5. පදමා, ශ්‍රීදෙවිතොමෝ; සවයම්, තොමෝ; අදඃශ්‍යා කිල, දෘශ්‍යම්න නොවන්නී නමුදු; ජ්‍යායාමණ්ඩලලක්ෂ්‍යණ, කානති පුඤ්ජයෙන් අනුමෙය වූ හෙවත් කානතිසමූහයෙන් දනගත හැකිවූ (සවරූපයෙන් අදෘශ්‍යවූය යිසේයි); පදමාතපත්‍රෙණ, පියුම් නමැති ඡත්‍රයෙන්; සාම්‍රාජ්‍යදීක්ෂිතම්, මණ්ඩලාධිපත්‍යයෙහි අභිෂෙක කරනලද්දාවූ; තම්, ඒ රඝුරජහු; හෙජෙ, භජනය කළා.

මෙහි රඝුරජහුගේ තෙජොවිශෙෂයෙන් තමාම ලභාවූ ශ්‍රීදෙවිය විසින් සේසත ඇල්වීම කරනලද්දේය යනු කවිහුගේ උත්ප්‍රෙක්ෂායි. "පදමමෙව ආතපත්‍රං පදමාතපත්‍රං නෙන"-යනු රූපකසමාසයි.

[සරඝවතියගේ සානනිධ්‍යයද කියන්නානු "පරිකල්පිත" යනාදි කියත්].

6. පරිකල්පිතසානූනිධ්‍යා කාලෙ කාලෙ ච වන්දිභූ
සතූනඃ සතූතිගිරඕ්‍යාගිරූපතසෙඨ සරඝවති.

7. මනුප්‍රභෘතිභිර්මාන්‍යෛර්භුක්තා යද්‍යපි රාජභිඃ
තථාප්‍යනන්‍යපූර්වෙව තස්මින්නාසීච්ඡුක්‍රරා.

8. ස හි සර්වස්‍ය ලොකස්‍ය යුක්තදණ්ඩතයා මනඃ
ආදදෙ නාතිශීතොෂ්ණා නභස්වානිව දක්ෂිණඃ.

---

6. සරඝවතී ච, සරඝවිතොමෝද; කාලෙ කාලෙ, කලින් කල හෙවත් සියලු සුදුසු කාලයන්හි; වන්දිභූ, වන්දිභටවයන් කෙරෙහි; පරිකල්පිතසානූනිධ්‍යා, කරනලද ළඟාවීම් ඇත්තී; සතූනඃම්, සොඳුන්‍යයම සුදුසුවූ (ඒ රඝුරජහු කරා); අඕ්‍යාභිඃ, අරිවත්වූ; සතූතිභිඃ, සතුති වාක්‍යයන් කරණකොටගෙන; උපතසෙඨ, ඒළඹුණියඃ; හෙවත් දෙවතාබුඩියෙන් එරජු පිදුවාඃ.

අඕ්‍යාදනපෙතාඃ අඕ්‍යාඃ:— "ඩඕ්‍යුපඨ්‍යඕ්‍යන්‍යාඃසාදනපෙතෙ" යන සූත්‍රයෙන් අඕ් ශබ්දඃයාකෙරෙන් අනපෙතාඃඊයෙහි තඬිත යන් ප්‍රත්‍යඃයඃ– රඝුහුගේ දෙවතාවඃයද "විෂ්ණුඃ පෘථිවිපතිඃ" යූබැවින් හෝ ලොකපාලාතමක බැවින් හෝ අනුසඤ්ඤයයි මෙසේ ඇති කලැ "උපාදෙවපූජාසඞ්ගතිකරණමිත්‍රකරණපථිෂු" යන වකතව්‍යඃයෙන් උපපූර්ව ඣාධාතුහුගේ ආතමනෙපදඃඞිඃඃ වේ.

7. වසුඞ්කරා, පෘථිවිතොමෝ; මනුප්‍රභෘතිභිඃ, මනුරජහු ආදි කොට ඇත්තාවූ; මාන්‍යෛඃ, පූජ්‍යවූ; රාජභිඃ, රජුන් විසින්; භුක්තා යද්‍යපි, පරිභොග කරනලද්දීමය; තථාපි, එතකුදු වුවත්; තස්මින්, ඒ රඝු රජහු කෙරෙහි; අනන්‍යපූර්වා ඉව, පෙර අනික් කිමිදකු නැත්තියක මෙන් හෙවත් අන් රජක්හු විසින් උපභොග නොකරනලද්දියක මෙන්; ආසීත්, වූවාඃ. [පළමුකොටම ලත් කිමිහු කෙරෙහි මෙන් ඇලුණියඃ යියේයි].

අන්‍යඃ පූර්වෝ යස්‍යාඃ සා අන්‍යපූර්වා, න අන්‍යපූර්වා අනන්‍යපූර්වා ෂඣීබහුව්‍රීහිනහි නඤ්තත්පුරුෂ සමාසඃයයි.

8. ඝි, යම්හෙයකින්; සඃ, ඒ රඝුරජතෙම; යුක්තදණ්ඩතයා, අපරාධඃයට සුදුසු දඬුවම් ඇති බැවින්; සර්වස්‍ය ලොකස්‍ය, සියලු ලෝ වැස්සාගේ; මනඃ, සිත; ආදදෙ, ගත්තේද; [කවරකු මෙන්ද?] නාතිශීතොෂ්ණඃ, ඉතා සිහිල් හෝ ඉතා උණුසුම් හෝ නුවූ; දක්ෂිණඃ, දකුණුදික්හි වූ; නභස්වාන් ඉව, වාතඃය මෙනි හෙවත් මලඃය මාරුතඃය මෙනි.

යුක්තදණ්ඩතාය "කාමඤ්චකනීති" යෙහිද පඤ්චාලද්දේඃය. හේ දෙසේගි:—

9. මත්ප්‍රෙතකණ්ඨාඃ කෘතාසෙන ගුණාධිකතයා ගුරෞ
එලෙන සහකාරස්‍ය පුෂ්පොදගමෙ ඉව ප්‍රජාඃ.

10. නයවිද්භිර්‍යෙ රාඥි සදසච්චාපදර්ශිතම්
පූර්‍ව එවා භවත්පක්ෂඝතසම්නතාභවද්‍යුත්තරඃ.

11. පඤ්චානාමපි භූතානාමුත්තකීං ප්‍රථුපුර්ගුණාඃ
නවෙ නඝම්නගිපාලෙ සර්ඃ නවම්වාභවත්.

"උමෙජයති නිඝෙණන මෘදුනා පරිභූයතෙ
දණ්ඩන නාපතිඝනඝමාදයුක්තදණ්ඩඃ ප්‍රශස්‍යතෙ"

ඝනුයි. මේ අටවම ශ්ලෝකයෙහි අපරාඛ්‍යඃ—"නාතීඝිතො න චානාදුඝණශෙවන්ො මාඝ ඉවාග්‍රහීත්"—යිද කිසිපොතෙක පාඨයි

9. තෙන, එහෙයින් ඒ රඝුරජහු විසින්; ප්‍රජාඃ, ජනයෝ; ගුරෞ, පිහිවූ දිලීපරජු විෂයෙහි; ගුණාධිකතයා, (තමා) ගුණයෙන් අධික බැවින්; මත්ප්‍රෙතකණ්ඨාඃ කෘතාඃ, මදක් උකටළිවූවෝ කරනලදහ; [කවරකු විසින් මෙන්ද?]-සහකාරස්‍ය, මී අඹරුක්හුගේ; එලෙන, ඵලය විසින්; පුෂ්පොද්ගමෙ ඉව, [ඒ රුක්හුගේ] මල් හටගැනීමෙහි [මදක් උකටළි කරන්නාක්] මෙනි. [මෙහි රඝුනුගේ රාජ්‍යය මී අඹ ඵලයක් මෙන්ද දිලීපරජහුගේ රාජ්‍යය මී අඹමල් පිපීමක් මෙන්ද සලකනලද්දේය. මල් දැකීමම වඩා ඵලරසලාභය ජනයා සතුටු කෙරේ. එහෙයින් පුෂ්පයට වඩා ගුණාධිකවූ ඵලයවිසින් පුෂ්පයෙහි ප්‍රීතිය අඩුකරවන්නාක් මෙන් සහකාරඵලාකාරවූ රඝුරජු විසින් සහකාර පුෂ්පාකාරවූ පියරජු කෙරෙහි ජනයෝ මදක් උකටළි කරන ලදහ. ගුණයෙන් වැඩිවූ උත්තරවිෂයතෙම ගුණයෙන් අඩුවූ පූර්වවිෂය සිහිනොකරවයි යනු මෙහි භාවයි].

10. නයවිද්භිඃ, නීතිශාස්ත්‍රඥයන් විසින්; නවෙ, අභිනවවූ; රාඥි, [ඒ] රජහු විෂයෙහි; සත් අසත් ච, [ධර්‍මයුද්ධාදි] යහපතද [කූට යුද්ධාදි] අයහපතද; උපදර්ශිතම්, දක්වනලද්දේය; තස්මින්, ඒ රජු කෙරෙහි; පූර්‍වඃ පක්ෂඃ එව, පළමුකි [ධර්‍මයුද්ධාදි] සාධ්‍යයම; අභවත්, වූයේය; උත්තරඃ [පක්ෂඃ], දෙවනුකි [කූටයුද්ධාදි සාධ්‍යය] නෙම; න අභවත්, නුවූයේය. [මෙහි "පක්ෂ" යනු සිද්ධකළයුත්තයි. නීතිවෙදීන් විසින් යහපත් අයහපත් ධර්‍මයුද්ධකූටයුද්ධාදිය එරජහට දන්වන ලදුවත් රජුකෙරෙහි පිහිටියේ සිදුකළයුතු යහපත පමණෙක. අයහපත එරජු විසින් සිදුකළයුත්තක් නොවිය යනු භාවයි.]

11. පඤ්චානාම් භූතානාම් අපි, [පෘථිව්‍යාදි] පඤ්චමහාභූතයන් ගේද; ගුණාඃ, [ශබ්දරසාදි] ගුණයෝ; උත්තකීම්, අධිකභාවය;

12. ඝථා ප්‍රහ්ලාදනාච්චන්ද්‍රඃ ප්‍රතාපාත්තපතෝ ඝථා
තථෛව සොභූදඤ්චිතෝ රාජා ප්‍රකෘතිරඤ්ජනාත්.

13. කාමං කණ්ඨානතවිශ්‍රාණෙන විශාලෙ තස්‍ය ලොචනෙ
වඤ්චුඃ ඉමත්තා තු ශාසෙන්‍ද්‍රණ සූක්ෂ්මකාඃ්‍යාඃ්පිදර්ශිනා.

පුරුෂඃ, පොෂණය කළානුයැ; තස්මින්, ඒ; තෙවෙ, අලුත්වූ; මහිපාලෙ [සති], [රඝුතම්] මහිපාලයා ඇතිකල්හි; සච්චම්, සියලු වඤ්චුජාතය, තවම් ඉව අඟවත්, අලුත්වූවක් වැනි වී. [ඒ පෙර පැවැත්තාමවූ භූතජාතය අපූර්ණගුණයොගයෙන් අපූර්ණ වූවක්ම වැනි විය යනු භාවයි].

පෘථිවි, ජල, තෙජස්, වායු, ආකාශ යන පවහූතයන්ට ක්‍රමයෙන් **ගන්ධ, රස, රූප, සපර්ශ, ශබ්ද** යන මොහු ගුණයෝ **ෂඩ්ති යනු නෛයායිකාදීන්ගේ මතයි.**

12. ඝථා, යම්සේ; චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; ප්‍රහ්ලාදනාත්, අතිශයින් සතුටු කිරීම හෙතුකොටගෙන; අඤ්චිඃ, අර්චිාතුගත නම් ඇත්තෙක් විද හෙවත් **"චන්ද්‍ර"** නම් විද; ඝථා, යම්සේ; තපනඃ, සූර්‍ය්‍යතෙම; ප්‍රතාපාත්, සන්තාපජනනය හෙතුකොටගෙන; [අඤ්චිඃ, අර්චිාතුගත වූ නම් ඇත්තෙක් විද හෙවත් **"තපන"** නම් විද]- තථා එව, එසේම; සඃ රාජා, ඒ රඝුරජතෙම; ප්‍රකෘතිරඤ්ජනාත්, ජනයන් රඤ්ජනය කිරීම හෙතුකොටගෙන; [අඤ්චිඃ] අභූත් [සාර්ථක **"රාජ"** ශබ්ද ඇත්තෙක්] වී.

චන්ද්‍රයත්‍යාහ්ලාදයතීති චන්ද්‍රඃ, සතුටු කරවයි යන අර්ථයෙන් **"චන්ද්‍ර"** නම්; **"චඳි"** ධාතුනුකෙරෙන් ඔණාදික රප්‍රත්‍යයයි. තපතීති **තපනඃ**, සන්තාප කෙරේනුයි **"තපන"** නම්. **"තප"** ධාතුනු කෙරෙන් **"නන්දිග්‍රහිපචාදිභ්‍යෝ ල්‍යුණ්ණ්‍යඃ"** යන සූත්‍රයෙන් **"ල්‍යු"** ප්‍රත්‍යයයි. **"රාජන්"** ශබ්දය වූකලි දීප්‍යාර්ථ **"රාජ"** ධාතුනු කෙරෙන් ඔණාදික **"කනින්"** ප්‍රත්‍යය වීමෙන් සිඩයි. **"රඤ්ජ"** ධාතුවෙන් නොවේ එතකුදු වුවත් ධාතූන් තමන් අනෙකාර්ථ ඇති බැවින් **"රඤ්ජනාත් රාජා"** යි කිව්හු විසින් **"රාජඃ"** ඝටම රජනාර්ථය කියනලදි. රඤ්ජයත්ති **රාජා**, [ජනයන් තමා කෙරෙහි] අලවානුයි **"රාජන්"** නම්.

13. විශාලෙ, පුළුල්වූ; තස්‍ය, ඒ රඝුරජහු පිළිබඳවූ; ලොචනෙ, දෙඇස්හු; කාමම්, එකාන්තයෙන්; කණ්ඨානතවිශ්‍රාණෙන, දෙකන් සමීපයෙහි විශ්‍රාම ගත්හ හෙවත් දෙකන් ළඟට පැමිණියහ; වඤ්චුඃ තථා තු, ඇස් ඇතිබව (නෙත්‍රප්‍රයොජනය) වූහාහි; සූක්ෂ්ම කාඃ්‍යාඃ්පිදර්ශිනා, සියුම් කටයුතු ද දක්නාවූ; ශාසෙන්‍ද්‍රණ, ශාස්තු යෙහි (මැයි). [එවෙලෙ ඇත්තවුන්ගේ ඇස නම් ශාස්ත්‍රය මැයි සේසි]. මෙහි අපරාර්ධය කිසි පොතෙක:—**'කාමං කමලපත්‍රාණාං නෙත්‍රෙ තස්‍යානුකාරිණී,** කියාත් පාඨයි.

14. ලබ්ධප්‍රශමනඃසඨ්මඨෛනං සමුපසර්පිනා
පාර්ථිවශ්‍රීර්විහිතෙව ශරත් පඞ්කජලඝ්නණා.

15. නිර්ඃෂටලඝුහිර්ෂෛඃෂිමුක්තවර්ම්මා සුදුඃසහඃ
ප්‍රතාපශ්චතස්‍ය භානොශ්ච යුගපව්‍යානශෙ දිශඃ.

16. වාර්ෂිකං සඤ්භාරෙණෙව ධනුෂෛන්‍රං රඝුදීඛෙ
ප්‍රජාර්ථසාධනෙ නෙව හි පඤ්චාශොද්‍යතකාර්ම්මුකෙව.

---

14. අථ, අනතුරුව; ලබ්ධප්‍රශමනඃසඨ්ම්-ලබ්ධ, ලබනලද රාජ්‍යයාගේ; ප්‍රශමන, සන්හිදුවීමෙන් හෙවත් සතුරන් රැඳවීම් පිළිබඳ දෙකින්වූ තහවුරුකිරීමෙන්; සඨ්ම්, සමාහිත සිත් ඇත්තාවූ; එතම්, මේ රඝුරජහු වෙතට; පඞ්කජලඝ්නණා, පියුම් ලකුණුකොට ඇති; ශරත්, ශරද්ඍතුතොමෝ; පඞ්කජලඝ්නණා, පදමලඝ්නණ ඇති; විහිතා, දෙවෙනිවූ; පාර්ථිවශ්‍රීඃ ඉව, රාජලඝ්මී යක මෙන්; සමුපසර්පිතා, එළඹියාඃ.

අභිනව රාජ්‍යයෙහි කටයුතු සිදුකිරීමෙන් රජුගේ සමාහිත චිත්තතා සංඛ්‍යාත සුඛිතත්වය මෙයින් දක්වූහ. රජුවිසින් කට යුතු ප්‍රශමනයෝ—

"රඝෝ පෞරජනස්‍ය දෙශනගරග්‍රාමෙෂු ගුප්තිස්ථථා
යොධානාමථ සංග්‍රහොඃපි තුලයා මානව්‍යවස්ථාපනම්
සාම්‍යං ලිඛ්සිෂු දුඃකෘතක්‍රියකරණං න්‍යාශඃ සමාසෙනඃඒතං
කාර්ත්ස්නෙන්‍යෙව මහීභුජාං ප්‍රශමනාන්‍යෙතානි රාජ්‍ය තවෙ"

යනුවෙන් ආචාර්ය්‍ය මල්ලිනාථයන් විසින් දක්වනලදහ.

15. නිර්ඃෂටලඝුභිඃ-නිර්ඃෂ්ට, නිරවශෙෂකොට වර්ජිත කිරීමෙන්; ලඝුභිඃ, සැහැල්ලුවූ; මෙඝෛ, මෙඝයන් විසින්; මුක්තවර්ම්මා, ඔරනලද මාඟී ඇති; සුදුඃසහඃ, [එහෙයින්ම] ඉවසිය නොහැකිවූ; තස්‍ය, ඒ රඝුරජහුගේද; භානොශ්ච, සූර්ය්‍යාගේද; ප්‍රතාපඃ, පුරුෂවික්‍රමය හා තෙජස; යුගපත්, එකවිට; දිශඃ, දිගුන්; ව්‍යානශෙ, පතළේය.

මෙහි මේ ශ්ලොකය හා සමානාර්ථඇති අනික් ශ්ලොකයෙක් කිසි පොතෙක පාඨයි. හේ මෙසේය—

"නිර්ඃෂටලඝුහිර්ෂෛඃෂ සවිතුඃසහස්‍ය වොභයොඃ
වර්ධිෂ්ණවො දිශාභොගාඃ ප්‍රතාපාශෙව වෙවිත්‍රාඃ"යි

16. ඉන්‍රඃ, ශක්‍රතෙම; වාර්ෂිකම්, වර්ෂා ඍතුයෙහිවූ හෝ වර්ෂණය නිමිත්තකොට ඇති; ධනුඃ, දෙව්දුන්න; සඤ්භාර, ගත් තේය; රඝුඃ, රඝුරජතෙම; ජෙත්‍රම්, දිනනසුලුවූ; [ධනුඃ, දුන්න]; දඬෙ, බැරිය; [තුමක්හෙයින්ද?]-ඎ, යම්හෙයකින්; තෙ, ඒ

17. *අධිජ්‍යමායුධං කර්තුං සමයෝ'යං රඝෝර්ඉති
සඞ්ඛං ඛනුඃ ශඞ්කිතෙනෙව සකෘජ්‍යහ්‍රෙ ශතමන්‍යුනා.

18. පුණ්ඩරීකාතපත්‍රඤ්ච විකසත්කාශචාමරඃ
ඍතුර්විඛ්‍යඛ්‍යාමාස න පුනඃ ප්‍රාප තච්ඡ්‍රියම්.

19. ප්‍රසාදසුමුඛෙ තස්මිංශ්චන්ද්‍රෙ ව විශදප්‍රභෙ
තදූ චක්‍රුඃසමනාං ප්‍රීතිරාසීත්සමරසා මයෝඃ.

ඉන්ද්‍ර රඝු දෙදෙනා; ප්‍රජාවිසාධනෙ, ප්‍රජාවන්ගේ අපීඩිඩිය කිරීමෙහි; පයස්විනොදූතකාර්මුකෙන, වාරවෘයෙන් ඔසවනලද දුනු ඇත්තාහුද [එහෙයිනි].

පයස්විනෙණ උදූතෙ කාර්මුකෙ යාභ්‍යාං තෙන පයස්විනොදූත කාර්මුකෙන-තෘතීයා බහුව්‍රීහියි. (පාඨාන්තරයෙහි—"පයස්විනොදූම විශ්‍රමෙන" කියාද පැනේ.

17. අහම් සමයඃ, මේ ශරත්ලක්ෂණවූ කාලයතෙම; රඝෝඃ, රඝු රජහුගේ; ආයුධම්, ධනුෂ; අධිජ්‍යම් කර්තුම්, (සතුරු රජුන් පරද වනු සඳහා) නහනලද දුනුදිය ඇතිකරනු පිණිස; [භවති, වේ;] ඉති, මේ හෙතුකොටගෙන; ශඞ්කිතෙන ඉව, බියවූවකු මෙන්; ශතමන්‍යුනා, ඉන්ද්‍රයා විසින්; සඛම්, සඛිභාවූ; ධනුඃ, වාපයතෙම; සජ්‍යහ්‍රෙ, හකුළුවනුලැබී; (හරනලදැයි සේයි).

අධිගතා ජ්‍යා යත්‍ර තත් අධිජ්‍යම්-සප්තම්බහුව්‍රීහියි.

18. පුණ්ඩරීකාතපත්‍රඃ, හෙළපියුම් නමැති ශ්වෙතවර්ණ ඡත්‍රඇති; විකශත්කාශචාමරඃ, පුබුදුවන්නාවූ චැලුක්මල් නමැති චාමර ඇති; ඍතුඃ, ශරද්ඍතුතෙම; තම්, (හෙළපියුම්ක්වැනි ඡත්‍රයක් හා චැලුක් මල් වැනි චාමරඇති) ඒ රඝුරජහට; විඩම්බයාඉ්චක්‍රෙ, අනුක්‍රියා කෙළේය; (එපමණක්මුත්;) පුනඃ, නැවත; තච්ඡ්‍රියම්, ඒ රඝුරජහුගේ සම්පත්තියට; න ප්‍රාප, (ශරද්ඍතුතෙම) නොපැමිණියේය. (හෙළපියුම් හා චැලුක්මල්ඇති ශරද්ඍතුතෙම එවැනි ඡත්‍රචාමරඇති රඝුරජුට ඒ දෙකින් සමානව ක්‍රියාකළ පමණමුත් ඒ රජහුගේ සැපත වැනි සම්පත්තියකට පැමිණිය නුහුණුයේය යනු භාවයි).

පුණ්ඩරීකමෙව ආතපත්‍රං යස්‍ය සඃ 'පුණ්ඩරීකාතපත්‍රඃ' විකසන්ති කාශානි එව චාමරාණි යස්‍ය සඃ 'විකසත්කාශචාමරඃ' යීද වාක්‍යයි.

19. ප්‍රසාදසුමුඛෙ, පැහැදීමෙන් යහපත් මුවඇති; තස්මින්, ඒ රඝුරජහු කෙරෙහිද; විශදප්‍රභෙ, නිර්මලකාන්තිඇත්තාවූ; චන්ද්‍රෙ ව, සඳු කෙරෙහිද සෙ; චක්‍රෝඃ, දෙදෙනා කෙරෙහි; තදූ, එකල්හි; චක්‍රුඃසමනාම්, ඇස් ඇත්තවුන්ගේ; සමරසා, සමාන ආස්වාදඇති; ප්‍රීතිඃ, ප්‍රීතියක් තොමෝ; ආසීත්, වූවාය.

---

* මේ ශ්ලෝකය සර්වඥ පොතෙක නොපැනේ.

20. හංසශ්‍රේණීෂු තාරාසු කුමුදවතසු ච වාරිෂු
විභූතයඃ සමුදියාතාං පක්ෂිණාං ඉව පතුරිණාං.

21. ඉක්ෂුවිකාශයනිඃශාදින්‍යඃ ගොපතුර්ගුණොදයම්
ආකුමාරකතොද්ඝාතං ශාලිගොප්‍යොජගුර්‍යශඃ.

මෙහි ජනානුරාගසවරූප ප්‍රීතිගුණය වර්ණනීයවූ රඝුරජු කෙරෙහි කිසිවිට විය. එයින් උත්කෘෂ්ටවූ චන්ද්‍රයා හා සමකක්ෂකාව යෙන් තද්ගුණභාගිත්වකීර්තනයෙන් රජතෙම සතුතය. එහෙයින් මේ තුල්‍යයොගිතා නම් අලඞ්කාරය වේ.

20. හංසශ්‍රේණීෂු, හංසපඞ්කතීන්හිද; තාරාසු, තාරකාවන්හිද; කුමුවත්සු, කුමුදුමල් බොහෝකොට ඇති; වාරිෂු ව, ජලයන්හිද; තදියානාම්, ඒ රඝුරජහු සම්බන්ධවූ; යශසාම්, කීර්තීන්ගේ; විභූතයඃ, සම්පත්තීහු; පක්ෂ්‍යඝ්‍රාඃ ඉව පතුරුවනලද්දාහුදෝහෝ; (අන් පරිද්දෙකින් මොවුන්ගේ ඛවලත්වය කෙසේ වීද යනු භාවයි).

මේ උත්ප්‍රේක්ෂාලඞ්කාරයෙහි ඉවශබ්දය උත්ප්‍රේක්ෂාව්‍යඤ්ජකයි. කුමුදානි සන්ති යෙෂු කුමුවතසු- "කුමුදනඩවෙතසෙභ්‍යොඩ මතුප්" යන්නෙන් "කුමුද" ශබ්දයාකෙරෙන් අස්‍යාර්ථයෙහි ඩිම තුප් ප්‍රත්‍යයයෑ හෙවත් 'ඩින්' වූ මතුප්‍රත්‍යයයි.

21. ඉක්ෂුවිකාශයනිඃශාදින්‍යඃ, උක්ඛස්සෙවණෙහි හුන්නාවූ; ශාලි ගොප්‍යඃ, හැල්ගෙවිලියෝ; ගොප්තෘඃ, (ජනයන්) රක්නාවූ; තස්‍ය, ඒ රඝුරජහුගේ; ගුණොදයම්, ගුණයෙන් හටගත්තාවූ; ආකුමාර කතොද්ඝාතම්-ආකුමාර, කුමරුවා පටන් පැවති; කතොද්ඝාතම්, කථාරම්භ ඇත්තාවූ හෙවත් ළදරුවන් විසිනුදු වර්ණනා කරනු ලබන්නාවූ; යශඃ, යසස; ජගුඃ, ගායනය කළාහුය; නොහොත්— යශඃ, යසස; ආකුමාරකතොද්ඝාතම්, කුමාරවූ රඝුහුගේ (ඉඳුවිජ යාදි) කථාවන් දක්වා ආරම්භ ඇතිකොට; ජගුඃ, ගායනය කළාහුය.

15. චාරු නෘත්‍යවිගමෙ ච තන්මුඛං
සෙදඛින්නතිලකං පරිශ්‍රමාත්
ප්‍රෙමදත්තවදනානිලඃ පිබන්-
නන්‍යජීවදමරාලකෙශවරෙණ.

16. තස්‍ය සාවරණදෘෂටසන්ධයඃ
කාම්‍යවස්තුෂු නවෙෂු සඞ්ගිනඃ
වල්ලභාභිරුපසෘත්‍ය චක්‍රිරෙ
සාම්භුකත්‍රිවිෂයාඃ සමාගමාඃ.

නාටිකාඛ්‍යනාවන් නවතකල්හි රජ තෙමේ ම ප්‍රඥකර නම් වද්‍යවිශෙෂය වාදනය කෙරෙයි. එහෙයින් රජු කෙරෙහි ඇලුණු නාටිකාවෝ නැටීමට ද අසමර්ථ වූවාහු තමන්ගේ ඇඳුරන් ද ළඟ සිටින බැවින් ලජ්ජාවට පෑමිණියාහ යනු භාවයි.

15. චාරු, මනොඥ වූ; නෘත්‍යවිගමෙ ව, නෘත්‍යය අවසන් වූ කල්හි ද; පරිශ්‍රමාත්, නැටීමේ වෙහෙසින්; සෙදඛින්නතිලකං, ඛහදියෙන් බිඳුණු (විසුරුණු) තිලක ඇත්තා වූ; තත්මුඛං, ඒ නාටිකාඛ්‍යතාවගේ මුහුණ; ප්‍රෙමදත්තවදනානිලඃ, ප්‍රෙමයෙන් දෙනලද මුඛමාරුත ඇත්තේ; පිබන්, පානය කරන්නේ; අමරාල කෙශවරෙණ, (අමරාවතීරාජධානියෙහි සහ අලකාපුරියෙහි ඊශ්වර වූ) ඉන්ද්‍රකුවෙරදෙදෙනා; අන්‍යජීවත්, ඉක්මවා ජීවත්වී ය. ඊටත් වඩා උත්කෘෂටජීවිත ඇත්තේ විය යි සේයි.

ඉන්ද්‍රාදීන්ට මෙබඳු සෞභාග්‍යයක් දුර්ලභ හෙයින් ඔවුන්ට ද වඩා ශ්‍රෙෂඨ විය.

16. උපසෘත්‍ය, අන්තැන්හි හොස්; නවෙෂු, අභිනව වූ; කාම්‍යවස්තුෂු, හොග්‍යවස්තූන්හි; සඞ්ගිනඃ, ආසක්ත සිත් ඇත්තා වූ; තස්‍ය, ඒ අග්නීවර්ණරජහුගේ; සාවරණදෘෂටසන්ධයඃ, ආවරණ සහිත වූ ද ප්‍රකාශ වූ ද සන්ධාන ඇත්තා වූ; සමාගමාඃ, ඒ සඛ්‍යයෝ; වල්ලභාභිඃ, ප්‍රියාවන් විසින්; සාම්භුකත්‍රිවිෂයාඃ, අසීසක් විදිනලද විෂයප්‍රවෘත්ති ඇත්තෝ; චක්‍රිරෙ, කරනලදහ.

කෑමැතිපරිද්දෙන් පරිභොග කරන ලද්දේ නම් රජ තෙම අප හා සැප විඳීමෙහි ආසා නැත්තේ නැවත අපගේ සමීපයට නොඑන්නේ යයි සිතා රජහට සම්පූර්ණසැප විඳීමට ඉඩ හුදුන්හ. අසීයක් සැප දුන්හ.

17. අඞ්ගුලිකිසලයාග්‍රනර්ජනං
භ්‍රූවිභඞ්ගකුටිලඤ්ච වික්ෂිතම්
මෙඛලාගිරසනාවව බන්ධනම්
වඤ්චයන් ප්‍රණයිනීරවාප සඃ.

18. තෙන දූතීවිදිතං නිමෙදුෂා
පාඤ්චතඃ සුරතවාරරාත්‍රිෂු
ශුශ්‍රුවෙ ප්‍රියජනස්‍ය කාතරං
විප්‍රලම්භපරිශඞ්කිනෝ වචඃ.

19. ලෞල්‍යමෙත්‍ය ගෘහිණීපරිග්‍රහාන්-
නත්‍රිකිඤ්චසුලභාසු නම්‍රතා
වත්‍රතෙ සම ස කථඤ්චිදුල්බණ-
නඩ්ගුලික්‍ෂරණඝනතවත්තිකඃ.

---

17. සඃ, ඒ අග්නිවර්ණ තෙම; ප්‍රණයිනීඃ, ප්‍රියාවන්; වඤ්චයන්, වඤ්චා කරමින් (අන්‍යස්ථානවලට යමින්); අඞ්ගුලිකිසලයාග්‍රනර්ජනං, ඇඟිලි නමැති පලුපත්අගින් තර්ජනය කිරීමට ද; භ්‍රූවිභඞ්ගකුටිලං, බැම ඇකිළීමෙන් වක් වූ; වික්ෂිතම්, බැලීමට ද; අඤ්චතඃ, නොයෙක් වර; මෙඛලාගිඃ, මෙවුල්දම්වලින්; බන්ධනඤ්ච, බැම්මට ද; අවාප, පැමිණියේ ය.

18. සුරතවාරරාත්‍රිෂු, ක්‍රීඩාවාරයන් සඹඳ රාත්‍රීන්හි; දූතීවිදිතං, දූතිය දැනුවත්ව; පාඤ්චතඃ, පශ්චාත්භාගයෙහි; නිමෙදුෂා, නිෂ්ඵලත්‍ව කරන්නා වූ; තෙන, ඒ අග්නිවර්ණරජු විසින්; විප්‍රලම්භ පරිශඞ්කිනඃ, විරහය පිළිබඳ සැකඇත්තා වූ; ප්‍රියජනස්‍ය, ප්‍රියාවගේ; කාතරං, බැගැපත් වූ; වචඃ, වචනයන්; ශුශ්‍රුවෙ, අසන ලද්දේ ය.

රජ තෙම සත්‍රීන් සමග සඞ්ගමය පිණිස නියමිත රාත්‍රියෙහි තමා සමීපයට පැමිණි දූතස්ත්‍රියගේ පිටිපසින් ප්‍රියාව කරු ගොස් ඇට නොපෙනෙන සේ සිට රජු පැමිණි බැව් නොදත් ප්‍රියාව විසින් කියනු ලබන "අහෝ අද රජු නොපැමිණේ ද කිම මා හා කෝපයෙන් නොආයේ ද" යනාදි වියොගදුකට පැමිණ කියන බැගැවවන අසනලදි.

19. ගෘහිණීපරිග්‍රහාත්, රාජීන් සමග සඞ්ගමය හෙතු කොට ගෙන; නත්‍රීකිඤ්චසුලභාසු, වෙසඟනන්; අසුලභාසු, දුර්ලභකල්හි; ලෞල්‍යම්, චපලත්වයට; එත්‍ය, පැමිණ; අඞ්ගුලික්‍ෂරණඝනතවත්තිකඃ, ඇඟිලිවල ඔගදිය වැකිරීමෙන් ගිලිහුණු තෙලිකුර ඇත්තා වූ අග්නි

20. ප්‍රෙමගර්භිතවිපක්ෂමත්සරා-
දයනාවව මදනානමශිඤ්ඡිතම්
නිනය්‍යුරුත්සවව්‍යිඛ්‍යජලෙන තං
දෙව්‍ය උජ්ඣිතරුෂඃ කෘතාර්තිතාම්.

21. ප්‍රාතරන්‍ය පරිභොගශොභිනා
දර්‍ශිනෙන කෘතඛණ්ඩනව්‍යථාඃ
ප්‍රාඤ්ජලිඃ ප්‍රණයිනීඃ ප්‍රසාදයන්
සෝ'දුනොත් ප්‍රණයමන්දරඃ සුතඃ.

වණ්ණ තෙම; තද්වපුඃ, ඒ නාරිකාඛනාවන්ගේ ශරීරවිත්‍රය; ආලිඛන්, අඳිමින්; කථඤ්චිත්, කෙසේ නමුත් (දුකසේ); ව්‍යර්තතෙ සම, පැවැත්තේ ය (රාජීන් සම්පයෙහි ම නැවතුණේ ය.)

වෙසඟනක් කරා යාමට අවකාශ නොලැබුණු විට ඔවුන්ගේ ශරීරවිත්‍රය අඳින්ට පටන්ගනී. එකල්හි ඩඟවැඟිරි තෙලිකුර ද වැටුණු හෙයින් දුකසේ සිවියේ යයි සේසි.

අඞ්ගුලීනාං ඝරණෙන-සඤ්ඤා-වර්ත්තිකා යස්‍ය = සඃ, අඞ්ගුලී ඝරණසඤ්ඤාවර්ත්තිකඃ.

20. ප්‍රෙමගර්භිතවිපක්ෂමත්සරාත්: ප්‍රෙමගර්භිත- ප්‍රෙමයෙන් ආඩම්බර වූ; විපක්ෂ- සපත්නීජනයා කෙරෙහි; මත්සරාත්, මසුරු කම හෙතු කොට ගෙන ද; ආයතාත්, වැඩුණා වූ; මදනාත් ච, අනඩහයා හෙතු කොට ගෙන ද; දෙව්‍යඃ, මෙහෙසිහු; උජ්ඣිත රුෂඃ, හරනලද කෝප ඇත්තාහු; තං මහීක්ෂිතම්, ඒ රජහු; උත්සවව්‍යිඛ්‍යජලෙන, වදනොත්සවව්‍යාජයෙන්; කෘතාර්තිතාම්, අර්ථ සිද්ධියට; නිනය්‍යුඃ, පැමිණ වූහ.

උත්සවයක් කෙරෙමි සි යම් බිසවක් කී නම් රජු ඒ සථාන යට අනායාසයෙන් පැමිණේ. පැමිණි කල්හි අන්තැනෙක යා නොදී එහි ම සිටුවාගනී. එහෙයින් කීහ: උත්සවව්‍යාජයෙන් ඒ රජු කෘතාර්තාඛවට පැමිණ වූහ සී.

21. සඃ, ඒ අග්නිවර්ණරජ තෙම; ප්‍රාතඃ, උදෑසන; එත්‍ය, පැමිණ; පරිභොගශොභිනා, පරිභොගයෙන් හොබනා වූ: දර්‍ශිනෙන, දැකීම හෙතු කොට ගෙන; කෘතඛණ්ඩනව්‍යථාඃ, කරන ලද ආශාභඞ්ගදුක් ඇත්තා වූ; ප්‍රාණයිනීඃ, ප්‍රියාවන්; ප්‍රාඤ්ජලිඃ, බඳැඳිලි ව (නමස්කාර කරමින්); ප්‍රසාදයන්, සතුටු කරවමින්; සුතඃ, නැවත; ප්‍රණයමන්දරඃ, විශ්වාසයෙහි අලස වූයේ; අදුනොත්, ඔවුන්ගේ සන්තාපවර්ධනය කෙළේ ය.

22. සවපනකීර්තිනවිපක්ෂමඛණනාඃ
ප්‍රත්‍යහෙත්සුරවදනනාය එව නම්
ප්‍රව්‍රජදනනගලිනාශ්‍රුබින්දුගිඃ
ක්‍රොධගිනනවලයෙඃවිවතීනෙඃ.

23. සාපනපුෂපශයනාන් ලනාගෘහා-
නෙනඃ දූතිසානමාගිදශීනඃ
අන්‍යහූත් පරිජනාඛණනාරතං
සෝ'වරොධනසවෙපථූනනරම්.

ඒ අග්නිවර්ණ රජ එක් සත්‍රියකට අද එමි සි ප්‍රතිඥ දී එහි නොගොස් අන් හැනක අන් සත්‍රියක් සමග වැස උදැසන පැමිණි සේක්. පැමිණ ආශ්‍රාහඬයට (බණ්ඩිහාබවට) පැමිණ දුකඛිත වූ පළමු ප්‍රතිඥ දුන් සත්‍රින්ට බදාදිලි ව නමස්කාර කරමින් සතසයි. එහෙත් තෑවහ ද විශ්වාසය කැඩිමෙන් ඒ සත්‍රින් වැඩියක් ම දුකට පවුණුවයි යනු භාවයි.

අන් හැනක රැ ගත නොව උදේ පැමිණියා වූ, අන් සත්‍රියක් හා සමෙහාගයට පැමිණි ලකුණු ඇති පුරුෂයා දැක සෝප වූ සත්‍රිය 'බණ්ඩිතා' නම් වේ. එසින් කිහ:-

"නීතාන්‍යත්‍ර නිශාං ප්‍රාතරුගතෙ ප්‍රාණවල්ලභෙ
අන්‍යා සමෙහාගවිහ්නසතු භූපිතා බණ්ඩිතා මතා" සි

ප්‍රතාපරුද්‍රයෙසි.

22 සවපනකීර්තිනවිපක්ෂං, සවප්නයෙන් ප්‍රහාණ කරනලද සතුරුසත්‍රිජනයා ඇත්තා වූ; හම්, ඒ අග්නිවර්ණ රජහට; (සිනෙන් අන්‍යසත්‍රින්ගේ නම් කීමා වූ ඒ අග්නිවර්ණ රජහට) අවදනන්‍යඃ එව, තිබූ නොකරන්නා වූ ම; අඛනාඃ, සත්‍රිහු; ප්‍රව්‍රජදනන ගලිතාශ්‍රුබින්දුභිඃ, ඇදෙහි අතුරනලද ඇතිරිලිවැද හෙළනලද සඳුඵබින්දුවලින් ද; ක්‍රොධඝ්‍රානවලයෙඃ, ක්‍රොධයෙන් බිඳින ලද වළලුවලින් ද; විවතීනෙඃ, ඕහට අනඉවුඛ වීමෙන් ද; ප්‍රත්‍යහෙත්සුඃ, බියගැන් වූහ.

අග්නිවර්ණ තෙම සිනෙන් අන්‍යසත්‍රින්ගේ නම් ගම් කියයි. එකල්හි ඇදේ සයනය කළ රාජමහේසිකාවෝ මෙතුමා ගොත්‍රය කිලුටු කරන්නෙහැ සි කලකිරී අඬා වළලු ආදිය කඩා දමා රජු හැර අන්අහසට හැරී කෝපයෙන් ශයනය කළෝ සි

23. දූතිභාෂිතමාගීදශීනඃ, දූතීන් විසින් මාගිය දක්වනලද; සඃ, ඒ අග්නිවර්ණ රජ තෙම; සාපනාපුෂපශයනාන්, කරනලද

24. නාම වල්ලභජනස්‍ය තෙ මයා
ප්‍රාප්‍ය භාග්‍යමපි තස්‍ය කාඞ්ක්ෂ්‍යතෙ
ලොලුපං වත මනෝ මමෙති නං
ගොත්‍රවිස්ඛලිතමූචුරඞ්ගනාඃ.

25. චූණීබභ්‍රුලුලිතස්‍රගාකුලං
ජීර්ණමෙඛලමලක්ෂිතාඞ්කිතම්
උත්සිතස්‍ය ශයනං විලාසින-
ස්තස්‍ය විභ්‍රමරතාන්‍යපාවෘණොත්.

මල්යහන් ඇත්තා වූ; ලතාගෘහාන්, ලියමඬුලුවලට; එතෑ, පැමිණ; අවරොධභයවෙපථූනරම්, අන්තඃපුරජනයා කෙරෙහි භීතියෙන් අධිකකම්පා ඇත්තේ; පරිජනාඞ්ගනාරතං, දාසාඞ්ගනාවන් හා සඞ්ගමය; අඞ්ගූත්, පැවැත්වී ය. (සවකීය මෙනෙසින් නොදැනුවත්ව දාසස්ත්‍රීන් සමඟ රතික්‍රීඩානුභව කෙළේ ය.)

24. මයා, මා විසින්; තෙ, ඔබ්ගේ; වල්ලභජනස්‍ය, ප්‍රියජනයාගේ; නාම, නාමයට; ප්‍රාප්‍ය, පැමිණ; (නෙවත් ඔබගේ ආදරවනතියගේ නමින් කථාකිරීම නිසා) තස්‍ය, ඒ ප්‍රියජනයාගේ; භාග්‍යං අපි, සම්පත ද; කාඞ්ක්ෂ්‍යතෙ, බලාපොරොත්තුවනුලැබේ; මම, මාගේ; මනඃ, සිත; වත, එකාන්තයෙන්; ලොලුපං, ඉතා චපලනොවේ ද; -ඉති, මෙසේ; අඞ්ගනාඃ, ප්‍රියාඞ්ගනාවෝ; ගොත්‍ර විස්ඛලිතං, නම් මාරුවීම ඇති; තං, ඒ රජහට; ඌචුඃ, කීහ.

යම් ස්ත්‍රියක් කෙරෙහි ගොත්‍රස්ඛලනය වී ද ඒ ස්ත්‍රී "මහරජ මම ඔබගේ ප්‍රියතැනැත්තියගේ නාමයෙන් ආමන්ත්‍රණය කරනලද්දෙමි. එහෙයින් ඒ ඔබගේ ප්‍රීතාව විසින් ලබන සැපය ද ලබනු කැමැත්තෙමි සැබවින් ම මගේ සිත චපල ය" යි රජුට කියයි. ගොත්‍රස්ඛලනය නම් එක් භාර්‍යාවක් සමඟ වෙසෙමින් අන් භාර්‍යාවගේ නම්ගොත් කියා ආමන්ත්‍රණය කිරීම යි.

25. චූණීබභ්‍රුලුලිතස්‍රගාකුලං: චූණීබභ්‍රු, කොකුම්සුණු ආදියෙන් පිඟුවන් වූ; ලුලිත- කැළඹුණා වූ; ස්‍රගාකුලං, මාලාවලින් ව්‍යාකුල වූ; ජීර්ණමෙඛලම්, සිදුණා වූ මෙවුල්දම් ඇති; අලක්ෂිතක+අඞ්කිතම්, ලාඛඵපාවින් ලකුණු කරන ලද්ද වූ; ශයනං, ඇඳ; උත්සිතස්‍ය, තැඟී සිටියා වූ; විලාසිනඃ, සුරතක්‍රීඩායෙනි ඇලුණු; තස්‍ය, ඒ අග්නිවර්ණරජහුගේ; විභ්‍රමරතානි, ක්‍රීඩාවිශෙෂයන් (සුරතබන්ධවිශෙෂයන්); අපාවෘණොත්, ප්‍රකට කෙළේ ය.

ව්‍යානනාදි රතික්‍රීඩාබන්ධනයන්ගේ වෙසෙස් රතිරහස්‍යයෙන් දතයුතු ය. එයින් එක් ශ්ලොකයෙක් මෙසේ ය:-

26. ස සඛයං වරණරාගමාදධෙ
යොෂිතාං න ච තථා සමාහිතඃ
ලොභ්‍යමානනයනඃ ශලථාංශුකෙ-
මේඛලාගුණපදෙර්නිතම්බිභිඃ.

27. චුම්බනෙ විපරිවර්තිතාධරං
හස්තරොධි රශනාවිසර්පණෙ
විඝ්නිතෙච්ඡමපි තස්‍ය සම්මතං
මන්මථෙඞ්ගිතමභූද් වධූරතම්.

28. දර්ශිතෙෂු පරිභොගදර්ශිනීර්-
නාම්නුවීමනුපාඝ්‍යසංස්ථිතඃ
ජායයා සමිතමන්වයා වධූඃ
ශ්‍රීනිමීලිතමුඛ්‍යමඛාර සඃ.

"ව්‍යානතං රහමිදං ප්‍රියා යදි ස්‍යාදධොමුඛවතුෂ්පදූකෘතිඃ
තත්කථිං සමධිරුහ්‍ය වෘද්ධහං ස්‍යාදඛාණ්ඩාදිපශුසංස්ථිතඃ සථිරඃ"
ව්‍යානතබන්ධය මෙසේ දැක්වී.

26. සඃ, ඒ අග්නිවර්ණී නෙම; සඛයං, නෙමේ ම; යොෂිතාං, කාන්තාවන්ගේ; වරණරාගං, පාදරාගය (නෙවත් පාදයන්හි ලාක්ෂාරසය); ආදධෙ, ගැවේ ය: ශලථාංශුකෙඃ, ලෙහුණු වසත්‍ර ඇත්තා වූ; (සවාමියා විසින් ශරීරස්පර්ශය කිරීම් හෙතුවෙනි.) නීතම්බිභිඃ, උකුළු ඇත්තා වූ; මෙඛලාගුණපදෙඃ, මෙවුල්දම් එලව සථානය වූ කටිභාගයෙන්; ලොභ්‍යමානනයනඃ, ආකර්ෂණය කරනු ලබන නෙත් ඇත්තේ; තථා, එසේ; සමාහිතඃ, එකඟ සිතින්; න ච (අභූදධෙ), ලාක්ෂාරසය නොගැවේ ය.

27. චුම්බනෙ, සිඹීමේදී; විපරිවර්තිතාධරං, අන්අතකට හරවනලද තොල් ඇත්තා වූ; රසනාවිසර්පණෙ, මෙඛලාදම ලිහිල් කිරීමෙහි; හස්තරොධි, අතින් (හෝ අත) වළක්වන්නා වූ; වධූරතම්, කාන්තාභිරමනය; විඝ්නිත + ඉච්ඡං අපි, බාධා කරන ලද ආසා ඇත්තේ ද; සම්මතං, සම්ප්‍රහාරයෙන්; මන්මථ + ඉඞ්ගිතං, කාමාග්නියට දර (කාමොද්දීපනයට හෙතු); අභූත්, වූයේ ය.

28. සඃ, ඒ අග්නිවර්ණී නෙම; දර්ශිතෙෂු, කැවපත්හි; පරිභොගදර්ශිනීඃ, සම්භොගලකුණු දක්නා වූ; වධූඃ, කාන්තාවන්; නාම්නුවීම, කෙළිපෙරදුරු ව; අනුපාඝ්‍යසංස්ථිතඃ, (ඒ කාන්තාවන්ගේ) පිටිපස්හි; සංස්ථිතඃ, සිටියේ; සම්මත- මදසිතායෙන්; මන්වයා, මඛහර වූ; ජායයා, පිළිබිඹුවෙන්; ශ්‍රීනිමීලිතමුඛ්‍යඃ, ලජ්ජාවෙන් නැමුණු මුහුණු ඇත්තියන්; වඛාර, කෙළේ ය.

29. කණ්ඨස්‍යකථාමෘදුබාහුබන්ධනාම්
න්‍යස්තෝපාදතලෝපධානදශෝ
ප්‍රාප්‍යෙවනත්‍ය ශයනෝත්සිතං ප්‍රියා-
සඛං නිශාන්‍යෂවිසර්ජිතාග්නිබන්ධනම්.

30. ප්‍රෙක්ෂ්‍ය දර්භණතලස්ථමාත්මනෝ
රාජවේෂමතිශක්‍රශොභිනම්
පිත්‍රියෙ න ස තථා යථා යුවා
ව්‍යක්තලක්ෂ්ම පරිභොගමණ්ඩනම්.

31. මිත්‍රකාර්‍යමුපදිශ්‍ය පාර්ථිවං
ප්‍රස්ථිතං තමනවස්ථිතං ප්‍රියා
විද්ම හෙ ශඨ! පලාශනවල්ගු-
ර්හංසජ්‍යෙති රුරුධ්‍රු කාව්‍යග්‍රහෙ.

---

29 ප්‍රියා, භාර්‍යාවෝ; කණ්ඨස්‍යකථාමෘදුබාහුබන්ධනාං: කණ්ඨස්‍යකථා-බොටුවෙහි යොදනලද; මෘදු-මොළොක් වූ; බාහු බන්ධනම්, හසනබන්ධන ඇත්තා වූ; අන්‍යුපාදයෝ:, රජුගේ අන්‍යුපාද යන්හි; න්‍යස්තොපාදතලං, පිහිටුවනලද සඛකීය පතුල් ඇත්තා වූ: ශයනොත්සිතං, යහනෙන් නැඟී සිටියා වූ; තං, ඒ අග්නිවර්ණරජහු අතින්; නිශාන්‍යෂවිසර්ජිතාග්නිබන්ධනම්, උදැසන හැර (ඉවත්ව) යාම පිළිබඳ සිඹීම; ප්‍රාප්‍යෙවනත්‍ය, ප්‍රාප්තා කාලාහු ය (ඉල්වූහ):

30. යුවා, තරුණ වූ; සඃ, ඒ අග්නිවර්ණරජ තෙම; අත්‍යන්ත්‍රක් ශොභිනම්, ශක්‍රයාට වඩා ශොබනා වූ; දර්භණතලස්ථං, කැටපහෙහි පිහිටියා වූ; ආත්මනඃ, තමාගේ; රාජවේෂං, රාජවේෂය; ප්‍රෙක්ෂ්‍ය, බලා; යථා, යම්සේ; ව්‍යක්තලක්ෂ්ම, ප්‍රකටලක්ෂණ ඇත්තා වූ; පරිභොගමණ්ඩනම්, සුරතාලඞ්කාරය දැක සතුටු වී ද; තථා, එසේ; න ප්‍රිත්‍රියෙ, සතුටු නොවී.

මේ රජ තෙම කැඩපතින් මුහුණ බලන්නේ ශක්‍රයාටත් වඩා ශොභන වූ තමාගේ රාජරූපය දැක්ම සත්‍රීපරිභොගයෙන් වූ නඛක්ෂතාදි ලකුණු දැක යම්සේ සතුටු වීනම් එසේ සතුටු නොවී ය. රූපශොභාව දැකීමටත් වඩා පරිභොගලකුණු දැකීම ම ප්‍රියකරවියයි සේසි.

31. මිත්‍රකාර්‍යං, මිත්‍රයකුගේ කටයුත්තක්; අපදිශ්‍ය, දක්වා; පාර්ථිවඃ, පෘථිවීන්; ප්‍රස්ථිතං, යන්ට සැරසුණු වූ; අනවස්ථිතාං, සිටින්නට අසමර්ථ වූ (වසඳවූ වූ ; තං, ඒ අග්නිවර්ණරජහු; ප්‍රියාඃ, අඹණන්නාවෝ; හෙ ශඨ, එම්බා වසඳවයා: පලාශනවල්ගූනි, බැහැර

32. තස්‍ය නිදියරතිශ්‍රමාලසාः
කණ්ඨසූත්‍රමපදිශ්‍ය යොෂිතः
අධ්‍යශෙරත වෘහද්භුජාන්තරං
පිවරස්තනවිලුලිතවල්කලම්.

33. සඛ්‍යමාය නිශි ගූඪචාරිණං
චාරදූතිකපිතං පුරොගනාः
වක්ෂසිෂ්‍යසි කුතස්තනමොචනං
භාමුතෙති වධාජුෂ්තමඛ්‍යනාः.

පලා යාමේ ව්‍යාජයෙන්; අඤ්ජසා, තත්වූ පරිද්දෙන්; විදම්ः+ඉති, දැනිමූ යයි; සාවශ්‍රහෙः, කෙස්වලින් ගෙන; රැරැට්ः, ගමන වැළැක් වූහ.

රජු ප්‍රයෝගයෙන් අහන්න් රව්වා අන් හැන්හෝට පළාගාමට් සැරසෙන් ම සත්‍රිහු ඔහුගේ කෙස්වැටියෙන් ගෙන වැළැක්වූහ.

32. නිර්‍දියරතිශ්‍රමාලසාः: නිර්‍දය-දයා රහිත වූ (අධික වූ); රති ශ්‍රම+අලසාः, රති කෙළිවිඩාවෙන් අලස වූ; යොෂිතාः, අඹුන්නාවෝ; කණ්ඨසූත්‍රම්, කණ්ඨසූත්‍රාලිඛ්‍යතය; අපදිශ්‍ය, හඹවා; පිවරස්තන විලුලිතවල්කලම්, පිරුණු තනවලින් පිරිමැදිනලද විලවුන් ඇති; තස්‍ය, ඒ අග්නිවර්ණරජහුගේ; වෘහද්භුජාන්තරං, මහත් විසෘඃසථල යෙහි; අධ්‍යශෙරත, ශයනය කොළෝය.

අධික වූ රතික්‍රීඩාවෙන් ශ්‍රාන්ත වූ සත්‍රිහු ශ්‍රාන්ත් වූ බව නොකියා කණ්ඨසූත්‍ර නම් අලිඛ්‍යනවිශෙෂව්‍යාජයෙන් ඒ රජුගේ විසෘඃසථලයෙහි ශයනය කෙරෙත්.

කණ්ඨසූත්‍රආලිඛ්‍යනය නම්:-

"යත් කුර්‍යාතෙ වක්ෂසි වල්ලභස්‍ය–
සන්තාපනිඃසාතං නිර්ඩොපගූඪම්
පරිශ්‍රමාර්‍තං ශමකෙර්දශාඃ
තත් කණ්ඨසූත්‍රං ප්‍රවදන්ති සන්තඃ"

සත්‍රිහු පරිශ්‍රමාපගමය පිණිස පුරුෂයාගේ විසෘඃසථලයෙහි ගාඪා ලිඛ්‍යනය කොට හෝවත් ද ඒ කණ්ඨසූත්‍රාලිඛ්‍යන නමැයි පණ්ඩිතයෝ කියත්.

33. සඛ්‍යමාය, ක්‍රීඩා පිණිස; නිශි, රාත්‍රියෙහි; ගූඪචාරිණං, රහසිගත ව හැසිරෙන්නා වූ; චාරදූතිකපිතං, දූතචාරාඛ්‍යනාවන් විසින් කියනලද්දා වූ (දන්වනලද්දා වූ); තං, ඒ අග්නිවර්ණරජහු; අඛ්‍යනාඃ, කාන්තාවෝ; පුරොගනාඃ, ඉදිරියට ගියාහු (වළක්වන

34. යොෂිතාමුඛ්‍යනෙදිවාර්චිෂාං
සුපශීනිඃශ්‍රිතිමසාවවාප්නුවන්
ආරුරොහ කුමුදාකරෙපමාං
රාත්‍රිජාගරපරෝ දිවාශයඃ.

35. වෙණුනා දශනපීඩිතාධර-
ව්‍රණසා නඛපදාඞ්කිතොරවඃ
ශිල්පකාය්‍ය උභයෙන වෙජිතා-
ස්තං විජිහ්මනයනා ව්‍යලොභයන්.

ලද මාගී ඇත්තාහු; කාමුක, එම්බා කාමුකය; තමොවෘතඃ, අඤ්ඤකාරයෙන් වසනලද්දේ (නොහොත් සැඟවුණේ); කුතඃ, කුමන් හෙයින්; වඤ්චයිෂ්‍යසි ඉති, වඤ්චා (රැවටීම) කරන්නෙහිදැ සි; වකෘෂුඃ, ඇද්දහුග (සවකීය ගෘහවලට ගෙන ගියාහු ය).

34. උඩුපතෙඃ, වණ්ඩයාගේ; අර්චිෂාං ඉව, කානනීන් වැනි වූ; යොෂිතාං, කාන්තාවන්ගේ; සුපශීනිඃශ්‍රිතීං, පහස්සුවයට; අවාප්නුවන්, පැමිණෙමින්; රාත්‍රිජාගරපරඃ, රාත්‍රියෙහි නිදිනොරකිරීමෙහි යෙදුණා වූ දිවාශයඃ, දුවල් සයනය කරන්නා වූ; අසෞ, මේ අග්නිවණ්ඩරජ තෙම; කුමුදාකරෙපමාං, කෙරවීකරයක් හා උපමාන බවට; ආරුරොහ, පැමිණියේ ය.

කුමුදාකරය=කුමුදඵුල්ල රැ පුබුදිසි දවල් හැකිළෙසි එහෙයින් කීහ. "දිවාශයඃ කුමුදාකරොපමාං ආරුරොහ" සි.

35 දශනපීඩිත + අධරාඃ, දත්වලින් පෙළුනලද තොල් ඇත්තා වූ; නඛපද+අඞ්කිත + උෂ්ඨවඃ: නඛපද- නියපොතුපහරින්; අඞ්කිත- සලකුණු කරනලද; උෂ්ඨවඃ, කළවාපෙදෙස් ඇත්තා වූ (තුවාල කරනලද තොල් හා කළවා ඇත්තා වූ); වෙණුනා, වස්කුළල්වලින් ද; ව්‍රණයා, ව්‍රණාවෙන් ද යන; උභයෙන, දෙකින්; ශිල්පකාය්‍යඃ, (ශිල්පදක්වන) ගායිකාවෝ; වෙජිතාඃ, පීඩිත වූවාහු; විජිහ්මනයනාඃ, ඕක්‍රදෘෂ්ටි (රවා බැලුම්) ඇත්තාහු; තං, ඒ අග්නිවණ්ඩරජහු; ව්‍යලොභයන්, ප්‍රලොභ කරවූහ.

කළවා හා දෙතොල් තුවාල වූ කල වීණාගායනය හා වෙණු වාදනය දුෂ්කර වෙයි. එසේ වුවත් වෙණුවිණාවාදනය නියම වූ සත්‍රීන්ට ශිල්ප දැක්වීමට (ගායනයට) කී කල්හි නොහැකැ යි කීමට ද කාරණය කීමට ද ලජ්ජාවූවාහු තමා කළ දෙය නොදැන මෙන් අපට පිඬා කෙරෙයි කියා ශිල්ප දක්වම්න්ම වෙදනාවට පැමිණියාහු රජුට රවා බලත්. එය රජුගේ සොම්කසට හේතු යි.

36. අඞ්ගසත්ත්වවචනාශ්‍රයං මිථඃ
සත්‍රීහු නාට්‍යමුපධාය දර්ශයන්
ස ප්‍රයොගනිපුණෛඃ ප්‍රයොක්තෘභිඃ
සඤ්ජඝ්නිවාන් සහ මිත්‍රසනාථෛඃ.

37. අංසලම්බිකුටජාර්ජුනස්‍රජ-
සනස්‍ය නීපරජසාඞ්ගරාගිණඃ
ප්‍රාවෘෂි ප්‍රමදබර්හිණෙෂ්වහූන්
කෘත්‍රිමාද්‍රිෂු විහාරවිභ්‍රමඃ.

38. විග්‍රහාවව ශයනෙ පරාඞ්මුඛීඃ
නානුනෙතුමබලාඃ ස තත්පරෙ
ආවභාඞ්ක්ෂ සනාඝබද්ධකලවා-
සනා විවෘත්‍ය විශතිර්භුජාන්තරම්.

---

36. අඞ්ගසත්ත්වවචනාශ්‍රයං, හස්තාදි අවයවය සත්ත්වගුණය වචනය යන මොවුන් ආශ්‍රය කොට ඇත්තා වූ; නාට්‍යම්, නැටීම; මිථඃ, රහසිගතව; සත්‍රීහු, සත්‍රීන් කෙරෙහි; උපධාය, උගන්වා; දර්ශයන්, දක්වන්නා වූ; සඃ, ඒ අග්නිවර්ණරජ තෙම; මිත්‍ර සනාථෛඃ, මිත්‍රයන්ගේ සමීපයෙහි; ප්‍රයොගනිපුණෛඃ, නාට්‍ය ප්‍රයෝගයෙහි (නැටීමෙහි) දක්ෂ වූ; ප්‍රයොක්තෘභිඃ සහ, නාට්‍ය වාද්‍යයන් සමඟ; සඤ්ජඝ්නිවාන්, (ඔවුන් පරදවනඅටියෙන්) නාට්‍ය ඝට්ටනය කෙළේ සි.

ආඞ්ගික ය **සාත්ත්වික** ය **වාචනික** යයි නාට්‍යය තුන්පරිදි වේ. හස්තපාදාදිවාලනයෙන් දක්වනුයේ **ආඞ්ගික** නම්. අභ්‍යන්තර යෙහි පවත්නා ශෘන්ගාර ප්‍රේම ක්‍රෝධ රෞද්‍රාදිය දක්වනුයේ **සාත්ත්වික** නම්. වචනයෙන් ගීතිකාදියෙන් දක්වනුයේ **වාචනික** නම් වේ.

37. ප්‍රාවෘෂි, වර්ෂාකාලයෙහි; අංසලම්බිකුටජාර්ජුනස්‍රජඃ: අංසලම්බි– උරහිසෙහි එල්වෙන්නා වූ; කුටජාර්ජුනස්‍රජඃ, කෙළිඳ හා කුඹුක්මල්මාලා ඇති; නීපරජසා, කොළොම්පුෂ්පරේණු යෙන්; අඞ්ගරාගිණඃ, අඞ්ගරාග ඇත්තා වූ; තස්‍ය, ඒ අග්නිවර්ණ රජහුගේ; ප්‍රමදබර්හිණෙෂු, මත්තමයූරයන් ඇති; කෘත්‍රිමාද්‍රිෂු, නිර්මිතපර්වතයන්හි; විහාරවිභ්‍රමඃ, වාසය කිරීම් විලාසය; අභූත්, වූයේ ය.

ක්‍රීඩා පර්වත නිර්මිතකඳුවලට පැමිණියේ යයි සේයි.

38. (ප්‍රවෘෂි, ප්‍රවෘට්කාලයෙහි;) සඃ, ඒ අග්නිවර්ණ තෙම; විග්‍රහාත්, ප්‍රේමය නිසා ඇතගත් කලහයෙන්; ශයනෙ, ශය

39. කාර්ත්තිකීෂු සවිතානහර්ම්‍යභාක්
යාමිනීෂු ලලිතාඞ්ගනාසඛඃ
අඞ්ගනුඞ්කත සුරතශ්‍රමාපහං
මෙඝමුක්තවිශදං ස වඤ්චිතාම්.

40. සෛඝනඤ්ච සරයූං විවාහිණීවතීං
ශ්‍රෝණිබිම්බමිව හංසමේඛලම්
සඛ්‍රියාවිලසිතානුකාරිණීං
සෞධජාලවිවරෛරවේක්ෂතඃ.

නෙහි; පරාඞ්මුඛීඃ, පරාඞ්මුඛ වූ; අබලාඃ, කාන්තාවන්; අනුනෙතුං, සනසන්නට; න තස්ථිරෙ, ඉක්මන් නොවී ය; ච, වැළි එසෙක් ඇති; ඝනශබ්දවිකලවාඃ, මෙඝශබ්දයෙන් චකිත වූවානු; (එහෙයින් ම) විවෘත්‍ය, පරිවර්ත්තිත ව (තමන්ට අභිමුඛ ව); භූජාන්තරම්, බාහුයුග්මය අතරට; විශතීඃ, ප්‍රවිෂ්ට වන්නා වූ; තාඃ, ඒ කාන්තාවන්; ආවඤ්ඡ, කැමැති වී.

ශයනයෙහි කෝපයෙන් පරාඞ්මුඛ වූ සත්‍රීන් සැනසීමට රජු ඉක්මන් නොවූයේ ය, මෙඝගර්ජිතයෙන් බිය ව තමන් ම අවුත් තමාගේ හස්තාන්තරයට පැමිණීම නියත බව දන්නා හෙයිනි.

34. කාර්ත්තිකීෂු, ඉල්මාසය සම්බන්ධි වූ: යාමිනීෂු, රාත්‍රීන්හි (හෙවත් ශරත්කාලය පිළිබඳ රාත්‍රීන්හි): සවිතානහර්ම්‍යභාක්, උඩුවියන් සහිත ප්‍රාසාදයන්හි වාසය කරන්නා වූ; (පිණිකාලය නිසා යසි සේසි.) ලලිතාඞ්ගනාසඛඃ, සොඳුරු අඞ්ගනාවන් යහළු කොට ඇත්තා වූ; සඃ, ඒ අග්නිවර්ණ තෙම; සුරතශ්‍රමාපහාං, රති ක්‍රීඩායෙන් වූ විඩාව දුරු කරන්නා වූ; මෙඝමුක්තවිශදං, මෙඝයෙන් මිදුණු හෙයින් නිර්මල වූ; වඤ්චිතාම්, සඳරුස්; අඞ්ගනුඞ්කත, ආශ්‍රය කෙළේ ය (වින්දේ ය).

40. හංසමේඛලම්, හංසයන් නැමැති මෙවුල්දම් ඇත්තා වූ; සෛඝනඤ්ච, සුදුවැලිතලා නමැති; ශ්‍රෝණිබිම්බං ච, කටිප්‍රදෙශ ද; විවෘණ්වතීං, ප්‍රකාශ කරන්නා වූ; සඛ්‍රියාවිලසිතානුකාරිණීං, සවකීය ප්‍රියාවන්ගේ විලාසයට සමාන ක්‍රියා ඇත්තා වූ; සරයූං, සරහූනදිය; සෞධජාලවිවරෛඃ, ප්‍රාසාදයාගේ කවුළුදැල්විවර වලින්; ව්‍යලොකයත්, සතුරින් බැලී.

41. මම්මීරෙරඟුරුධූපගන්ධිභිර්-
ව්‍යක්තහෙමරශනෛඝනමේඛනඃ
ජහ්නුරඟ්ධනමොක්ෂලොලුපං
හෙමනේර්නිවසනෛඃ සුමධ්‍යමාඃ.

42. අර්පිතසනිමිතදීපදෘෂ්ටයෝ
ගහීවෙශ්මසු නිවාතකුක්ෂිෂු
තස්‍ය සඒසුරතානතරක්ෂමාඃ
සාක්ෂිනාං ශිශිරරාත්‍රයෝ යයුඃ.

43. දක්ෂිණේන පවනෙන සම්භෘතං
ප්‍රේක්ෂ්‍ය චූතකුසුමං සපල්ලවම්
අඞ්ගනෙසුරවධූනවිග්‍රහා-
ඝතං දුරුතසහවියොගමඞ්ගනාඃ.

---

41. මම්මීරේඃ, මම්ර යන අනුකර්ණ ශබ්ද පවත්නා වූ; අගුරුධූපගන්ධිභිඃ, අගිල්දුම්සුවද ඇත්තා වූ; ව්‍යක්තහෙමරශනෛඃ: ව්‍යක්තා- ප්‍රකට වූ; හෙමරශනෛඃ, සවණිමෙඛලාභරණ ඇත්තා වූ; හෙමනේඃ, හෙමනනයෙහි වූ; නිවසනෛඃ, වසන්‍න යන් කරණ සොට ගෙන; සුමධ්‍යමාඃ, ශොභනමධ්‍ය ඇති කාන්තා වෝ; එකතඃ, එක් පෙදෙසෙක්හි (උකුළුප්‍රදෙශයෙහි); අඟ්ගථන මොක්ෂලොලුපං, නරුපට බැඳීමෙහිත් මිදීමෙහිත් ලොල් වූ; තං, ඒ රජහු; ජහ්නුඃ, අඟකණිණය කළාහුය.

42. නිවාතකුක්ෂිෂු, වාතරහිත අභ්‍යන්තර ඇත්තා වූ; ගහී වෙශ්මසු, ඇතුළුගෘහයන්හි; අර්පිතසනිමිතදීපදෘෂ්ටයඃ: අර්පිත- නබන(දල්වන)ලද; සනිමිතදීපදෘෂ්ටයඃ, නිශ්චල වූ ප්‍රදීප නමැති ඇස් ඇත්තා වූ; සඒසුරතානතරක්ෂමාඃ, සියලු සුරතභෙදයන්හි යොග්‍ය වූ (හෙවත් සියලු ස්ත්‍රීඛාවලට සුදුසු වූ); ශිශිරරාත්‍රයඃ, ශිශිරකාලයෙහි රාත්‍රීහු; තස්‍ය, ඒ අග්නිවර්ණරජහට; සාක්ෂිතාං, සාක්ෂිබවට; යයුඃ, ගියාහුය.

අග්නිවර්ණයන් විසින් කළ සියලු සුරතස්ත්‍රීඛාවිශෙෂයෝ ශිශිර රාත්‍රි නමැති සත්‍රීන් විසින් ඇතුළුගබඞාවන්හි දැල්වූ පහන් නමැති නිශ්චල ඇස්වලින් දක්නාලදහ අතිකෙක් සාක්ෂි වීමට අසමර්ථ විය යි සේසි.

43. අඞ්ගනාඃ, කාන්තාවෝ; දක්ෂිණේන පවනෙන, දකුණු වාතයෙන් (මලයානිලයෙන්); සම්භෘතං, උපදවනලද; සපල්ලවම්, පලුපත් සහිත වූ; චූතකුසුමං, අඹමල්; ප්‍රේක්ෂ්‍ය, බලා; අවධූත

44. තාඃ සඛමඞ්කමධිරොප්‍ය දෙලයා
ප්‍රෙඞ්ඛයන් පරිජනාපවිද්ධයා
මුක්තාරජ්ජු නිබ්බිඳං භයවිජ්ලාත්
කණ්ඨබන්ධනමවාප බාහුභිඃ.

45. තං පයොධරනිෂික්තනවඳූනෙත්‍ර-
මෞක්තිකාග්‍රථිතවාරුභූෂණෛඃ
ග්‍රීෂ්මවෙශවිධිභිඃ සිෂෙවිරෙ
ශ්‍රොණිලම්බිමණිමේඛලෛඃ ප්‍රියාඃ.

46. යත් ස භග්නසහකාරමාසවං
රක්තපාටලසමාගමං පපෞ
තෙන තස්‍ය මධුනීමාන් කෘශත්-
වින්තයොනිරභවත් පුනර්නවඃ.

විග්‍රහඃ, දුරු කළ විරොධ (දබර) ඇත්තාහු; දුරුතැසහවියොගං, ඉවසිය නොහැකි විරහදුක් ඇති; තම්, ඒ රජහු; අඞ්ගනෙළුඃ, අනුගමනය කළහ (රජුට අවනත වූහ).

සත්‍රීහු වසන්තකාලය පැමිණි හෙයින් විරහදුක් ඉවසිය නොහැකි බව දැන කලහ නොකොට රජු සමඟ සමගිව විසූහ.

44. තාඃ, ඒ අඞ්ගනාවන්; සඛං අඞ්කං, සිය ඇකයට; අධිරොප්‍ය, නංවා; පරිජනාපවිද්ධයා, පිරිවරජනයා විසින් සොලවන ලද; දෙලයා, දෝලාවෙන් (තොටිල්ලෙන්); මුක්තාරජ්ජුං, හරතලද රැහැන් ඇතිව; ප්‍රෙඞ්ඛයන්, සොලවන්නේ; භයවිජ්ලාත්, (වැටෙය යන) භීතිව්‍යාජයෙන්; නිබ්බිඳං, අතිදැස ව; බාහුභිඃ, අත්වලින්; කණ්ඨබන්ධනං, ග්‍රීවාබන්ධනයට; අවාප, පැමිණියේ ය. (සඛයංග්‍රහ සුඛය- තමා ම වැළඳගැනීමේ සැපය- වින්දේ ය.)

45. ප්‍රියාඃ, කාන්තාවෝ; පයොධරනිෂික්තනවඳූනෙත්‍රෛඃ, පයෝධරයන්හි ඉසිනලද සඳුන් ඇති; මෞක්තිකග්‍රථිතවාරුභූෂණෛඃ, මුතුඔබ්බා කරනලද මනහරආභරණ ඇති (මුතු අධික ආභරණ ඇති); ශ්‍රොණිලම්බිමණිමේඛලෛඃ, කටියෙහි එලෙන්නා වූ මිණිමුවා මෙවුල්දම් හෙවත් කටිසූත්‍ර ඇත්තා වූ; ග්‍රීෂ්මවෙශවිධිභිඃ, උෂ්ණකාලයට සුදුසු සැරසීම්විශෙෂයෙන් යුතුව; තං, ඒ අග්නිවර්ණරජහු; සිෂෙවිරෙ, සෙවනය කළාහු ය. (සිතල අධික වන ලෙස සැරසී උෂ්ණරාත්‍රීන්හි අග්නිවර්ණරජු සේවනය කළෝ සි.)

46. යත්, යම්හෙයකින්; සඃ, ඒ අග්නිවර්ණ තෙම; භග්නසහකාරං, කඩා ලනලද අඹදළු ඇත්තා වූ; රක්තපාටලසමාගමං,

47. එවමින්ද්‍රියසුඛානි නිර්විශන්-
නනඃඛායීව්මුඛඃ ස පාර්ථිවඃ
ආතමලක්ෂණනිවේදිතානෘතූන්-
නන්‍යවාහයදනඞ්ගවාහිනඃ.

48. තං ප්‍රමත්තමපි න ප්‍රභාවතඃ
ශෙකුරාක්‍රමිතුමන්‍යපාර්ථිවාඃ
ආමයඝතු රතිරාගසම්භවෝ
දක්ෂගාප ඉව චන්ද්‍රමක්ෂිණාන්.

රත්පළොල්මල් හා එක් වූ; ආසවං, මද්‍යය; පපෙෆ, පානය කෙළේ ද; තෙන, ඒ ආසවපානහේතුවෙන්; මධුනිශීථාත්, වසන්ත කාලය අවසන් වීමෙන්; කෘශඃ, මඳවියදී ඇත්තා වූ; තස්‍ය, ඒ අග්නිවර්ණ රජහුගේ; චිත්තයොනිඃ, අනඞ්ග තෙම; පුනඃ, නැවත; නවඃ අභවත්, අළුත් විය. (බලසම්පන්න විය.)

වසන්තකාලය මනයොනා ප්‍රබල වන කාලය යි. වසන්තය ඉක්මෙන් ම දුබල වෙයි. එහෙත් අඹදළු කඩාදමා පළොල්මල් හා එක් සොට මද්‍යය පූ කල නැවතත් රජුගේ මනයොනා ප්‍රබල විය සි සේසි.

47. එවං, මෙසේ; අනඞ්ගවාහිනඃ, මදනයා විසින් මෙහෙයන ලද්දා වූ; අන්‍යකාමායීව්මුඛඃ, අන්කටයුත්තෙහි පරාඞ්මුඛ වූ; සඃ+පාර්ථිවඃ, ඒ රජ තෙම; ඉන්ද්‍රියසුඛානි, ඉන්ද්‍රියයන්ට සැපඵළවන්නා වූ රූපශබ්දගන්ධාදිය; නිර්විශන්, වළඳන්නේ; ආතමලක්ෂණනිවේදිතාන්, සවකීයලක්ෂණයෙන් (හෙවත් නානාවිධ මල්ධැරීම් ආදි ලක්ෂණයෙන්); නිවේදිතාන්, (මේ ඍතුව මේ කාලයෙහි පවත්නේ යයි) ප්‍රකටකරනලද්දා වූ; ඍතූන්, වර්ෂාදිඍතුකාලයන්; අන්‍යවාහයත්, ඉක්මවී ය.

නියමිවශයෙන් ඒ ඒ ඍතුවෙහි මල්ඵලධරන්නා වූ වෘක්ෂයෝ වෙත්. ඒ ඒ ලක්ෂණයෙන් මේ කාලය මේ ඍතුව යයි දත හැකි. අඹමල් ලක්ෂණයෙන් වසන්ත ඍතුව හැඳිනගන්නාක් මෙනි. රජ තෙමේ ද ඒ ඒ ඍතුවෙහි විශෙෂ වූ මාලාදිය පැළඳ ආත්මලක්ෂණයෙන් ඍතූන් හැඳින්විය.

48. ප්‍රමත්තං අපි, ව්‍යසනයන්හි තත්පර (ප්‍රමාද) වූ ද; තං' ඒ රජහු; ප්‍රභාවතඃ, රාජබලයෙන්; අන්‍යපාර්ථිවාඃ, අවශෙෂ රජවරු; ආක්‍රමිතුං, මැඩපවත්වන්නට; න ශෙකුඃ, නොහැකි වූහ; රතිරාගසම්භවඃ, රතිකෙළියෙහි ඇලීමෙන් හටගත්තා වූ;

49. දුඝටදෙඝමපි නනන්ත සෝ'නාජත්
සඩ්ඝවසතු හිඝජ්ජාමනාශ්‍රවඃ
සඩ්ඝාදුහිසතු විඝයෙහිීතසඝනෝ
දුඃඛම්ඉන්ද්‍රියගණෝ නිවාඝයිතෙ.

50. තස්‍ය පාණ්ඩුවදනාලපභූඝණා
සාවලම්බගමනා මෘදුඝවනා
රාජඝක්ෂ්මපරිහානිරීඝයෙ
කාමඝානඝමවඝස්ථයා තූලාම්.

ආඝයඃ + තු, රෝගය වනාහි; (අඩිකාමෙථුනයෙහි යෙදීමෙන් ක්ෂයරොගය වැළඳෙන බව වෛද්‍යශාස්ත්‍රය කියයි.) දක්ෂශාපඃ, දක්ෂ නම් බ්‍රහ්මයාගේ ශාපය තෙම; චන්ද්‍රං ඉව, චන්ද්‍රයා මෙන්; අක්ෂිණොත්, ක්‍රමයෙන් කෘශ කෙළේය.

දක්ෂශාපඝ මහාභාරතයෙහි ගදාපර්වයෙහි 35 වෙනි අධ්‍යායයෙහි 43 වෙනි ශ්ලොකය බලනු.

දක්ෂ නම් ප්‍රජාපතීන්ගේ ශාපයෙන් අවපක්ෂයෙහි චන්ද්‍රයා ක්‍රමයෙන් ක්ෂය වන බව එහි කියනලදි.

49. හිඝජ්ජාං, වෙදුන්ගේ; අනාශ්‍රවඃ, වචනයෙහි නොසිටියා (අකිකාරු) වූ සඃ, ඒ අග්නිවර්ණ තෙම; දුඝටදෙඝං අපි, දක්නාලද දෙඝ ඇත්තා වූ ද (රෝග ඉපදීමට හෙතුව දූෂ ද); තත්සඩ්ඝවසතු, ඒ සඩ්ඝමය පිළිබඳ වස්තූන් (හෙවත් සත්‍රී මද්‍ය ආදි කොට ඇති සඩ්ඝමයට කාරණ වූ දේ); න අත්‍යජත්, අත්නොහළේ ය; (ඒ එසේමැයි.) සඃවාදුහිඃ, මනොඥ වූ; විඝයෙඃ, විෂයවස්තූන් (රූපාදීන්) විසින්; හෘතඃ ඉන්ද්‍රියගණඃ තු, පැහැරගන්නාලද ඉන්ද්‍රියසමූහය වනාහි; තතඃ, ඒ විෂයකාරණයන් කෙරෙන්; දුඃඛං, දුකසේ; නිවාඝයිතෙ, වළක්වනුලැබේ. (පස්කාම්සැපයෙහි ගිජු වූයේ එයින් නොවැළැක්කහැකි ය.)

50. තස්‍ය, ඒ අග්නිවර්ණරජහුගේ; පාණ්ඩුවදනා, පඬුවන් මුහුණු ඇති; අල්පභූඝණා, සවල්පආභරණ ඇති; සාවලම්බගමනා, දුසාදීන්ගේ හඬයෙහි එල්බී යන ගමන් ඇත්තා වූ; මෘදුඝවනා, නීතසවර ඇත්තා වූ; රාජඝක්ෂ්මපරිහානිඃ, ක්ෂයරොගය සම්බන්ධ පරිහානිය හෙවත් ක්ෂීණාවස්ථා නොමෝ; කාමඝානඝමවඝස්ථයා, කාමාතුරාවස්ථාව හා (කාමුකාවස්ථාව හා); තූලාං, සමානවයට; ආඝයෙඃ, පැමිණියා ය.

කාමාතුරාවස්ථාවෙහි ද පාණ්ඩුවදනාදිසවරූප පැනෙයි. එමෙන් කාමුකත්වයෙන් හටගත් රොගයෙහි ද එබඳු විය යි සේසි.

'කාමඝමාන' යයි කියයුතු තැන 'කාමඝාන' යනු රූඪි යි.

51. වේ‍යාම පශ්චිමකලාසපිතෙඳු වා
පඞ්කශෙෂමිව සම්පලවලම්
රාඥි තත්කුලමභූත් ක්ෂයාතුරෙ
වාමනාර්චිරිව දීපභාජනම්.

52. බාඪමෙෂු දිවසෙෂු පාර්ථිවඃ
කම් සාධයති පුත්‍රජන්මනෙ
ඉත්‍යදර්ශිතරුජො'ස්‍ය මන්ත්‍රිණඃ
ශශ්වදූචුරශශඞ්කිනීඃ ප්‍රජාඃ.

53. ස තථෙඞ්ගිතවිදා සඛො'පි සන්
පාවනිම්නවලොඞ්ඝ්‍ය සන්නතිම්
වෙදෙෂතනපරිභාවිතං ශදං
න ප්‍රදීප ඉව වායුමන්‍යගාත්.

---

51. රාඥි, අග්නිවර්ණරජහු; ක්ෂයාතුරෙ, ක්ෂයරොගයෙන් පීඩිත වූ කල්හි; තත්කුලං, ඒ රඝුකුලය; පශ්චිමකලාසපිත+ඉව, පශ්චිමකලාවස්ථාවෙහි (අවතුදුස්වන) සිටි චන්ද්‍රයා ඇති; වේ‍යාම වා, ආකාශය මෙන් ද; (මෙහි 'වා' ශබ්දය 'ඉව'ශබ්දාර්ථය දෙයි.) පඞ්කශෙෂං, මඩ ඉතිරි වූ; සම්පලවලම් ඉව, ග්‍රීෂ්මකාලයෙහි වූ මඩවළක් මෙන් ද; වාමනාර්චිඃ, සවලපශිඛා ඇත්තා වූ; දීපභාජනම් ඉව, ප්‍රදීපභාජනයක් මෙන් ද; අභූත්, වූයේ ය.

රඝුකුලප්‍රදීපය නිවීමට ආසන්න වූයේ යයි සේයි.

52. බාඪං, සැබෑවින් ම; පාර්ථිවඃ, රජ තෙම; එෂු දිවසෙෂු, මේ දවස්වල; පුත්‍රජන්මනෙ, පුත්‍රොත්පාදනය පිණිස (පුතකු ලැබීම සඳහා); කම්, ජපහෝමාදි ක්‍රියාවන්; සාධයති ඉති, සිද්ධ කෙරේ යයි; අදර්ශිතරුජඃ, නොදක්වනලද රොග ඇත්තා වූ (රොගය ප්‍රකාශ නොකරන්නා වූ); අස්‍ය, මේ අග්නිවර්ණරජහුගේ; මන්ත්‍රිණඃ, ඇමැතියෝ; අසඞ්කිනීඃ, රජුට ව්‍යසනයෙක් අේ හෝ යි සඞ්කා ඇත්තා වූ; ප්‍රජාඃ, ප්‍රජාවන්ට; ශශ්වත්, නිතර; ඌචුඃ, කීවාහු ය. (රජහට ක්ෂයරොගය වැළඳී තිබෙන බව නොකියා සැඟවූහ.)

රජු දක්නට නොලත් ප්‍රජාවන් රජු කොහිදැයි අසනකල්හි පුත්‍රොත්පාදනය පිණිස යාග කෙරෙන්යි කියා ඔවුන් වංචා කළහ යනු භාව යි.

53. සඃ+තු, ඒ අග්නිවර්ණ තෙම් වනාහි; අනෙකවනිතා සඞ්ඝ+අපි සන්, නොයෙක් වනිතාවන් යහළු කොට ඇත්තේ ද;

51. තං ගෘහොපවන එව සඞ්ඝතාඃ
පශ්චිමක්‍රතුවිද පුරෝධසා
රෝගශාතනිමපදිශ්‍ය මන්ත්‍රිණඃ
සමාහිතෙ ශිඛිනි ගුඪමාදධුඃ.

52. තෛඃ කෘතප්‍රකෘතිමුඛ්‍යසංග්‍රහෛ-
රාශු තස්‍ය සහධර්මචාරිණී
සාධු දක්ෂගුහගෙහිලක්ෂණා
ප්‍රත්‍යපද්‍යත නරාධිපශ්‍රියම්.

පාවනීං, පිතෘදෙවතාවන්ගේ ණය මුදන්නා වූ; සන්නතිම්, පුත්‍ර පරම්පරාව; අනවලොක්‍ය, නොදැක (පුත්‍රයකු නොලබා); වෛද්‍ය ගණනාපරිභාවිතං, වෙදුන්ගේ උත්සාහය ද පරදවන්නා වූ; ගදං, රෝගය; ප්‍රදීපඃ, පහන තෙම; වායුම් ඉව, මාරුතය මෙන්; න අත්‍යගාත්, ඉක්මවා නොගියේ ය. (මැරුණේ ය යනු භාව සි.)

පුත්‍රයකු ලැබීම පිතෘදෙවතාවන්ගේ ණයෙන් මිදීමට කාරණ යයි. මේ රජ එකී ණයෙනුත් පිරිසුදු නොවී රෝගය බලවත් හෙයින් වෙදුන්ගේ උත්සාහය ද නිරර්ථක කොට වාතයෙන් නිවෙන පහනක් මෙන් එයින් ම මළේ යයි සේයි.

54. පශ්චිමක්‍රතුවිද, අවසානයෙහි (මරණින් මත්තෙහි) කට යුතු විධි දන්නා වූ; පුරෝධසා, පෙරෙවියා හා; සඞ්ඝතාඃ, එක්වූ; මන්ත්‍රිණඃ, ඇමැතියෝ; ගෘහොපවනෙ + එව, ගෘහාරාමයෙහි (රාජොද්‍යානයෙහි) ම; රෝගශාතනිං, රෝගව්‍යුපශමනශාන්තිය කෑ සි; අපදිශ්‍ය, හඟවා; තං, ඒ අග්නිවර්ණරජහු: සමාහිතෙ ශිඛිනි, සමෘද්ධ වූ ගින්නෙහි; ගුඪම්, අප්‍රකාශවශයෙන්; ආදධුඃ, බහා ලූහ. (ආදහනය කොළෝ ය.)

55. ආශු, එහා; කෘතප්‍රකෘතිමුඛ්‍යසංග්‍රහෛඃ, කරනලද පුර වැසි ප්‍රධානයන්ගේ සඞ්ග්‍රහ (රැස්වීම්) ඇති; තෛඃ, ඒ මන්ත්‍රීන් විසින්; සාධු, මනා කොට; දක්ෂගුහගෙහිලක්ෂණා, දක්නාලද මනොඥගැබ්ලකුණු ඇති; තස්‍ය, ඒ අග්නිවර්ණරජහුගේ; සහධර්මචාරිණී, ධර්මපත්නී තොමෝ; නරාධිපශ්‍රියම්, රාජ්‍යශ්‍රියට; ප්‍රත්‍යපද්‍යත, පැමිණියා ය.

අග්නිවර්ණරජුගේ ප්‍රධානමෙහෙසිය ගර්භිණී යයි දැන රාජ්‍ය යෙහි අභිෂෙක කළහ යනු භාව සි.

56. තස්‍යාඝනථාවිධනරෙන්‍ද්‍රවිපත්තිශොකා-
දුෂ්ණෛර්විලොචනජලෛඃ ප්‍රථමාභිනපුඃ
නිර්වාපිතඃ කනකකුම්භමුඛොජ්ඣිතෙන
වංශාභිෂෙකසවිධිනා ශිශිරෙණ ගඞ්ගඃ.

57. තං භාවාය ප්‍රසවසමයාකාඞ්ක්ෂිණීනාං ප්‍රජානා-
මනන්තර්ගූඪං ක්ෂිතිරිව නනොබිජමුප්තිං දධානා
මෞලෛඃ සාර්ධං සථවිරසවිවෙහෙමසිංහාසනස්ථා
රාජ්ඥී රාජ්‍යං සවිධවදශිෂද්භර්තුරව්‍යාහනාඥං.

ඉති ශ්‍රීරඝුවංශෙ මහාකාව්‍යෙ කලිදාසකෘතෞ
අග්නිවර්ණාභිෂෙකරා නාම
එකොනවිංශඃ සර්ගඃ.

---

56. තථාවිධනරෙන්‍ද්‍රවිපත්තිශොකාත්, උක්තප්‍රකාර වූ රාජ විපත්තිය පිළිබඳ ශොකයෙන්: උෂ්ණෛඃ, උණුසුම් වූ; විලොචන ජලෛඃ, නෙතුළුවලින්; ප්‍රථමාභිනපුඃ, පළමු කොට නවතලද; තස්‍යාඃ, ඒ ධර්මපත්නියගේ, ගඞ්ගඃ, ගැබ තෙම; කනකකුම්භමුඛොජ්ඣිතෙන, රන්කුඹුමුවින් හරනලද්දා වූ; ශිශිරෙණ, ශීතල වූ; වංශාභිෂෙකවිධිනා, රඝුරාජවංශයත අභිෂෙකවිධියෙන්; (අභිෂෙකජලයෙන් යනු ලක්ෂණයෙන් ගතයුතු අර්ථ සි.) නිර්වාපිතඃ, නිවනලද්දේ ය.

රජතුමාගේ මරණයෙන් ශොකයට පැමිණ උණුසුම්කඳුළු වැටී දේවියගේ ගර්භය ද උණුසුම් විය. සිසිල් වූ අභිෂෙකජලය වැටීමෙන් එය නිවුණේ ය යනු භාවසි.

57. ප්‍රසවසමය+ආකාඞ්ක්ෂිණීනාං, ප්‍රසූතිකාලය බලාපොරොත්තු වන්නා වූ; ප්‍රජානාම්, රටවැස්සන්ගේ; භාවාය, සම්පත්තිය; ක්ෂිතිඃ, පෘථිවී තොමෝ; අනන්තර්ගූඪම්, අභ්‍යන්තරයෙහි සැඟවුණා වූ; නනොබිජමුප්තිම් ඉව, නිකිණිමස වපුළ බිජුවටක් මෙන්; (අනන්තර්ගූඪං, ඇතුළත සැඟවුණා වූ;) තං, ඒ ගර්භය; දධානා, දරන්නා වූ; හෙමසිංහාසනස්ථා, සවණිමය සිංහාසනයෙහි සිටියා වූ; අව්‍යාහතාඥා, නොනසන්නලද ආඥා ඇත්තා වූ; රාඥී, මෙහෙසී තොමෝ; මෞලෛඃ සථවිරසවිවෙඃ, පරම්පරාගත

වෘද්ධාමාත්‍යයන් සමඟ; භර්තුඃ, සවාමියාගේ; රාජ්‍යං, රජකම; විධිවත්, විධි වූ පරිද්දෙන්; අශිෂත්, අනුශාසනා කළාහ.

නිකිණීමස වපුල බිජුවට මඩතුළ පිවිස යහපත් සෘතුගුණ ලැබ ක්‍රමයෙන් මුහුකුරා ගොස් බොහෝ වූ ශස්‍යඵල දෙන්නේ ය. රාජ්‍යයගේ ගහීය ද රාජ්‍යානුශාසනයට සමර්ථ කුමාරයකු සුදුසු කාලයෙහි දෙන හෙයින් මහත් ඵලදායක ය. 'නහොගහීමූඡවිමී ඉව' යනු එහෙයින් කීහ.

කාලිදාසකෘතෙෂු, කාලිදාසකවීන්ගේ කෘතියක් වූ; ශ්‍රී රඝු වංශෙ මහාකාව්‍යෙ, ශ්‍රීමත් රඝුවංශමහාකාව්‍යයෙහි; අග්නිවර්ණ ශෘඞ්ගාරඃ නාම, අග්නිවර්ණරජහුගේ ශෘඞ්ගාරය යන නම් ඇති; ඒකොනවිංශඃ සර්ගඃ, එකුන්විසි (19) වන සර්ගය; ඉති, සම්පූර්ණ යි.

එකුන්විසිවන සර්ගය යි.

සමථෙඝං සිද්ධිමාඝාතා - ව්‍යාඛ්‍යා සඤ්ඣඝඝොහිණී
තථා ඵලතු ලොකානාං - නිර්ඝනං ප්‍රාථිනාඃ ශුභාඃ.

සමාපෙඝොঽයං ග්‍රන්ථඃ.
ශුභං භූයාදඛ්‍යෙතුරධ්‍යාපකස්‍ය ච.

රඝුවංශ සාරය.

—//—

මහාකවි **ශ්‍රී කාලිදාසයෝ** යශෝලාභාදි අනේක හව්‍යයන්ට ආශ්‍රය වූ මහා කාව්‍යයක් රචනා කරනු කැමැත්තාහු සූර්‍යවංශෝද්භූත රඝුරාජවංශය කථාශරීරයොට ගෙන ඒකෝන විංශති (19) සර්ගපරිමිත වූ රඝුවංශ නම් විචාරපූර්ණ ග්‍රන්ථයක් කළහ.

ආඛ්‍යානයන්ගේ සුඛාවබෝධය පිණිස එම රඝුවංශ මහා කාව්‍යයෙහි සාරය හෙළබසින් මෙහිලා දක්වමු.

—

ආරම්භය

' වචනාර්ථ දෙදෙනාගේ සුඳුරාවබෝධය පිණිස ශබ්දාර්ථ දෙදෙන මෙන් නිත්‍ය සම්බන්ධ වූ ලෝකයට මවුපිය වූ උමා මහෙසුරු දෙදෙන වඳිමි.

සූර්‍යවංශය කොහිද? මගේ නුවණ කොහිද? එදෙක ඉතා දූරතර ය. මඳ නුවණක් ඇති මා වැන්නන්හු මහා සාගරය වැනි සූර්‍යවංශය වර්ණනා කරන්නට උත්සාහ කිරීම පණ්ඩිතයන්ගේ උපහාසයට කරුණෙකි. එහෙකුදු වුවත් වාල්මීකි ආදි මහාකවීන් විසින් වර්ණිත වූ වචන නමැති ප්‍රවේශෝපාය ඇති මේ වංශයෙහි වජ්‍රයෙන් විදුනා ලද මාණික්‍යයෙහි සූත්‍රයාගේ මෙන් මාගේ ඥානගතියක් ඇත්තේය.

එබැවින් මම-උත්පත්තියෙහි පටන් පවිත්‍ර වූ, ඵලප්‍රාප්තිය දක්වා කටයුතු කරන සුලු වූ, සමුද්‍රය දක්වා මුළු පොළොවට ඊශ්වර වූ, දෙව්ලොව දක්වා බාධා රහිත රථගාමී ඇති, යාචකයන් කැමැති තාක් ධනය දෙන සුලු වූ, අපරාධයට සුදුසු දඬුවම් කරන සුලු වූ, සුදුසු කාලයෙහි ප්‍රබුද්ධවන්නා වූ, දීම පිණිසම ධන රැස් කරන්නා වූ, සබවස පිණිස මද තෙපුල් බණන සුලු වූ, කීර්තිය පිණිස දිනනු කැමැති වූ, කාමුක නුවූ, පුත්‍රපෞත්‍ර පරම්පරාව පිණිස දාරපරිග්‍රහය කරන්නා වූ, බාල්‍යයෙහි විද්‍යාභ්‍යාසයෙහිත් තාරුණ්‍යයෙහි විෂය රසාස්වාදයෙහිත් වෘද්ධාවස්ථායෙහි තපශ්චර්‍යායෙහිත් යෙදී කෙළවර ධ්‍යාන පරවශව ශරීරත්‍යාගය කරන්නා වූ රඝුරජුන්ගේ වංශය කියමි. මාගේ වාක්ශක්තිය හීන වුවද ඔවුන්ගේ ගුණ සමූහය මා මෙහි යෙදවීය. එසේ හෙයින්

මානේ මේ කාව්‍යය ගුණ දෝෂ විවේචනයෙහි සමර්ථ වූ සුදුසු ශ්‍රවණය කිරීමට සුදුසු වෙත්. යම් හෙයකින් සවණ්හියාගේ පිරිසුදු බව හෝ කිලිටි බව දැක්වීමට හින්නම සමර්ථ වේද එහෙයිනි.

වංශ කථනය.

වේදයට ඕංකාරය මෙන් සියලු පෘථිවීශ්වරයන්ට ආදිම වූ **වෛවස්වතමනු** නම් රජෙක් විය. පවිත්‍ර වූ ඔහුගේ වංශයෙහි උභයකුල පරිශුද්ධ වූ **දිලීප** නම් නරවරයෙක් වී. ආරෝහ පරිණාහ සම්පන්න වූ ඒ රජහට ශරීරාකාරයට සුදුසු නුවණ ද, නුවණට සුදුසු ඉගෙනීම ද, ඉගෙනීමට සුදුසු කෘත්‍යාරම්භය ද, ක්‍රියාකාරිත්වයට සරිලන ක්‍රියා සාඵල්‍යය ද පිහිටියේ ම ය. ඒ රජතෙම රට වැසියන්ගේ යහපත පිණිසම කරවුවර ගත්තේ ය. සියලු ශාස්ත්‍රයෙහි නොපැකිලූ පවත්නා බුද්ධියත් දිය නැහූ දුන්නත් ඔහුගේ ක්‍රියා සාඵල්‍යයට හේතුවිය. සිවුරඟ සෙනඟ ශත්‍රුවාමරාදි උපකරණ හා සමාන ය. එතුමා මේ මේ කටයුතු මඹ කෙරෙමි සි ඖෂණය නොකරන නමුදු ක්‍රියාඵලය දැක මේ මේ දැ හෙළේ යයි නිශ්චය කළ හැකි වෙයි. එතුමා නිර්භය ව ජීවත් වූයේ ය. අදීන වධම්ය රැක්කේ ය. නිර්ලෝභි ව ධන රැස්කෙළේ ය. නොඇලී සැප වින්දේ සි. ජරා රහිත ව වෘද්ධ වූ මෙරජ රට වැසියාගේ පියකු වැනි විය-ජනයා භික්මවීම ය, ආරක්ෂාව ය, ආහාරපාන යෙන් රට සුභික්ෂ කොට පෝෂණය ය යන මෙතෙක් දැ එතුමා විසින් ම කළ හෙයිනි. රටවැසියාගේ (ජනක කනීෘ වූ) පියවරු දරුවන් උත්පාදනමාත්‍රයෙන් පියවූහ.

දඬුවම් කිරීම ලොකසම්ය පිණිස මුත් ජනපීඩනය පිණිස නොවේ; දුරපරිග්‍රහය ද සුන්දර වූ දූ පුතුන් ලබනු පිණිසය; කෙලස වශගතවයෙන් නොවේ. මේ හේතුවෙන් එතුමාගේ අර්ථ කාමසම්පත් ඛය ද ධර්ම්ය ම වී. එතුමාගේ රාජ්‍යයෙහි වෛශ්‍යය යන ශබ්දය ක්‍රියාවිරහිත ව නාමමාත්‍රයෙන් පැවතුණෙන් සාමන්ත රජවරු ඔහුගේ කීර්තිය ලැබීමට උත්සාහ නොකළහ. පෘථිව්‍යාදි මහාභූත සියල්ල පරාර්ථය පිණිස පවත්නාක් මෙන් දිලීප රජතුමා ද පරාර්ථ කරණය එහම ජීවිත ඵලය කොට වුසූ බැවින් බ්‍රහ්මයා විසින් මෙතුමා මහා භූතයන්ගෙන් ම නිර්මිත යයි හැඟේ.

ඒ දිලීප රජහට දක්ෂිණා ගුණය නිසා **සුදක්ෂිණා** යයි ප්‍රසිද්ධ වූ, මගධ වංශයෙහි ජාත වූ අග්‍රමහෙසියක් වූව. එතෙකුදු වුව බොහෝ කලක් යන තුරුත් තමහට පුත්‍රයකු නො ලත් බැවින් මහත් ඛේදයට පැමිණි රජතුමා රාජ්‍යභාරය ඇමැත්තන් වෙත පවරා මෙහෙසිය හා සමඟ පුත්‍රලාභය පිළිබඳ ගුරුකම් ලැබීම

පිළිසිඹු සවකිය වංශයෙහි(පුරොහිත)කුලගුරු වූ වසිෂ්ඨ මුනිහු වෙත ගියේය. දේවියත් සමඟ යහපත් අස්ථියෙන නැගී වනසෞන්දර්‍යය බලමින් බොහෝදුර ගොස් වසිෂ්ඨාශ්‍රම සම්පයෙහිදී රථයෙන් බැස පා ගමනින් අසපුවට පැමිණ අරුන්ධති නම් ඍෂිපත්නිය සහිත වශිෂ්ඨ මුනිහු වැඳ ඔවුන් විසින් කළ ආගන්තුක සත්කාර ලැබ මදවේලාවක් ගමන් විඩා හැර තමා ආ කරුණු වශිෂ්ඨ මුනි හට සැල කෙළේය. (මෙහිදී කවිවරයා විසින් 39 පටන් 55 දක්වා ශ්ලෝක 16 කින් කළ මාගීවර්ණනය හා තපෝවන වර්ණනය වමත් කාර ජනකය.)

"රාජ්‍යය පිළිබඳවත් ප්‍රජාව පිළිබඳවත් නිරුපද්‍රැතතාව හා අභිවෘද්ධිය සියල්ලම ඔබගේ උතුම් ගුණ තේජසින් සැලසි තිබේ. එතෙකුදු වුවත් ඔබගේ යෙහෙළිය වූ මේ සුදක්ෂිණාවට පුත්‍රයකු නො ලැබීම නිසා සමෘද්ධ වූ රාජ්‍යය ද අපට සැප නො එළවයි. යාග හෝමාදි කුශල ක්‍රියායෙන් මාගේ අභ්‍යන්තරය ආලෝක සහිත ය. එතෙකුදු වුවත් පුත්‍රාභාවයෙන්(පරම්පරාවෙහි දයෙන්) බාහිරය අඳුරු ය. එබැවින් මම ලෝකාලෝක (චක්‍රවාල) පර්වතය මෙනි. පින්වත් බ්‍රහ්මරාජයාණෙනි, පුණ්‍යය පරලොව පමණක් සැප දෙයි. යහපත් දූපුත් පරපුර වන්හි දෙලොවම සැප දෙන්නේය. ඔබතුමා සියනින් පැන් ඉස වැවූ අසපුයෙහි වෘක්ෂයක් ඵල රහිත ව (වඳ ව) නිබෙනු දැක දුක්වන්නාක් මෙන් වඳ වූ මා බලා සෙසේ නම් දුක් නොවන්නෙහි ද? පින්වත් සවාමීනි, මාගේ මේ පිතෘ දෙවහාකයෘණය (පියන්ගේ ණය) ජල සන්තානයක් නැති හස්තිරාජයක්හුගේ ආලානය (බඳින වැඹ) මෙන් මට ඉතා පීඩාදායක ය. ඔබතුමා මා මේ ණයින් මුදවන්නට සමර්ථ ය. ඉක්ෂ්වාකු වංශිකයන්ට නොලැබිය හැකි දෙය ලබාදීම ඔබට හැකි වේ."

දිලීප රජු විසින් කියන ලද. මේ නියා අර්ථවත් වූ හෘදය ග්‍රාහී වචනයෙන් ප්‍රබෝධිත වූ වසිෂ්ඨ මුනිතෙම ධ්‍යානයෙන් මදක් කල් ගෙවා පුත්‍රයන් නොලැබීමට හේතුව–සුරභිධේනුවට ගෞරව නොකිරීම නිසා ඇය විසින් රජ බිසෝ දෙපළට කරන ලද ශාපය'සි දැන රජහට ඒ බව කියේ ය. "ඊට කළ යුතු ප්‍රතිකාරය නම් සුරභිධේනුව සන්තෝෂකර ගැනීමය. එසේ වුව ද දැනට ඕ පාතාලයෙහි වරුණයාගේ යාගය සඳහා ගොස් නාගයන්ගේ රැකවලෙහි සිටී. ඔහුගේ යාගය ද බොහෝ කල් ගතවන්නෙකි. එබැවින් ඇය වෙනුවට ඇයගේ පුත්‍රී වූ දෙනකට උපස්ථාන කරව. ඔබගේ උපස්ථානයෙන් ප්‍රීති වූ ඕතොමෝ අභිමතාර්ථය සිදුකෙරෙසි. (කැමති දෑ දෙන්නීය.)"

වශිෂ්ඨ මුනිවරයා මෙසේ කියන්නේ ඔහුගේ යාග ක්‍රියාවන්හි සෘතාදිය ලබා ගැනීමට උපකාරී වූ නන්දිනී නම් මඬලය දැකුම් ඇති ධේනුව වනයෙහි සිට පෙරළා අව.

නම කී සෙණෙහි දෙනගේ පැමිණීම ශුභ ලක්ෂණයක් හෙයින් මුනිතෙම ඒ නිමිත්තින් රජුගේ මනෝරථය බාධා රහිතව සිදුවන බව දැක රජහට මෙසේ ද කිය:—

"මහරජ, ඔබගේ මනෝරථය සිදුවෙයි. නම කී කෙණෙහිම මේ පින්වත් ධේනුව පැමිණියේ එහෙයිනි, එබැවින් අනලස ව වනවාසියකුගේ පැවතුම් ඇති ව නිරන්තරයෙන් මේ දෙන අනුව යමින් ඇට උපස්ථාන කරව! ඇ ඔන කල්හි යව! සිටින කල්හි සිටුව! හොත් සල්හි ශයනය කර! පැන් බොන කල්හි (පැන්) බොව! ඔබ මෙහෙසිය ද දෙන කෙරෙහි භක්තිමත් ව පවිත්‍ර ව ගඳින් මලින් පුදා උදැසන මේ දෙන වනයට යන කල්හි තපෝ වනය (ආශ්‍රමභූමිය) කෙළවර දක්වා අනුගමන් කෙරේවා! සවස ඒ දක්වා පෙර ගමන් කෙරේවා! මෙපරිද්දෙන් ඇගේ පැහැදීම දක්වා සේවාකම් කෙරේවා! ඔබට නිරුපද්‍රවය වේවා! නරවරය, පුත්‍රවතුන් ඉදිරියෙහි යහපත් පියකු මෙන් සිටිවා!"

මෙකී විධානය බිරින්ද සහිත රජතෙම ප්‍රීතියෙන් පිළිගත්තේය. රාත්‍රිකාලය පැමිණි හෙයින් මුනිතෙම රජතුමාට නිදාගැනීමට තණ ඇතිරියක් හා පණිශාලාවක් ද සූදානම් කරවිය. තපෝ බලයෙන් රාජාගි ශයනාසන සම්පාදනය දුෂ්කර නුවූ නමුත් ව්‍රතාචරණය එදිනම ආරම්භ කිරීම ශුභය සි දන්නා හෙයින් වනවාසීනට සුලභ වූ ද්‍රව්‍යයෙන්ම ශයනාසනාදිය පිළියෙළ කරවූයේය. රජතුමා ද සිය මෙහෙසියත් සමඟ මුනිවරයා විසින් දැක්වූ පන් සලට වැද නන්දිනිය නිදාගත් ස්ථානය සමීපයෙහි කුශශයනයෙහි වැද හෙව රාත්‍රිය ගතකෙළේය.

වශිෂ්ඨාශ්‍රමාභිගමන නම්
ප්‍රථම සර්ගය නිමි.

2

පසුදින පහන් වූ කල්හි දිලීප රජ සුදක්ෂිණා දේවීන් ලවා ගඳ මලින් පුදවා වනයට යෑම පිණිස දෙන මිදීය. ඍෂිවවනය පරිදි මෙහෙසිය දෙනට පසු ගමන් කෙරෙමින් තපෝවන සීමාව දක්වා ගමන් කළා ය. එහිදී රජතෙම දේවිය නවත්වා ව්‍රතාචරණය පිරිවර සමඟ බැරි හෙයින් සුවලප වශයෙන් සිටි අන්‍ය අනුචර පිරිස ද රඳවා හුදකලාවම නන්දිනිය ආරක්ෂා කෙරෙමින් පසුපස්සෙහි

ගියේය. රසවත් තණකොළ කබාදෙමින් ඇඟ කසමින් මැස්සන් එළවමින් රිසියේ යෑමට බාධා නොකරමින් ද, ඡායාවක් මෙන් අත් නොහැර ගමන නිෂද්‍යාදියෙහි අනුකරණයෙන් ද දෙන සතුටු කිරීමෙහිම තත්පර විය. දිය නැහැ දුනු සහිතව ලියගොඹුයෙහි පැටලීමෙන් අවුල් වූ කෙස් ඇති ව වනයෙහි හැසිරෙන පෘථිවී ශ්වර තෙම සිංහ ව්‍යාඝ්‍රාදි වණඩ සත්වයන් භික්මවනු පිණිස උත්සාහවත් වූවක්හු මෙන් පෙනිණි. සවස් වනතුරු මෙසේ වන යෙහි තන්හි තන්හි ඇවිද හිරුඛිස්නා වේලෙහි දෙන අසපුවට යෑම පිණිස පිටත් වන්නා හාම රජතුමා ද ඇ අනු ව වනසෞඳ යීය ද බලමින් ගමන් කෙළේය. දෙන් තොමෝ ගුරුළුබර හෙයින් ද රජතෙමේ ශරීරය බර බැවින්ද මන්‍දගමනින් ගමන් මාගීය අලඞ්කාර කරන්නාහු ගමන් කළහ. සවස් වේලෙහි විලඳ බඳුනක් ගත් අත් ඇති ව ධේනුවට පෙර ගමන් කළා වූ සුදක්ෂිණා තොමෝ ප්‍රදක්ෂිණා කොට ඇගේ අංදෙස අතරට විලඳ පූජා කළා ය. එදින සවස කිරිදෙවීම් ආදියෙන් පසු දෙන හොත් කල්හි තුමූත් සමීපයෙන් හෙව නිදන්නට වන්හ. පසුදින ද පළමු පරිද්දෙන්ම ව්‍රතාවරණයෙහි යෙදුණහ.

මෙසේ පුත්‍රලාභය පිණිස මෙහෙසිය සමඟ ව්‍රතයෙහි හැසිරෙන්නා වූ රජහට එක්විසි දිනයෙක් ගතවිය.

අනික් දිනයෙහි නන්දිනී තොමෝ රජුගේ භාවය (චිත්ත ප්‍රවෘත්තිය) දැනගනු කැමැත්තී හිමාලය පර්‍වත ප්‍රාන්තයෙහි පිහිටි ගිරිගුහාවකට ප්‍රවිෂ්ටවූව. රජතුමා ද කිසිකලෙකත් නොපැමිණි රමණීය ස්ථානයක් වූ හෙයින්, ක්‍රූරසත්වයන් ගෙන් දෙනට කිසිද හිංසාවක් නොපැමිණෙන බැව් සිතා අවට ප්‍රදේශයෙහි සඤ්චාරික සෞන්දර්‍යය කරා නෙත් හෙළීය. එතෙකුදු වුව එකෙණෙහි ම සිංහයකු විසින් අල්වා ගැනීමෙන් ආනීනාද කළ දෙනගේ බැගෑ හඬින් රජුගේ ඇස් එදෙසට යොමුවිය. පලොල් වන් දෙන බිම හෙළා ඊ පිට නැඟී සිටින සිංහයෙක් රජුට පෙනිණ. හේ හට ගත් ක්‍රෝධ ඇත්තේ සිංහයා නසන්නට සිතා හියක් ගැනීමට ඇඟිලි දෙකින් හිපගලිය අල්වත් ම ඇඟිලි දෙක එහි ම ඇලී ගියේය. රජු විස්මිත විය. ක්‍රෝධයෙන් දෑවෙන්නට ද වන. වැළිදු සිංහ තෙම රජුගේ විස්මය දියුණු කරවමින් මිනිස් තෙපුලෙන් කථා කෙළේය. එහිදී මෘග රාජයා හා නරරාජයා අතර කෙබඳු දෙබසෙක් වීද? යත්—

"මෘගරාජ:—මහරජ ඔබගේ පරිශ්‍රමයෙන් කම් නැත. හිය මට විද්දත් නිෂ්ඵල වේ. වාතය වෘක්ෂෝන්මූලනයෙහි සමර්ථ වුව ද පර්‍වත පෙරළීමෙහි සමර්ථ නොවෙයි. මම වනාහි ඊශ්වරයා

ගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වූ පිටක් ඇති, නිකුම්භරාක්ෂස මිත්‍ර වූ, කුම්භෝදර නම් සේවකයා වෙමි. මේ ගිරිදුර්යෙහි පෙනෙන දෙව්දුරු රැසා මෙහෙසුරු විසින් පුත්‍රස්ථානයෙහි ලා සලකනු ලැබේ. කිසියම් කලෙක ඇතකු විසින් කපෝල කණ්ඩූයනයෙන් මේ වෘක්ෂයගේ සිවිය තළන ලද්දේ ය. එයින් පාළිති තොමෝ ශෝකවූවා ය එතැන් පටන් වලැකුන් පලවා හැරීම පිණිස මා සිංහයකු කොට, සමීපයට පැමිණියකු ආහාර කොට ගැනීමට අවසර දී, මේ ගුහායෙහි තැවැත් වී. එබැවින් මෙහෙසුරුගේ නියෝගය පරිදි ආහාර වේලාවට පැමිණි මේ දෙන ක්ෂුධිත වූ මට හෝජනයට සැහෙයි. ඔබ ලජ්ජා දුරුකොට නවතුව! සවකිය ගුරුවරයා කෙරෙහි ඔබ විසින් මැනැවින් භක්තිය දක්වන ලදි. ශස්ත්‍රයෙන් නොරැකිය හැකි දෙය නොරැක්කසි ශස්ත්‍රධාරීන්ට අපකීර්තියෙක් නොවේ.”

මේ කථාව අසා රජතෙම ඊශ්වර ප්‍රභාවයෙන් තමා ගල් ගැසුණු (ජඩීකෘත) බව දැන අවඥව ලිහිල් කොට මෙසේ පිළිතුරු දෙයි—

“නරරාජ:—පින්වත් මෘගරාජය, ක්‍රියා රහිත ව (අවශ ව) සිටින මා කියන වචනය හාස්‍යයට කරුණු විය හැකි ය. එසේ වුවත් ඔබ දේව බලයෙන් සියල්ලන්ගේ අභ්‍යන්තරය (සිත්හසර) දන්නා හෙයින් කියම්. ලෝකේශ්වර වූ ඊශ්වර තෙමේ මා විසින් ද පිදිය යුත්තෙකි එසේ ද වුව මාගේ ගුරුහුගේ එකම ධනය වූ මේ ධේනුව මා ඉදිරිපිටම නැසෙනු බලා සිටිය නොහැක්කෙමි. එබැවින් ඔබ මාගේ ශරීර මාංස යෙන් අහරකිස කොට මේ ධේනුව මුදුහරින්නට සතුටු වුව මැනැවි. සවස පෙරළා එනතුරු මැගේ කුඩා වසු නො ඉවසිල්ලෙන් බලා සිටී.”

“මෘගරාජ:– (මඳසිනා පහළ කොට) මහරජ, එකච්ඡත්‍ර ඇති මුළු ලොව ආධිපත්‍යයත්, තරුණ වයසත්, කාන්තිමත් ශරීරයත් යන මෙතෙක් මහාර්ඝ වස්තු රාශියක් ඉහා සුවලපයක් වටිනා දෙනක් උදෙසා නසනු කැමැත්තෙහි! ඔබ විචාරශූන්‍ය මූස යෙකැයි හැඟේ. ඔබට සත්ත්වකාරුණ්‍යය තිබේ නම් එක දෙනක් උදෙසා මැරී යෑමට වඩා ජීවත්වීමෙන් කෙළ ගණන් සත්ව යන් ආරක්ෂා කිරීම මැනැවි. වැළිදු එකම දෙනක් ඇති ඔබගේ ගුරුවරයා (වශිෂ්ඨ) සෝපු වෙතියි බියෙක් වේ නම් කෝටිගණනක් වුවත් කළ වැනි ගුරුළු ඇති දෙනුන් දී ඔහු සැනසීමට ද ඔබ සමර්ථ ය. එබැවින් මහත් පුණ්‍යඵලයන්

විත්ද යුතු වූ ශකනිමත් සවකිය ශරීරය ආරක්ෂා කර! සමෘද්ධ වූ ඖජ්‍යය වනාහි පෘථිවීතල ස්පර්ශමාත්‍රයෙන් ශක්‍රපදවියට වෙනස් යයි කියත්.

සිංහයා මෙසේ කියත්ම මරණ භයින් බැගෑ වූ දෙනගේ දුඃඛිත බැලීමෙන් අතිශයින් කරුණාද්‍ර වූ රජතෙම නැවත මෙසේ කී—

"නරරාජ:—උසස් වූ 'ක්ෂත්‍ර' ශබ්දය 'විනාශයෙන් රකී' (ක්ෂතාත් ත්‍රායත ඉති) යන අර්ථය සලකා ලොව පහළ විය. ඊට විරුද්ධ වූ පැවැතුම් ඇති මාගේ ක්ෂත්‍රියත්වයෙන් (රාජ්‍යයෙන්) කවර වැඩෙක් ද? නිසුවෙන් කිලිටි වූ ජීවිතයෙන් හෝ ප්‍රයෝජන කවරේ ද? මේ දෙනගේ විනාශයෙන් ඇතිවන මහර්ෂිහුගේ කෝපය හෝ අන්‍ය දෙනුන් දීමෙන් කෙසේ නිවිය හැකි ද? දෙව්ලොව සුරසිඩෙනුවට නො දෙවැනි වූ දෙනකි මෝ. ඊශ්වර ප්‍රභාවයෙන් ඔබ මෑ අල්වා ගත්තෙහි ය! එබඳු වූ මැය මාගේ ශරීරය දීමෙන් මුදාගැනීම යුකති යුක්ත ය. එසින් ඔබගේ අහරකිස (ව්‍රතානන්තර භෝජනය) ද මුනිහුගේ හෝමා දිය ද සිදුවන්නේ සි. සවාමියා විසින් ආරක්ෂා කරනු පිණිස භාර දුන් දෙය විනාශකොට තමා නිරුපද්‍රව සවාමියා ඉදිරියට යා නො හැකි ය. සවාමියකු ඇති බව ද මෙය මැනැවින් දන්නෙහි ය! එබැවින් මි දෙව්දුරු රැක රැකී මෙහි ඔබගේ ප්‍රයාසය මහති. මා නොනැසිය යුත්තකු කොට සිතසි නම් මාගේ කීර්ති ශරීරය ම රක්ෂා මැනව! මා වැන්නෝ එකාන්තයෙන් නැසෙන හෞතික ශරීරයෙහි අපේක්ෂා නො කෙරෙත්. තවද මිත්‍රත්වය ද, සහබස් කිරීම පෙරට වම වෙයි. වන මධ්‍යයෙහි අප දෙදෙනා අතර ඒ සම්භාෂණය ද වූ හෙයින් අපි මිත්‍රයෝ වෙමු. එසේ හෙයින් මිත්‍ර මෙහෙසුරු සේවකය, ඔබ මගේ ඉල්ලීම ඉටුකරන්ට සුදුස්සේහි."

මෘගරාජ:—"එසේ වේවා!"සි වචනය කී ඇසිල්ලෙහි රජතෙම සිංහයා ඉදිරියෙහි මුණින් දිගා වී භයානක සිංහනාද ප්‍රහාරය ලබන්නට බලාපොරොත්තු වී. එහෙත් "දරුව නැඟුටුව" යන අමෘතායමාන (අමා වැනි) වචනය. අසා නැඟිට බලන්නේ සිංහයකු නොදිටී. කිරිවැහෙමින් ඉදිරියෙහි සිටි මැණියන් වැනි දෙන පමණක් දිටී."

විස්මයෙන් බලාසිටි රජහට දෙන මෙසේ කිව:—

"සත්පුරුෂය, මම මායාවක් කොට ඔබ පරීක්ෂා කෙළෙමි. ඍෂිහුගේ ප්‍රභාවයෙන් යමයා ද පවා මට පහර නොදෙයි. අන්‍ය

සිංහාදීන් ගැන කවර කථා ද? දරුව, ගුරුහකතියෙනුත්මා කෙරෙහි පවත්නා අනුකම්පාවෙනුත් ඔබට පැහැදුණේමි. කිරි පමණක් නොව කැමැති දෑ දීමට ද මම සමර්ථ වෙමි. කැමැති වරයක් ඉල්වව"සි.

ඒ අසා රජතෙමේ ඇඳිලි බැඳ හමාගේ වංශය රක්නා වූ බාහු බලයෙන් ලැබූ වීර ශබ්ද ඇති පුත්‍රයකු ඉල්වී. "එසේ වේවා!"සි කියා නන්දිනී තොමෝ 'මාගේ කිරි සවලපයක් කොළගොටුව කින් ගෙන පානය කරව'සි කිවුය. රජතුමා: "වසුගේ බිමෙන් හා හෝම පිණිස ගැනීමෙන් පසු කුලගුරුහුගේ අනුඥයෙන් බොන්නෙමි"සි කියා සවස අසපුවට පැමිණ සියලු පුවත් ගුරුහට දන්වා ඔහුගේ අනුමතය පරිදි දෙනගෙන් කිරි සවලපයක් ගෙන පානය කෙළේ ය.

මෙතෙකින් දිලීප රජතෙමේ ව්‍රතය අවසන් කොට ව්‍රතාන්ත භෝජනය වළඳා, වශිෂ්ඨ මුනිහුගේ ආශීර්වාද ලැබ පෙරළා නුවරට පැමිණ නැවත රාජ්‍යය භාරගෙන ප්‍රජාපාලනයෙහි යෙදුණේය.

නොබෝකලෙකින් සුදක්ෂිණා තොමෝ ගර්භිණී වූවා රජුගේ මනදෙළ පිරවූ.

නන්දිනීවර ප්‍රදාන නම්
තිවන සර්ග නිමි.

3

ශරීරය කෘශවීම මුහුණ පඬුවන්වීම මැටිකැමෙහි ලොල් බව ඇත මෙසින් මෙහෙසියගේ දෙළදුක් ලකුණු පහළ විය.

"දෙවියන් දෙව්ලොව අනුභවකරන්නාක් මෙන් ඇයගේ පුත්‍රයා මුහුදු නිම් කොට පොළොව අනුභව කෙරෙසි" යනු හඟවන්නාක් මෙන් ප්‍රථම කොට ම මැටිකැමෙහි අභිලාෂය ඇට ඇති වී.

ඕතොමෝ දෙළදුකින් යම් යම් දෙයක් කැමැති වූ නම් ඒ ඒ දෙය නො වරදවා ම සිය සැමියාගෙන් ලැබුණේ ය. ක්‍රමයෙන් දෙළදුක් පීඩා දුරුවීමෙන් ශරීරය සුඵුලවෙමින් වැඩී දෙතන පිරී තනපුඩු කළුවී ගහි පරිපාකය හැඟ වී.

රජතුමා සුදක්ෂිණාව කෙරෙහි පවත්නා ප්‍රේමය, පුත්‍රලාභය නිසා ඇති වූ උදාරත්වය (ඔදවැඩි සිත), සඛ්‍යය දැන් බලයෙන් ලත් මහත් රජ ඉසුරය යන මෙහෙක් දෙයට අනුරූප පරිදි පිළි වෙළින් දේවියට ගැඹි පෙරහැර (පූජා සත්කාර) කෙළේ ය.

එසේම දිලීපරජතෙම කුමාර වෛදූකමී (=කෞමාරභෘත්‍ය) යෙහි දක්ෂයන් ලවා දේවියගේ ගර්භපෝෂණයට සුදුසු පිළියම් කැර විය. එහෙයින් ඕ මේඝවර්ණා අනස මෙන් ගර්භ මෝචනයට (=ප්‍රසූතියට) ආසන්න ව සිටියාය.

සුදක්ෂිණා තොමෝ සවලප දිනකගේ ඇවැමෙන් ග්‍රහයන් පස්දෙනකු උච්චව සිටීමෙන් දක්වන ලද මහත් භාග්‍ය ඇති පුත්‍ර යකු ප්‍රසූත කළාය.* එකෙණෙහි දසදිගුන් ප්‍රසන්නවීමාදි ශුභ නිමිති පහළවිය.‡ කුමාරෝත්පත්තිය කියා එන අන්තඃපුර ජන යන්ට පූණිපාත්‍ර(=තැගි)දීමෙන් රජුට ඉතිරිවූයේ ශ්වේතවර්ත්‍රයත් චාමර දෙකත් පමණෙකි ? පුත්‍රයා දැකීමෙන් රජුගේ අභ්‍යන්තර යෙහි වූ ප්‍රීතිය පුන්සඳ දුටු සාගර ජලය මෙන් උතුරා ගියාය.

වශිෂ්ඨමුනිහු පැමිණ කුමාරයා පිළිබඳ ජාතකර්ම සියල්ල කළ කල්හි ආකරයෙහි උපන් මැණිකක් සණගැම් ආදියෙන් ඔපවූ කල්හි මෙන් අතිශයින් බැබළිණි.† පුත්‍රෝත්පත්තියෙන් ප්‍රීතිමත් වූ රජුන් විසින් බන්ධනගත සත්ත්වයන් මුදාහරිනු (=නිදහස් කරනු) සිරිතෙකි. එතෙකුදු වුවත් දිලීප රජුගේ යහපත් ධර්මිෂ්ඨ රාජ්‍යපාලනය ඇති හෙයින් සිරකරුවන් එකෙකුත් නොවීය. එසේ හෙයින් රජතෙම තමා පමණක් පිතෘඍණයෙන් මිදිය. ඉක්බිති සවකිය පුත්‍රයා ශාස්ත්‍රයාගේ පරතෙරට ද යුද්ධයෙහි සතුරන්ගේ පරතෙරට ද යන්නේය යන අර්ථය සලකා(='ලඞ්ඝයතීති ලඝුඃ'යි වක්‍රව්‍යුත්පත්තියෙහි ලඝට රකොට) "රඝු"යි නම් කෙළේය. මවුපියන් මනතෙත් පිනවමින් පෙරපස සඳ මෙන් වැඩෙන්නා වූ රඝු කුමාරතෙම ධාත්‍රීය විසින් කියන ලද ප්‍රථම වචනය කියා ඔවුන්ගේ ශ්‍රෝත්‍රයෙහි දමී වත්කෙළේය. තෘතීය වර්ෂයෙහි චූඩාකර්මය කරන ලද රඝුකුමර වයස්‍ය ඇමති පුත්‍රයන් හා එක්ව කෙළිමින් වැඩී පස් වැන්න වර්ෂයෙහි සෝඞ්ය ඉගෙන ගං මුවදෙරින් මුහුදට බස්නාක් මෙන් ශාස්ත්‍ර සාගරයට බැස්සේය.

---

* ගහන් සිවිතුහු බා
මොහොතින් නුවණ සුල බා
බැම්ණි ලිය සසො බා
එපුත් රැවනඟ වැදූ මහ බා
(කව්සේකර 3-7)

‡ දසදිග එසාලු බී
ඛුනානඟ ද පැදකුණු බී
සුවඳ මදනල බී
එදා දඹදිව මඟුල්ගෙය බී
(කව්සේකර 3-8)

§ උපන් බව තම පු න්
කී කීවන්ට තුටු සි න්
බප ඇමවත් දෙව න්
දෙවන් පම්ණෙකි ඉතිරි ඇදඟ න්
(කව්සේකර 3-10)

† පිය බමුණු සිරිම න
දැකම් සියලු නිමව න
ගැසණ මිණෙව් ර න
කුමරු බැබැළිණි මහත් පින් යුත
(කව්සේකර 3-12)

එකොළොස් වැනි හවුරුද්දෙහි ශාස්ත්‍රාභ්‍යාස පරිද්දෙන් උපනයන කර්මය (=ගුරුන් වෙත භාරකිරීම) කොට අධ්‍යයනාරම්භය කැරැවී. කුමාරතෙම ගුරුන්ට ආයාස නොකොටම ශුශ්‍රූෂා, ශ්‍රවණ, ග්‍රහණ, ධාරණ, ඌහා, අපෝහා, අර්ථවිඥාන, තත්ත්වඥාන, යන අෂ්ටවිධ බුද්ධිගුණයෙන් වේදය, න්‍යායය, ව්‍යාපාරය, දණ්ඩනීතිය යන සිවුසයුරු මෙන් ගැඹුරු වූ චතුර්විධ ශාස්ත්‍රයන් අවසන් කොට ඉගෙන ධනුශ්ශිල්පයෙහි අතිදක්ෂ වූ දිලීප රජු වෙතින්ම ශස්ත්‍රවිද්‍යාව ද උගත්තේය. වත්සතරයකු වෘෂභස්කන්ධයට පැමිණෙන්නාක් මෙන් බාල්‍යය ඉක්මවා තාරුණ්‍යයට පැමිණි රඝුකුමාරයාහට දෙවිසිවන වස ගෝදානකර්මය(=කේශාන්තකර්මය) කොට පියරජතෙම විවාහමඟුල ද මැනවින් සිදු කෙළේය. වියදඬු මෙන් දික් වූ ශරීරයත් බාහු ඇති, දෙරබාවක් මෙන් පෘථුල වූ වක්ෂඃස්ථලයක් ඇති, විශාල ග්‍රීවයක් ඇති කුමාරතෙම ශරීරෝත්කර්ෂයෙන් පියරජු දිනූ නමුදු විනයාවනත හෙයින් පහත් ව පෙනුණේය. සත්ත්වභාවයෙනුත් ශාස්ත්‍රාභ්‍යාසයෙනුත් ද්විප්‍රකාරයෙන් ම ශික්ෂිත හෙයින් රාජ්‍යභාරය ධැරීමට යෝග්‍ය යයි දත් රජතුමා ඔහුට යුවරජ තනතුරු දීමෙන් බොහෝ කල් එකලා ව ඉසුලූ රාජ්‍යභාරය සැහැල්ලූ කෙළේය. එසේම අශ්වමේධ නම් මහා යාගයෙහි ප්‍රධානාඞ්ගය වූ අශ්වයා රැකීම රඝුකුමරුට භාරකොට පියරජ හෝම කෙරෙමින් එකුන් සියයක් යාගයන් අවසන් කොට සිය වැනි යාගයට ආරම්භය වශයෙන් යාගාශ්වයා සැමැති සේ හැසිරෙන්නට මුදා හැරියේය. රාජපුත්‍රයන් සමඟ රඝුකුමරු අශ්වයාගේ ආරක්ෂාවෙහි යෙදී සිටී. ශක්‍රයා 'තමාගේ ශතක්‍රතු නාම යෙන් පැවැති කීර්තිය පැහැර ගන්නට දිලීප රජ උත්සාහ කරන්නේය'යි මාත්සර්‍යයෙන් යාගවිනාශය කරමිසි සිතා අදෘශ්‍යමාන ව අශ්වයා සොරා ගෙන යන්නට පිටත් විය. ආරක්ෂක සේනාව අසු නොදක විස්මිත ව ඇත් මැත් බලන්නට වන. එකෙණෙහි මේ බැව් දත් නන්දිනී නම් ධේනු තොමෝ එහි පැමිණ සඝකීය මූත්‍රයෙන් රඝුකුමාරයාගේ නෙත් සෝදවා අශ්වවෙෂයා දකින්නට සැලැස්වූහ. රඝුකුමාරතෙම අසු රැගෙන අහසින් යන ශක්‍රයා දැක මහ හඬින් ඔහු නවතමින්:—

"පින්වත් දේවේන්ද්‍රය, ඔබ යාගයන්හි පුදලබන්නවුන් අතුරෙන් ප්‍රමුඛයා යයි පණ්ඩිතයෝ කියත්. එසේ තිබියදී මපියාණන්ගේ යාගවිනාශය පිණිස ක්‍රියාකරන්නේ කෙසේ ද? ධර්මික ක්‍රියාවනට විරුද්ධ වූ රාක්ෂසාදීන් දිවැසින් බලා නැති කළයුතු ඔබම යාගවිනාශයට ප්‍රයත්න කෙරෙසි නම් සවර දෙවියන්ගේ පිහිටෙක් ද? එබැවින් වේදමාර්ගය දක්වන ඔබ අපගේ යාගාශ්වයා මිදිය යුතුය"යි කීයේ ය.

රඝුහු විසින් කී බුහුටි වදන් අසා ශක්‍රයා විසමයට පැමිණ මෙසේ පිළිවදන් දිනි:-

"රාජකුමාරය, ඔබ කී සියල්ල සත්‍ය ය. එතෙකුදු වුවත් ඔබ පියතුමා අපගේ කීර්තිය පැහැර ගන්නට උත්සාහ කෙරෙයි. කීර්තිය ධනය කොට ඇති අප විසින් එය රැක ගත යුතු බැවින් මේ අසු මම පැහැර ගනිමි. ඒ ගැන ඔබ උත්සාහ නො කරව! සගර පුත්‍රයන් හිය මහ ගමන් නො කරව" යනුයි.

ශක්‍රයාගේ වචනය අසා සිනාසී රඝුකුමාරතෙම "එම්බා දේවේන්ද්‍රය, ඔබගේ නිශ්චය එසේ නම් ශස්ත්‍රය ගනු! රඝු නො පරදවා ඔබගේ අදහස් ඉටු නො වෙයි" කී.

එහිදී අහස සිටි ඉන්ද්‍රයා හා බිම සිටි රඝුත් අතර මහත් සටනෙක් විය. රඝුකුමාරයා ප්‍රහාර ප්‍රතිප්‍රහාර වශයෙන් විදිමින් මයූර පත්‍රාකාර එක් හියෙකින් ශක්‍රයාගේ ධ්වජය ඉරා දමා අඞ්සද වන් මුව ඇති අන් හියෙකින් ඔහුගේ දුනුදිය ද කපා හෙළීය. මෙසින් අතිශය කෝපී වූ ශක්‍රතෙම වජ්‍රායුධය ගෙන දමාගැසී. රඝුකුමාර තෙම වජ්‍ර ප්‍රහාරයෙන් මුසපත් ව බිම වැටී ඇසිල්ලෙකින් නැගිට නැවතත් යුදට වනී. බලා හුන් සේනාව ප්‍රීතිඝෝෂණය කළා ය. එසේ ද වුවත් වජ්‍රප්‍රහාරය ද ලැබ පසුබට නො වන රඝුහුගේ විර්‍යාධික්‍යයෙනි පැහැදුණා වූ ශක්‍රදේවයා කුමරහට:-

"කුමාරය, පර්වතයන්හි පවා නො පැකිල පවත්නා ශක්තී ඇති මාගේ වජ්‍රප්‍රහාරය ඔබ හැර අන් කිසිවෙක් නො ඉවසීය. මම එයින් ප්‍රීතිවීමි. අශ්වයා හැර අන් කැමැති දෙයක් කියවයි!" කී.

"පින්වත් දේවේන්ද්‍රය, අශ්වයා නො හරින්නට සිතන්නෙහි නම් සවිප්‍රකාරයෙන් යාගය කොට අවසන් වූ කල මපියාණන්ට යම් පුණ්‍යයක් ලැබේ නම් එය සලස්වව! එ මතු ද නො වෙයි. මේ ප්‍රවෘත්තිය ඔබගේ දූතයකු ලවා මපියාණන්ට දන්වනු මැනවි" යි රඝුකුමර කී.

"යහපතැ" යි පිළිනා දී සක්දෙවිතෙමේ සියල්ල එසේ ම ඉටු කෙළේ ය. ඉක්බිති දිලීප රජ පුත්‍රයා රාජ්‍යයෙහි පිහිටුවා දේවියත් සමඟ වනයට වැද තපස් කොට සවගීපරායණ වීය.

රඝුරාජාභිෂේක නම්
තුන්වන සඟ නිමි.

4

රඝුකුමරතෙම පියාණන්ගේ රාජ්‍යශ්‍රියට පැමිණ සූසීමාසනං ගමනයෙහි ගින්නක් මෙන් අතිශයින් බැබළිණි. රඝුහුගේ රාජ්‍ය ප්‍රාප්තිය ඇසූ සතුරන්ගේ හෘදයෙහි දිලිප කාලයෙහි දුම්මින් පැවැති ගිනි ඇවිළුණාක් මෙන් විය. අභිතව රජුගේ පහළ වීමෙන් ප්‍රජාවෝ ද අතිශයින් සතුටු වූහ. එ මතු ද නොව මඤ්ඤාදි නානා රජුන් විසින් පරිභූකත වුව ද පෘථිවිතොමෝ රඝුරජහට නවීනවූ වාක් වැනිවිය. පඤ්චමහා භූතයෝ පවා ඔහුට ගන්ධරසාදි ගුණයන් ගේ ආධික්‍යය ඇති කළහ. මෙසේ රඝුරජ මහත් සෞභාග්‍යයෙන් පිරී සඳහිරු දෙදෙනා අඤ්ජී නාම වශයෙන් ම 'චන්ද්‍ර' 'තපන' යන නම් ලද්දා සේ 'ලෝවැස්සන් තමා කෙරෙහි අලවයි' යන අර්ථානුගතව ම රාජනාමය ලබා වැජඹෙන කල්හි ශරත් ඍතුව පැමිණ රජහට දිග් විජය පිණිස යෑමට කල් දුන් විය–වැසිවලා පහව ගොස් අහස ප්‍රසන්න වීමෙන් සූසීයාගේ තේජස මෙන්, ම රඝුරාජයාගේ තේජස ද දශදිග පතලේ ය. හංස පඬිකුලින්හි ද තාරකා සමූහයෙහි ද ප්‍රබුද්ධ කුමුදයෙන් ගැවසි ජලාශයයන් හි ද ශෝභාව රඝුරාජ කීර්තිය ව්‍යාප්ත වූවාක් මෙනි. මේ කාල යෙහි මහා තේජස් ඇති අගස්ති තරුව පහළ වීමෙන් ජලය ප්‍රසන්න විය. එතෙකුදු වුවත් එබඳු ම තෙද ඇති රඝුරාජයාගේ පහළ වීමෙන් සතුරු රජුන්ගේ සිත් කැලඹිණි. මෙසෙසින් ශරත් ඍතුව ගඞ්ගාවන් නො ගැඹුරු කෙරෙමින් මඩවගුරු වියළ වමින් මාගීසුඛය ඇති කොට රඝුරජු දිග් විජය පිණිස මෙහෙයී.

රජතෙම ගමනාරම්භයෙහි දී කළ හෝමයෙහි දක්ෂිණාවෘත්ත ව නැඟි ගිනි දැලින් ම ජය නිමිති දැක මාලිගයෙහි හා ප්‍රත්‍යන්ත දුගීයන්හි ද රැකවල් ලා ආරක්ෂා විධාන කොට ශබ්විධ බලයෙන් යුක්ත ව පිටත් විය.

වයෝවෘද්ධ පෞරසත්‍රීන් විසින් විලඳ ඉසීමෙන් කළ මඞ්ගලාචාර පිළිගනිමින් ප්‍රථම කොට පෙරදිගට ගමන් කෙළේ ය. අනුකූල වාතයෙන් කම්පිත වූ පතාකයන් කරණකොට ගෙන ශත්‍රූන්ට තර්ජන කරන්නාක් මෙන් පෙරදිගට යන්නා වූ රජුගේ රථාශ්වයන්ගෙන් නැඟුණු ධූලියෙන් අහස පොළොව මෙන් ද, මේඝකූටාකාර හස්තීන්ගෙන් පොළොව අහස මෙන් ද පෙනුණේ ය. ඉදිරියෙහි තේජස ද අනතුරු ව ශඞ්ඛ තූර්‍යාදි ශබ්දය ද ඉක්බිති ධූලි ද සතර වැනි ව සිවුරඟ සෙනඟ දූසි මෙසේ සතර සමූහ ඇත්තියක මෙන් මහා සේනාව ගමන් ගත. රඝු රජතුමා සජලභූමීන් අජල කෙරෙමින් දුස්තර වූ ගඞ්ගාවන් සුව සේ තරණය

කථි හැක්කාවුන් කෙරෙමින් මහා අරණ්‍යයන් හෙළි කොරෙමින් මහා සේනාව ගෙන පෙරදිගට යන්නේ ඊශ්වර ජවායෙන් නිකුත් ගඞ්ගා නම් ගඟ ගෙන යන භගීරථ රජ මෙන් හෙබී. ක්‍රම යෙන් පෙරදිග් වැසි රජවරුන් පරදවමින්-අවනත කෙරෙමින්-ඒ ඒ ජනපද දිනා තාලවෘක්ෂ පඞ්ක්තියෙන් නීලවර්ණ වූ වෙරළට පැමිණියේ ය. නදීස්‍රෝතසෙහි පිහිටි වේත්‍ර ලතාවක් (=වේවැලක්) මෙන් අවනත භාවය දක්වා සුහම්ම දෙශිය ක්ෂත්‍රියයෝ රඝුහු කෙරෙන් ආත්මාරක්ෂාව සලසා ගත්හ.

රජතෙම නෞකාබලයෙන් යුක්ත වූ වඞ්ග දේශස්ථ ක්ෂත්‍රිය යන් මූලෝත්පාටනය කොට ගඞ්ගානදී ප්‍රවාහාභ්‍යන්තරයෙහි පිහිටි කුඩා ද්වීපත්වල ජයස්තම්භ පිහිටුවා ක්ෂමාව අයැදි පසු වඞ්ග යන් නැවත ස්වරාජ්‍යයෙහි ම තැබී.

ඉක්බිති හස්ති සමූහයම පාලම් වැනි කොට **කපිශා** නදි යෙන් එතර ව **උත්කල** (ඔඩිසි)දේශස්ථ රජුන් දැක් වූ මාගී යෙන් කලිඟු දෙස බලා ගොස් **මහේන්ද්‍ර** පර්වතයෙහි ස්වතේජස පිහිටු විය. ගජසේනායෙන් බලවත් වූ **කාලිඞ්ගයන්** සමඟ මහත් සටන් කොට ජය ගෙන 'ධම්මිජයී' හෙයින් (=අධම් නො කරන හෙයින්) නැවතත් ඔවුන්ට ම රාජ්‍යය දුන්නේ ය. රඝුරජ මහේන්ද්‍රනාථ වූ **කලිඟු** රජුගේ කීර්තිය මුත් භූමිය පැහැර නො ගත්තේ ය.

රඝුරජුගේ යෝධයෝ මහේන්ද්‍ර පර්වතයෙහි ජයපානය සරසා බුලත්පතින් පානය කළහ. එයින් නික්ම ඵලභරිත වූ පූග වෘක්ෂ මාලායෙන් ගැවසුණු වෙරළ ඔස්සේ ගොස් **කාවේරී** නදියෙන් එතර ව හාරිත පක්ෂීන්ගෙන් රැව්ර මිරිස් වන ඇති **මලය** පර්වත ප්‍රාන්තයට පැමිණියේ ය. එන්සහල් හා වන්දන වෘක්ෂ බහුල වූ ඒ දකුණු දෙස්හි සූර්‍යයී තේජස දමඳ වෙයි. එතෙකුදු වුවත් එ දෙස් හි ම අධිපති වූ **පාණ්ඩ්‍ය** රජහු රඝුහුගේ තේජස නො ඉවසූහ. එබැවින් සමුද්‍රය තාම්‍රපර්ණී නදිය හා එක් වූ ස්ථානයෙන් උපන් අගනා මුතු රැස රඝුරජුට උපායන කොට ශාන්තිය ලැබූහු.

රඝුරජ එහි වූ සඳුන්තුරු බහුල **මලය දර්දුර** පර්වතයන් ඉක්මවා සමුද්‍රතටයෙන් බොහෝ දුරින් පිහිටි **සහ්‍ය** නම් පර්වත යට පැමිණ පශ්චිම දිගුන් දිනීමෙහි උත්සුක විය. **කේරලයන්** දිනා, **මුරලා** (නම්දී) නදී වාහනයන් විසින් වුහුටු වැටකේ මල්රේණු යෙන් රඝුයෝධයන්ගේ කඤ්චුකයන් සුවඳ කළ කල්හි රජතල් ය, හිඳිය, දෙඔය යන රැක් බහුල වූ **අපරාන්ත** දේශයට පැමිණි යේ ය. ඔවුන් යටත් කොට සවකීය මතෑතුන්ගේ දළ පහරින්

රඝුවිජය ලකුණු කළ ත්‍රිකූට පර්වතයම ජයස්තම්භය කොට **පාර සිකයන්** (=පර්සියාව) දිනනු පිණිස ගොඩින් ගමන් ගත්තේය.

එහි දී අශ්වසේනායෙන් බලවත් වූ **යවනයන්** හා මහත් සටනෙක් විය. මධුකරව්‍යාප්ත සෞඳපටලයන් වැනි යවනයන් ගේ හිස්වලින් පොළොව වසාලූ රඝුරජතෙමේ ඉතිරි වූවන් හිස් වෙළුම් ඉවත් කොට යටත් වූ හෙයින් ඔවුන්ට අභය දුන්නේය. රඝුයෝධයෝ එහි ද්‍රාක්ෂා (=මිදි) වනයන්හි දිවිසම් මතුයෙහි හිඳ මධු(=වැසින්) පානය කොට විඩා දුරුකළහ. එයින් පිටත් ව උතුරු දිග දිනනු පිණිස යන්නේ **සිඤ්ඣුනදි** තීරයෙහි වැස විඩා දුරු කොට **හූණ** නම් ක්ෂත්‍රියයන් ජයගෙන **කාම්බෝජයට** පැමිණියේ ය. ඔවුහු යුද්ධයක් නැතිවම උත්තම අශ්වයන් ඇතුළු නොයෙක් වස්තු පඹුරු කොට දී අවනත වූහ.

කෝශලේශ්වරතෙමේ එයින් නික්ම හිමවත් පර්වතය නැඟ, භූජපත්‍ර වනයන් ඇසුරු කොට කුළල් බට නාද කරවමින් හමන, ගඞ්ගා නම් නදී ජලය මිශ්‍රිතවීමෙන් සිහිල් වූ වාතයන් සෙවුනේ **කිණ** දෙඹ රුක් සෙවණෙහි කස්තූරියෙන් සුගන්ධිත වූ ශිලාතල යන්හි සේනාවන් හා විශ්‍රාම කෙළේ ය. රඝුරජුගේ ඇතුන් දේව දූරු වෘක්ෂයන්හි බොටුවෙන් බැඳ තැබූහ. එහි පොතු තැලීමෙන් වූ ලකුණින් වැද්දෝ ඇතුන්ගේ ප්‍රමාණය තේරුම් ගත්හ.

පාර්තීය රජුන් හා මහත් සංග්‍රාමයක් කොට රඝුරාජයෝ **උත්සවසඞ්කේත** නම් ලද ඔවුන් විරතෝත්සවයන් කළහ. එහිදී කින්නරයන් ලවා සවකීය ජයඝෝෂය ගායනා කරවා, හිමවත්හි සාරවස්තූන් පඹුරු වශයෙන් ලැබ, රාවණයා විසින් සොලවන ලද්දෙකැයි කෛලාස පර්වතයට නොගොස්, **ලෞහිත්‍යා** නදී සෙන් එතරව, **ප්‍රාග්ජ්‍යෝතිෂ** (=කාමරූප) ජනපදයට පැමිණ, එහි කළු අගිල් වෘක්ෂයන්හි ඇතුන් බැඳ තබා කඳවුරු බැන්දේය.

ප්‍රාග්ජ්‍යෝතිෂ (=කාමරූප) යෙහි රජවරු මදුතුන් පඹුරු කොට දීමෙන් අවනත බව දක්වා නානාවිධ රතනයෙන් රඝුරජ පිදූහ.

මෙසේ සියලු දිගුන් දිනා "**විශ්වජිත**" නම් මහා යාගය කොට යටත් රජුන් හා භටයන් ද සුදුසු තැනතුරු පඹුරු දී යවා දිග්විජයෝත්සවය අවසන් කෙළේ ය.

රඝුරාජ දිග්විජය නම්
සිවුවන සග නිමි.

5

විශ්වජිත යාගයෙහි සියලු ධනය වියදම් කොට නිර්ධනී ව සිටි රඝුරජතුමන් වෙත ගුරුදක්ෂිණා පිණිස ධනය සොයන්නා වූ **කෞත්ස** මුනිතෙම පැමිණියේ ය. **වරතන්තු** මුනිහුගේ ශිෂ්‍ය වූ ඔහට සත්කාර කිරීමට රන්බඳුනක් පමණකුදු මාලිගයෙහි නොමැති හෙයින් මැටිභාජනයෙක්හි ලා ආගන්තුක සත්කාරය කෙළේ ය. ඉක්බිති කුශල ප්‍රශ්නය කොට මුනිවරයාගේ පැමිණීම කුමක් පිණිස දැයි ඇසී.

පූජා පිණිස මැටි බඳුනක් ගත් බැවින් ම රජුගේ නිධීන භාවය දත් මුනිතෙම–"මහරජ ඔබ වැනි ධාර්මික රජකු රජ කරන කල්හි රටවැසියනට කෙසේ නම් දුකෙක් වේ ද? කවර අශුභයෙක් වේ ද? සූර්‍යයා බබළන කල්හි අන්ධකාරයක් නැත්තා සේ ඒ කිසිත් නැහැ. පිදියයුත්තන් කෙරෙහි පිදීම් ගුණය ඔබ කුලවාරිත්‍රයක් වුව ද ඔබගේ ඒ ගුණ පූර්‍වයන් ඉක්ම පවත්නා බව දනිමි. එතෙකුදු වුවත් 'මම කල් ඉක්මවා ධනාර්පිව ඔබවෙත පැමිණියෙමි'යි මට ඛේදයෙකි! අසහාය රජන් වූ ඔබ වැන්නන් සියලු ධනය යාගයෙහි යොදා නිර්ධනත්වයට පැමිණීම ද පැසසිය යුතුමැයි. චන්ද්‍රකලාවන්ගේ ක්ෂයවීම මෙන් ඔබගේ ධනක්ෂය ද අභිවෘද්ධියට කාරණ ය.

එබැවින් මම:–

"ධම්මාථං ක්ෂීණකොශස්‍ය ක්ෂීණත්වමපිශොභතෙ
සුරෙඃ පිතාවශෙෂස්‍ය කෘශණ්‍යපක්ෂෙ විධොරිව"යි

කාමන්දකිය නීතියෙහි කියා ය. එබැවින් පින්වතාණෙනි, ඔබට මඟහරයෙක් වේවා! මම අන් තැනකට ගොස් ගුරුධනය සෑපයීමට උත්සාහ කෙරෙමි"යි කියා ගමනට සූදානම් විය.

"එසේ වුවත් ඔබගේ ගුරුදක්ෂිණාව කෙතෙක් දැ"යි මහරජු විසින් විචාරනලද මුනිතෙම 'තුදුස් කෙළකැයි'කී. මෙතෙක් වීමට හේතුව නම්–වරතන්තු මුනිතෙම කෞත්ස නම් වූ සවකිය ශිෂ්‍යයා ගුරුහකතියෙන් යුක්ත ව ශුශ්‍රූෂාව කළ හෙයින් වේද වේදඞග මීමාංසා න්‍යාය පුරාණ ධර්මශාස්ත්‍ර යන චතුර්දශ විද්‍යාවම මැනැවින් ඉගැන්වී. ගුරුපූජා වශයෙන් ශිෂ්‍යයාගේ භක්තිය ම සැලකිය. එසේ වුව ද ශිෂ්‍යතෙම ගුරුදක්ෂිණා පිණිස නැවත නැවත විවාරන හෙයින් කුපිත වූ ගුරුහු "විද්‍යාවක් පාසා කෝටිය බැගින් දිය යුතුය"යි කීහ. "ධනය මහත් වූ බැවින් ම මහා රජන් වූ ඔබ කරා පැමිණියෙමි. එසේ වුව ද ඔබගේ අතිවි පූජා පාත්‍ර

යෙන් ම ධනයෙන් ශූන්‍ය වූවෙකැ යි දත් බැවින් අන්‍යසථානය කට යමැ'යි කී මොහුට අසහාය පෘථිවීශ්වර වූ රඝුරජ:—

"පින්වතාණෙනි, ශාසත්‍ර පාරප්‍රාප්තයෙක් ගුරුදක්ෂිණා ලබනු පිණිස රඝුරජුවෙත පැමිණ ශූන්‍ය බලාපොරොත්තු ඇති ව අන්‍ය ත්‍යාගශීලියකු කරා ගියේ ය" යන පරිභවය මට නො වේවා. ඔබ මාගේ අග්‍ර්‍යගාරයෙහි සතර වැනි ගින්නක් මෙන් මාගේ පූජා ලබමින් දෙතුන් දිනක් ඉවසනු මැනව. මම ඔබගේ ප්‍රාර්‍ථනය ඉෂ්ට කරන්නට ම උත්සාහ කරමි"යි කී. තවද:—

රජතෙමේ දිග්විජය යාගාදිය පිණිස මහාජනයාගේ බොහෝ ධනය වියදම් කළ බව දන්නා හෙයින් කුවේරයාගෙන් ධනය ලැබීමට සිතා සවස් කාලයෙහි ම රථය ශස්ත්‍රයෙන් පුරවා උදෑසනම යුද පිණිස යමැයි නිශ්චය කොට ගෙන පවිත්‍රව නිදගත් තේ ය. රාත්‍රියෙහි කෝෂ්ඨාගාරයෙහි රුවන් වැස්සක් වැස්සෙන් විසමයට පැමිණි භාණ්ඩාගාරිකයෝ ඒ බව රජහට සැලකළහ.

වජ්‍රයෙන් බිඳිනාලද මේරු පර්වතපාදය මෙන් භාස්වර වූ සවණි රුෂිය දැක ප්‍රීතිමත් වූ රජතෙම සියල්ලම කෞත්සමුනිහට දුන්නේ ය. එහෙත් කෞත්සතෙම ගුරුදක්ෂිණාවට ප්‍රමාණ වූ තුදුස් කෙළ පමණක් ම ගෙන සියගණන් ඔටුවන් හා වෙළඹුන් පිටින් පිටත් කොට රජහට ආශීර්‍වාද කරන්නේ, "මහරජාණෙනි, යම්කිසි පෘථිවීශ්වරයකුට පෘථිවිය කැමති වසතු සම්පාදනය කෙරේ නම් එයආශ්චර්‍යයක් නොවේ. අහස පවා අභිමත දෙය දෙතුලබන්නා වූ ඔබගේ ප්‍රභාවය නොසිතිය හැක්කෙකි. එබඳු ඔබට පුත්‍රලාභය හැර අන්කිසි ප්‍රාර්‍ථනීය වසතුවෙක් නැති. එබැවින් ඔබගේ පියාණන්ට ඔබ ලැබුණාක් මෙන් ආත්මගුණානුරූප පුත්‍රයෙක් ලැබේවා"යි ප්‍රාර්‍ථනා කෙළේ ය.

කෞත්ස බ්‍රාහ්මණයාගේ ප්‍රාර්‍ථනායෙන් බ්‍රහ්ම මුහූර්තයෙහි (=අභිජිත්යෝගයෙහි) කුමාරයෙක් උපන්නේ ය. ඔහුට බ්‍රාහ්මණාර්‍ථය ම සලකා "අජ"යයි නම් කෙළේ ය. ප්‍රදීපයෙන් දැල් වූ ප්‍රදීපයක් මෙන් රූපාදි සියල්ලෙන්ම පියාණන් හා සම වූ අජකුමරතෙමේ සියලු ශාසත්‍රයෙහි පාරප්‍රාප්ත ව තාරුණ්‍යයෙන් බබළන කල්හි, විදර්භී දේශාධිපති භෝජ රජු තමාගේ නැඟණියන් වූ ඉන්දුමතී කුමරියගේ සවයංවර විවාහය පිණිස අජකුමාරයා එවනු පැනවැ සි රඝුරජ වෙත දූතයකු එවී. පුත්‍රයා දාරපරිග්‍රහණයට යෝග්‍යාවස්ථායෙහි සිටීම ද විදර්භාධිපති භෝජයන් හා සම්බන්ධීමෙහි යෝග්‍යත්වය ද සලකා රඝුරජතුමා පිරිවර සහිත අජකුමාරයා විදර්භදේශයට පිටත් කෙළේ ය.

අජකුමරතෙම ඒ ඒ තන්හි කඳවුරු බඳිමින් ගොස් එක් දිනක් නම්දා නදීතීරයෙහි සේනාසන්නිවේශය (=කඳවුරු බැඳීම) කොට වීඩා හරිමින් සිටී.

එකෙණෙහි මොට වූ දළ ඇති, මද නැහුණු වල් ඇතෙක් නදී ජලයෙන් නැඟී තරඟ දෙබේ කෙරෙමින් මහත් ශබ්ද සහිත ව අජ කුමාරයාගේ කඳවුර කරා දිව ආය.

රැක්අත්තන කිරිමෙන් සුවඳ ඇති ඔහුගේ මද ගඤ්ඡය ආඝ්‍රාණය කොට කුමරුන්නේ හස්තිසේනාව භිස් ලූ ලූ අහ දිවෙන්ට වන්හ. අශ්වයෝ බඤ්ඤ බිඳගෙන දිවූහ. රථයෙහි යෙදූ අසුන් වල් වැදීමෙන් රියසක් සුනු විසුනු විය. යෝධයෝ සන්‍රක්ෂණයෙහි ව්‍යාකුල වූහු. මෙසේ එක්ක්ෂණයෙක්හි මූළුකඳවුර කැලඹි ගියේ ය.

වන ඇතුන් නැසීම නීතිවිරෝධ හෙයින් අජකුමර තෙමේ ඇතු නවතන රිසින් සෙමින් දුනුදිය ඇද හී පහරක් කුම්භයට යැවී.

එකෙණෙහිම ඇත්සිරුර අනන්තර්හිත ව දිව්‍යරූපයට පැමිණ අහසෙහි සිටි ඒ දෙවියා විසමයෙන් ව්‍යාකුල වූ අජකුමරයා කලපදුම් පුෂ්පයෙන් පුදා කියන්නේ:—

"එම්බා රාජන්‍යය, මහඬහ මුනිහුගේ ශාපයෙන් හස්තිත්වයට පැමිණි මා ගඤ්ඡාඔපති ප්‍රියදර්ශනයන්ගේ පුත්‍ර වූ "ප්‍රියංවද" නමැති දැන ගනුව. ප්‍රණිපාත කොට ක්ෂමාව ඉල් වූ කල්හි මතඬග මහර්ෂිතෙම "ඉක්ෂ්වාකුවංශික අජකුමාරයා යම් කලෙක නාගේ හිස හියකින් පළන්නේ නම් එකල්හි ශාපයෙන් මිදෙන්නෙහි ය"සි කියේ ය. එබැවින් බොහෝ කල් ප්‍රාර්ථනාකරන ලද එය සිදු කරන ඔබ විසින් මම ශාපයෙන් මුදන ලදිමි. එයට ප්‍රතිපූජාවක් වශයෙන් ඔබට සතුරන් නො මරා ජය ලැබිය හැකි "ශාඞ්ගී" නම් ආයුධය දෙමි. කරුණාකර එය පිළිගනු මැනවැ"සි කිය.

'එසේ වේවා'සි කියා මන්ත්‍ර සහිත වූ ආයුධය පිළිගෙන අජ කුමාරයා විදර්භදේශය බලා ගියේ ය. ප්‍රියංවද ද කුවේර පුරය බලා ගියේ ය.

"රඝුපුත්‍ර වූ අජකුමාරයා පැමිණෙන්නේය" සි අතිශයින් ප්‍රීතිමත් වූ හෝජරජ පෙර ගමන් කොට නගර සමීපයෙහිදී පිළිගෙන නුවරට කැඳවා පූජාසත්කාර කොට නැහෙනහිරි වාසල් දෙර සමීපයෙහි සරසන ලද අභිනව රාජභවනයෙහි වාසය කැරවී. අජකුමාරයා පසුදින සවයංවරය සිදුවන්නේය සි දැන

ගමන්විඩාව බොහෝ වූ හෙයින් කලෙකින් සුව සේ නිදාගති. පසු දින උදැසන වන්දිපුත්‍රයන්ගේ වෛතාලයන් අසා නැඟිට ප්‍රාථඃ කෘත්‍යයන් නිමවා දක්ෂ සේවකයන් විසින් මොනවට සරසන ලද්දේ සඛයංවර විවාහ භූමියෙහි සැදී සිටි රාජ සභාවට ප්‍රවිෂ්ට විය.

[මෙහි "රාත්‍රිගීතා මනිමතා වර මූඤ්ච ශය්‍යාං" යනාදි ශ්ලෝක (9) නවයෙකින් දක්වනලද වන්දීන්ගේ සතුති පඨනය මනහර ය.]

අජ සඛයංවරාභිගමන නම්
පස්වන සඟ නිමි.

6

හේ එහි දේව ලීලායෙන් සැරසි සිහසුන් අරූ හුන් රජුන් දිටි. එහෙත් රතියගේ ඉල්ලීමෙන් මෙහෙසුරු විසින් මූර්තිමත් කළ අනඞගයා මෙන් භ්‍රාජිත වූ අජකුමර දුටු රජවරු ඉඳුමතිය ලැබීමේ ආශාව දුර ලූහ.

අජකුමාරයා ද භෝජ රජුන් විසින් දක්වන ලද පසිඬකයට නැඟී එහි නානා වණ්ණ විචිත්‍රාසනරණ ඇති රතනාසනයෙහි මයූර වාහනාරූඪ කඳකුමරු මෙන් හුන්නේය. නානාදේශාගත රාජ සමූහයා මැද හුන් හෙතෙම කප්රුක් මැද පිහිටි පාරිජාත වෘක්ෂය මෙන් භ්‍රාජමාන විය.

ඉක්බිති සඛයංවරයට කාලය පැමිණෙත් ම ඔවුනොවුන් පිළිබඳ වංශ පරම්පරා දන්නා වන්දීන් විසින් එහි සිටි චන්ද්‍රවංශ සූර්ය වංශ දෙක්හි උපන් රාජසමූහයෝ සතුති ගීයෙන් පසසන ලදහ. අනතුරුව අගිල්හර දුම් ධ්වජ පතාකාවන් ඉක්ම නගිද්දී, මයූර නෘත්‍යයට හේතු වූ සක්පිඹිද්දී, හාත්පස මඬලතුසියන් රැව් දෙද්දී සිය කැමැත්තෙන් සවාමියකු සොයාගන්නා (=සඛයංවරා) වූ **ඉන්දුමති** කුමරිය විවාහ යෝග්‍ය විසිතුරු සුළඟරණින් සැදී දෙලායෙකින් රාජසභාවට අවතීර්ණ වූව. "බ්‍රහ්මයාගේ විශේෂ නිර්මාණයක් වැනි ඇය- දැක සභාසද රජවරු ශරීරමාත්‍රයෙන් ආසනයන්හි හුන්හ" යනු ආශ්චර්‍ය්‍ය නො වෙයි. ඔවුනතුරෙන් සමහරෙක් ඇය කෙරෙහි ප්‍රරූඪාභිලාෂ ඇත්තාහු නානාවිධ ශරීර විකාරයන් කළහ.

එකෙක් නෙළුම්මලක් ගෙන කරකවයි. අනිකෙක් දසරූ වෙන් පහත් ව අඞ්ගදය කෙළවර රැඳුණු උතුරුසළුව සහස් කෙරෙයි. අන්‍යයෙක් ඇඟිලි අගින් සඛ්මය පාපුටුව ඉරි අඳියි.

තවෙකෙක් වම් අත ආඝනයෙහි එක්පසෙන තබා වාමාංසය මඳක් ඔසුවා ළඟ සිටි මිතුරකු හා කථා කෙරෙයි. අන් තරුණ රජෙක් මඳක් පඬුවන් වැටකේ පහන් ගෙන නියගින් ඉරයි. අන් කිසිවෙක් පසැටක් උඩ දමයි. අනිනෙක් යහපත් ව තුබුණාවූ ද කිරීටය සඝස් කරන්නාක් මෙන් වොටුන්න පිරිමදියි.

මෙසේ රාජසමූහය නානාවිධ ක්‍රියාවන්හි ව්‍යාපෘත ව සිටිය දී ම පුරුෂයකු මෙන් බුහුටි වූ තෙපුල් ඇති **සුනන්දා** නම් ද්වාරපාලිකා තොමෝ ඉඳුමතිය ඒ ඒ රජුන් වෙත පමුණුවා ඔවුන්ගේ වංශය රාජ්‍යය තේජස ප්‍රභාවය ආදි ගුණවර්ණනා කොට මෙසේ කියා දුන්නී ය.

මේ "**පරන්තප** රජතෙම **මගධ** දේශයට ඊශ්වර ය; ගම්භීර ගුණයෙන් යුක්ත ය; ප්‍රජාරඤ්ජනයෙන් පැසසුම් ලද්දෙකි; "පරන්තප" යනු මොහුට අන්‍වර්ථ නාමයෙකි. බොහෝ රජවරු සිටිය ද මොහු නිසාම භූමිය යහපත් රජුන් ඇත්තී ය; මහායාග කරන්නෙකි. මොහු හා විවාහවන්නට කැමැත්තී නම් එසේ කොට **පුෂ්පපුර** අහන්නට නෙත්‍රෝත්සවයක් කරව!"

"**අඞ්ගජනපදාධිපති** මේ රජතෙමේ සුරභන්ත් විසින් ද පතන ලද යොවුන් සිරි ඇත්තේ ය; විනීත හස්තින් ඇති මෙතුමා භූමිසථ වූයේ නමුදු ශක්‍රපදවිය වළඳයි. ශ්‍රී-සරස්වතී දෙදෙනා විසින් ම සේවිත වූ මේ රජ පතන්නෙහි නම් ඔබ ඔවුන්ට තුන් වැන්නිය වටු.

"**නිපවංශජ** වූ මේ සුෂේණ රජ **ශූරසේන** දේශයෙහි අධිපති ය; සඛීයෙහි පවා ව්‍යාපා කිසිනි ඇත්තේ ය; ආචාර යෙන් පවිත්‍ර ය. ශෞර්‍ය-ක්ෂමා - ඥාන - මෛත්‍රාදි නිත්‍යවිරෝධී ගුණයෝ පවා මොහු ඇසුරුකොට විරෝධතා දුරුකළහ. යමුනා තීරයෙහි පිහිටි කුවේරෝද්‍යානය බඳු වෘකුවනෝද්‍යානයෙහි යොවුන් සැප විඳිනු රුස්නී නම් මේ රජහට මෙහෙසිය වව!"

"**කාලිඞ්ගදේශාධිප** වූ මේ **හෙමාඞ්ගද** රජතෙම මහේන්ද්‍ර පර්වතයට බදු බල ඇත්තේ මහේන්ද්‍ර පර්වතයට හා සමුද්‍රයට ඊශ්වර ය; මහා සමුද්‍ර තරඞ්ග ශබ්දය මෝහට යාමතූර්‍යයක් බදු විය. මම්මර ශබ්ද ඇති තල්වනයෙන් ශෝභිත වූ සමුද්‍ර තීරයෙහි වෙසෙමින් මොහු හා රමණය කර!"

"මේ **නාගපුරාධිප** වූ **පඬුරජ** තෙම මුත්හර පැලඳ හරිවඳු නයෙන් අඞ්ගරාගය කොට හුන්නේ ළඟිරු රශ්මි රත්වන් වූ මධ්‍යභාගයෙහි ඇද හැළෙන ගඟුලැල්ලෙන් යුත් පර්වතයක් මෙන්

බබළයි. මහාකුලීන වූ මොහු හා එක් වූ කල්හි දක්ෂිණදිශායෙහි බුලත්වැලින් වෙළුණු පුවක් රුක් ඇති, එල්වැලින් වෙළුණු සඳුන් රුක් ඇති, තමලුපත් ඇති රිඇති, මලය පර්‍වතසන්න උද්‍යාන යන්හි ක්‍රීඩාසුව විඳිද හැකි වේ. ඉඳුමතී තොමෝ ඔහුකෙරෙහි ද මනෝබන්ධනය (=ආලය) නො කොට ඉක්ම ගියා.

රාත්‍රියෙහි පහනක් ගෙන රාජමාගීයෙහි යන කල්හි පසු කළ සියලු දෙය විවණී වන්නාක් මෙන් ඉඳුමතී නමැති ප්‍රදීප ශිඛාව යම් යම් රජකු ඉක්මවා ගියා ද ඒ ඒ රජ විවණී භාවයට පැමිණියේ ය.

එසේ ද වුවත් රඝු පුත්‍ර වූ අජ කුමාරයා වෙත පැමිණි ඉඳුමතිය අන් තැනකට යාගත නුහුණ. ඒ එසේ මැයි! පුෂ්පිත මීඅඹ රුකක් වෙත පැමිණි භෘඞ්ග පඞ්ක්තියක් අන් තැනකට නො යා මැයි.

ආකාරයෙන් ම ඉඳුමතිය අජකුමාරයා කෙරෙහි ආසක්ත වූ යයි දත් සුනඳ තොමෝ ඔහුගේ වර්ණිතය සවිත්තර ව ප්‍රකාශ කොට, කුලයෙන් රූපලාවණ්‍යයෙන් වයසින් ගුණයෙන් තමාට සමාන වූ මෙකුමරු හා මාණික්‍යයක් සඞ්ගිය හා එක්වන්නාක් මෙන් එක්වව සි කිහ.

සානුරාග දෘෂ්ටියෙන් හා රෝමාඤ්චිත ගාත්‍රයෙන් ඉඳුමතී ඔහු කෙරෙහි රක්ත වූවාය සි දන්නී ද සුනඳ තොමෝ පරිහාස පූර්‍වක ව "ආර්‍යාවෙනි, අන් කුමරකු වෙත යෙමු"සි කිව. රෝෂ යෙන් බැම හකුළුවා බැලීම එයට ඉඳුමතියගේ පිළිතුර විය.

ඉක්බිති ඉඳුමතී තොමෝ මූර්‍තිමත් වූ අනුරාගය බඳු මඩගල චූර්ණයෙන් රක්තවර්ණ වූ මල්මාලාව සුනඳුව ලවා අජ කුමාරයාගේ ගෙල පැලඳ වූහ.

සමගුණ ඇති ඔවුන් දෙදෙනාගේ යෝගයෙන් ප්‍රීති වූ පුර වැසියෝ වඳුරා හා එක් වූ කෞමුදී තිථිය (=හිල් පුරපසළොස්වක) මෙනැසි ද, සාගරය හා එක් වූ ජාහ්නවී (=ගඞ්ගා) නදිය මෙනැසි ද, අන්‍ය රජුන්ගේ කනට යහුල් වැනි-ප්‍රීති වාක්‍ය පැවැත් වූහ.

සඞ්ගරංවර වර්ණනා නම්
සවන සග නිමි.

7

ඉක්ඛ්වකු හෝජ රජතෙම කඳකුමරුන් හා සම්බන්ධගත වූ **දේවසේනා** නම් දෙවඟන මෙන් ආත්මානුරූප වූ සවාමියකු ලැබූ තම නැඟණියන් ගෙන නගරයට ප්‍රවිෂ්ට විය. රාජසමූහය ද මනෝරථය සුන් වූ හෙයින් උදාසන ග්‍රහතාරකාවන් මෙන් නිෂ්ප්‍රභ ව තම තමන්ගේ කඳවුරු කරා ගියහ.

ඉක්ඛ්වකු අජ-ඉන්දුමතී යන වර-වධූ යුවළ සර්ව්‍යප්‍රකාරයෙන් ම අභිනව මඞ්ගල්‍යාලඞ්කාරයෙන් සැරසී දද සෙවණින් නිවාරිත සූර්‍යාසංතාප (=අව්ව) ඇති රාජමාර්ගයට අවතීර්ණ වූහු.

එකල්හි අභිනව යුවනිපති දෙදෙනා දැකීමෙහි ව්‍යාපෘත වූ පෞරකාන්තාවන් අතුරෙන් එක් ස්ත්‍රියක් කවුළුව සමීපයට වඩා දුවන්නී මල්දම ලිහිල් ව විසිර ගිය ද කොණ්ඩය ඉනි ගිය ද කවුළුව කරා යනතුරු එය නො සැලකූහ.

අනිකක් තොමෝ පාදයෙහි ලාරස තවරමින් සිට ලීලා ගමන් දුරුකොට කවුළුව කරා දුවන්නී ලාරස තැවරූ පියවර සටහන් දැක් වූ.

අන් යුවතියක් දකුණැස පමණක් අඳුන් ගා තෙලිකුර වම නින් ගෙන කවාටය දෙසට දිවූ.

අන්‍ය ස්ත්‍රියක් යුහු ගමනින් ලිහිල් වූ වස්ත්‍රය අතින් ගෙන දිව ගියා.

අනිකක් තොමෝ අඩක් ඇවුණු රසනාදාමය ගෙන වහා නැඟිටියා පියවරක් පාසා රතනයන් වගුරුවමින් ගොස් කවුළු සමීපයෙහි සූත්‍රය පමණක් ගෙන සිටියා ය.

මෙසේ මහල් පෙරහැරින් යන අජකුමාරයන් ගවාක්ෂ අහරින් බලන්නා වූ පෞරාඞ්ගනාවන්ගේ සියලු ඉන්ද්‍රියයන්ගේ ම ශක්තිය චක්ෂුරින්ද්‍රිය වෙත ම පිහිටියාක් වැනි විය.

"අසමසම වූ සෞන්දර්‍යයී ඇති මේ දෙදෙනා සම්බන්ධ නුවූහු නම් මොවුන්ගේ අනන්‍ය සාධාරණ රූප නිර්මාණයෙහි වූ බ්‍රහ්මයාගේ ප්‍රයත්නය නිෂ්ඵල වන්නේ ය. පූර්ව්‍යජන්මයෙහි රති-සමර දෙදෙනා නම් මොහු ය. නැතහොත් දහස් ගණන් රජකුමරුන් ඇති තැනින් මේ අජකුමරු ම සොයා ගත්තේ කෙසේ ද? සිත වනාහි පූර්ව්‍යජන්මයෙහි සඞ්ගතිය දනී"සි මෙසේ කියන්නා වූ පුරසුන්දරීන්ගේ කන්කලු (=මිහිරි) තෙපුල් අසමින් අජකුමරු ඉන්දුමතිය හා හෝජරාජමන්දිරයට පැමිණියේ ය.

එහිදී අජකුමරු ඇතුපිටින් බැස කාමරූප දේශාධිපති හෝජරජුගේ අතගෙන ඇතුළු මළුවට පිවිස සරසන ලද මහාඝ සිංහාසනයෙහි හිඳ හෝජ රජු විසින් දුන් රතන සහිත මධුපකීය* හා දුහුල් යුගළය පිළිගෙන විවාහ මඟහලයට සූදානම් විය. ඉක්බිති අන්තඃපුරාධිකාරීන් විසින් අජකුමාරයා අග්නිකුණ්ඩය (=ගිනිවළ) සමීපයට පමුණුවා ඒ ගින්නම සාක්ෂි කොට යුවති පති දෙදෙනා කරග්‍රහණය කරවා විවාහය කරන ලදහ. ඒ වධූවර දෙදෙන හිනිපැදකුණු කොට කුලගුරුහු විසින් මන්ත්‍ර පුරසකෘත ව (=මතුරා) දුන් විලඳ ගින්නෙහි බහා එක් සඛීසනයෙක්හි හුන්හු

ඉක්බිති ඥාතකයන් නෑයන් සහිත රජු විසින් ද පතිපුත්‍රයන් ඇති අඟනන් විසින් ද පිළිවෙළින් ඔවුන්ට තෙත් විලඳ ඉසින ලදි.

පාණිග්‍රහණය මෙතෙකින් නිමවා හෝජරජ සෙසු රජවරුන්ට ද පුදසත්කාර විධාන කෙළේ ය. ඔහු ද ඇතුළත කිඹුලුන් ඇති විල් මෙන් පිටතින් ප්‍රසන්නාකාරය දක්වා ඔහුගේ පූජාවසතු පඬුරු සවරූපයෙන් ආපසු දී නික්ම ගොස් අජකුමරුන් යන මාගීය අවුරා කුමරු එනතුරු යුද පිණිස සැරසී බලා හුන්හ.

විධිවූ පරිදි විවාහය නිමවා නැඟණියනට දියයුතු දායාද යන් ද දෙවා ඔවුන් පිටත් කොට පසුගමන් පිණිස දිනත්‍රයක් ගොස් හෝජරජ නැවැත්තේ ය.

අජකුමාරයා ඉන්දුමතිය රැගෙන යන මාගීයෙහි පෙර සිටම එදිරි ව සැරසී සිටි සතුරු සමූහයා මඟ අවුරා යුදට වන්හ.

අජකුමාරයා ද ඉන්දුමතියගේ ආරක්ෂා පිණිස පියාණන්ගේ අමාත්‍යයකු බොහෝ භටයන් සමඟ යොදා තෙමේ යුදබිමට වැද මහත් වූ යුද්ධයක් කෙළේ ය.

සතුරන් විසින් තම සේනාවන් පරදවන ලද ද අජකුමර තෙම තනි ව ම යුදකොට පළමු ප්‍රියංවදයාගෙන් ලත් ගාඬිවී අස්ත්‍රය යොදා සියලු රජුන් ආයුධ ගත් අත්ඇති චිත්‍රයෙක්හි අඳින ලද ප්‍රතිරූප මෙන් කොට ඔවුන්ගේ කීර්තිය පානය කරන්නාක් මෙන් සඟ ගෙන පිම්බේ ය. අසහාය වීර වූ අජකුමාරයාගේ සක්ඟඩ දන්නා වූ යෝධයෝ පෙරළා අවුත් ඔහුළුණු පියුම් මධ්‍යයෙන් පෙනෙන චන්ද්‍ර ප්‍රතිබිම්බය මෙන් නිදිගත් සතුරන් මැද බබළන සඛිය සවාමියා දුටහ.

---

* දී ගිනෙල් දිය මී උක්සකුරු යන පස්වගියෙන් කළ යෝගයෙකි.

ඉක්බිති අජකුමාරතෙම ලේඛාගත හි අගින් ඒ රජුන්ගේ ධර්මජයන්හි "තොපගේ යසස පමණක් රඳු පුත්‍රයා විසින් පැහැර ගන්නා ලදි; කරුණා බහුල බැවින් ජීවිතය දෙන ලදි" යන මේ වාක්‍යය ලියවා ඉඳුමතිය ම විජයලක්ෂ්මිය කොට ගෙන සිය නුවර බලා ගියේ ය.

පැසසිය යුතු දිනුම් ඇති අජකුමාරයා රඳු රජු වෙත පැමිණි කල්හි යහපත් බිරිඳක් ලැබූ පුත්‍රයා රාජ්‍යයෙහි පිහිටුවා පිය රජ මොක්ෂ මාර්ගය පිණිස පිළිපන්නේ ය. (=තපසට ගියේ ය.) ඒ එසේ ම ය. රාජ්‍යභාරය ඉසිලීමට සමර්ථ පුත්‍රයකු ඇති කල්හි සූර්‍ය්‍ය වංශිකයෝ ගෘහස්ථාශ්‍රමයෙහි නො සිටිත්. මේ ඔවුන්ගේ කුල චාරිත්‍රය යි.

අජවිවාහ නම්
සත්වන සඟ නිමි.

8

රඳු රජතුමා සවකිය පුත්‍රයාගේ විවාහ මඬහලය පවත්නා කල්හිම අන්‍ය දේවියක මෙන් පෘථිවිය ද ඔහුට පාවාදී වශීභූත මුනිහු විසින් සම්පාදිත නීර්ජලයෙන් අභිෂෙක කෙළේ ය.

ඇතැම් රජකුමරුවෝ විෂ දීම් ආදී දුෂ්ටක්‍රියායෙන් පවා රාජ්‍යය ලැබීමට උත්සාහ කෙරෙත්. එසේ ද වුව අජකුමාරයා පියරජුගේ ආඥාව ඉටුකිරීම් වශයෙන් මුත් රාජ්‍යලෝභයෙන් රාජ්‍යය පිළිගත්තේ නො වේ.

"අජ රජුගේ රාජ්‍යය පවත්නා කල්හි රඳු රජම පෙරළා යොවුන් වියට පැමිණ සිටියාක් වනැ"යි මහා ජනයෝ සැලකූහ. පිය සතු රාජ්‍යශ්‍රිය පමණක් නොව සියලු ගුණයන් ද රඳු පුත්‍රයා ලබාගත් හෙයින් මෙසේ සිතීම යුකති යුක්ත මැයි.

ප්‍රජාවන් අතුරෙහි සියල්ලෝ වෙන වෙන ම "රජතුමා මා ගැන ම සිතන්නේය"යි සිතූහ. කිසිවකුටත් අවමානයක් රජු ගෙන් නුවූ බවට මේ සාධක ය.

අජරජ ඉතා රළු නුවූ ඉතා මෘදු නුවූ මැදුම් පිළිවෙතින් යුක්තව සාමන්ත රජුන් තමා වෙත නතු කෙළේ ය.

මෙපරිද්දෙන් පුත්‍රයා රාජ්‍යධුරයෙහි මැනැවින් ප්‍රතිෂ්ඨිත බව දැන පියරජතුමා තාපස වේෂධාරී ව වනයට යෑමට පිටත් විය. එතෙකුදු වුවත් මහත් සේ හඬා වැලප පාමුල වැටී "මා

පරිත්‍යාග නො කරනු මැනවැ" යි යාචඤ්ඤ කරන්නා වූ පුත්‍රයා කෙරෙහි කරුණායෙන් රඝුරාජර්ෂිතෙම නුවරින් බැහැර උයන්හි ආශ්‍රමයක විසීමට සතුටු විය. මෙසේ ප්‍රව්‍රජ්‍යාශ්‍රමයට පැමිණ අන්තිම ආශ්‍රමය ගත්කරන්නා වූ රඝුරජු ය, අභිනව රජ පැමිණි අජනරපති ය යන රජුන් දෙදෙනාගෙන් හෙබි රඝුරාජ වංශය බැස යන චන්ද්‍රයා හා උදාවන සූර්‍යයාත් ඇති අහස මේන් බැබ ළිණි. තාපස වේෂයත් (=යති ලිඞ්ගයත්) රාජ වේෂයත් (=පෘථිවී ශ්වර ලිඞ්ගයත්) ධරන්නා වූ මේ රඝු-රාඝව* දෙදෙනා නිවර්තක ප්‍රවර්තක (=සංසාර නිරෝධය, සංසාර සමුදය) ධර්මයන්ගේ අංශුඛ යක් පොළොවට බටුවාක් මෙන් ජනයන් විසින් දක්නා ලදහ.

තරුණ රජතෙම ජනයන්ගේ දුෂ්ටශිෂ්ටතා බලනු පිණිස විනිශ්චයාසනාරූඪ විය. මහලු රජතෙම සමාධිය ලබනු පිණිස විවේකස්ථානයකට පැමිණ කුශතණ ඇතිරියෙහි වැඩ හුන්නේය.

එකෙක් ප්‍රභුශක්තියෙන් සතුරු රජුන් වශඟ කෙළේ ය. අන්‍යයා සමාධි බලයෙන් ප්‍රාණාදි පඤ්චවායූන් වශඟ කෙළේ ය.

අජතෙම අන්‍ය සාමන්ත රජුන්ගේ සිදුරු සොයනු පිණිස නීති නමැති ඇස මෙහෙයිය. රඝුතෙම පරමාත්මයා දකිනු පිණිස හෘදයාභ්‍යන්තරයෙහි මනස පිහිටු විය (=සිත එකඟ කෙළේ ය.)

අභිනව රජ ඵලප්‍රාප්තිය දන්වා ආරබ්ධ ක්‍රියාව අත් නො හැරියේ ය. පුරාණ රජ පරමාත්ම දර්ශනය (=මොක්ෂාධිගමය) දක්වා යෝගාභ්‍යාසයෙන් වෙන් නොවී.

මෙසේ රාජ්‍යසමෘද්ධිය මෝක්ෂලාභය යන දෙක්හි යෙදී සතුරන් විෂයෙහි ද ඉන්ද්‍රිය විෂයෙහි ද අප්‍රමත්ත ව වසන්නා වූ ඔවුන් දෙදෙනා අතුරෙන් අජරජ මිනිස් සතුරන් විසින් නො පැරදවිය හැකි රාජ්‍යසමෘද්ධියට ද, රඝුරජ කෙලෙස් සතුරන් විසින් පැහැර ගත නො හැකි අවිද්‍යාව ඉක්ම වූ මොක්ෂසුවයට ද පැමිණියහ.

රඝුරාජර්ෂිහුගේ දෙහත්‍යාගය (=මරණය) අසා අජරාජයෝ අතිශයින් ශෝකවූහ. එතෙකුදු වුවත් පරමාර්ථය(=ලෝකනාත්වය) දන්නා යතින් විසින් සන්නිදුවන ලද ශෝක ඇත්තේ එතුමන් පිළිබඳ නෛෂ්ඨික කර්මය (=අන්තිම යාගය) කොට ලෝකයට අස හාය ශාසකයා වූයේ ය. යහපත් සවාමියකු ලත් පෘථිවිතොමෝ බොහෝ රත්නයන් ඉපද වූ, ඉඤ්ඉමතිය වීරපුත්‍රයකු ප්‍රසූත නාළා.

සූර්‍යයා බඳු කාන්තියෙන් දසදික්හි ප්‍රසිද්ධ වූ දශරථ නම් වූ ඒ කුමාරතෙමේ රාවණ ශත්‍රු වූ රාමයාගේ පියා ය. දශරථකුමා රෝත්පත්තියෙන් පිය වූ අජරජ පියන් පිළිබඳ වූ ඍණයෙන්

* රඝුරජ හා අජ කුමාරයා.

(ඇපිතෘ දේවයන් තෂීණය නමැති ණයෙන්) මිදුණේ ය. දෙවියන් හා යෑමින් පිළිබඳ ණය පෙරම මුදා සිටි හෙයින් පුත්‍රලාභයෙන් පසු සියලු ණයෙන් මුක්ත වූ අජරජ පරිවේෂ* රහිත සූර්‍යයා මෙන් භ්‍රාජිත විය.

ධනය පමණක් නොව බලය බහුශ්‍රැතත්වය යන ගුණයන් පවා හඟට පැමිණියන් රැකීමය, පණ්ඩිතයන් පිදීමය යන පරාර්ථය පිණිස ම යොදමින් රාජ්‍යානුශාසනා කරන අජරජ එක් දිනක් දේවිය සමඟ උයන් කෙළියට ගොස් ක්‍රීඩා තත්පර වූයේ ය.

එකෙණෙහි අහසින් යන **නාරද** මුනිහුගේ දිව්‍යපුෂ්පමාලාව සුළඟින් ඉගිළ අවුත් ඉන්දුමතී දේවියගේ හන මත වැටුණු. එය බලා ව්‍යාකුලත්වයට පැමිණි දේවී මරණයට පැමිණුණ. ජ්වලයෙන් නැහුණු ගින්නක් මෙන්, වැසි නැති සෙණයක් මෙන් බලා පොරොත්තු රහිතව සිදු වූ ප්‍රියාවගේ හදිසි මරණයෙන් අජ රජ ද මුසපත් ව බිම හිණ. පරිවාර ජනයන්ගේ මහත් බැහැපත් හඬින් ද, එසින් බිහපත් විල් ඇසුරු කළ හංසාදි පක්ෂීන්ගේ කල කල රැවින් ද ඒ උද්‍යානය ඒකකෝලාහල විය.

එතෙකුදු වුවත් පවන් සැලීමාදියෙන් රජතුමා සිහි ලද. දේවිය නම් පරමාර්ථ මරණයට ම පැමිණියා ය. අජ රජ ශෝකාසාගරයෙහි නිමිග්න ව ප්‍රියාවගේ සිරුර ඔසවා ඇකයෙහි තබා සහජ වූ ද ධීරගුණය දුරු කොට විලාප කියමින් ඉකි බිඳ බිඳ හඬන්ට විය. ඉතා තද යකඩය පවා අතිශයින් තැවුණු කල මෘදු වෙයි. මිනිසුන් ගැන කවර කථා ද?

(මේහි කරුණා රස පරිපූර්ණ අජ විලාපය ශ්ලෝක පඤ්චවිංශතියෙකින් (25) බඳනා ලද අපුරු සංවේග කර ය.)

ඉන්දුමතියගේ මළසිරුර වැලඳ හඬන්නා වූ අජ රජුගේ ඇකයෙන් එය දුකසේ ඉවත් කොට ගෙන ඥතිමිත්‍රාදෝ අගිල් දරින් කරන ලද විතර්කයෙහි බහා ආදාහනය සිදුකළහ. ඉක්බිති අජ රජතුමා මළවුන් පිණිස දශදිනෙකින් මත්තෙහි කළයුතු ශුද්ධික්‍රියා විධිය ද උයනෙහිදී ම සිදුකොට නුවරට පිවිසියේ ය.

මේ ප්‍රවෘත්තිය ධ්‍යාන චිත්තයෙන් දත් වශිෂ්ඨ මුනිහු [යාග කර්මයක් ආරම්භ කොට එය නො නිමි හෙයින්] ශිෂ්‍යයකු ලවා රජහට මෙසේ කියා එවූහ:—

---

* සුදු වලාකුළු සහිත කල්හි වහු සූර්‍යයන් වෙවී පෙනෙන කවාකාර මණ්ඩලය පරිවේෂ නාම්.

"පින්වත් මහරජ, ඔබගේ දුඃඛය දැනගෙන ද ඔබ සැනසීම පිණිස ඒමට යාගය අසම්පන්න හෙයින් නො හැකිය. ඔබ දේවිය වනාහි ශාප හේතුවින් මිනිස්බවට පැමිණි දෙවිදුවකි:-පුරාණ කාලයෙහි අතිශයින් තීව්‍ර වූ තපස් කරන තෘණබින්දු නම් තාපස යෙක් විය. ශක්‍රපදවිය ගනී යයි සැක කළ ශක්‍රයා ඔහුගේ තපස් බිඳුවන පිණිස හරිණී නම් දෙවඟන යැවී.

තෘණබින්දුගේ තපසට බාධා කළ හරිණී: "නි මිනිස් දුවක් වව!" යි ඒ තපස්වීහු විසින් ශාපකරන ලදු. ඈ විසින් ක්ෂමාව අයැදි කල්හි "දිව්‍යපුෂ්පයක් දැකීමෙන් ශාපයෙන් මිදීම වන්නේ ය"යි තෘණබින්දු කිය. ඕතොමෝ විදභී රාජ දුහිතෘ වූවා ඔබට මෙහෙසී ව සිට දිවමල්දම දැකීමෙන් ශාපයෙන් මිදී දෙව්ලොව ගියා.

"එබැවින් ශෝකවීමෙන් කම් නැත. උත්පත්ති ඇති සියල්ලන්ටම විපත්ති සිදුවීම නියත ය. පෘථිවිය මැනැවින් පාලනය කරව! පෘථිවිය නිසා ම රජවරු පත්නි සහිත වෙති. ඔබ විසින් ලත් ශාස්ත්‍රමය ඥානය මානසික සන්තාපයට ප්‍රතිකාර කිරීමෙහි සමර්ථ වෙයි. ප්‍රියාවගේ වියෝගයෙන් හැඬීම නිෂ්ඵලය, හැඬීමෙන් තබා අෑ අනුව මැරීමෙන් වත් ඇය ලැබිය නො හැක්ක, කර්මානුරූප ව මිය යන්නවුන් එක් මහඟ නො යන හෙයිනි. එබැවින් ශෝක දුරුකොට සඛකිය දේවියට නිවාප දානාදියෙන් සංග්‍රහ කරව! 'සඛකීයයන් විසින් හෙළන උණුසුම් කඳුළෙන් පරලොව ගියහු දැවෙති'යි කියන හෙයින් හැඬීම දුරු කළයුතු මැයි. මරණය සත්වයන්ට සාධාරණ සිදුවීමෙකි. මුසයෝ ප්‍රියයාගේ විනාශය ළඟි හැණී හුලක් මෙන් සිතත්. සුසිහු වනාහි එයම හුල් උදුරාලී මෙකැයි සිතත්. ප්‍රිය විනාශය කුශලයට අවාරයක් වන හෙයිනි. තම සිරුර පවා හැරයෑම නියත බැවින් අන්‍යයන්ගේ වියෝගය ගැන කියනුම කවරේ ද?. එබැවින් ඉන්ද්‍රිය දමනයෙන් යුත් උත්තමය, සාමාන්‍ය පුහුදුනන් මෙන් හැඬීම ඔබට නො වටනේ මය. වාතයෙන් වෘක්ෂයත් පර්වතයත් දෙකම කම්පා වේ නම් ඔවුන්ගේ වෙනස කවරේ ද"යි.

කුලගුරු වූ වශිෂ්ඨ මුනිහුගේ මේ අවවාදය "එසේ ය" කියා පිළිගත් නමුත් රජහට එසේ පිළිපැදීම සුකර නොවිය. ශෝකයෙන් සත වූ හෘදයෙහි ඒ අවවාදය නො වැදුණු හෙයින් පෙරළා වශිෂ්ඨර්ෂීන් කරුම ගියාක් මෙන් විය.

එතෙකුදු වුව පුත්‍රයා ළඳරුවියෙහි සිටීම රජුගේ ප්‍රාණත්‍යාගයට එකම බලවත්තය විය. එහෙයින් යම්තම් අටවසක් ගෙවෙන

තුරු අජරජ ජීවත් වූයේ ය. සුවසළ නො හැකි ශෝකජ රෝග යීක් සැදීමෙන් මරණයට පත්වන්නා වූ රජ එයම ලාභයක් මෙන් සිතා බාලවුවද පුත්‍රයාට රාජ්‍යය දී ගඩහා-ශරයූ දෙනදීන් එක් වූ තන්හි පුණ්‍යතීර්ථයෙහි පැන සියදිවි තොරසරගත්තේය.

අජවිලාප නම්
අටවන සඟ නිමි.

9

ඉක්බිති ඔහු පුත් දශරථ රජ උත්තර කෝශල රාජ්‍යය අනුශාසනා කෙළේ ය. කඳකුමරුන්ට බදු බල ඇති මේ රජ විධි වූ පරිදි රට පාලනය කරන කල්හි කොසොල් ජනපදයෙහි වැසි ජනතාවට රෝගයෙක් පවා නො වීය. අන්‍ය සතුරු උවදුරු පිළිබඳ කවර කථා ද?

දඩකෙළිය, දූකෙළිය, මද්‍යපානය, මිථ්‍යාචාරය යන ව්‍යසන යෙන් තොර වූ, ශක්‍රයාහට වුවත් බැගෑ නෙපුලක් හෝ කෙළි පිණිස වුවත් අසත්‍ය වචනයක් හෝ සතුරන්හට වත් ඵරුෂ වචනයක් හෝ නො කියන්නා වූ, යටත් වැසියන්ට අභිවෘද්ධිය ද විරුද්ධ වූවන්ට විනාශය ද දෙන්නා වූ, සමුද්‍රය හිම් කොට පොළොව දිනූ මේ දශරථ රජතෙම සවමණ්ඩලාදී ද්වාදශ රාජමණ්ඩලයට* ප්‍රධාන සක්විති වූ නමුදු අනලස් වූයේ ය. සතුරන් ලුහුබඳිනු ලබන්නක්හු සේ ජාග්‍රත වූයේ ය-ප්‍රබෝධ විය.

ප්‍රභු මන්ත්‍ර උත්සාහ යන ත්‍රිශක්තිය මෙන් මේ රජුට **කෞශල්‍යා, සුමිත්‍රා, කෛකේයි** යන මෙහෙසිඳු තිදෙනෙක් ද වූහ. එසේ වුව ද ඉදුරන් පිනවීම ම ජීවිත ඵලය සි නො ගෙන ක්‍රියා කළ බවට **නමසා-ශරයූ** යන නදීන්ගේ තීරයන්හි කළ රන්මුවා යාගසතාමහයෝ ම සාක්ෂි වෙති.

එක්තරා වසන්ත කාලයෙහි දශරථ රජතුමා රුක්ලිය නව පල්ලව කුසුමයෙන් සැදෙද්දී, බඹරකොවුලන් මිහිරි ගී ගයද්දී, විල් පොකුණු පුරවූ පියුමින් සැරසෙද්දී, අශෝක රුක් මල්පල්

---

* 1. සවමණ්ඩල. 2. ශත්‍රුමණ්ඩල. 3. මිත්‍රමණ්ඩල. 4. ශත්‍රුමිත්‍ර. 5. මිත්‍රමිත්‍ර. 6. මිත්‍රශත්‍රු යන මොහු ඉදිරිපස සමඬල සි. පිටිසසින්. 7. පාර්ෂ්ණිග්‍රාහ. 8. ආක්‍රන්ද. 9. පාර්ෂ්ණිග්‍රාහාසාර. 10. ආක්‍රන්දසාර. 11. මධ්‍යස්ථ. 12. උදාසීන යන සමඬලය යන මේ දෙළොස සි.

ලෙන් සැදී කාමුකයන් මන් මත් කරද්දී උයන් කෙළි පිණිස ගියේ ය. පරිවාර ජනයා හා රිසියේ ක්‍රීඩා කොට දඩකෙළියෙහි යෙදීම ද කැමැති විය. (මෙහි ශ්ලෝක සුවිස්සෙකින් (24) පමණ කළ උද්‍යාන ක්‍රීඩාවර්ණනය රවනාවාතුරීය පළ කෙරේ.)

දඩක්‍රීඩාවෙන් වසඟවූ ඉලැක්කිය හෙළීමෙහි පරිවය ය, සතුන් ගේ භයක්‍රෝධ ආකාර දැනීම ය, විඩා දුරුවීමෙන් ශරීරලාඝවාදි ගුණය යන මෙතෙක් අනුසස් ලැබෙන හෙයින් ඇමැතියන් හා දඩක්‍රීඩා පිණිස ගිය බවමුත් ආඛෙටක ව්‍යසනයෙන් ගියේ නොවේ.

මෙසේ වනයෙහි මුව සූරු සිංහ ව්‍යාඝ්‍රාදීන් ලුහුබදිමින් විදිමින් ක්‍රීඩාකරන්නා වූ රජහට නිරන්තර සේවනයෙන් එහි ඇල්ම (=බැඳීම) අධික විය. ඒ එසේ මැ සි! කාමයෝ කිසියේත් උපභෝගයෙන් නො සන්සිඳෙත් මැනු? ගින්නට තෙල් ඉසි කාලක් මෙන් කාමසේවනය කාමාශාව වැඩිදියුණුවීමට ම හේතු වේ. එබැවින් වනයෙහි ම මල්පලු පත් ම ශයනාසන කොට ගෙන රැරහ ම පහන් කොට ගෙන රාත්‍රිය ද ගත කෙළේ ය.

මෙසේ දඩකෙළනා රජුට එක් දිනක් **තමසා** නදියෙහි කළ යක් පුරවන ශබ්දයෙක් ඇසිණ. අසා එය හස්තියකුගේ හඬෙ කැයි සැක කොට වලැතුන් මැරීම නීතිවිරෝධී වුව ද වපලත්වය හේතුකොට ගෙන ශබ්දවෙධී ශරයෙකින් (=ශබ්දානුසාරයෙන් විදිනසුලු ක්‍රමයෙකින්) එදෙසට විද්දේ ය.

"අපොසි, පියාණෙනි!"සි කැගැසීමෙක් ඇසුණේය. රජ එය අසා වේවැල් ගහනයෙහි සොයා යන්නේ නීය වැදී දියකළය සමඟ වැටී සිටි මුනි පුත්‍රයකු දැක මහත් සන්තාපයට පැමිණිණ. වහා අසුපිටින් බැස අඹය විවාලේ ය. තපස්වී පුත්‍රයා ගොත ගසමින් "මා ද්විජයකු (=බ්‍රාහ්මණ ක්ෂත්‍රිය වෛශ්‍ය ජාති ඇත්තකු) නො වන බැවින් බ්‍රහ්මහත්‍ය පාපය ගැන සැක නො කරව"සි කී හෙයින් මදක් අස්වැසුම් ලත් රජතෙම ඔහුගේ කීම පරිදි වනයෙහි සිටි ඔහුගේ අඹ දෙමාපියන් වෙත පැමිණිවී. ඔහු දෙදෙන බොහෝ විලාප කියමින් හඬා රජු ලවා ම පුත්‍රයාගේ භීය ඉවත් කරවූහ. එකෙණෙහි ම මුනිපුත්‍රයා මෙලේ ය. අඹ තපස්වීහු දෙදෙන "එම්බා මහරජ, අපමෙන් ම ඔබ ද මහලු කල්හි පුත්‍ර ශෝකයෙන් මැරෙන්නෙහි ය"සි ශාපකොට රජු ලවා ම දරුසෑයක් කරවා පුත්‍රයා දවන ගින්නට පැන දිවි හසාගත්හ.

ඉක්බිති රජ තමාගේ විනාශයට හේතුභූත වඩබාග්නිය ධරන සමුද්‍රය මෙන් සවිනාශ හේතුව වූ ශාපය ධරමින් මෙතෙකින් දඩකෙළිය නවතා නුවරට වනි.

(මෙහි යමක සහිතවූ ද නොයෙක් වෘත්තයෙන් යුක්තවූ ද මෘගයා වර්ණනය හෘදය ග්‍රාහීය.)

මෘගයා වර්ණන නම්
නවවන සග නිමි.

10

දශරථ රජහට **හවුරුදු** දසදහසක් ගතවනතුරු ද පුත්‍රයකු ලැබීමේ වාසනා මහිමය නොවීය. එබැවින් ඍෂ්‍යශෘඞ්ගාදි මුනිහු රජුට පුතුන් ලැබීම පිණිස යාග කරන්ට වූහ.

මේ කාලයෙහි දෙවියන්ට **ලඞ්කාධිපති** රාවණ රජුගෙන් බොහෝ පීඩා ලැබිණ. එහෙයින් සම්‍යෙන් පිහිත මහින් සෙවණ ඇති රුකක් සොයා යන්නාක් මෙන් සියලු දෙවියෝ එක් ව **විෂ්ණු** වෙත ගියහ.

ඔවුන් සමුද්‍රය කරා යන් ම ප්‍රාර්ථනාසිද්ධියට පෙර නිමිත්තක් මෙන් විෂ්ණු දේවතෙමේ ද පිබිදියේ ය.

අනන්තයාගේ දරණවැළ මඤ්චකයෙහි ශ්‍රීකාන්තාවගේ උකු ළෙහි පා තබා, පීතාම්බරධාරීව, ශ්‍රී වත්‍ස ලකුණු ඇති කෞස්තුභ මාණික්‍යය පැලඳ, දිව්‍යාභරණින් අලඞ්කෘත වූ, චතුර්භුජයක් ඇති විෂ්ණු දෑත ප්‍රණිපාත කොට "සියල්ල මවන සියල්ල ධරන සියල්ල නසන ඔබට අපගේ නමස්කාරය වේවා" යනාදීන් සියලු දෙවියෝ සෙත්‍රෝත්‍ර පැවැත්වූහ.

(මෙහි ශ්ලෝක සොළොසෙ (16) කින් කළ විෂ්ණුස්තෝත්‍රය මනෝඥය.)

සතුටියට අනතුරුව විෂ්ණුදේවතෙමේ දෙවියන්ගේ සුව දුක් විමසූයේ ය. එසින් ම ඔහු ප්‍රීතිමත් වූ බව දත් දෙවියෝ තමන්ට රාක්ෂසයන්ගෙන් පැමිණි ගැහැට ඕහට සැල කළහ.

භාග්‍යවත් වූ විෂ්ණුතෙමේ දෙවියන්ට ආමන්ත්‍රණය කොට තමා පළමුව ම දෙවියන්ට රාක්ෂසයන්ගෙන් වන උවදුරු දන්නා බවත්, ප්‍රමාදයෙකින් සිදු වූ පාපයෙකින් සත්පුරුෂයන්ගේ ළය තැවෙන්නාක් මෙන් රකුසන්ගෙන් තුන්ලොවට ම සන්තාපය ඇති බව දැන තැවෙන බවත්, ඉන්ද්‍රයාත් තමාත් එකම කටයුතු

ඇත්තන් බැවින් තමාගෙන් මෙය කළයුතු යයි ඉඳුරාගේ ප්‍රාර්ථනය නුවුවමනා බවත් තමා ඒ කාර්‍යය කිරීමට එකඟ බවත් කීයේ ය.

"තවද රාවණයා මෙහෙසුරුවර ලබනුවස් සඛකීය කඩුවෙන් ම හිස් තවයක් කපා එක්හිසක් ඉතිරි හෙළේ එය මාගේ චක්‍රයෙන් සිඳිය යුතු හෙයිනි. බ්‍රහමයා ඔහුට වරදුන් බැවින් ඔහුගේ උස්ව නැඟීම මම මෙතෙක් ඉවසමි. ඔහු (=රාවණයා) තපස් රැක බ්‍රහමයා පහදවා මිනිසුන් ගැන නො සලකා දේවනිර්මාණයෙකින් නො නැසිය හැකි ලෙස වරය ලැබී. එබැවින් මම දශරථ රජුගේ පුත්‍රස්වරූප මනුෂ්‍යාවතාරයෙන් ඉපද ඔහු නසන්නෙමි. නොබෝ කලෙකින් ම යාඥිකයන් විසින් ගෙනා බලි කොටස් රකුසන් විසින් ආස්වාද නොකරන ලදු ව තොප විසින් ගතහැකි වෙයි. විමානයෙන් හැසිරෙන්නෝ රාවණයාගේ පුෂ්පකරථය දැක බිය පත් ව වලාකුළුවලින් වැසී සැඟවී යෑම මෙතැන් පටන් අත් හරින්වා"යි.

මෙසේ රාවණ නමැති නියගින් පෙළුණු දේව නමැති සස්‍යය වවන නමැති අමාවැස්සෙන් තෙමා කෘෂ්ණ දේව (=විෂ්ණු) නමැති මහා මේඝය අන්තර්හිත විය.

ඉන්ද්‍රාදි දෙවියෝ ද රාවණවධයෙහි උත්සුක වූ විෂ්ණුට අනුගත වූවාහු සුග්‍රීවාදි රූපයෙන් උපන්හ.

මේ කාලය දශරථ රජු විසින් ආරබ්ධ වූ "පුත්‍රකාම්‍ය" යාගය ද අවසන් වන කාලය යි.

යාගාන්තයෙහි යාග කර්‍තෘන් විසමිත කෙරෙමින් එක්තරා පුරුෂයෙක් ගිනි මැද පහළ ව කිරිබත් පිරූ රුවන් තැටියක් ගෙනවුත් රජහට දිනැ. විෂ්ණු දෙවියන් ඒ වරුයෙහි(=කිරිබතෙහි) ඇතුළත් ව සිටි හෙයින් ඒ තැටිය ඉසිලිය නො හැකි තරම් බර ව තුබුණේ ය. රජතුමා ඒ බත දෙකට බෙදා කෞසල්‍යා-කෛකේයී යන බිසවුන් දෙදෙනාට දී සුමිත්‍රා ඔවුන් දෙදෙනාගෙන් කොටස බැගින් ලබනවා දකිනු රිසිවිය.

රජුගේ සිත් පවත් දන්නා බිසවුන් දෙන්නා ද එසේම කළහ. ඒ බත වැළඳීමෙන් එකොණෙහි ම ඔවුහු ගැබ් දූරුහ.

ක්‍රමයෙන් ගැබ් මුහුකුරා ගොස් කෞසල්‍යා **රාම** නම් පුත්‍රයා ද, කෛකේයී **භරත** නම් පුත්‍රයා ද, සුමිත්‍රා **ලක්ෂ්මණ-ශත්‍රුඝන** යන නිමුන් පුතුන් දෙදෙනා ද ප්‍රසූත කළහ.

ඔවුන්ගේ උතුපතතියට අනතුරුව ගුලෝභාය දුර්භික්ෂාදි ද්වේෂ රහිත ව ආරෝග්‍යාදි ගුණයෙන් යුක්ත විය. එය දෙව්ලොව පෘථිවියට බැස පුරුෂෝත්තමයාට (=විෂ්ණුව) අනුගමන් කළාක් වැනි ය. රාමාදි කුමාරයන්ගේ උතුපතතික්ෂණයෙහි රාවණයාගේ දසිස් ලකළ කිරුළු මිණි හිලිහිණි. එය ඔහුගේ සම්පත වැටුණු බවට පෙර නිමිත්තෙකි.

ජාත සංසකාරාදියෙන් පෝෂිත වූ කුමාරවරු සතරදෙන පියාණන්ගේ ප්‍රිතිය සමග ම වැඩී ඔවුනොවුන් අවිරුද්ධ ව අනඤ්ඤ වූ රඝුවංශය අත්‍යාර්යයෙන් බැබළවූහ.

කිවයුතු විශෙෂයෙක් ඔවුනතුරෙහි නැත්තේ නො වේ. සහෝදරත්වය සමව ම ඇත ද රාම-ලක්ෂ්මණ දෙදෙනා ද, භරත-ශත්‍රුඝ්න දෙදෙනා ද ඒකක්‍රියා සමාන සුඛ දුඃඛ වූවාහු ය. ගිනි සුළං දෙදෙනා ද, සඳ මුහුදු දෙදෙනා ද ඔවුන්ට උපමාන කළ හැකි වෙත්. තේජසින් මෙන් ම චිනයයෙන් ද ග්‍රිෂ්මාවසානයෙහි ශ්‍යාමවර්ණ වලාකුළු ගහන වීමෙන් සමශිතොෂ්ණ වූ දිනයන් මෙන් ඒ කුමරහු මහජනයාගේ සිත් ගත්හ.

මොවුන් කරණකොට ගෙන දශරථ රජතුමා තමා මුන්තිමත් ධර්මාර්ථ කාම මෝක්ෂ යන චතුර්විධ සම්පතින් යුක්තයකු කොට තැකි ය. සතර සයුර රතනයෙන් රජු සතුටු කළාක් මෙන් පුත්‍රයෝ සතරදෙන ද ගුණ සමූහයෙන් පියාණන් සතුටු කළහ. වියදඬුමෙන් දික් වූ බාහුසතරින් යුත් විෂ්ණු මෙන් ම රජතුමා ද දේවාංශ වූ පුත්‍රයන් සතරදෙනා කරණකොට ගෙන බැබළිණි.

රාමාවතාර නම්
දසවන සග නිමි.

11

ඉක්බිති **විශ්වාමිත්‍ර** (=කෞශික) මුනිතෙම තමාගේ යාග යෙහිදී ඔටගත් උවදුරු නැති කරනු සඳහා රාමකුමාරයා කැඳවා ගෙන යන්නට සිතා දශරථ රජු වෙත ආයේ ය. තේජස්විින්ගේ වයස ගැන නො සලකන බැවින් කාකපක්ෂධරවූ ද කුමාරයා ඉල් විය. රඝුවංශිකයන් ප්‍රාණය වුව ද ප්‍රාර්ථනා කරන්නවුන්ගේ ප්‍රාර්ථනා භඞ්ගය නො කරනු සිරිත් හෙයින් පුත්‍රවියෝගය ඉවසිය නො හැකි වුව ද ලක්ෂ්මණ සහිත ව රාමකුමාරයාගේ ගමනට අවසර දුන්නේ ය. පියාණන්ගේ ආඥව මුදුනෙන් පිළිගෙන ගමනට

සුදුනම් වූ කුමාරවරු දෙදෙනා පියාණන් පා වඳින කල කුමාරයන්ගේ කඳුළින් රජුගේ පතුල් ද පියාණන්ගේ කඳුළින් කුමාරුන්ගේ පිට ද තෙමී ගියේ ය. මෙපරිද්දෙන් ම මැණියන් තිදෙනා ද වැඳ අවසර ගෙන පෞර ජනයාගේ නෙත් ද කඳුළින් තෙත් කරවමින් විශ්වාමිත්‍ර මුනිහු පෙරටු කොට නුවරින් නික්ම ගමන් ගත්හ. **බලාතිබල** නම් වූ මන්ත්‍ර දෙදෙනාගේ ආනුභාවයෙන් කුමරුන්ට මාගී විඩාවෙක් නොවීය. එපමණකුදු නොව පූජී කථා (=ඉතිහාස) ප්‍රවෘත්ති දන්නා වූ විශ්වාමිත්‍ර මුනිහුගේ කථාවන් ශ්‍රවණය කිරීමෙහි තත්පර වූ ඔවුන්ට මාගීය කෙතෙක් ඉක්ම වී ද යනුත් නො දැනිණි. පළමු කොට තපෝවනයට පැමිණි රාම ලක්ෂ්මණ කුමරුන් විසින් **සුකේතු**හුගේ පුත්‍රී වූ **තාඩකා** නම් රාක්ෂසිය දක්නා ලදී. කෘෂ්ණපක්ෂයෙහි රාත්‍රියක් මෙන් කාලවර්ණ වූ, මළවුන්ගේ වසා හැඳගත්, සිංහ නාදය මෙන් බිහිසුණු නාද ඇති ඕතොමෝ රාමයා වෙත දිව ආය. ඉණෙහි එල්ලෙන මිනිස් අතුණු ඇති ව රාමකුමරු මරනු පිණිස අත ඔසවා එන්නා වූ ඈ දැක සත්‍රින් මැරීමේ පිළිකුල නොහොත් කරුණාවත් සමඟ හියක් මුදා හැර රාක්ෂසී මරුදමන ලදී.

රාමයාගේ ප්‍රථම පරාක්‍රමයෙන් සතුටු වූ මුනිදුහු කෙරෙන් රකුසන් මැරීම පිණිස මන්ත්‍රයුක්ත වූ අස්ත්‍රයක් ලත් රාමතෙම මලණුවන් කැටිව අනිපවිත්‍ර වූ **වාමනාශ්‍රම** නම් වූ අසපුවට ගොස් විශ්වාමිත්‍ර මුනිදුහු විසින් ආරබ්ධ යාගයෙහි ආරක්ෂාව පිණිස සිටියේ යි.

එහි වදමල් වැනි ලේබිඳුවලින් අපවිත්‍ර කළ යාගවේදිකාව දැක දුන්න ගෙන උඩුකුරුව බලන්නේ ගාධ්‍රයන්ගේ පියාපහරින් කම්පිත වන්නා වූ ධ්වජයන් ධරමින් සිටි මහත් රාක්ෂස සේනාව දිටී.

ඔවුන්ගේ නායක වූ තාඩකා පුත්‍ර **මාරීච** නම් රාක්ෂසයා ද **සුබාහු** නම් වූ අනිකකු ද **වාසුදේවනාක** වූ ඒ පහරින් නසා යාග උපද්‍රවයන් නැති කොට මුනිවරයන්ගේ යාග ක්‍රියාවන්ට අවකාශ සලසා දුන්නේ ය.

මේ කාලයෙහි **ජනක** රජුගේ යාගයක් පිණිස විශ්වාමිත්‍ර මුන්හට ආරාධනාවක් කළ හෙයින් එහි යන ගමන් ජනක රජුගේ දුන්න පිළිබඳ අසා එය බැලීමට කැමැති වූ කුමාරයන් දෙදෙනා ද එක්ව ගියේ ය. මාගීයෙහි පෙර දවස **ගෞතම** නම් ඍෂිවරයා සිටි අසපුවෙහි වෘක්ෂ මූලයන්හි ඔවුහු තිදෙනම නවාතැන් ගත්හ. රාමකුමාරයාගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වූ ඒ ආශ්‍රම භූමියෙහි

ගෞතම නම් සවකිය සවාමියාගේ ශාපයෙන් ගලක්ව සිටි **අහල්ලා** එකෙණෙහි ම රාමානුග්‍රහයෙන් නැවත මනුෂ්‍යත්ව යට පැමිණියා ය.

මුනිහු එහි පැමිණි බව අසා ජනකරජ පූජාසත්කාර පෙර ටුව පෙර ගමන් කොට පිළිගෙන කුමරුන් දෙදෙනා ද කැටිව නුවරට ගොස් යාගය අවසන් කොට මුනිහුගේ වචනයෙන් රම කුමාරයාට දුන්න නැමීම පිණිස අවසර දුන්නේ ය. (මේ දුන්න වනාහී මහ බලැති රජුන් විසින් නමනු නබා ඔසවනුත් නො හැකි වූවෙකි. "යමෙක් මේ දුන්න නැමී නම් ඔහුට මාගේ දියණි යන් වූ අහිරූපී **සීතාව** දෙන්නෙමැ"යි රජු විසින් ප්‍රකාශිත කි.)

"රම නම් වූ ළදරු කුමරකු දුන්න නමන්නේය"යි අසා එහි පැමිණි මහ ජනයා විසමය ප්‍රාප්ත කරවමින් රාමතෙම හියක් යොදූ වැඩියක් වැර යොදූ දුන්න ඇදි ය. එකෙණෙහි සෙණ හඬක් මෙන් නාදකරමින් එය බිඳ වැටුණේය. ඒ ශබ්දය ක්ෂත්‍රිය යන් කෙරෙහි බද්ධ වෛර වූ පරශු රාමයාට නැවතත් ක්ෂත්‍රියයන් උසස් වූයේය යි ඝනවන්නාක් මෙන් විය.

ජනකරජ මහත් ප්‍රීතියට පැමිණ වීර්‍යශුල්කය (=වීර්‍යයට දිය යුතු මූල්‍යය) වූ සීතාව විශ්වාමිත්‍ර මුනි නමැති ගින්නම සාක්ෂි කොට රාමයාහට පාවාදින. **ශතානන්ද** නම් පුරෝහිතයා දශරථ රජු වෙත යවමින් "සීතාව ඔබ පුත්‍රයාගේ භාර්‍යාව කොට පිළි ගැනීමෙන් මේ **නිමි** රාජකුලය සේවක භාවයෙන් පිළිගනිත්ව"යි කියා යැවී.

ඔහුගේ වචනයෙන් දශරථ රජ ද මහත් බල සෙනඟ පිරි වරා **මිථිලා** පුරයට ගොස් ජනක රජු හා එක් වූයේ ය. ඒ රජවරු දෙදෙන සවකිය ප්‍රභුත්වයට යෝග්‍ය පරිදි පුත්‍ර පුත්‍රීන්ගේ විවාහ මඟුලය මහත් සමාරෝහයෙන් පැවැත් වූහ. **රම-සීතා** දෙදෙ න ද, **ලක්ෂ්මණ-ඌර්මිලා** දෙදෙන ද, **භරත-මාණ්ඩවී** දෙදෙන ද, **ශත්‍රුඝන-ශ්‍රුතකීර්ති**[1] දෙදෙන ද මෙහිදී ම විවාහප්‍රාප්ත වූහ.

මෙසේ එකවිට පුත්‍රයන් සතර දෙනාගේ ම විවාහ මඟුහ ල්‍යය සිදුකොට දශරථ රජ සවපුරයට යෑම පිණිස පිටත් විය.

එකෙණෙහි ප්‍රතිකූල වාතාදියෙන් පෙර නිමිති පහළ කොට **තේජස්** රාශියක් මෙන් අනිමුඛයෙහි පහළ වූ ජමදග්නි බ්‍රාහ්මණ

(1 ඌර්මිලා සීතාගේ සොහොයුරියකි. මාණ්ඩවී ශ්‍රුතකීර්ති දෙදෙන ජනක රජුගේ සොහොවුරු කුශධ්වජගේ දුවරුය.)

පුත්‍ර වූ **පරශුරාම** තෙම ක්‍ෂත්‍රිය රජුන් එක් විසිදෙනකුන් නැසූ බවට ලකුණක් වශයෙන් ඇට විසිඑකක් ඇති අක්ෂමාලාවක් දකුණු කනෙහි ධරමින් මග අවුරා සිටිනු දක්නා ලදි.

දශරථ රජ තමාගේ දුර්බල බව ද පුත්‍රයන්ගේ බාල බව ද දැන ඛේදයට පැමිණි නමුත් රාමකුමාරතෙම දුන්නෙහි හීය නඟමින් ඉදිරියට පැමිණියේ ය.

"ක්ෂත්‍රිය ජාතිය මාගේ වෛරී ය, ඒ ක්ෂත්‍රිය ජාතිය එක්විසි වරක් නසා මම ශාන්තව සිටියෙමි; එතෙකුදු වුවත් තාගේ විසීා නිශය ඇසිමෙන් දණ්ඩෙන් පහළ සජීයකු මෙන් කිපුණෙමි. අන්‍ය යන් විසින් නමනු නබා ඔසවනු ද නො හැකි වූ ජනක රජුගේ දුන්න යුෂ්මතා කාඞ්ක්ෂයෙහි ය. ලෝකයෙහි රාම නාමය මා කෙරෙහි ම මේ තාක් වැටුණේ ය. දැන් තෝ එය පැහැර ගත් තෙහි! ක්ෂත්‍රියයන් නසන්නා වූ මාගේ වික්‍රමය තා නො දිනූ කල්හි මා නො පිනවයි. එබැවින් (යුද්ධයෙක් නො වේවා!) මාගේ මේ දුන්න ඇදීමම ජයපරාජයෙහි ලා සලකමි. එසේ නැත හොත් අභය ප්‍රාර්‍ථනය (=අභය ඉල්වීම) පිණිස ඇඳිලි බඳිවා"යි.

මෙසේ කියේ පරශුරාමයා යි. එතෙකුදු වුවත් පරශු නැත ද නිකම් රාමයා ඔහුගේ ගර්ජනයට බිය නො වීය. ඔහුගේ දුන් නෙහි හීය යොදා ඇද පරශුරාමයාහට ක්‍රියායෙන් ම පිළිතුරු දින.

එකෙණෙහි පරශුරාමයාගේ තේජස ද හීන ව ගියේ ය. රාමයා කෙබන්දෙක් දැයි ද ඔහුට හැඟී ගියේ ය.

රාමකුමරු ද දුන්න ඇද තමාගේ හීය නො සිස්වනු පිණිස සතුරා වුව ද බ්‍රාහ්මණයකු නිසා ඔහු නොමරා ඔනු විසින් රුස් කළ පුණ්‍යවිපාකසවරූප සවර්ගීය නසනු පිණිස පෙරදිගට විද පීය. එයින් භාර්ගව (=පරශුරාම) ගේ සවර්ගීමාර්ගය ඇවිරුණේ යි. එසේද වුව විෂ්ණු අවතාරය වූ රාමයා කෙරෙන් වූ පරාජය ද උතුම් කොට සැලකූ **භාර්ගව** (=පරශුරාම) ඍෂිතෙම ඔහුට සතුති කොට පුණ්‍යතීර්‍ථයක් කරා ගියේ ය. ඔහුගේ ගමනින් පසු දශරථ රජු පුත්‍රයා වැලඳ නැවත උපන්නකු මෙන් ප්‍රීත ව සිය නුවර බලා පිටත් විය. මාර්ගයෙහි කීපදිනක් කඳවුරු බැඳ (=වසන්‍ත්‍රමණඩප යන්හි) නිවාසග්‍රහණය කෙරෙමින් සීතා දැකීමට ලොල් වූ පුරභ නන්ගේ නෙත්‍ර නැමැති නිලුපුල්වලින් සැදූ කවුළු ඇති අයෝධ්‍යාපුර යට වනි.

සිතා විවාහ වර්ණනා නම්
එකොළොස් වන සඟ නිමි.

12

ඉක්බිති දශරථ රජ ක්‍රමයෙන් මහලු වයසට පැමිණියෙන් රාමකුමාරයා රාජ්‍යයෙහි පිහිටුවනු සඳහා අභිෂේක සම්භාරයන් රැස් කැරවිය. ඒ අතර කෛකේයී බිසව තමාට දුන් වර[1] දෙකක් සිහිකොට සවකීය පුත්‍ර භරතට රාජ්‍යය දෙන මෙන් ද තුදුස් වසක් යනතුරු රාම කුමරුන් වනයට යවන මෙන් ද ඉල්වූවා ය.

මෙය ඉතා බෙදහර ඉල්ලීමක් වුව ද සත්‍ය වචනය රක්නා රජතුමාට එය ඉෂ්ට නො කර සිටිනු බැරිවිය. රාමකුමාරයා ද "රාජ්‍යය ගනුව!"සි කී පියහුගේ ආඥව පිළිගත්තේ අඩම්න් පිතෘ නියෝගය ඉක්මවනු බැරිව ය. වැළි "වනයට යව!"සි කී ආඥව සතුටු මුහුණින් ම පිළිගති. අභිෂේකය පිණිස දුහුල් වස්ත්‍ර හඳින කල ද වනයට යෑම පිණිස වල්කල හඳින කල ද රාමයාගේ මුඛ ශෝභාව එක සේ ම පිහිටි බව දුටු ජනයෝ විසමිත වූහ.

රාම කුමරයා තමන් අනුව එන්නා වූ සීතා ලක්ෂ්මණ දෙදෙනාත් කැටුව පියාණන්ගේ සත්‍යවාදී බව රකිනුවස් දණ්ඩකාරණ්‍යයට ප්‍රවිෂ්ට විය. පුත්‍රශෝකයෙන් පීඩිත වූ දශරථ රජතුමා ද මුනිකුමාරයා නැසීමෙන් වූ ශාපය සිහිකෙරෙමින් ම මෙලේ ය.

මේ කාලයෙහි භරත කුමාරයා ද මැණියන්ගේ නුවර සිටි බැවින් අමාත්‍යයෝ රජුගේ මරණය ගැන නොදන්වා කුමාරයා කැඳවා ගත්හ. එතෙකුදු වුවත් රජුගේ මරණය පිළිබඳ තොර තුරු දත් කෙණෙහි භරත මැණියන්ට නිදුකොට රාජ්‍යය ද හැර දෙටු සොහොවුරන් සොයා වනයට ගොස් හඬා වැලප රාජ්‍යය භාරගන්නා මෙන් ඔවුන් යැදිය. පියාණන්ගේ සත්‍යවචනයට කැලැල් නො වන පිණිස රාමකුමරු එය ප්‍රතික්ෂේප කෙළේ සි. දෙටු සොහොවුරු රාජ්‍යය පරිත්‍යාග කළ ද ඔහු සිටියදී තමා රාජ්‍යය කිරීම ජ්‍යෙෂ්ඨයා විවාහ ප්‍රාප්ත නොවී සිටියදී බාලයා විවාහ වීම මෙන් ලාමක කොට සිතූ හෙයින් දේ භරත කුමාරයා රාම කුරයාගේ පාදුකා යුගළ ඉල්වාගෙන එය අභිෂේක කොට රජු වශයෙන් සලකා එයට සත්කාර කෙරෙමින් නුවරින් පිටත **නන්දිග්‍රාම**යෙහි සිට රාජ්‍යානුශාසනා කෙළේ ය. දෙටු සොහොවුරු කෙරෙහි දුසහකම් ඇති භරත කුමරයා රාජ්‍ය තෘෂ්ණා රහිත ව සවකීය මවගේ පාපයට දඬුවම් විඳින්නාක් මෙන් මෙසේ ක්‍රියා කරන කල්හි රාමකුමරු සීතා ලක්ෂ්මණ

1 කැමැති දෙයක් දෙමියි වූ ගිවිසුම්.

දෙදෙනා සමඟ වනයෙහි වෙසෙමින් මහලු ඉක්ෂ්වාකු වංශිකයන්ගේ ව්‍රතය රැක්කේ ය.

මේ වනය රාජ්‍යයට සමීප බැවින් "නැවතත් භරත පැමිණ රාජ්‍යය පිළිගැනීමට යාවිදැ, කෙරෙනි"සි සැක කොට රාම එයින් නික්ම දකුණු දිගට යන කල්හි **විරෝධ** නම් රාක්ෂසයෙක් මඟ අවුරා සිට සීතා පැහැර ගත්තේ ය. රාම ලක්ෂ්මණ දෙදෙනා ඔහු මරා වළ ලා **පඤ්චවටී** නම් ස්ථානයෙහි වූසුහ.

එහිදී රාවණගේ නැඟණියෝ **ශූර්පණඛා** නම් රාක්ෂසිය කාමාතුර ව රාමකුමරු වෙත පැමිණුණු. "මම භාර්‍යා ඇත්තෙක්මි ලක්ෂ්මණ වෙත යව!"සි කියන ලදු ව එහි ගිය විට ද නො පිළිගත් හෙයින් නැවත රාමයා වෙත පැමිණියහ. ඇගේ විකාරය දුටු සිතා තොමෝ සිතාසුණා ය. එසින් කුපිත වූ ශූර්පණඛාවන් වහසි බැණ සැබෑ ප්‍රකෘති රූපය දැක් වූ හෙයින් භීතියට පත් සිතා රාමයා වෙතට දිව්වා ය.

ලක්ෂ්මණ 'ඕ රාක්ෂසියකැ'සි දැන කන් නාසා ඇපා දැමූයෙන් විරූප වූවා අහසට පැන නැඟී ඔවුන්ට තර්ජනය කොට එයට පලි ගනිමැයි **ජනස්ථාන** නම් රාක්ෂස බලසොටුවට ගොස් රකුස් සෙනෙවියන්ට මේ බව දන්වා සෙනඟ ගෙන යුදයට පැමුණුණු. රාමකුමරු ලක්ෂ්මණට සීතා භාරකොට රණබිමට වැද **දූෂණ-ඛර-ත්‍රිශිරස්** යන රාක්ෂස සේනාපතීන් ප්‍රමුඛ වූ සියලු රකුසන් නසා ජයග්‍රහණය කෙළේ ය. ඔවුන්ගේ පරාජය දුටු ශූර්පණඛා රාවණ සහෝදරයා ගොස් එපවත් සැල කෙළෙන් ඔහු නැඟණියන්ට කළ නිග්‍රහයෙන් ද, ඥාතීන්ට කළ හිංසායෙන් ද, "රාමයා මාගේ ශිෂ්‍යයන්හි පා තැබිය"සි සිතා රාවණ තෙමේ **සුවර්ණ** මෘගයකුගේ සවරූප ගත් රකුසකු ලවා රාම රවටා සීතා පැහැර ගෙන පුෂ්පක නම් අහස් යානයෙන් **ලඞ්කා** පුරය බලා පිටත් විය. එසමණෙහි පැමිණි **ජටායු** නම් ගිජු ලිහිණියකු තමාගේ ගමනට බාධා කළ හෙයින් ඔහුගේ පියාපත් කපා බිම හෙළී ය.

ඔහු පණ අදිමින් සිටියදී සීතා සොයමින් පැමිණි කුමරුන්ට මේ ප්‍රවෘත්තිය දන්වා මෙළේ ය. ඔහු විසින් කළ උපකාර ඉමහත් කොට පිළිගත් කුමාරයෝ ගෞරවයෙන් ජටායුහුගේ ආදාහන කෘත්‍යය සිදුකොට **කබන්ධ** නම් රාක්ෂසයාගේ වචනයෙන් **සුග්‍රීව** හා මිත්‍රත්වයට පැමිණ වදුරු සේනාවන් කැටුව සීතා සොයන්නාහු **ජටායුහුගේ** දෙටු සොහොවුරු **සම්පාති**ගෙන් ඇගේ ප්‍රවෘත්ති අසා වැඩි තොරතුරු දැනගනු පිණිස **මාරුති** නම් වූ **හනුමන්** ලඞ්කාවට එවූහ.

හනුමත් ලඞ්කාවට පැමිණ ඇය සොයන්නේ රාක්ෂසින් විසින් අකාවල් කරනු ලැබ සිර්කර සිටි සීතාව දැක රාමගේ පේරැස් මුදුව පෙන්වා තොරතුරු කියා ලඞ්කාපුරය ද ගින්නෙන් දවා පෙරළා ගොස් සියලු පවත් රාම කුමරුන්ට දැන්විය.

ඉක්බිති වදුරු සේනාවන් පිරිවරා ගෙන අවුත් මුහුදු තෙරට පැමිණි රාමයා වෙතට **විභීෂණ** නම් වූ රාවණගේ බාලසොහොවුරු පැමිණියෙන් ඔහුට "ලඞ්කාරාජ්‍යය දෙමි"සි ප්‍රතිඥ දී තමාට අවනත කොට ගෙන වදුරන් ලවා මුහුද මැදින් බැම්මක් බඳවා එයින් එතර ව ලක්දිව වටකෙළේ ය. එහිදී වදුරු රකුසු දෙසෙනඟ අතර මහත් වූ යුද්ධයෙක් විය.

වෘක්ෂයෙන් ගසා පලිහ කැඩීම ද, ගලින් ගසා මුගුරු සුනුකිරීම ද, ශස්ත්‍රයට ද වඩා එරුණු වූ නිය පහර දීම ද, පළුත පෙරළා ඇතුන් නැසීම ද ඒ යුද්ධයෙහි විශෙෂ ලක්ෂණ විය.

මේඝනාද නම් රාවණ පුත්‍රයා විසින් නාගපාශයෙන් බඳනා ලද රාම-ලක්ෂ්මණ දෙදෙනා ගරුඩයාගේ පැමිණීමෙන් මුකත වූහ. රාවණයා විසින් **ශක්තිආයුධයෙන්** ගසා ලක්ෂ්මණගේ වක්ෂස (=ළය) පැළූ බව දුටු රාමගේ වක්ෂස ශෝකයෙන් පැළිණි. එසේ වුව ද හනුමත් විසින් ගෙනෙන ලද **සඤ්ජීවනී** නම් ඖෂධයෙන් සුව ලැබූ ලක්ෂ්මණ මේඝනාදයා නැසී. ඉක්බිති අකාලයෙහි නින්දෙන් පිබිදූ **කුම්භකර්ණයා** රාමගේ ආයුධයන් විසින් දිඹුනින්දට (=මරණයට) පමුණුවන ලදි. මෙසේ ක්‍රමයෙන් විනාශයට යන සැකිය සේනාවන් දුටු රාවණතෙම "අද ලෝකය **අරාවණ** හෝ **අරාම** කෙරෙමි"සි නිශ්චය කොට රථයට නැඟී යුදට වන. එසේ අවසාන සටනට සැරහී සිටින රාවණයා දැක ශක්‍රයා තමාගේ රථය රාමයාට දිනි. රාක්ෂසාස්ත්‍රයෙන් නොකැඩෙන්නා වූ ඉන්ද්‍රකවචය ද **මානලින්** විසින් රාමයාට පළඳන ලදි. මෙසේ ඔවුනොවුන් මුහුණලා ඛන්ධ යුද්ධ කරන රාම-රාවණ යුද්ධය උපමා විෂය ඉක්මවී.

ඉන්ද්‍රාදීන් පවා පැරැද්ද වූ, කෛලාසය පවා අතින් එස වූ, මහා බල ඇති රාවණගේ ජ්‍යෂ්ඨානිශය රාමයා විසින් ද බුහුමන් කරනු ලැබිය.

වාදකරන්නන්ගේ වචනය වචනයෙන්ම සිදින්නාක් මෙන් ඔහු දෙදෙන ද අස්ත්‍රය අස්ත්‍රයෙන් කපමින් බොහෝ වේලාවක් යුද කළහ. අනතිමේදී රාමයාගේ **බ්‍රහ්මාස්ත්‍රයෙන්** රාවණගේ හිස්දහය ක්ෂණයෙකින් කපා වැටිණ. එතෙකුදු වුව කපා හෙළූ ඔහුගේ හිස් නැවතත් සකීවනු පෙර දුටු බැවින් 'දෙවියෝ රාවණ

නැසුණේ යයි විශ්වාස නො කළහ. මඳ කලක් බලා සිට නැවත සන්ධිමක් නුවූයෙන් ඔදවැඩි සිත් ඇත්තාහු රාමයාගේ ජයග්‍රහණයෙහි මල්වැසි වස්වා දෙව්ලොව ගියහ.

රාම තෙමේත් රකුසන්ගෙන් මුදාගත් සීතාව ඔවුන්ගෙන් කිලිටි වූවයි සැක කෙළේ ය. ඇය ගින්නට පැන සවකීය ශුද්ධිය ප්‍රකාශ කළ බැවින් භාග්‍යවිව වශයෙන් පිළිගෙන ලක්රජය විභීෂණට දී ලක්ෂ්මණත් සමඟ රාවණගේ **පුෂ්පක** නම් රථයට නැඟී ආකාශයෙන් අයෝධ්‍යාපුරය බලා පිටත් විය. වනවාසයට නියම කළ තුදුස් වස ගෙවුණු බැවිනි.

රාවණ වධ නම්
දෙලොස් වන සඟ නිමි.

13

ඉක්බිති රාම නම් වූ විෂ්ණු දේවතෙමේ තමාගේ ම මූර්තියක් වූ අඟසට පැමිණියේ මහා සමුද්‍රය බලා සවකීය භාග්‍යවිවට මෙසේ කියන්ට වන:-

"එම්බා සීතාවෙනි, මලය පර්වතය දක්වා වැටී තිබෙන මාගේ පාලම්න් (=බැම්මෙන්) බෙදී තිබෙන, පෙණ බහුල වූ මේ සමුද්‍රය ශරත් කාලයෙහි පැහැදිලිව පෙනෙන තරු ඇති ඡායාපථයෙන් (=අහස් ගඟින්) බෙදී පෙනෙන අහස මෙනි. ඒ සෞන්දර්‍යය බලව!

පියාණන්ගේ යාග අශ්වයා **කපිල** මුනිහු විසින් පැහැර ගෙන පාතාලයට ගිය කල්හි අශ්වයා සොයනු පිණිස පොළොව කැණින්නා වූ **සගර** නම් ලද අපගේ පූර්ව පුරුෂයන් විසින් මෙය සාරන ලද්දේලු.

සූර්‍යරශ්මිහු මෙසින් ජලය ගනිත්. මෙහි ම නොයෙක් රත්නයෝ සමෘද්ධියට පැමිණෙත්. මේ මුහුද ජලය ම දරකොට ඇති වඩබාග්නිය ධරයි. මෙසින් ම චන්ද්‍රයා උපන්නේ සි. දශ දිශාවන් පැතිර සිටිනා විෂ්ණු මෙන් මේ මුහුද ද දශදිග පැතිර සිටී. එහෙයින් මෙහි සවරූපය මෙ පමණැයි දත හැකි නොවේ. සවකීය නාභියෙන් නැඟුණු පියුම ආසන කොට හුන් ප්‍රථම බ්‍රහ්මයා විසින් සතුනිකාරනු ලබමින් විෂ්ණු දේව වූ මම යුගානන්තයෙහි ලෝකය හකුළුවා ගෙන මෙහි ම යෝග නිද්‍රාවට පැමිණෙමි.

ඉක්‍රයා විසින් පර්වතයන්ගේ පක්ෂයන් සිදින කල්හි පිහිට සොයා පැමිණි සිය ගණන් පර්වතයෝ මෙය ඇසුරු කොට රැකෙත්. වරාහරූපී මා විසින් පළමු කොට රසාතලයෙහි සිට පෘථිවී නමැති භාර්‍යාව විවාහ කොට ගෙන එන කල්හි මේ සමුද්‍ර ජලය ම ඇට ඇසිල්ලක් මුඛාවරණ පටය (=අවගුණ්ඨනය) විය.

මුඛාපිණයෙහි බුහුටි වූ පුරුෂයකු මෙන් මේ තෙමේ ගඹහා ජලය තමන් බීමත් තමන්ගේ ජලය ගඹහාවන්ට පෙවීමත් එකවිට කෙරෙයි. **තිමි** නම් මහා මත්ස්‍යයෝ ද හස්ත්‍යාකාර කිඹුල්ලු ද මහා රළු වැනි නාගයෝ ද ඔබගේ තොල් වැනි වණිවත් පබළු ද මෙහි වෙති, රළු පහරින් විද්‍රැම (=පබළු) පර්වතයෙහි විසුරුවන ලද ශඛ්ඛ සමූහය උඩට නැඟි පබළුකටුවල හැපී දුක සේ ඉවත් ව යන සැටි බලව! අයෝමය චක්‍රායුධයක් වැනි සමුද්‍රයාගේ දුරින් පෙනෙන සිහින් වතරේඛාව ඇති තීරභාගය ධාරාව (=මූවහත) සෙයින් බබළයි. අපි මොහොතකින් මෙතෙරට පැමිණියම්හ; බලව! වැලිතලාහි විසුරුණු මුතු ඇති, ඵලහරිත පුවක්ගස් පඬුකැති ඇති වෙරළ පෙනේ. පසුපාර්ශ්වයෙහි නෙත් යොමා බලව! වනය සහිත භූමිය මුහුදට දුවන්නාක් මෙනි.

අපගේ මේ පුෂ්පක නම් ආකාශ යානය ඇතැම් තැනෙක වලාකුළුවලින් මත්තෙහි ද ඇතැම් තැනෙක වලාකුළු යන මාර්ගයෙහි ද අන් තැනෙක පක්ෂීන් පියාසර කරන පෙදෙස්හි ද ගමන් කෙරෙයි. මේ **චෙරාවන** ඝනතිහුගේ මද ගඳ ඇති අහස් ගඟ රළු පහස ලද ආකාශ වාතය ඔබගේ ඩා සංසිදුවයි. වාකවුළුවෙන් පිටත දැමූ ඔබ අතට විදුලිය වළයයක් දැම්මට මෙන් මේ මේඝය උත්සාහ කෙරෙයි. මේ **ජනස්ථාන** නම් වූ වනය සි. මෙහි **බරදූෂණාදි** රකුසන්ගේ උපද්‍රව දැන් නැති බැවින් තාපසයෝ පන්සල් කරවා ගෙන වෙසෙත්.

ඔබ සොයන්නා වූ මට මේ ස්ථානයෙහි තිබී එක් තුරුවලාවක් සම්භවිය. මේ ඉදිරියෙහි පෙනෙන **මාල්‍යවන්** පර්වතයෙහි ශිඛරය බලව! මෙහිදී ඔබගේ වියෝගයෙන් හැඬිම්. එකල්හි මෙහි වූ කොලොම් පුෂ්ප හෝ මිහිරි කේකාරව හෝ මා සතුටු කිරීමට සමර්ථ නොවීය. තවද මේ පර්වත කූටයෙහි ගුහාගත ව සිටි මාවිසින් මේඝ ගර්ජිතාවන් දුක සේ ඉවසන ලදි (=අසන ලදි.) හොඹවහු වනයෙන් ගැවසීගත් විල් ලිහිණියන්ගෙන් ගහන ව පෙනෙන මේ **පම්පා** විලේ ජලය මගේ නේත්‍රයන් තුටු කෙරෙයි. මෙහි වක්‍රවාකයන් ද ඉවුරෙහි වූ අශෝක ලියද බලව! අපගේ විමානයෙහි මිණිකිණිහි හඬ අසා ඉගිලෙන **ගෝදාවරී** නදිය ඇසුරු කළ ලිහිණි පෙළ ඔබට පෙර ගමන් කරන්නා

වැනි ය. ඔබ විසින් වඩන ලද මිඅඹ රුක් ඇති, උඩබලා සිටින මුවන්ගෙන් යුත් මේ **පඤ්චවටී** නම් ස්ථානය කලෙකින් දක්නට ලැබිණ. මේ **ගෝදාවරී** තීරයෙහි හොමුවහු ලියගොමුවෙනි ඔබ ගේ උකුළෙහි හිස තබා දඩසෙළියෙන් වූ විඩා දුරුකළ සැටි මට සිහිවෙයි.

මේ පෙනෙන්නේ **ගාධාසුරජු** පවා ශක්‍රපදවියෙන් තොර කළ මහ බලැති **අගස්ති** මුනිහුගේ ආශ්‍රම පදය යි. දුරින් පෙනෙන හාත්පස වනයෙන් වට වූ **ශාතකර්ණි** මුනිහුගේ **පඤ්චාප්සර** නම් විල මේඝයන් අතරින් පෙනෙන සඳ මෙන් බබළයි තණ පමණක් කමින් මුවන් සමඟ හැසිරෙමින් තපස් රැකි ඒ මුනිහු ගේ සීලභේදය පිණිස ශක්‍රයා විසින් අප්සරාවන් පස්දෙනකුන් මේ ස්ථානයට එවූ බැවින් මෙ නම වී ලු.

නමින් **සුතීක්ෂ්ණ** වුව ද ශාන්තදාන්ත චරිත ඇති මේ මුනි තෙම පඤ්චතාපනය කරනු බලව! මොහු වෙතට ද දෙවඟනන් එවූ නමුත් මේ තපස්වීහුගේ ශීලභේදයට ඔවුහු අසමත් වූහ.

එක් අතක් අහසට දිගුකොට සිටින මේ තෙම මෞනව්‍රතය ඇති ව සූර්‍යයා දෙස බලා තපස් කරන්නෙකි. ඍතාදියෙන් බොහෝ කල් ගිනි පුදා අන්තයෙහි සවකිය ශරීරය ද ගින්නට පිදූ **ශරභඞ්ග** මුනිහුගේ තපෝවනය මේ ය. ඵලචර්‍යාදානයෙන් (=ඵල හා සෙවණ දීමෙන්) අදත් ඒ මුනිහුගේ පුත්‍රයන් බඳු ආශ්‍රම වෘක්ෂයෝ ආගන්තුක සඬ්ග්‍රහ කෙරෙති. මේඝයන් විසින් ආශ්‍රිත කූට(=මුදුන්) ඇති මේ **චිත්‍රකූට** පර්වතය නෙත් පිනවයි. ඒ අසලින් පෙනෙන මන්දාකිනී නදිය මුතුවැලක් මෙනි. මල් නැති ව පලදෙන රුක් ඇති, අතිශය මහිම ඇති මේ ඉදිරියෙන් පෙනෙන වනය **අත්‍රි** මුනිහුගේ තපෝවනය යි. ඒ මුනිහුගේ **අනුසූයා** නම් භාර්‍යාව මුනින්ගේ ස්නානය පිණිස මේ වනයෙහි ගඞ්ගා නම් ගඟ පැවත් වූහ. (=ඉගන අව)

සමහර තැනෙක ඉඳුනිල්මණින් ගැවසි මුතුවැලක් මෙන් ද, ඇතම් තැනෙක යුදුනෙළුම් මාලාවක් නිල්මානෙල් මලින් ගැවසුණාක් මෙන් ද, අන් තැනෙක රාජහංසයන් හා එක් වූ නීලහංස (=කාදම්බ පක්ෂි) ශ්‍රේණියක් මෙන් ද, අන්‍යස්ථානයෙක්හි අහරතුර සදරස් වැටුණු රුක් සෙවණැල්ලක් මෙන් ද, අන් තැනෙක්හි කෘෂ්ණසර්පියන් වෙළාගත් හම්මයෙන් ආලෙප කළ සිරුරු ඇති (=ගළු තැවරූ) රාශීවර ශරීරය මෙන් ද මේ පෙනෙන්නේ **ගඞ්ගා-යමුනා** දෙදෙනාගේ එක්වීම ඇති **ප්‍රයාග** තීර්ථය යි.[1]

1 කාව්‍යශේඛරයෙහි 3 වැනි සර්ගයෙහි 42, 43, 44, 45, කාරිකා සඳහන්.

තුන්වැනි ඥානයෙන් තොරවූව ද මෙහි ශරීරය පුදන්නෝ මෝක්ෂයට පැමිණෙති යි කියති. මේ පෙනෙන්නේ **ගුහශාගේ** පුරය යි. වනවාසයට පැමිණි මම මෙහිදී සිළුමිණි හැරදමා ජටාධර වීමි. ඉදිරියෙහි මානස (=අනෝතත්ත) විලෙන් ගලාබස්නා **ශරයූ** නදිය පෙනේ.

"**උත්තරකෝසල** වාසීහු මේ නදියට කිරිමවකට මෙන් ගරු කෙරෙත්. ඉදිරියෙහි පෙනෙන ධූලිරාශියෙන් හනුමත්ගෙන් අපගේ පැමිණීම දැනගත් **භරත** කුමාරයා සෙනඟ පිරිවරා අපට පෙර ගමන් කරන බව හැගේ.

ඒ සත්පුරුෂයා රාක්ෂස වධයෙහි නියුක්ත වූ මාගේ රාජ්‍ය සම්පත ආරක්ෂා කෙරෙමින් සිට මා කරා පැමිණෙයි. පිය රජු විසින් දෙනලද රාජ්‍ය සම්පත්තිය තාරුණ්‍යයෙහිත් සිට මෙපමණ කලක් ඉඳුල් නොකොට සිටීමෙන් ඔහු කෙළේ **'ආඝිඩාර** (=කඩුමුවාතක් මෙන් නියුණු) ව්‍රතයෙකි."

මෙසේ කියත් ම ඔවුන්ගේ කැමැත්ත දත් විමානය (=අහස් යානය) අහසින් බැස විසමයෙන් බලාසිටි භරත කුමාරයා ඇතුළු සේනාව ඉදිරියෙහි නැවතිණ.

රාමතෙම විභීෂණ විසින් දක්වන ලද මාගීයෙන් සුග්‍රීවගේ අත අල්වා ගෙන සළුපිත මණිමය හිණිපෙළින් බැස ඉක්ෂ්වාකු වංශජයන්ගේ කුලගුරු වූ වශිෂ්ඨ මුනිහට නමස්කාර කොට අර්ඝ්‍ය පාත්‍රය ගෙන පෙරමුණට පැමිණි භරතයා වැලඳ ගෙන හිස සිඹ්බේ ය.

අනතුරුව වෘද්ධමන්ත්‍රීන්ගේ අභිවාදනයන් පිළිගනිමින් කරුණාර්ද්‍ර බැල්මෙන් හා කුශල ප්‍රශ්න සඛ්‍යාත වචනයෙන් ද ඔවුනට සඛ්‍රහ කොට සුග්‍රීව-විභීෂණ දෙදෙනා හඳුන්වා දී සියලු දෙනම හස්ත්‍යශ්ව රථ වාහනාදියෙන් පිටත් ව ක්‍රෝශාර්ධයක් (=හැතැප්මක්) පමණ ගමන් කොට **අයෝධ්‍යා** (=සාකේත) නුවර සමීප උයන්හි ශත්‍රුඝ්න කුමාරයන් විසින් සරසන ලද වසන්ත මණ්ඩපයට පැමිණියහ.

දශාඩ්ගා ප්‍රත්‍යාගමන නම්
තෙලෙස්වන සඟ නිමි.

14

උයනට පැමිණීමට අනතුරු ව රාම ලක්ෂ්මණ දෙදෙනා පියාණන්ගේ මරණින් ශෝචනීය අවස්ථාවට පැමිණි කොසල්‍යා සුමිත්‍රා යන මැණිවරුන් දෙදෙනා දුටහ.

පිළිවෙළින් මැණිවරුන්ට අභිවාදනය කළ වික්‍රමශාලී පුත්‍රයන් දෙදෙනාගේ නේත්‍රයන් කඳුළින් පිරී පැවති හෙයින් හොඳින් දැක ගත නො හැකි වුව ද මැණිවරු පුත්‍රයන්ගේ ස්පර්ශය ලැබීමෙන් ප්‍රත්‍යක්ෂ ව ම හැඳින ගත්හ.

මැණිවරු දෙදෙන පුත්‍රයන්ගේ ශරීරයන්හි රාක්ෂසයන්ගේ ආයුධ ප්‍රහාරයෙන් වූ කැලැල් මහත් දයාවෙන් අත ගාමින් වීර පුත්‍රයන් ලැබීම ක්ෂත්‍රිය කාන්තාවන්ට ප්‍රීතිජනක වුව ද වීරමාතාවන් වීමේ කීර්තිය නො කැමැති වූහ.

ඉක්බිති "ස්වාමියාට හිරිහැර කර වූ කාලකර්ණී සීතා මම ය"යි තම කියමින් නැන්දණියන්ගේ පාමුල හුණු සීතාව "නැගිටින්න යෙහෙළිය, ඔබගේ පවිත්‍ර පැවැත්ම නිසා ම සහෝදරයා සහිත ස්වාමිපුත්‍රයාගේ ජයග්‍රහණය වූයේ නො වේදැ"යි ප්‍රිය වූ සත්‍යවචනයෙන් ඔවුන් විසින් පසසන ලදු. වැළිදු රඝුවංශධ්වජ ජායමාන රාමකුමරුන්ගේ අභිෂේකය මැණිවරුන්ගේ ප්‍රීති කඳුළින් ආරබ්ධ වුව ද වෘද්ධාමාත්‍යයන් විසින් රන්කලස් පිරූ තීර්ථ ජලයෙන් අවසන් කරන ලදි.

තපස් වෙස් ධැරීමෙනුදු දර්ශනීය ශෝභා ඇති රාමකුමාරයා රූපේන්ද්‍ර නෙපථ්‍යධාරණයෙන් (=රාජාභරණ පැළඳීමෙන්) අතිශයින් ශෝභාමත් වූයේ වෘද්ධමන්ත්‍රීවරුන් හා රාක්ෂස සේනාවන් හා වානර සේනාවන් විසිනුදු පිරිවරන ලද්දේ මහත් රාජර්ධියෙන් තෝරණ ධ්වජ පතාකාලඞ්කෘත ප්‍රාසාදයන්ගෙන් නිකුත් වන විලඳ වර්ණය ඇති අයෝධ්‍යා පුරයට ප්‍රවිෂ්ට විය

ලක්ෂ්මණ ශත්‍රුඝන දෙදෙනා විසින් චාමර සලනු ලබමින් භරත විසින් ශ්වේතවර්ත්‍ර ධරනු ලබමින් රථයෙන් ගමන්ගත් රාම රජතෙම මූර්තිමත් වූ චතුරුපාය මෙන් පෙනිණි.

නැන්දණියන් විසින් මොනවට සරසන ලද සීතා ද කර්ණී රථයෙන් යන්නී ප්‍රාසාද වාතපාන (=කවුළු) සමීපයෙහි රැස් ව හුන් පෞරස්ත්‍රීන් විසින් වඳනා ලදු.

මෙසේ නුවරට පැමිණි රාමරජතෙම පියාණන්ගේ ප්‍රතිරූපය පමණක් ඇති මාලිගයට ප්‍රවිෂ්ට ව භරතමාතෘ වූ කෙකේයී දිසව වැඳ "සත්‍ය වශයෙන් ම මැණියෙනි, අපගේ පියාණන් සත්‍යයෙන් වෙන් නුවූයේ ඔබ නිසා ය"යි කියමින් ඇගේ ලජ්ජාව දුරු කෙළේ ය. සුග්‍රීවාදි මිත්‍රයන්ට සාධ්‍යමය පරිභෝග වස්තුවල ම ද වඩා අගනා කම්කරුවන් විසින් නිර්මිත ශයනාසන භෝජනාදියෙන් ඔවුන් විසමයප්‍රාප්ත වන සේ සඞ්ග්‍රහ විධි සැලැස්වී. අභි

කුඤ්ජනය පිණිස පෑමිණි අගස්ත්‍යාදි දිව්‍ය ඍෂිවරුන්ගෙන් රාව ණගේ ප්‍රභවාදි (=උත්පත්ති ආදි) පුරාවෘත්තය ද ඇසීය.

මෙසේ රජසුව විඳින ඔවුන්ට නොදැනීම වාගේ අඛමසක් ගත වූ හෙයින් රාම රජතුමා විභීෂණ සුග්‍රීවාදීන්ට සීතාදේවිය ලවා සත්කාර පූජාවිධි පවත්වවා පිටත්කරවිය. පුෂ්පක රථයට ද නැවතත් කුවේර වාහනය වීමට අනුඥා කොට ධර්මාර්ථකාම සඞ්ඛ්‍යාත ත්‍රිවර්ග සම්පත් විඳිමින් සොහොවුරන්ට ද මැණිවරුන්ට ද සමව පවතිමින් රාජ්‍යය කෙළේ ය.

රාම රජුගේ රාජ්‍යයෙහි වැස්සෝ රජුගේ නිලෝභිත්වයෙන් ධනවත් වූහු, රජු උවදුරු නසන බැවින් නිරුපද්‍රව ක්‍රියා ඇත්තෝ වූහු, රජු ශෝක දුරුකරන්නකු වූ හෙයින් පුත්‍රයන් ඇත්තෝ වූහු.

විවිධ චිත්‍රයෙන් විසිතුරු වූ මාලිගයන්හි කැමැති සේ සැප විඳින්නා වූ රාමරජහට දණ්ඩකාරණ්‍යයෙහි විඳි දුක් ද සිහිකරන විට සැප මෙන් වැටහිණි. මෙසේ මදකලක් යන්නා හා ම සීතාව ගර්භිණී වූ බව වචනයෙන් නොකිව ද සිනිදු ඇසින් හා පඬුවන් මුහුණින් ප්‍රකාශ කළා ය. සවාමිතෙම රහසින් ඇගේ දෙළදුක් විවාළ කල්හි ගඞ්ගානදීතෙර පිහිටි තපෝවනයන්හි යැමට කැමැත්ත ලජ්ජාවෙන් වුවද නොසඟවා කිව.

එක් දිනක් රජතෙම භද්‍ර නම් චරපුරුෂයකුගෙන් "තමාගේ පැවැතුම් ගැන රටවැසියා අතර පවත්නා කථා කෙසේදැ"සි විවාළේ ය. කීමට මැළි වූ ඔහු බලවත් ව අසන හෙයින් 'රාක්ෂස භවනයෙහි වුසූ සීතා පිළිගැනීම හැර අන්කිසි දෝෂයක් ඔබට නොකියති'සි කියෙන් රජ මහත් සේ ඛේදයට පැමිණියේ ය. භාර්‍යාව පිළිබඳ නිකු හාරයෙන් යුක්ත වූ අපකීර්ති යහුලින් රාම රජුගේ ළය දෙදරා ගියේ ය. "කිමෙක් ද, මම මේ නිකුව ඉවසම් ද? නිර්දෝෂ වූ භාර්‍යාව දුරුහෙරෙම් ද?" යන දෙගිඩියායෙන් කැලඹී ගිය රාමරජ භාර්‍යා පරිත්‍යාගය නොට නිකුවෙන් මිදෙන්නට සිතීය. ඒ එසේ ම ය! යශස ධනකොට ඇත්තෝ දේහ ත්‍යාගයෙන් ද යශස රකිත් මැනු?

මෙසින් තේජස ද හීන වූ රජතෙම වහාම සොහොවුරන් කැඳවා මෙසේ කීය:-

"සච්චරිත්‍ර ඇති සූර්‍යවංශජ වූ රජපරපුරයට මා නිසා කැල ලක්වීම දුකෙකි. ජනයා අතර පැතිර යන මේ නිකුවෙන් මිදෙනු පිණිස පියාණන්ගේ ආඥාවෙන් රාජ්‍යය අත්හැරියාක්

මෙන් පුත්‍රලාභයට ආසන්නවූ ද සීතාව අත්හැර දමන්නේ. මගේ මේ නිශ්චය කාරුණික වූ ඔබ විසින් වැළැක්විය යුතු නො වේ. නිදුව බැහැර කොට කලක් මාගේ ජීවිත පැවැත්ම ඔබ කැමැත්තහු නම් මෙයට බාධා නො කළ යුතු යි."

නිර්දෝෂ වූ සීතාදේවිය කෙරෙහි ඉතා රෞද්‍ර වූ අදහස් ඇති ව මෙසේ කී රජුගේ වචනය පිළිගන්නට හෝ ප්‍රතික්ෂේප කරන්නට හෝ ඔහු කිසිකෙනෙක් සමර්ථ නුවූහ. එබැවින් ලක්ෂ්මණ කැඳවා "සීතාව තපෝවනය දක්වන්නට යන්නාක් මෙන් ගෙන ගොස් **වාල්මීකි** මුනිහුගේ ආශ්‍රමයට හැරලා එව"යි ආඥා කෙළේ ය.

ලක්ෂ්මණ තෙමේ ද "එසේ ය"යි රාජාඥාව පිළිගෙන පරශුරාමයා පියාගේ අණින් මෑණියන්ට පහර දුන්නාක් මෙන් සීතාව ගෙන ගොස් ගඞ්ගානදීතීරයෙහි රථයෙන් බස්වා වැද්දකු විසින් ගෙනා ඔරුවෙකින් ගඟින් එතර කොට ඉතා දුක සේ ගොතගසමින් රාජාඥාව ඇට දැන්වීය. ඕ ඒ ඇසූ කෙණෙහි ම මූසපත් ව සඛකිය මැණියන් වෙත (=පොළොවෙහි) ඇද වැටුණා ය. එතෙකුදු වුවත් පෘථිවි තොමෝ "එම්බා සීතාව, ඉක්ෂ්වාකු වංශික වූ සාධුවරිත ඇති සවාමිතෙම නිර්දෝෂ වූ නී හෙයේ නම් අත්හරින්නේද"යි සැක කරන්නියක මෙන් ඒ තාක් ඇට පොළෝගැබට පිවිසීමට අවසර නුදුන්හ.

ලක්ෂ්මණගේ උත්සාහයෙන් සිහිලැබීම ඇට අධික දුඃඛදායක විය. එතෙකුදු වුවත් ආර්‍ය්‍ය ගෝත්‍ර ඇති හෙයින් ඕතොමෝ සවාමියාහට අපවාද නො කිව. තමාගේ අභාග්‍යයට ම නිදා කළා ය.

ලක්ෂ්මණ කුමාරයා ඇය අස්වසා අනුන්ට යටත් බැවින් තමා කළ වරදට ක්ෂමාව ගෙන යන්නට පිටත්විය.

සීතා ඔහුගේ විරජීවනය ප්‍රාර්ථනා කොට මෙසේ කියන්නට වූහු:-

"නැන්දණියන්ට මාගේ ප්‍රණාමය දන්වා මා කුසගොත් දරුවාගේ නිරුපද්‍රවය ප්‍රාර්ථනා කරන්නැ"යි කියව! රාමරජහට ද මෙසේ කියව:—"ප්‍රත්‍යක්ෂ ව ගින්නෙහි පිවිස පවිත්‍රබව දැක් වූ මා මෙසේ ලෝකාපවාද මාත්‍රයෙකින් දුරුකිරීම ප්‍රසිද්ධ වූ රඝු කුලයට උචිත වේ ද? නැතහොත් ඔබගේ වරද කුමට කියම් ද? මාගේ ම ජන්මාන්තර පාපයන්ගේ විපාක දීමෙකි මේ. පළමු රාජ්‍යලක්ෂ්මිය හැර මා සමඟ වනයට ගිය ඔබ රාජ්‍යලක්ෂ්මිය

ළැබ ඇය හා සහවාසයට පැමිණි සඳ ඕ මා නො ඉවසූ වන. රාක්ෂසස්ත්‍රීසහනයෙන් පීඩිත වූ තපස්විනීන්ට ඔබගේ ප්‍රසාදයෙන් පිහිට වූ මම අද ඔබ ජීවත් ව සිටියදී ම අනිකකු පිහිට සොයා කෙසේ යන්නෙම් ද? ඔබගේ තේජස වූ දරුගැබ නැත්නම් මාගේ මේ තුවජ ජීවිතය ක්ෂණයෙකින් නොරහර ගනිමි. දැන් එයට ද අවකාශ නැති බැවින් මම පුත්‍ර ප්‍රසූතියෙන් ඉක්බිති "ඔබම මතු මහුත් මට ම සවාමි වෙත්වා! මෙසේ වියෝගයෙක් කිසිකලෙකත් නො වේවා"යි ප්‍රාර්ථනා කොට තපස් රකින්නෙමි. වණ්ණාශ්‍රම පාලනය රාජධර්මය බැවින් ඔබ විසින් පරිත්‍යක්ත වුව ද මා තපස්වි සාමාන්‍යයෙන් දැක්ක යුතු වෙමි." යි

"එසේය"යි පිළිගෙන ලක්ෂ්මණ කුමාරයා පිටත් ව ගොස් නො පෙනෙන මානයට වන් කල්හි ම සීතා තොමෝ, ශෝකය ධරාගත නොහී කුරර පක්ෂිණියක් මෙන් මහත් සේ හඬන්නට වුව.

එ හඬ අසා මොනරු නැටුම් හළහ; වෘක්ෂයෝ මල් හෙළුහ; මෘගයෝ මුවින් ගත් තණකබළ බිම හෙළුහ. මෙසේ ඇ හා සම දුඃඛයට පැමිණි වනය ද හඬන්නාක් මෙන් පෙනිණි.

එකෙණෙහි කුශතණ හා දර ගෙනෙනු පිණිස වනයට පැමිණි ප්‍රථම කවි වූ වාල්මීකි මුනිතෙමේ එතනට අවුත් ඇය සනසා තමාගේ අසපුවට කැඳවා ගෙන ගොස් තාපසීන්ට භාර කෙළේ ය.

ඔවුහු ඇට මැනැවින් ආගනතුක සත්කාර කොට රාත්‍රියෙහි සයනය පිණිස දුඳුතෙල් පහන් ඇති, මුව සම් ඇතිරි අතුළ ගහන් ඇති, පන්සලක් ද දුන්හ.

එතැන් පටන් සීතා තාපසී විධි වූ පරිදි ආගනතුක සත්කාර කරන්නී වැහැරි ධරන්නී සවාමියාගේ පුත්‍රසනතිය පිණිස ජීවිතය ද ධැරූ.

රාමරජතුමා ද සීතාගේ ප්‍රවෘත්ති අසා හඬා වැලප ඇය රජ ගෙයින් නිකුත්කළ ද සිතින් ඉවත් නො කොට නුවණැති බැවින් ශෝකය ඉවසමින් වණ්ණාශ්‍රම පාලනයෙහි අප්‍රමත්ත ව රාජ්‍යානුශාසනා කෙළේ ය. "නිකුවට බියෙන් එකම සාධුවරිත ඇති දේවිය දුරු කළ රජතෙම අන්බිසවක් පාවා නො ගනී. ඇයගේ පිළිබිඹුව ම පත්නී වශයෙන් තබා යාග කර්මයන් ද සිදු කෙළේය" යන මේ ප්‍රවෘත්තිය ඇසූ සීතාතොමෝ කෙසේ නමුත් තමා පරිත්‍යාග කිරීමේ දුඃඛය ඉවසූහ.

සීතා පරිත්‍යාග නම්
තුදුස් වන සර්ගය නිමි.

15

මෙසේ සීතාව පරිත්‍යාග කොට හුදෙක් සමුද්‍රයම මෙවුල්දම් කොට ඇති පෘථිවිය පමණක් පරිභෝග කරන්නා වූ රාමරජු වෙතට ලවණ රාක්ෂසයා විසින් නසන ලද යාග ක්‍රියා ඇති සමුනා තීරවාසී මුනිවරු පිහිට සොයා ආහ. "ලවණයා ශූලා යුධ ධරන කල්හි ජයගත නො හැකි ය. ශූලායුධ රහිත අවස්ථාවක් බලා නැසිය යුතුය"යි ඔවුන් විසින් ම වඥෝපාය ද කියන ලදින් රාමරජ ලවණයා නැසීමට ශත්‍රුඝ්න කුමරුන්ට අණ දින. රඝුවංශිකයන් අතුරෙන් කවරෙක් නමුත් උත්සඟී (=සාමාන්‍ය) සූත්‍රයට අපවාද (=විශෙෂ) සූත්‍රයක් මෙන් සතුරන් බල බිඳීමට සමර්ථ වෙයි. එබැවින් ශත්‍රුඝ්න කුමාරයා සේනා සහිත ව නික්ම ගොස් එක් දිනක් රාත්‍රියෙහි වාල්මීකි මුනිහුගේ තපෝවනයෙහි නිවාසග්‍රහණය කෙළේ ය. එදිනම රාත්‍රියෙහි සීතාව ප්‍රභාස්වර වූ යමජ (=නිමුන්) පුත්‍රයන් දෙදෙනකු වැදූහ. සහෝදරයාගේ බිසව ලත් ප්‍රසූතිය අසා ප්‍රීතිමත් වූ කුමාරතෙමේ පසුදින මුනිවරයන් ගේ අවසරය පරිදි ලවණාසුරපුරය (=මථුරා) බලා පිටත්විය.

කුමාරයා නුවරට පැමිණෙත් ම කුම්භීනසි නම් වූ රාවණ භගිනියගේ පුත්‍ර වූ ලවණ තෙමේ වනයෙන් ලත් සුංකමක් මෙන් සැම සමූහයක්අල්වාගෙන රකුසුගණ පිරිවරා දුඹුරුවන් සිරුරින් හා වුරුණුතෙල් ගඳින් හා ගිනිදැල් බදු හිසකෙසින් ජඹගම (=ඇවිදින) විතකාවහ්නියක් මෙන් ඉදිරියට ආය.

එවේලෙහි ශූලායුධ රහිත බව දුටු කුමාරයා ද ඔහු වළඟ මින් ඉදිරියට ගියේ ය. "ආඃ, අද මගේ උදරපූරණයට භෝජන මඳ බව දැන හිත වූ බ්‍රහ්මයා විසින් නා මාවෙත එවූවා වනැ"සි වහසි බැණ කුමාරයා තසනු පිණිස උස්ගසක් තණ පදුරක් මෙන් උදුරා දමා ගැසී ය. තියුණු හීවලින් ගස කපා සුනුකළ බැවින් පර්වතයක් උදුරා ගෙන පහර දිනි. ඓන්ද්‍රායුධයෙන් එය ද සුනුවිසුනු කළ බැවින් කල්පාන්තවාතයෙන් උපුටා හළ එක් තලක් ඇති පර්වතයක් මෙන් දකුණත ඔසවා කුමාරයා වෙනට පැන්නේ ය.

විෂ්ණුදේවතාක* හීයෙන් හෘදය විදරිත වූ ඒ රකුසු තෙමේ පොළොව කම්පා කෙරෙමින් බිම හිණ. එ කෙණෙහි කාකාදි පක්ෂීහු රකුස් සිරුරෙහි ද දිවකුසුම් වැසි කුමරුන් සිරු

---

* විෂ්ණුදෙවියන්ගේ බල ඇති.

රෙහි ද වටහ. ලවණයා නැසීමට අනතුරු ව ශත්‍රුඝ්න කුමරු මීහා තේජස් ඇති ලක්ෂ්මණගේ සහෝදරත්වය පිළිගත්තේ ය.

එකුමර එහිම කාලිඳී (=යමුනා) තීරයෙහි **මථුරා** නම් පුරය මහත් යසසින් ආඝ්‍යකොට මදකාලක් එහි විසී. මේ කාලයෙහි වාල්මීකි තෙමේ සීතාගේ දරුදෙදෙනාට කුශතෘණයෙන් හා සෙමෙරින් ගතීකලාතනය දුරුකළ බැවින් **කුශ-ලව** සි ම නම් තබා වේද වේදාඞ්ගයන් ද උගන්වා තමා විසින් කළ ප්‍රථම කාව්‍යය වූ **රාමායණය** ගායනා කරන්නට ද ඉගැන්වීය. ඒ පුත්‍ර දෙදෙනා මැණියන් ඉදිරියෙහි රාමචරිතය ගායනා කිරීමෙන් ඇගේ වියෝ දුක මදක් අඩුකළහ.

ශත්‍රුඝ්නාදි අනික් සහෝදරයන්ට ද දරුවෝ දෙදෙනා බැගින් වූහු. ශත්‍රුඝ්න තෙම තමාගේ **ශත්‍රුඝාතීන්-සුබාහු** යන පුතුන් දෙදෙනාට **මථුරා-විදිශා** යන දෙනුවර පවරා දී පෙරළා අයෝධ්‍යාවට ම ගියේ ය. "පුත්‍රයන් උපන් බව නො කියව"සි වාල්මීකි මුනිහු කී බැවින් එය නො කියා අන් සියලු තොරතුරු ම රජහට දැන්වීය.

අනතුරු ව එක් දිනක් එක්තරා බ්‍රාහ්මණයෙක් තරුණ වන්නව ද පෙර මළා වූ පුත්‍රයකු රාම රජුවෙත ගෙනවුත් මාලිගා ද්වාරයෙහි බහා රජහට ආක්‍රෝශ කරන්නට විය. "එම්බා පෘථිවීය, ඔබ දශරථ රජුගේ අභාවයෙන් ඉතාමත් අභාග්‍ය අවස්ථාවකට පැමිණියහු" යනාදීන් පරිභව බණින්නා වූ බ්‍රාහ්මණයාගේ හඬ අසා තොරතුරු විමසා දැන රාමරජ ලජ්ජිතවිය, අකාලමරණයක් ඉක්ෂ්වාකුවංශිකයන්ගේ රාජ්‍යයෙහි නො වන හෙයිනි. රජ තෙම "මොහොතක් ඉවසව"සි බ්‍රාහ්මණයා නවතා යමයාගෙන් පලි ගැනීමට පිටත්විය එකෙණෙහි ම රජු ඉදිරියෙහි "මහරජ තොපගේ රාජ්‍යයෙහි මිනිසුන් කෙරෙහි අයෝග්‍ය හැසිරීමෙක් වෙයි. එය සොයා ශමනය කරව! එසින් ඉෂ්ටාර්ථ සිදුවිය වන්නේ ය"සි අමානුෂික වචනයෙක් ඇසිණි.

රජ එය ද සිහට ගෙන පුෂ්පක රථයෙන් ඒ දිශාවෙහි ඉගිලෙමින් පරීක්ෂා කරන්නේ ගඝඝා යවිකුරුව එල්බ දුෂ්කර වූ තපසක් කරන්නා වූ **ශම්බූක** නම් ශූද්‍රයකු දැක ගෝත්‍ර විචාරා ශූද්‍රයන් තපස් රැකීම වේදයටත් ධර්මශාස්ත්‍රයටත් විරුද්ධ බැවින් "මෙය ම ධර්මවිරෝධී අනාචාරය"සි සිතා රජතෙම ඔහුගේ හිස සිඳලීය. දුෂ්කර වූ තපසිනුදු සඞ්ගීයට යා නො හැකි වූ ශම්බූකයා රජු අතින් දඬුවම් ලැබීමෙන් එකෙණෙහි ම සඞ්ගීයට ගියේ ය. රජතුමා පෙරළා මාළිගයට එත් ම මළ බමුණුපැටියාට නැවත ජීවිතය ලැබී නිබෙනු දක්නා ලදි.

බ්‍රාහ්මණයා රාමරජහට පළමු කළ නිසුව සතුතියෙන් අවසන් කොට පුත්‍රයාත් සමඟ නික්ම ගියේ ය.

මෙසේ මාරයා ද දිනූ රාමරජ අශ්වමේධ යාගය පිණිස අශ්වයා මුදා මහත් සමාරෝහයෙන් යාගයට පටන්ගත් කල්හි **කුශය-ලවය** යන සඛකිය පුත්‍රයන් දෙදෙනා රාමායණය ගායනා කෙරෙමින් ඒ ඒ තැන ඇවිදිනාහු රජමාළිගයට ද පැමිණි සහ. යාගය පිණිස රැස් ව හුන් සියල්ලන් ඉදිරියෙහි කිඳුරු නදින් ඔවුන් රාමායණය ගායනා කරන්නට වන් කල්හි සියලු දෙන ම වශීකෘත ව මෙන් ඇසිපිය නො හෙළා අසා හුන්හ.

මෙහි කථානායකයා **රාම** රජ ය; කාව්‍යකර්තෘ **වාල්මීකි** ඍෂි ය; ගායකයෝ කිඳුරුනාද ඇති **කුශ-ලව** නම් වූ රාම පුත්‍රයෝ ය; මෙසේ හෙයින් අසන්නවුන් සිත් ගැනීමෙහි අසමර්ථතාවට කිසි ද හේතුවෙක් නැති.

කුමරුන්ගෙන් තොරතුරු දත් රජතෙම සොහොවුරන් ද කැටුව වාල්මීකි මුන්දුන් වෙත ගොස් රාජ්‍යයෙන් පිදී. එහෙත් කාරුණික මුනිතෙම කුමරුන් දෙදෙනා රාම පුත්‍රයන් බව පහදා දී "කුමරුන් සහිත ව සීතාව භාරගත මැනවැ"යි රජුගෙන් ඉල්වූයේ ය. රජතුමා තමාට ඇය ගැන කිසිත් සැකයක් නැති බවත් මහජනයා ඉදිරියෙහි තමාගේ පවිත්‍රත්වය දක්වා ඔවුන්ගේ සැක නැති කළහොත් මුනිහුගේ ආඥා පරිදි කුමරුන් සහිත සීතාව පිළිගන්නා බවත් කී බැවින් එසේ කිරීම පිණිස පිළින දී මහජනයා රැස් කොට වාල්මීකි මුනිහු සීතාත් කැටුව රාජ මාළිගයට ගියහ. මහජනයා ඇය දැක ඇස් හකුළුවා ගති.

"දරුව, සවාමියා ඉදිරිපිට සවචරිතය පවිත්‍ර බව (=පතිවත රැකි බව) ව ලෝකයාගේ සැක දුරුකරව"යි කී මුනිහුගේ වචනයෙන් සීතා තොමෝ ජලය ස්පර්ශ කොට සත්‍යක්‍රියා කරන්නී "එම්බා මිහිකත, කාය වාක් මනස් යන ද්වාරත්‍රයෙන් ම සවාමියාට විරුද්ධ හැසිරීමෙක් (=ක්‍රියාවක්) මාගේ නොවී නම් මා පෘථිවි ගර්භයෙහි රඳවන්නට සුදුසු වෙහි"යි කියන්නා හා ම එකෙණෙහි හටගත් විවරයෙකින් විදුලියක් මෙන් පහළවූ ප්‍රභාමණ්ඩලයෙක්හි නාසිපෙණ මතුයෙහි වූ සිංහාසනයක් අරා හුන් පෘථිවී දේවතා තොමෝ දක්නා ලදු. ඕතොමෝ හිමියා දෙස නෙත් හෙළා හුන් සීතාව අැකයට ගෙන "හා! හා!!"යි රාමයා කෑගසද්දී ම පාතාලයට වැදුණු. දුන්න ගෙන පොළොව හා යුද්ධකරන්නට සැරසුණු රාමයා බ්‍රහ්මයාගේ වචනයෙන් ක්‍රෝධය ඉවත් කෙළේ ය. රාම රජ යාගාවසානයෙහි සෘෂිවරයන් හා ඥාතිමිත්‍රයන් ද සඛ්‍රහ

යෙන් සතුටු කොට හැර සීතා කෙරෙහි වූ ප්‍රේමය දරුවන් දෙන්නා කෙරෙහි පිහිටුවා ලීය.

ඉක්බිති **සුබාහු** නම් වූ භරත කුමරුගේ මාමාගේ වචනය පරිදි **සිඟුදේශය** භරතට දුන් හෙයින් එහි ගොස් ගඬුවියන් හා යුදකොට දිනා **තක්ෂය-පුෂ්කලය** යන සවකිය පුත්‍රයන් දෙන්නා එනම් ඇති රාජධානි දෙයෙහි අභිෂේක කොට භරත නැවතත් රාමරජු වෙතට ආයේ ය.

ලක්ෂ්මණ තෙම සවකිය පුත්‍ර වූ **අඞ්ගද ය-චන්ද්‍රකේතු** ය යන නම් ඇති කුමරුන් දෙදෙනා රජුගේ අණපරිදි **කාරාපථ** දේශයෙහි අධිපතීන් කෙළේ ය. රාම පුත්‍ර වූ **කුශකුමරු කුශාවති** යෙහි ද **ලවකුමරු ශරාවති**යෙහි ද අධිපති බවට පැමිණවිය.

මෙසේ පුත්‍රයන්ගේ අභිවෘද්ධිය සලසා අනන්තයෙහි රාම තෙම සොහොවුරන් සහිත මහා සේනා පිරිවරා ගෙන ශරයූ නදියෙහි බැස දියෙහි ගිලී මිය ගොස් දෙව්ලොවට වැනි.

ගෝයූථයක් (=ගවරළක්) මෙන් සම්මර්දිත ව ශරයූ නදි යෙහි දේහත්‍යාගය කළ ඔවුන්ගේ ඒ තීර්ථය අද දක්වා ඒ නමින් **ගෝප්‍රතර තීර්ථ** යයි ප්‍රකට ය. එදින රාමරජු සමග දියෙහි ගිලී දෙව්ලොව ගියවුන්ට අන්‍ය දෙව්ලොවක් මැවිණි.

මෙසේ විෂ්ණුදේව තෙමේ රාමාවතාරයෙන් ඉපද රාවණවධ සවරූප දේවකාර්‍යය ඉටුකොට විභීෂණ දක්ෂිණ දිශාවෙහි ද හනුමත්හු උත්තරදිශාවෙහි ද ජයස්තම්භ දෙකක් මෙන් පිහිටුවා සවකීය දේවමූර්තියට නැවතත් ප්‍රවිෂ්ට විය.

ශ්‍රීරාම සඛ්‍යාරෝහණ නම්
පසළොස් වන සඟ නිමි.

16

තදනන්තර ව **කුශ** ය, **ලව** ය, **තක්ෂ** ය, **පුෂ්කල** ය, **අඞ්ගද** ය, **චන්ද්‍රකේතු** ය, **ශත්‍රුඝාති** ය, **සුබාහු** ය යන කුමාරවරු එක්ව ජ්‍යෙෂ්ඨාපචායනය (=වැඩිමල්ලන්ට ගරුකිරීම) කුලවාරිත්‍රය වන හෙයින් සිඟල්ලන්ට වැඩි සිටි කුශ කුමරුන්ට රාජ්‍යය පවරා අන්‍යයෝ ඔහුට යටත් ව රට පාලනය කරන්නාහු පාලම් තැනීම ය, ගොවිකම් ගවපාලනාදි ව්‍යාපාර ය, ඇතුන් බැඳීම ය යනාදී වූ සඵල කටයුතු කෙරෙමින් ඔවුනොවුන්ගේ රාජ්‍යසීමාවන් නො ඉක්මවූහ.

මෙසේ කුශාවතියෙහි රජ පැමිණි **කුශරජු** එක් දිනක් රාත්‍රි කාලයෙහි නින්දට වන් කල්හි භීමියන් නැති (=විරහිණි) සත්‍රිය කගේ වෙස් ගත් අයෝධ්‍යාපුරාධිදේවතා තොමෝ රජු වෙත පැමිණ මෙසේ කියන්නට වුව:—

"මහරජ, මම වනාහි ඔබගේ පිය වූ රාමරජු සියලු පුරවැසියන් ගෙන දෙව්ලොව ගිය බැවින් අනාථ වූ අයෝධ්‍යා පුරියගේ අධිදේවතා වෙමි. අලකාපුරය පරදවා ධනයෙන් හා සෞභාග්‍යයෙන් පරිපූර්ණ වූ අයෝධ්‍යා නම් නගරය ඔබ වැනි සුයම්වංශාභිජාත මහ බලැති රජකු විද්‍යමාන කල්හිත් ශෝචනීය අවසථාවට පැමිණියා ය. මාගේ නිවෙස්න භීමියන් නැති බැවින් අද විසිරී ගිය සිය ගණන් ප්‍රාසාදගෝපුරාට්ටාල ප්‍රාකාර ඇත්තේ සුසීඝ්‍ර සතඝගමයෙහි මහා වාතයෙන් බිඳුණු මේඝ ඇති දිවසාවසානය (=සඤ්ඣාව)මෙන් පෙනේ. පෙර නුරුවලා හඬ නගමින් රාත්‍රියෙහි අභිසාරිකාවන් ගමන්ගත් රාජ මාර්ගයෙහි අද සිවල්ලු ඇවිදිති. ගෙදිගුවිල් වනමිවුන් ලඟිනා තැනි. ක්‍රීඩා මයූරයෝ ළැවිගිනින් දැගිය පිල්කලබින් යුත් වනමොනරු ය, ප්‍රාසාදයෝ සිංහ ව්‍යාඝ්‍රාදීනට වාසස්ථාන වෙති. සුනුවම් කළ හම්‍යතලයන්හි තණපදුරු ය. පුෂ්පෝද්‍යානයෝ වඳුරු වැදි මුළුට කෙළිමඩුලු ය. රාත්‍රියෙහි ප්‍රදීප කාන්තිය හෝ දහවල් කාන්තාවන්ගේ මුඛකාන්තිය හෝ නැති වාකවුළු මකුළු දැලින් ගහනය. ශරයූ නදිය ද සනානාදියෙන් තොරවූවා දක්නවුන්ට ශෝක උපදවයි. මෙසේ හෙයින් මේ කුශාවතිය හැර රඝුවංශිකයන්ගේ කුලරාජධානිය වූ මාකරු පැමිණෙනු මැනවි!"සි

"එසේය"සි ගිවිස **කුශරජතුමා** පසුදින රාජසභාගත පුරෝහිතයන්ට සැලකොට ඔවුන් විසිනුදු "මැනවැ"සි පසස්නාලද්දේ කුශාවතිය **සොඤ්ඣිය** බමුණන්ට පරිත්‍යාග කොට සුදුසු නැකැත් යෝගයෙක්හි අන්තඃපුරය සහිත සියලු සෙනඟ පිරිවරා ජඞ්ඝම රාජධානියක් මෙන් අයෝධ්‍යාව බලා පිටත් විය. මහ මුහුදු ගොඩ ගමන් ගත්තාක් මෙන් පිටත් ව යන කුශරාජ සේනාවගේ පිඹාව ඉවසනු නො හැකි පොළොව ධ්‍රුලි ව්‍යාජයෙන් ආකාශ සඞ්ඛ්‍යාත විෂ්ණුහුගේ දෙවෙනි පාදසථානයට නැංගේ ය.

හස්ති සේනාවගේ මද ජලයෙන් පොළොව මඩ විය. එහෙත් පසුව ගමන්ගත් අශ්වයන්ගේ කුරගැටීමෙන් නැවත ධූලි බවට ද පැමිණියා ය. මෙසේ ගමන් කොට **විඤ්ඣපාදමූල** ඉක්මවා ඇතුන් ගෙන් හෙයක් බැන්දුක් මෙන් කොට ගඞ්ගා නම් ගඟින් එතර වී සිව් දිනකගේ ඇවැමෙන් රඝුරජු විසින් පිහිටුවන ලද යාග

සහමහ ඇති ශරයූ නදිය සරා පැමිණ ගමන් විඩා දුරු කොට අයෝධ්‍යා පුරාසන්නයෙහි සේනාවන් නවත්වා නගර ප්‍රතිසංස්කරණය කැරවීය.

සියලු උපකරණ සම්පාදිත ව තුබූ හෙයින් වහාම ප්‍රතිසංස්කෘත වූ නගරයට වාසතු විද්‍යාවෙහි නිපුණයන් ලවා විධි වූ පරිදි ශුභයෝගයෙක්හි ගෘහප්‍රවේශ මඞ්ගලය සිදු කරවා සර්වානන්ත රානුරූප ව සියලු පිරිවර ජනයන්ට සඞ්ග්‍රහ කොට නගරයෙහි නිවාසග්‍රහණය කෙළේ ය. සර්ව්ඕඝයෙන් සමෘද්ධ වූ ඒ අයෝධ්‍යා නගරයෙහි රාජ්‍යය පිහිටුවා වසන්නා වූ කුශරජතුමා ශක්‍රයාට හෝ වෛශ්‍රවණයාට හෝ ගරු නො කෙළේ ය.

ඉක්බිති රජහුගේ අන්තඃපුර ස්ත්‍රීන්ට සිනිදු වස්ත්‍ර පැළඳීම් මුක්තාහාර ධැරීම් ආදියෙන් සැරසෙන විදිය උගන්වන්නට මෙන් ග්‍රීෂ්මකාලය පැමිණියේ ය.

දක්ෂිණායනයෙන් උත්තරායණයට හිරු පැමිණීමෙන් උත්තර දිශායෙහි වූ හිමවත් පර්වතය සතුටු කදුළු හෙළන්නාක් මෙන් හිමස්‍යන්දනය කිරීම, දුවල් අධිකවීම, රාත්‍රිය අඩුවීම, දිනයක් පාසා විල්පොකුණු සිදියාම, සායන්තනමල්ලිකා (=හෙන්ද්‍රික්කා මල්) මහරි මල් කුඹුක් මල් පළොල් මල් පිපීම ද බහුල විය. රජතුමා ද මේ කල්හි එක් දිනක් ශරයූ නදියෙහි ජලක්‍රීඩාවට ගොස් දේවීන් සමඟ මහා හස්ති රාජයකු ඇතිනියන් හා සමඟ කෙළනා සේ ජල ක්‍රීඩා කෙළේ ය.

[මෙහි ශ්ලෝක (18) අටළොසෙකින් කළ සලිල ක්‍රීඩා වර්ණනය විසිතුරු වේ.]

ඒ අවස්ථායෙහි කුශරජුට රාජ්‍යයත් සමඟ පියාණන් දුන් ජෛත්‍රාභරණය රජු නො දැනුවත් ව ම ගිලිහී දියෙහි ගිලුණේ ය. සන්නාය අවසන් කොට ආභරණ පලඳනා මණ්ඩපයට පැමිණ බලත් ම දිව්‍යමය වූ වලයාභරණය* නො දැක එය සොයනුවස් කිමිදීමෙහි දක්ෂයන් ද දැල් දමන්නන් ද යෙදී ය. බොහෝ වෙහෙස වූ නමුදු නො ලත් බැවින් ඔවුන් විසින් "එය ගඟතුළ වසන කුමුද නම් නාගරාජයා විසින් ගන්නට ඇතැ"යි කියන ලද්දේ කෝපයෙන් රත් වූ නෙත් ඇති රජතෙම නාගයා නසනු පිණිස දුන්න ගත්තේ ය. කුශරජ වනාහි මලක් වුව ද ආභරණයක් වුව ද අවිශේෂයෙන් සලකන්නෙකි. එතෙත් මේ ආභරණය පියරජු පැළඳි ආභරණයක් හෙයින් ම මෙය නැතිවීම නො ඉවසීය. ලෝභයෙකින් නො වේ.

* මෙය අගස්ති ඍෂිවරයාගෙන් රාම රජුට ලැබිණි.

මේසේ කුමුද නාගයා නසනු පිණිස ගාරුඩ ඇත්තය ගෙන ගනට විද්ද කල්හි සුතෙර ගිරින් මඩනා ලද මහා සාගරය සේ කැළඹී ගිය ඒ මහා ජලාශය අවපාතයෙහි වැටුණු වාසභසතිරාජයකු මෙන් ඉවුරු බිඳිමින් හඬා නැංගේ ය.

එකෙණෙහි සුරාසුරම්පිත සමුද්‍රයෙන් ලක්ෂ්මිය පෙරටු කොට උද්ගත වූ පාරිජාත වෘක්ෂය මෙන් නාගකන්‍යාවක් සමඟ කුමුද නාරජ උඩට නැඟී ආභරණයත් රැගෙන රජුවෙත පැමිණ අභිවාදනය කොට "මහරජාණෙනි ඔබ විෂ්ණුහුගේ පුත්‍රාවතාරූප වූ අවතාරයක් බව දනිමි. සේවය වූ ඔබගේ ප්‍රීතියට විරුද්ධ ක්‍රියා වක් මම කෙසේ කෙරෙම් ද? එතෙකුදු වුවත් මේ ළඳුරිය කන්‍යක ක්‍රීඩා කරන්නී අහසින් වැටුණු ඔබගේ ආභරණය කුහුලින් ගත්තී ය. පෘථිවීශ්වරයාණෙනි, එය ඔබට ම දෙමි. මාගේ බාල නැඟණියන් වූ මේ කන්‍යාව ද තමා කළ අපරාධයට දඬුවම් වශයෙන් බොහෝ කලක් ඔබගේ පාදසේවා කරනුවස් පිළිගනු මැනවැ!" සි කියා කුමුද නාරජ කුමුද්වති නම් නැඟණියන් හා සමඟ ආභරණය රජුට ම දිනි.

කුශරජතුමා ද විධි වූ පරිදි විවාහ විධියෙන් කුමුද්වතිය පිළිගෙන අගමෙහෙසුන් කෙළේ ය. මෙසේ ගුරුළු වාහන වූ විෂ්ණුහුගේ වංශජයකු හා බන්ධුවයට පැමිණි නාරජතෙම ගුරුළුන් ගෙන් තමන්ට වන බිය දුරුකෙළේ ය. කුශරජු ද තක්ෂකයාගේ වංශයෙහි පස්වැනි පුත්‍ර වූ කුමුද නාරජුගේ බන්ධුත්වය ලැබ නාග භීතියෙන් තොර ව රාජ්‍යානුශාසනය කෙළේ ය.

කුමුද්වති විවාහ නම්
සොළොස් වන සග නිමි.

17

කුශරජහට දුව කුමුද්වතියට අතිථි නම් පුතණු කෙනෙක් උපන්හ. අනුපම කාන්ති ඇති ඒ කුමරු මාතාපිතෘ උභය වංශය සූසීයා උත්තරායණ දක්ෂිණායනයන් පවිත්‍රකරන්නාක් මෙන් පවිත්‍ර කෙළේ ය. අතිථි කුමරු වැඩිවිය පැමිණ කුල විද්‍යා ධ්‍යයනය කොට විවාහප්‍රාප්ත වූයේ ශෞර්යයෙන් තේජසින් පියරජු සම ව සිටී. කුශරජතුමා සවකුලෝචිත වූ ශක්‍ර සාහාය්‍යය පිණිස අසුර යුද්ධයට ගොස් ඉක්ෂ්ව නම් අසුරයා නසා ඔහු විසින් ම මරනු ලැබී.

කුමුදවතී බිසව ද ස්වාමියා අනුගමනය කෙළෙන් දෙදෙන ම දෙව්ලොව උපන්හ. යුද්ධයෙහිදී මැරීමත් ස්වාමියා අනුව මැරීමත් සවගීගාමී ක්‍රියා වන හෙයිනි.

තමාගේ ඇවැමෙන් පුත්‍රයා අභිෂේක කටයුතු යයි කුශදර්ජ කී පශ්චිම ආඥව පිළිපදින්නා වූ අමාත්‍යයෝ රැස් ව අතිථි කුමාරයා අභිෂේක කරනු පිණිස දක්ෂ ශිල්පීන් ලවා කණු සතරක් මතුයෙහි විසුතුරු මණ්ඩපයක් කරවා සවණීසට පූරිත තීර්ථ ජලයෙන් උතුසව සහිත ව අභිෂේක මඩගලය ආරම්භ කළහ. වෘද්ධ ඥාතීහු පළමු කොට නීතණ යවාඩකුර නුග සුඹුළු ඉහාදළු පලුපත් යන මේ ආදියෙන් 'නීරාජනා' නම් මඩගල ශාන්ති විධිය කොට සෙත් වැඩූහ.

ඉක්බිති මඩගල තූර්‍යයන් වාදනය කරද්දී පුරෝහිතයන් ප්‍රධාන බ්‍රාහ්මණයෝ ජයඝ්‍යඝ වූ අථර්වවේද මන්ත්‍රයෙන් ජප කොට අභිෂේක ජලය ගිම්යෙහි වත්කළහ. එකෙණෙහි වඳින් විසින් සතුත වූ රජතෙම කැඳැත්තන් විසින් අභිනන්දිත වූ මහා මේඝයක් මෙන් දිස්වී. අභිෂේකය අවසානයෙහි සනාතනයන්ට දක්ෂිණා සහිත යාගයන් සිදුකිරීමට සැහෙන ධනය දී කාරාගෘහාදියෙහි බඳුවූවන් මුදවා හැර වේශරවනාව (=රාජාභරණ පැළඳීම) පිණිස උඩුවියන් සහිත හස්තිදන්තමය මහාහි ආසනයෙක්හි හුන්නේ ය.

ප්‍රසාධකයෝ (=සළුවඩන නිලමවරු) හස්තධාවනය කොට සුවඳ දුමින් රජුගේ කේශකලාපය තෙත සිඳුවා ඒ ඒ ආභරණයන් පළඳවා මුතුලැල් ගවසා කේශකලාපය ද බැඳ පද්මරාග මාණික්‍යයෙන් යුක්ත කොට කස්තුරියෙන් සුගන්ධිත වූ චන්දනාඛරාගය ගා ගෝරෝචනා යුක්ත කොට පත්‍රරචනාව ද කළහ.

මෙසේ සවීාභරණ විභූෂිත ව මල්දම් පැලඳ හංසරූප ඇති දුහුල් හැඳ සිටි රාජශ්‍රියගේ ස්වාමිතෙමේ අතිශයින් දැකුම්කලු වී. ඡත්‍ර චාමරාදි රාජකකුදභාණ්ඩ ගත් අත් ඇති සේවකයන් විසින් සෙවිනා ලද අතිථි රජතුමා ජය ශබ්දය පෙරටු කොට රාජසභාවෙත ගමන් කොට රාජසමූහයාගේ සිළුමිණි පහස ලත් පාපුටු ඇති පියරජුගේ සිංහාසනයෙහි වැඩහිඳ මඩගල සභාමණ්ඩපය ශෝභාවත් කෙළේ ය.

මඳ සිනා පෙරටුව කථාකරන්නා වූ ප්‍රසන්නාමුඛ ශෝභා ඇති අතිථි රජු මූර්ධාභිමත් වූ විශ්වාසයක් මෙන් මහා ජනතාවෝ

පිළිගත්හ. වැළඳූ ශ්වේතච්ඡත්‍රය රජතුමාට පමණක් එසවුව ද පුරී ණ්ජවියෝග නමැති උණුසුම සියල්ලන් කෙරෙන් පහ ව ගියේ ය.

මහා තේජස් ඇති වහනිය ද පළමු කොට දුම් නහා දෙවනු ව ගිනිසිළු නගයි; සූය්‍යයා ද ප්‍රථමයෙන් උද්ගත ව ඉක්බිති රස් පතුරුවයි. අනිපි රජ වනාහි වහනිය මෙන් ද සූය්‍යයා මෙන් ද තේජස් ඇත්තේ ය. එතෙකුදු වුවත් ඔහු පෙර පසු නො ව ප්‍රතාපාදි ගුණයන් සමඟ ම උදා වූයේ සි.

වශිෂ්ඨ ගුරුහුනේ මන්ත්‍රය ද අනිපි රජුගේ දුනු හී ද එක් වූ කල නො ලද හැකි කිසිවකුත් නැති හෙයින් රජතෙම සියල් ලෙන් සම්පූණී වූයේ ය.

සෑ සහිත අධිකරණයන් (=හඬු) විනිශ්චයකාරයන් සහාය කොට ගෙන රජතුමා ම නො මැළිව විසඳයි. ඉක්බිති සේවක යන්ට ඒ ඒ කටයුතු ආඥ විධාන කොට හරියි මෙසේ ප්‍රජාපාල නයෙහි අප්‍රමත්ත වූ අනිපි රජ කි දෙය මිථ්‍යා නො වීය. දුන් දෙය නැවත නො ගත්තේ ය. එසේ වුව ද සතුරන් උපපාවනය කොට නැවත සවසථානයෙහි පිහිටුවන බැවින් පමණක් භග්නව්‍රත ඇත්තෙක් විය.

තාරුණ්‍යය, සෞන්දර්‍යය, සම්පත්තිය යන මේ දෑ එක එකකුදු මදයට කාරණ වතුදු සියල්ල එක්ව ද අනිපි රජුගේ සිත ගර්විත කරන්නට අසමර්ථ විය. මෙකී ගුණයන් කාරණකොට ගෙන බාල වයස්සා වූ නමුදු දිනක් පාසා රටවාසීන්ගේ සිත් දිනාගත් බැවින් නො සෙල්වීය හැකි සේ රාජ්‍යයෙහි සථිර ව පිහිටි රජතුමා බැහැර සතුරන් තමා කරා පැමිණීම අනිත්‍ය හෙයින් ද ඇත් ව සිටින බැවින් ද ආභ්‍යන්තරික වූ **කාම - ක්‍රෝධ - ලෝභ - මෝහ - මද මාත්සර්‍ය්‍ය** යන සවග සතුරන් දිනී.

කේවල නීතිය දීන වෙයි; ශෞර්‍යය ක්‍රැර වෙයි; අනිපි රජ මේ දෙකින් ම යුක්ත ව අති සිදුසිය ලැබී.

දිනපතා මන්ත්‍රීන් හා රහස් මන්ත්‍රණ කරතුදු කිසිකලෙකත් ප්‍රකට වූයේ නො වේ. සුදුසු කාලයෙහි නිදුගත ද සතුරු මිතුරු උභය පක්ෂයෙහි ම යෙදූ චරපුරුෂයන් ඇති බැවින් මේ රජතුමා සතතයෙන් ජාග්‍රත විය. රජතුමා ධනයෙන් සමෘද්ධ වූයේ නමුදු මුහුදු දිය වැඩිවන කල ගංමුව දෙරින් ම යන්නා සේ ජනාභිවෘද්ධියෙහි ම වසතුව යෙදී. මහජනයාගේ කෝපය සන්සිඳ වීමට එතුමා ඒකාන්තයෙන් සමර්ථය. එතෙකුදු වුවත් කිසිකලෙක එබඳු නො සතුටක් උපදවන ක්‍රියාවෙක් නො කරන ලද. එසේ ම

අර්ථය (=ධනය) හෝ කාමය නිසා ධර්මය නො නැසීය. ධර්මය නිසා අර්ථකාමයනුදු නැසුයේ නො වේ. ධර්මය අර්ථය කාමය යන ත්‍රිවර්ගයෙහි ම සම ව පැවැත්තේ ය. හීන මිත්‍රයෝ උපකාර නො කට හෙති; අධික බලවත්හු අපකාර කෙරෙති. එබැවින් සමතත්ත්වයෙහි බලවතුන් ම ඇසුරු කළා වූ මේ රජතුමා තමාගේත් සතුරාගේත් බලාබල මැනැවින් දැන සතුරු තමාට වඩා බලශාලී වී නම් යුද්ධයට නො ගියේ ය. එතෙකුදු වුවත් ඒ අතිථි රජුගේ රාජ්‍ය යෙහි වනගත මාගීය පවා උද්‍යාන මාගීයක් මෙන් නිරුපද්‍රව ය. පර්වතයන්හි පවා සඵකිය ගෘහයෙහි මෙන් නිර්භය ව වෙළඳ ජනයෝ ගමන් කළහ.

පොළොව ආකරයෙන් රුවන් ද වෙලින් අස්වැන්න ද වනයෙන් ඇතුන් ද තමාගේ රක්ෂණයට පඬුරු වශයෙන් මේ රජුට දුනු.* මෙසේ සමෘද්ධ වූ රාජ්‍යය **සාමඤ්ඤ දානඤ භේදඤ දණ්ඩඤ** යන සිවුවැදෑරුම් රාජනීතිය යොදමින් පාලනය කරන රජතෙමේ ඒ නීතියගේ ඵලය වූ අමාත්‍ය පුරෝහිත යුවරාජ සේනාපත්‍යාදි අට ලොස් සිරිය නිරවුල් ව ලැබී.

චන්ද්‍ර සමුද්‍රයන් පවා අභිවෘද්ධියට අනතුරු ව හානිය ලබන හෙයින් අතිථි රජ වෘද්ධිපක්ෂයෙහි පමණක් ඔවුන් හා සම විය. සඳරස්හු පියුමට ද හිරුරස්හු කුමුදයට ද නො යෙති. එසේ වුව ද මේ රජුගේ ගුණ සමුද්‍රය සතුරන් කරා ද ප්‍රවිෂ්ට විය. මෙසේ ප්‍රභාශීලී වූ අතිථිරජ රක්ෂණ වර්ධන ධාරණ සඞ්ඛ්‍යාත සමාන ධර්ම ඇත්තෙන් පස්වැනි ලෝකපාලයකු මෙන් ද සවැනි මහා භූතයකු මෙන් ද අටවැනි කුලපර්වතයක් මෙන් ද දෙව්ලොවට ශක්‍රයා මෙන් මිනිස් ලොවට අධිරාජ ව සිටියේ ය.

අතිථි වර්ණනා නම්
සතළොස් වන සඟ නිමි.

18

නිෂධ දේශාධිපතිහුගේ පුත්‍රිය වූ අතිථිරාජ මෙහෙසී තොමෝ රජුට දුව පුතකු ලදු. **නිෂධ** යයි ම ඕහට නම් තැබූහ. අතිථි රජුගේ ඇවෑමෙන් කුශරජුගේ මුනුපුරු වූ ඒ නිෂධ කුමාරයා සාගරය කෙළවර කොට ඇති පොළොවට අධිපති විය.

---

* ආකරයෙන් රුව ත්
වෙනෙනිබු වෙලින් අස්ව ත්
සිය රැකුමැ තුටුව ත්
දෙරණ ලිය දුනු ඔහුට එකුව ත්
(කවිසේඛර 1-43)

නිෂධ පුත්‍ර වූ **නල** ය, ඔහුපුත් **නභ** ය, ඔහුපුත් **පුණ්ඩරීක** ය, ඔහුපුත් **ක්ෂේමධන්ව** ය, ඔහුපුත් **දේවානීක** ය, ඔහුපුත් මිහිරි වදන් ඇති **අහීනගු** ය, ඔහුපුත් **පාරියාත්‍ර** ය, ඔහුපුත් උදාර සභාව ඇති **ශිල** ය, ඔහුපුත් **උන්නාභ** ය, ඔහුපුත් **වජ්‍රණාභ** ය, ඔහුපුත් **ශඛණ** ය, ඔහුපුත් **ව්‍යුෂිතාශව** ය, ඔහුපුත් **විශවසහ** ය, ඔහුපුත් **හිරණ්‍යනාභ** ය, ඔහුපුත් **කෞශල්‍ය** ය, ඔහුපුත් **බ්‍රහ්මිෂ්ඨ** ය, ඔහුපුත් **පුෂ්‍ප** ය, ඔහුපුත් **ධ්‍රැවසන්ධි** ය යන මේ රජවරු පිළිවෙළින් රාජ්‍යය කළහ.

ධ්‍රැවසන්ධි රජතුමා සවකිය පුත්‍ර **සුදර්ශන** කුමාරයා බාලකාල යෙහි ම මුවදඩයම් පිණිස ගොස් සිංහයකු විසින් මරනු ලැබී. එහෙයින් සාවුරුදු පමණ වූ සුදර්ශන කුමාරයා අමාත්‍යයන් විසින් රාජ්‍යයෙහි අභිෂික්ත විය. රාජවිපියෙහි මඩගල හස්ත්‍යාරූඪ ව ඇත්ගොව්වන් විසින් ආරක්ෂා පිණිස අල්වා ගන්නා ලදු ව නගර ප්‍රදක්ෂිණා කරන සුදර්ශන රජ බාලවුව ද පිතෘ රාජ ගෞරවයෙන් මහජනයා විසින් දක්නා ලදි. කුඩාවුව ද ඉන්ද්‍රනීල මාණික්‍යය **මහානීල** යයි කියනු ලබන්නේ තේජස්මහත්වය නිසා වන හෙයින් ඒ මිථ්‍යාවෙක් නො වේ. එමෙන් ම සුදර්ශන රජුට ද තේජෝමහත්වයෙන් "**මහාරාජ**" යන නාමය අන්වර්ථ විය.

සයහැවිරිදි වියෙහි පිහිටි මේ රජතුමා මහරි මලකට ද වඩා සුකුමාර බැවින් රාජාභරණ ධරිමෙනුදු විඩාපත් වුව ද අතිශයින් බර වූ පෘථිවී භාරය ධරිමට සමර්ථ වූයේ අනුභාව ශක්තියෙනි. සෝඩියෙහි (=අක්ෂරමාලායෙහි) වර්ණපරිචය ලබන්නටත් පෙර මේ රජතුමා වෘද්ධ අමාත්‍යයන් ආශ්‍රයෙන් සියලු දණ්ඩනීතිය පිළිබඳ ඵලය ලැබී.

මෙසේ කල් යත් යත් සුදර්ශන රජුගේ ශරීරාවයව පමණක් නොව සියලු කුලෝචිත ගුණ සමූහය ද වෘද්ධිප්‍රාප්ත විය. පෙර ජන්මයෙහි ශාස්ත්‍රපාරයට පැමිණි බැවින් ගුරුන්ට වෙහෙස නොකොට **නීති** විද්‍යයෙහි පරතෙරට පැමිණි මේ නරදේවයා ධනුශ්ශිල්පයෙහි හික්මෙන කල්හි: උඩුකය මදක් දිගහැර කෙස් කලබ උස්කොට බැඳ වම්පය දණමඬල මදක් වක් කොට කන දක්වා අදනා ලද හී සහිත දුනුදිය ඇත්තේ දක්නවුන්ගේ මනුවන් පැහැරගනී.

මෙසේ සකලකලා පාරප්‍රාප්ත වූ සුදර්ශන රජතුමා ක්‍රමයෙන් පුරහන්ගේ නේත්‍රයෙන් පියයුතු වූ, අනඝ වෘක්ෂයාගේ පුෂ්පය වූ, සර්ව්වඔඝසත්ත්වාධ්‍ය සවාභාවික ආභරණ සමූහයක් බඳු ප්‍රථම යෞවන ලක්ෂණයෙන් හොබනා කල්හි පළමුකොට ම පරිග්‍රහ

කුළ ශ්‍රී භූ (=රාජ්‍ය පෘථිවි) සඞ්ඛ්‍යාත පත්නීන්ට සපත්නි වශයෙන් ඇමතියන් විසින් එළු වූ රාජකන්‍යාවන්ගේ ද පාණිග්‍රහණය කෙළේ ය.

වංශානුක්‍රම නම්
අටලොස් වන සඟ නිමි.

19

සුදර්ශන රජහට අග්නිවර්ණ නම් එක ම පුත්‍රයෙක් විය. තරුණ වයසට පැමිණි පුත්‍රයා රාජ්‍යයෙහි පිහිටුවා සුදර්ශන රජ තපසට ගියේ ය.

සවහසන ප්‍රාප්ත වූ රාජ්‍යපාලනය පිණිස අග්නිවර්ණ රජහට වෙහෙසිය යුත්තෙක් නො විය. පිය රජතුමා සකල රාජ්‍යය ම නිෂ්කණ්ටක කොට සුවසේ රජසැප විඳීමට සැලැස්වූ හෙයිනි. එතෙකුදු වුවත් අග්නිවර්ණ රජ මහා කාමුකයකු වූ බැවින් සුවලපකලක් රාජ්‍ය විචාරණය කොට රාජ්‍යය ඇමතියන්ට භාර කොට තමා කාමුක කාන්තාවන් හා සමඟ නිරන්තරයෙන් ක්‍රීඩා තත්පර විය.

පුළි පුළි උත්සවයට අධික සමාරෝහයෙන් පසු පසු උත්සවය කරමින් තූර්‍යනාදයෙන් තොරතොා වූ මාළිගයන්හි කාමිනීන් හා කාමසුඛයෙහි නිමග්න වූ අග්නිවර්ණ රජ මහාජනයාට දක්නට පවා සුලභ නො විය. මන්ත්‍රීන්ගේ ඉල්ලීමට ගෞරවයක් වශයෙන් ප්‍රජාවන්ට දර්ශනය පිණිස කිසිකලෙක පැමිණියේ ද කවළියෙකින් දික්කළ පාදය පමණෙකි.

දිවාරාත්‍රි දෙක්හි ම කාමුක කාන්තාවන් පිරිවරා ජලක්‍රීඩා කරමින් උද්‍යානයන්හි හැසිරෙමින් මද්‍යපානය කරමින් නෘත්‍ය ගීතවාදිත්‍රයන් පවත්වමින් ඒ ඒ අවස්ථායෙහි භාග්‍යවන්ත සතුටු කිරීම පිණිස ඔවුන්ගේ භාඩන පීඩනයන් ද ලබමින් සල්ගෙවන රජතෙමේ රාජ්‍යපාලනයෙහි ප්‍රමාද වූයේ ය. එහෙත් ප්‍රතාපශීලී වූ හෙයින් සතුරන් විසින් ජයගත හැක්කකු නොවුව ද අධික මෙථුන සේවන හේතුවෙන් වූ රාජයක්ෂ්මන් (=ක්ෂය) රෝගය වැලඳී වෙදුන් කි ප්‍රතිකාරයෙහි ද ගරු නො කොට රෝගී ව ද සත්‍රී සංසර්ගාදි අපථ්‍ය සේවනයෙන් අසාධ්‍ය අවස්ථාවට ම පැමිණියේ ය.

මනෝඥ වූ රූපාදි විෂයයන් විසින් පැහැර ගන්නා ලද ඉන්ද්‍රිය සමූහය එසින් බලකාලීම දුෂ්කර ය; එබැවින් ම ඉන්ද්‍රිය විජය සාධුජනයන් විසින් පසස්නා ලැබේ.

(මෙහි 5 පවන් 46 දක්වා ශ්ලෝක එක්සාලිසකින් කළ ස්ත්‍රීඛාවණ්ණය ශෘඞ්ගාර රස පෝෂිත ය.)

ක්‍රමක්‍රමයෙන් පාණ්ඩුවණී මුඛය ද, ආභරණ රහිත බව ද, අනිකකු අත ගෙන ගමන් කිරීම ද, කටහඬ සිහින් වීම ද යන කාමුකාවස්ථාවට ම සම වූ රෝග ලක්ෂණයෝ පහළවූහ. අග්නිවණී රජ ක්ෂයරෝගග්‍රස්ත කල්හි ඒ රඝු කුලය අව තුදුස්වක අන්තිම කලා ශේෂ චන්ද්‍රයා ඇති දවස මෙන් ද, ග්‍රීෂ්මයෙහි මඩ පමණක් ශේෂ වූ විලක් මෙන් ද, තෙල් සිදී ගිය බැවින් නිවීමට ආසන්න වූ පහන් දැල්ල ඇති පහන් තැටියක් මෙන් ද විය.

ඇමතිවරු රජුගේ රෝගය සහවා "රජතුමා මේ දිනවල පුත්‍රයන් ලැබීමට යාගයක් කරවන්නේය"යි රටවාසීන්ට බොරු කියමින් වෙදුන් ලවා ප්‍රතිකර්ම කර වූ නමුත් ඖෂධ ශක්තියට වඩා රෝග ශක්තිය බලවත් වී මහා වාතයෙන් නිවී යන පහනක් මෙන් රජතුමා එසින් ම මළේ ය. ඇමති පුරෝහිතයෝ රෝග ශාන්තිය පිණිස යාගයෙකැයි කියමින් රජුගේ මරණය සහවා ආදාහන කෘත්‍යය ද නිමකොට රජ මෙහෙසිය කෙරෙහි ගර්භිණී ලක්ෂණ ඇති බැව් දැක ඇය රාජ්‍යයෙහි අභිෂේක කළහ. එතැන් පටන් පරම්පරාගත වෘද්ධ ඇමතියන්ගේ ද සහාය ලැබ බිසව් තොමෝ මැනැවින් රට පාලනය කළාය.

අග්නිවණී ශෘඞ්ගාර වර්ණනා නම්
එකුන් විසිවන සර්ග නිමි.

ආචාර්ය හැඩිපන්නල පඤ්ඤාලෝක
සර්විර සවාමීන් විසින් සඞ්ග්‍රහ කළ
රඝුවංශ සාරය නිමි.

රඝුවංශ ගත සඥා නාම යන්ගේ

අකාරාද්‍යනුක්‍රමණිකාව

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
අක්ෂඃ	12-63.
අගස්ත්‍යඃ	4-47, 6-61, 15-54, 16-44.
අග්නිවර්ණඃ	19-1.
අඞ්ගදඃ	15-90.
අඞ්ගාඃ	6-27, 30.
අව්‍යථඃ	4-28.
අජඃ	5-36, 55, 62, 64. 6-78. 7-31, 33, 55. 8-2, 6, 17, 20, 22, 25, 70. 9-4,5. 10-24.
අතිථිඃ	17-1.
අතිබලා	11-9.
අත්‍රිඃ	2-75. 13-50.
අථර්වා	1-60. 8-4.
අද්‍රිතනයා	2-37.
අධොක්ෂජඃ	10-33.
අනඞ්ගඃ	19-47.
අනුගොදං	13-35.
අනුසූයා	12-27. 13-51, 14-14.
අනූපාඃ	6-37.
අනන්තඃ	2-62. 8-46.
අපරාන්තාඃ	4-61.
අප්සරාඃ	16-71.
අමෘතා	10-58.
අම්බරීෂාශ්‍රමනඃ	13-6.
අයොධ්‍යා	11-93. 13-61. 14-29 15-38, 60, 98. 16-25. 17-36.
අරුණඃ	9-6.
අරුන්ධතී	1-57. 2-71.
අර්ණවඃ	1-16.
අලකා	9-14. 16-42.
අවන්තයඃ	6-32.
අව්‍යක්තම්	13-60.
අශ්විනෞ	18-23.
අෂ්ටමූර්තීඃ	2-35.
අහිතඟුඃ	18-14.
ආකාශගඞ්ගා	1-79. 16-71.
ආදිපුරුෂඃ	10-6.
ආසිධාරං ව්‍රතං	13-67.
ඉක්ෂ්වාකුඃ	1-73. 3-1, 72. 5-55. 6-71. 12-20. 13-61, 70. 14-55. 15-44, 49.
ඉන්ද්‍රඃ	1-12. 6-31.
ඉන්දුමතී	5-39. 6-2, 31, 70. 8-1, 29.
ඉන්ද්‍රඃ	4-16. 6-62. 7-35. 8-5, 81.
ඉන්ද්‍රජිත්	13-73. 15-26.
ඊශ්වරඃ	3-54. 4-72 8-34. 9-21. 13-57.
උත්කලාඃ	4-40.
උත්තරකොසලාඃ	3-5. 6-71. 9-1. 13-62. 18-7.
උත්සවසඞ්කේතාඃ	4-81.
උදධිඃ	12-68.
උදඤ්චන්	16-27.
උෂ්ට්‍රඃ	11-8.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
ඵල්ගුනාහඃ	18-20.
ඵමා	3-23.
ඵරඟපුරම්	6-59.
ඵර්මිලා	11-54.
ඵර්වී	1-14. 18-34.
යඃක්ෂවාන්	5-44.
යඃක්ෂශඃඞ්ගඃ	10-4.
ඓන්ද්‍රම්	2-50. 6-26. 15-22.
ඓන්ද්‍රිඃ	17-22.
ඓරාවතඃ	1-37. 6-73. 17-32.
ඓශම්	2-75.
ඔඖර්ඃ	9-82.
කකුත්සථඃ	6-71. 9-16.
කපිලඃ	3-52. 13-3. 16-34.
කපිශා	4-38.
කලිඞ්ගාඃ	4-40. 6-53.
කලින්දඃ	6-48.
කවඞ්කඃ	12-57.
කවිඃ	14-70. 15-32, 71, 75.
කල්පද්‍රැමඃ	5-52. 6-6.
කල්පවෘක්ෂඃ	1-76. 11-50. 14-48. 17-26, 32.
කාකුත්සථඃ	4-43, 90. 6-2. 7 - 3. 9- 65. 12-30, 46, 72. 13-79. 15-4, 75. 17-1.
කාමඃ	16-50.
කාමරූපාඃ	4-85, 86. 7-17.
කාමේඛාජාඃ	4-72.
කාරාපථඃ	15-90.
කාර්ත්‍තවීර්‍යඃ	6-38.
කාර්ෂණඃ	15-24.
කාලඃ	15-92.
කාලනෙමිඃ	15-40.
කාලිඞ්ගඃ	4-42, 44. 6-53.
කාලින්දකන්‍යා	6-48.
කාලින්දී	15-28.
කාලියඃ	6-49.
කාවේරී	4-81.
කුණ්ඩිනම්	7-33.
කුමාරඃ	3-57. 5-36.
කුමුදඃ	16-76, 81, 86. 17-6.
කුමුද්වතී	16-85. 17-1, 6.
කුම්භකර්ණඃ	12-80.
කුම්භජන්මා	12-31.
කුම්භයොනිඃ	4-22. 15-55. 16-72.
කුම්භිනසී	15-15.
කුම්භොදරඃ	2-35.
කුලපතිඃ	11-30.
කුලිශඃ	10-13.
කුවෙරඃ	4-69. 5-26, 30. 9 - 24 15-45. 17-81.
කුශඃ	15-32, 63, 97. 16-1, 4, 35, 72, 81, 88. 17-4. 18-4.
කුශධ්වජඃ	11-54.
කුශාවතී	15-97. 16-25.
කුශිකඃ	11-37.
කුසුමචාපඃ	9-39.
කෘත්තිකා	14-22.
කෘශාඞ්ගඃ	2-49.
කෘෂ්ණඃ	6-42, 49. 10-48. 15-24.
කෘෂ්ණගතිඃ	6-42.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
කෙකයාඃ	9–17. 10–55.
කෙරලාඃ	4–57.
කෙශවඃ	17–29.
කෛකෙයී	10–70. 12–2, 4, 13, 26. 13–59.
කෛලාසඃ	2–35. 5–28. 12–89. 14–20.
කොශලාඃ	1–35. 4–73. 7 – 34. 8–71. 9–17, 52, 79.
කොසලාඃ	11–49. 13–62.
කෞතසඃ	5–1, 30, 32.
කෞමුදතෙයඃ	18–3.
කෞවෙරඃ	15–45.
කෞවෙරී	4–69.
කෞශල්‍යඃ	18–27.
කෞශිකඃ	11–1, 14.
කෞසල්‍යා	10–55.
කෞසතුභඃ	6–49. 10–10, 62. 17–29.
ක්‍රථකෛශිකාඃ	5–39,61. 7–32. 8–83.
ක්ෂත්‍රඃ	1–13.
ක්ෂීරනිධිඃ	1–12.
ක්ෂෙමධන්වා	18–9.
ඛණ්ඩිතා	5–67. 19–21.
ඛරඃ	12 – 42, 47. 13–65.
ගඞ්ගා	1 – 35. 4–34, 38, 76. 6–48. 10–37. 13–57. 14 – 3. 52. 16 – 33, 71. 17–14.
ගඞ්ගීපතිඃ	5–53.
ගහසහිමාන්	3–37.
ගරුඞඃ	11–27. 12–76.
ගරුත්මාත්	10–13. 16–77.
ගාඞ්ගීම්	7–61.
ගාරුඩම්	13–53.
ගිරිශඃ	2–41. 16–51.
ගුරුඃ	15–85.
ගුහඃ	6–4.
ගොභාණීම්	8–34.
ගොත්‍රභිද්	3–55. 6–73. 13–7.
ගොප්‍රතරඃ	15–101.
ගොදා	13–35.
ගොදාවරී	13–33.
ගොවර්ධනඃ	6–51.
ගෞඃ	1–26. 2–59, 61. 10–72.
ගෞතමඃ	11–34.
ගෞරී	2–26. 4–74.
ග්‍රහඃ	12–28.
චක්‍රධරඃ	16–55.
චතුර්භුජඃ	16–3.
චතුර්මුඛඃ	10–22.
චන්‍රකෙතුඃ	15–90.
චන්‍රමෞලිඃ	6–34.
චිත්තයොනිඃ	19–46.
චිත්‍රකූටඃ	12–15, 24. 13–47.
චිත්‍රා	1–47.
චෛත්‍රරථඃ	5–60. 6–50.
ජායාපථඃ	13–2.
ජගද්ගුරුඃ	10–64.
ජනකඃ	11–35. 13 – 78. 14–43. 15–31
ජනස්ථානම්	6–62. 12–42. 13–22.
ජයන්තඃ	3–23. 6–78.
ජලෙශ්වරඃ	9–24.
ජහ්නුඃ	6–85. 8–96. 14–51.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
ජානකී	12-61. 15-74.
ජාහ්නවී	10-26, 69.
ජීවිතෙශඃ	11-20.
ජෛත්‍රාහරණම්	16-83.
ජෛමිනිඃ	18-33.
තක්ෂඃ	15-89.
තක්ෂකඃ	16-88.
තමසා	9 - 20, 72. 14-76.
තාඩකා	11-15,18,21, 28.
තාම්‍රපර්ණී	4-53.
තාර්ක්ෂ්‍යඃ	4-44. 6-49.
තුරඟාච්	15-40.
තුහිනාද්‍රිඃ	8-55.
තෘණබින්දුඃ	8-80.
ත්‍රිකූටඃ	4-62.
ත්‍රිජටා	12-74.
ත්‍රිදශායුධම්	4-54.
ත්‍රිපදී	4-51.
ත්‍රිපුරඃ	17-14.
ත්‍රිභුවනම්	16-88.
ත්‍රිලොකනාථඃ	3-47.
ත්‍රිලොචනඃ	3-68.
ත්‍රිවිෂ්ටපම්	6-78.
ත්‍රිශිරාඃ	12-47.
ත්‍රිස්‍රොතාඃ	10-63. 13-51. 16-34.
ත්‍රෙතාගනිඃ	15-35.
ත්‍රෛලොක්‍යනාථඃ	16-86.
ත්‍රෛවික්‍රමඃ	7-35.
ත්‍ර්‍යම්බකඃ	2-42. 3-51. 13-51
දණ්ඩා	6-32.
දක්ෂඃ	3-33. 19-48.
දක්ෂිණා	1-31.
දණ්ඩකඃ	12-9. 14-25.
දණ්ඩනීතිඃ	18-46.
දර්දුරඃ	4-54.
දශී	18-35.
දශකණ්ඨඃ	13-30, 77.
දශමුඛඃ	14-87. 15-103.
දශරථඃ	8-30.9-1. 11-24, 57. 12-54. 13-75. 15-31, 43.
දශානනඃ	10-75.
දෘශරථිඃ	10-44. 11-13, 44. 12-45, 76. 13-68. 14-1. 15-8. 16-6.
දිගහජාඃ	1-79.
දිලීපඃ	1-12. 2 - 23, 59. 3-18, 42, 43, 56. 4-2. 6-74. 8-11.
දිවස්පතිඃ	17-7.
දීක්ෂිතපාඃ	11-33.
දුර්ජයඃ	17-5.
දුර්වාසාඃ	15-94.
දූෂණඃ	12-46.
දෙවානීකඃ	18-10.
ද්‍යෞඃ	2-75. 5-33.
ධනදඃ	9-25. 12-52, 88. 17-80.
ධාතා	10-43. 13-6.
ධ්‍රැවඃ	18-34.
ධ්‍රැවසන්ධිඃ	18-34.
නගරන්ධ්‍රිකාඃ	9-2.
නන්දනම්	8-33, 96.
නන්දිග්‍රාමඃ	12-18.
නන්දිනී	1-83. 3-40. 2-69.
නභඃ	17-41 18-6.
නභස්‍යඃ	9-54. 17-41.
නභොමාසඃ	18-6. 19-57.
නම්‍රුචිඃ	9-22.
නරවාහනඃ	9-11.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක	නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
නමීදෘ	5-42.	පාරියාත්‍රඃ	18-16.
නලඃ	18-5.	පාණිනී	1-1.
නහුෂඃ	13-36.	පාගහෘත්	2-9.
නාගපුරම්	6-59.	පාශ්චාත්‍යාඃ	4-65.
නාරදඃ	8-34.	පිතෘකානනම්	11-16.
නාරායණඃ	7-13.	පිනාකී	6-72.
නිකුම්භඃ	2-35.	පුණ්ඩරීඃ	18-8.
නිමිඃ	11-49.	පුණ්ඩරීකාක්ෂඃ	10-9. 18-8.
නිෂධඃ	18-1	පුණ්‍යජනඃ	9-6. 13-60.
නිෂාදාධිපතිඃ	13-59.	පුත්‍රඃ	18-30.
නීපාඃ	6-46.	පුනර්වසූ	11-36.
නෛමිෂම්	19-1.	පුරන්දරඃ	2-74.3-23.53.
නෛෂධඃ	18-1.		9-12. 12-84.
පඞ්කතිරථඃ	9-74.		17-79.
පඤ්චවටී	12 - 31.	පුරාතනඃ	11-85.
	13-34.	පුරුහොත්තමඃ	10-72.
පඤ්චාප්සරඃ	13-38	පුරුහූතඃ	4-3. 10 - 49.
පතඞ්ගඃ	2-15.18-27.		16-5. 17-32.
පත්‍රරථේන්ද්‍රකේතුඃ	18-30.	පුරෝධාඃ	19-54.
පද්මරාගඃ	13-53.	පුලින්දඃ	16-32.
පද්මා	4-5. 7-13.	පුෂ්කරඃ	19-14.
පම්පා	13-30.	පුෂ්කලඃ	15-89.
පරංතපඃ	6-21.	පුෂ්කලාවතී	15-89.
පරමාත්මා	15-22.	පුෂ්පකම්	10-46. 13-40,
පරමෙශ්වරඃ	1-1. 2-39.		79. 14-20.
පරමේෂ්ඨී	10 - 33.	පුෂ්පචාපඃ	11-45.
	15-93.	පුෂ්පපුරම්	6-24.
පර්ජන්‍ය	7-33.	පුෂ්‍යඃ	18-32.
පවනතනයඃ	15-103.	පෛතාමහී	15-60.
පාකශාසනඃ	10-1.	පෞරස්ත්‍යාඃ	4-36.
පාණ්ඩ්‍යාඃ	4-52.6-60.	පෞලස්ත්‍යඃ	4-83. 10-5,
පාරණා	2-55,70.		47, 73. 12-72,
පාරසීකාඃ	4-63.		77, 83,90, 102.
පාරිජාතඃ	6-6. 10-11.		13-72.
	17-7.	පෞෂී	18-32.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
ප්‍රකෘතිඃ	11–56.
ප්‍රචෙතාඃ	1–81.
ප්‍රජාපතිඃ	7–14. 10–22.
ප්‍රණවඃ	1–11.
ප්‍රණිධානම්	1–75.
ප්‍රතීපඃ	6–41.
ප්‍රත්‍යයඃ	11–56.
ප්‍රාග්ජ්‍යොතිෂාඃ	4–84.
ප්‍රාචීනබර්හිඃ	4–29.
ප්‍රාචෙතාඃ	15-63, 70.
ප්‍රායශ්චිත්තං	12–19.
ප්‍රඝංවදඃ	5–53. 7–61.
ප්‍රියදර්ශිනඃ	5–53.
බලනිෂූදනඃ	9–3.
බලභිත්	11–51.
බලාතිබලෙ	11–9.
බලිඃ	7–35.
බහුශ්‍රැතඃ	15–36.
බාලඛිල්‍යඃ	15–10.
බාලී	12–58.
බුධඃ	1–48. 13–76.
බෘහස්පතිඃ	13–76.
බ්‍රහ්මවච්ඃ	1–64.
බ්‍රහ්මා	5–36.
බ්‍රහ්මිෂ්ඨඃ	18–28.
බ්‍රාහ්මම්	12–97. 13–60
භගීරථඃ	4–34.
භද්‍රඃ	14–31.
භරතඃ	10 – 70, 81. 11–16,69. 12–12, 24. 13–64, 66, 68, 70, 72, 77. 14–11, 16, 73. 15-87. 88.
භාගීරථී	7–36. 14–28.
භාර්ගවඃ	11–46, 61, 67, 79,83,88. 14-46
භිද්‍යඃ	11–8.
භුජඞ්ගෙන්ද්‍රඃ	2–74.
භූතනාථඃ	2–58.
භෘග්වඃ	10–14.
භොගී	10–7.
භෝජඃ	5–39. 6–59. 7–2, 13, 18, 20, 29, 35.
මගධාඃ	1–58. 3–5,19, 23. 6–20, 21. 9–17.
මගධෙශ්වරඃ	6–20.
මඝවා	1-26. 3–48, 54. 9–19. 13–36. 39. 18–31.
මතඞ්ගඃ	5–53.
මථුරා	6–48. 15–28, 36.
මදනඃ	11-13.
මධ්‍යඃ	9–26, 29, 38, 48.
මධ්‍යමඒ	9–48.
මධ්‍යමාධවෙඉ	11–7.
මධූපඞ්නම්	15–15.
මනුඃ	1–11, 17. 2–4,33. 4–7. 9–3. 14–67.
මනොභවඃ	12–33. 16–51.
මනුඛිනී	13–48.
මන්මථඃ	9–48.
මරුත්	2–10 9–13.
මරුත්තාන්	3–4. 16–71.
මලයඃ	4–49, 54. 6–64. 9–25, 33. 12–32. 13–2. 16–49.
මහාකාලඃ	6–34.
මහාණ්ඩවඃ	12–66.
මහෙන්ද්‍රඃ	4–41, 46. 6–54, 72. 13–20.
මහෙශ්වරඃ	3–51.
මහොදධිඃ	4–36, 53. 6–54.
මාගධී	3–5, 19, 23.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
මාතලිඃ	3-69. 12-86.
මාධවඃ	11-7.
මානසම්	6-26. 13-55.
මාරුතිඃ	12-60, 78.
මාල්‍යවාන්	13-26.
මාහිෂ්මතී	6-43.
මිථිලා	11-32, 52.
මුරලා	4-58.
මෙඝනාදඃ	12-76, 79.
මෙදිනී	1-66.
මේරුඃ	1-14. 7-24. 17-26
මෛථිලඃ	11-32,37,43, 47, 48, 57, 72. 13-77.
මෛථිලී	11-93. 12-29, 36, 38, 55. 15-37, 56,73.
මෛථිලෙයඃ	15-31, 63,71. 16-42,88.
යජමානලෝකඃ	18-12.
යමඃ	9-6,24. 17-81.
යමුනා	6-49. 13-57. 15-2, 30.
යවනාඃ	4-64.
යාදෙනාථඃ	17-81.
යුධාජිත්	15-87.
යූපඃ	1-45.
රඝුඃ	1-9. 3-21, 32, 34, 45,49, 53, 55, 61, 63, 69. 4-16, 17, 22, 39, 52, 61, 69, 80. 5-12,24, 26, 28,39, 63. 6-6, 68,76,83. 7-71. 8-5,10, 13, 16, 17, 20,22,25. 9-5, 9. 10-68, 80. 11-2, 54. 14-7, 12,
රඝුඃ	14-13,29. 15-7,35,46, 54. 16-1, 8, 23, 35, 39, 42. 18-37.
රඝුනන්දනඃ	12-72.
රඝුනාථඃ	15-54, 90.
රඝුපතිඃ	12-104. 13-76.
රතිඃ	7-15.
රවිඃ	1-18.
රසාතලම්	12-70. 13-3, 8.
රාඝවඃ	7-12, 32,65. 8-16, 25. 11-6, 10, 17, 22, 32, 35, 42, 47, 48, 70, 79, 83, 88; 89. 12-32, 44, 51, 53, 69, 85, 96, 103. 15-6, 44, 92, 96. 19-1.
රාමඃ	4-56,61. 6-42. 10-67, 69, 81. 11-1,18,20, 34, 37, 68, 73, 92. 12-2, 3, 6, 7, 14, 20, 23, 24, 28, 31, 34, 35, 42, 43, 49, 50, 52, 57, 59, 64 66, 74, 77, 80, 81, 83, 84,87, 89,91. 13-1, 69, 74, 77. 14-15, 19, 21, 58, 68, 84. 15-3, 5, 9, 34, 39, 43, 48, 56, 64, 65, 67, 70, 71, 76, 86, 89, 94. 16-72.
රාමා	12-23. 14-27. 16-15.
රාමායණම්	15-63.
රාවණඃ	10-48. 11 - 19. 12-32, 51, 55, 83, 87, 91, 99, 103.
රුද්‍රඃ	2-54. 11-47
රේවා	6-43. 16-31
ලක්ෂ්මණඃ	10-71, 81. 11-2, 6, 26, 54, 91. 12-9, 39, 44,

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
ලක්ෂ්මණඃ	12-77. 13-65, 72. 14-44, 49 15-17, 90, 94.
ලක්ෂ්මීඃ	2-7. 6-43,58. 7-70. 10-10, 62. 12-15, 26, 68. 14-24, 63, 86. 16-79. 18-16, 47.
ලඞ්කා	6-40,62. 12-61, 63, 66, 71, 78, 84. 13 - 78. 15-103.
ලවඃ	15-32, 63, 97.
ලවණඃ	15-2, 5, 17, 26, 38, 40.
ලවණාම්භඃ	17-54.
ලෝකපාලාඃ	17-78.
ලෝකාලෝකඃ	1-69.
ලෞහිත්‍යා	4-84.
වඞ්ගාඃ	4-38.
වජ්‍රණාභඃ	18-21.
වජ්‍රධරඃ	18-21.
වජ්‍රපාණිඃ	2-42.
වජ්‍රී	9-24. 10-40.
වනායුඃ	5-73.
වරතනතුඃ	5-1, 12.
වරුණඃ	9-6. 11-53.
වසිෂ්ඨඃ	1-36. 2-19, 67, 69, 70. 3-40. 5-27. 8-3. 17-38.
වසුන්ධරා	4 - 8. 15 - 83. 16-28.
වසෙවෘන්සාරා	16-10.
වාමනඃ	11-22.
වාඝව්‍යාසත්‍රම්	4-44.
වායුදෛතම්	11-28.
වාල්මීකිඃ	14-45, 58, 79. 15-11, 37, 64,69,80.
වාසවඃ	3-60, 65. 5-5. 9-8. 11-33,53.
විඛෙෂජාඃ	3-61. 15-59.
විදර්භාඃ	5-40, 6-58, 66, 84. 7-1.
විදිශා	15-36.
විදෙහාඃ	11-36. 12-26. 14-24.
විද්‍යුද්ධරඃ	2-60.
විධාතා	1-36. 6-37.
විධිඃ	8-26,45.
විඛ්‍යඃ	6-61. 12-31. 14-8. 16-31,32.
විභාවසුඃ	3-37.
විභුඃ	10-65.
විභීෂණඃ	12 - 68, 104. 13-69. 14-17.
විරාධඃ	12-28.
විශාම්පතීඃ	1-94. 5-3.
විශ්වක්සෙනඃ	15-103.
විශ්වම්භරා	15-81. 18-24.
විශ්වසහඃ	18-24.
විශ්වෙශ්වරඃ	18-24.
විෂ්ණුඃ	10 - 49. 13-5. 14-59. 16-28, 82.
වෘත්‍රහා	3-64.
වෘන්දාවනම්	6-50.
වෘෂධ්වජඃ	11-44.
වෘෂභධ්වජඃ	2-36.
වෘෂා	10-52. 17-77.
වෘෂාඞ්කඃ	3-23.
වෙධාඃ	1-29. 8-48.
වෛදර්භීඃ	5-62.6-3. 7-17, 30, 67.
වෛදෙහඃ	14-39, 47, 84.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
වෛදෙහී	12-20, 59, 64. 13-2. 14-33,39,72. 15-61.
වෛනතෙයඃ	11-59. 16-88.
වෛවස්වතඃ	1-11. 12-95. 15-45, 57.
වෛෂ්ණවම්	10-54.
ව්යුෂිතාශ්වඃ	18-23.
වෝඃම	19-51.
ශක්රඃ	1-76. 3-39, 58. 4-42. 6-74. 14-83. 19-30.
ශඞ්ඛණඃ	18-22.
ශචී	3-13, 23, 57. 6-23. 7-3. 8-33. 17-7.
ශතක්රතුඃ	3-38, 51.
ශත්රුඤ්ජතී	15-36.
ශත්රුඥ්නඃ	10 – 71, 81. 13-79. 15-6, 19, 22, 36.
ශම්බුඤඃ	15-50.
ශරජන්මා	3-23.
ශරභඞ්ගඃ	13-45.
ශරයූඃ	8-96. 9-20.
ශරාවතී	15-97.
ශඵීඃ	11-93.
ශාතකණීඃ	13-38.
ශාර්ඞ්ගී	12-70. 15-4,40.
ශිලඃ	18-17.
ශිලාවර්ෂී	4-42.
ශිශිරඃ	9-31.
ශූරසෙනඃ	6-45.
ශූර්පණඛා	12-38, 51.
ශ්ලඵහෘත්	2-38.
ශෙෂඃ	12-70.
ශොණඃ	7-36.
ශ්යාමඃ	13-53.
ශ්රාඞ්ඃ	1-67.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
ශ්රීඃ	3-8,36. 5-38,47. 6-5, 29, 41. 8-5, 11, 13, 14. 9-5, 15, 27, 29,40,45. 10-8,70,75. 17-46. 18-8.
ශ්රීවත්සඃ	10-10. 17-29.
ෂඩානනඃ	14-22. 17-67.
සගරඃ	3-52.
සත්ත්වානඃ	10-77.
සමුද්රඃ	1-5.
සංපාතිඃ	12-60.
සංමොහනම්	5-57.
සප්තාර්ඡයඃ	13-51.
සප්තාසප්තිඃ	13-41.
සරයූඃ	13-63. 14-3, 30. 15-95, 100. 16-21, 35, 36, 54, 58, 75. 19-40.
සරස්වතී	3-9. 4-6. 6-29.
සහස්රනෙත්රඃ	6-23.
සහ්යඃ	4-55, 56.
සාකෙතම්	5 – 31. 13-79. 14-13. 18-36.
සාගරඃ	1-2. 3-9. 18-4.
සිඤ්චුඃ	4-70. 13-9. 15-87.
සිඤ්චුරාජඃ	6-61.
සිප්රා	6-35.
සීතා	12-9, 21, 33, 44, 54, 63, 74, 90. 14-5, 19, 26, 54, 59, 71, 83, 87. 15-1, 39, 71, 76, 80, 84, 85, 86.
සුකෙතුඃ	11-14.
සුග්රීවඃ	12-58. 14-17.
සුතීක්ෂ්ණඃ	13-41.
සුදක්ෂිණා	1-31. 2-21, 64. 3-1, 69.
සුදර්ශනඃ	18-35.

නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක	නාමය	සර්ග-ශ්ලෝකාඞ්ක
සුධර්මා	17-27.	සමරඃ	7-15. 11-45.
සුධා	2-39.	සුෂේණා	1-94. 10-42.
සුනභූ	6-20, 37, 70, 80.	සවඩා	1-17.
සුපර්ණඃ	10-61.	සවාහා	1-5.
සුප්රතීකඃ	5-75.	හනූමාන්	13-6.
සුබාහුඃ	11-29. 15-36.	හරඃ	4-34. 62.
සුමන්ත්‍රඃ	13-59. 14-47.		11-83.
සුමිත්‍රා	10-55,71. 14-51, 56.	හරිඃ	3-45, 51, 57, 70. 8-80. 9-57. 10-5, 86. 11-76. 12-57, 67, 103. 13-1, 69, 72, 74.
සුමෙරුඃ	5-30.	හරිණී	8-80.
සුරඞ්ගජඃ	5-75. 10-86.	හරිදශ්වඃ	3-22. 18-23.
සුරදව්වි	2-39.	හරිහයඃ	9-18, 23.
සුරභිඃ	1-76, 82. 2-54.	හව්ර්භුක්	1-57.
සුරසරිත්	2-75.	හාරීතඃ	4-49.
සුෂේණඃ	6-45.	හිමවාන්	4-82.
සුහමඃ	4-37.	හිමාද්රිඃ	4-82. 14-3.
සෙනානීඃ	2-37.	හිරණ්‍යනාභඃ	18-25.
සොමඃ	18-27.	හිරණ්‍යරෙතාඃ	18-25.
සොමොද්භවා	5-59.	හිරණ්‍යාක්ෂරිපුඃ	18-25.
සෞමිත්‍රිඃ	12 - 14, 104. 13-32, 73. 14-11, 53. 15-14, 20.	හුණඃ	4-71.
සකාඥඃ	2-36. 7-1.	හෙමාඞ්ගදඃ	6-53.
සප්තාර්ණඃ	11-13.	හෙමවතී	16-44.
ස්නාතකඃ	17-17.	හෙහයඃ	11-74.



